# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

දසවැනි කලාපය - 2019 දෙසැම්බර්

ISSN 1800-1459
eISSN 2673-1177

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

## දසවැනි කලාපය - 2019 දෙසැම්බර්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

දසවැනි කලාපය 2019 දෙසැම්බර්

ISSN 1800-1459

eISSN 2673-1177

ප්‍රථම මුද්‍රණය: 2019 දෙසැම්බර්

**සංස්කාරක** : ආචාර්ය **ආර්. ඒ. ඩී.** ප්‍රියංකා වීරසේකර

**සියලු ම විමසීම්**

සංස්කාරක

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**තැ.පෙ.** 02

බෙලිහුල්ඔය

දුරකථන/ෆැක්ස් - 045 22 80013

විද්‍යුත් තැපැල - sjseditor@crkd.sab.ac.lk

පරිගණක පිටු සැකසුම : ආචාර්ය සධීර බණ්ඩාර

මුද්‍රණය :

ප්‍රකාශනය : ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බෙලිහුල්ඔය

## සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී අඛණ්ඩ ව වාර්ෂික ව පළ වන විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

## සංස්කාරක මණ්ඩලය

මහාචාර්ය ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ

ආචාර්ය මනෝජ් ආරියරත්න

ආචාර්ය ජී. කේ. චම්පා එස් ද සිල්වා

ආචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර

ආචාර්ය කේ. වී. දීපානි එදිරිසූරිය මැණිකේ

ආචාර්ය ඒ. සරත් ආනන්ද

සම්බන්ධීකරණ සංස්කාරක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. සී. පල්ලියගුරුගේ

ඉංග්‍රීසි භාෂා සංස්කාරක : ආචාර්ය මහේෂ් හපුගොඩ

# සංස්කාරක සටහන

සිංහල භාෂාවෙන් පළ කෙරෙන විමර්ශිත සඟරා විරල යුගයක සිංහල භාෂාවෙන් ඥාන සම්පාදනය කිරීමේ අභිලාෂයෙන් සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි දසවැනි කලාපය මෙසේ සමර්පණය කිරීමට ලැබීම ඉමහත් සතුටකි. අඛණ්ඩ ව වාර්ෂික ව පළ වන මෙම සඟරාවෙහි අන්තර්ගත ශාස්ත්‍රීය ලිපිවල ඇති ගුණාත්මක බව පිළිබඳ ශාස්ත්‍රලෝලීන් අතර ඇති විශ්වාසය තහවුරු කරන, සබුද්ධික ඥාන සම්පාදනය නිසා මෙවර විවිධ විෂය ක්ෂේත්‍රවලින් නිර්මිත ශාස්ත්‍රීය ලිපි විශාල ප්‍රමාණයක් අප වෙත ලැබුණු බව සතුටින් දැනුම් දෙමි. එම සියලු ශාස්ත්‍රලෝලී පර්යේෂකයන්ට අපගේ ස්තුතිය පිරිනැමෙ යි. ශාස්ත්‍රීය ලිපි විමර්ශනය කිරීමට අවැසි ශාස්ත්‍රීය විනයෙන් යුක්ත විද්වතුන් සොයා ගැනීම එතරම් පහසු කාර්යයක් නොවුව ද, සිය කාලය සහ ශ්‍රමය නොමසුරුව කැප කරමින් එම භාරධූර ශාස්ත්‍රීය කටයුත්තට දායක වුණු විද්වත් විමර්ශක මඩුල්ලට අපගේ ප්‍රණාමය හිමි විය යුතු යි. තත් ප්‍රවීණ විමර්ශක මඩුල්ලේ පූර්ණ විමර්ශනයට ලක් කොට මෙහි අන්තර්ගත ලිපි සම්පාදනය වුණු බව සඳහන් කළ යුතු ය. සිංහල බසින් සරසවියක ශාස්ත්‍රීය සඟරාවක් සම්පාදනය කිරීම පහසු කාර්යයක් නොවන බව අපගේ අත්දැකීම යි. ඒ සඳහා කාලය සහ සම්පත්දායකත්වය ප්‍රතිපාදනය කර ගැනීම අතිශය දුෂ්කර, වෙහෙසකර වූ කර්තව්‍යයකි. ඒ අනුව මෙම සත්කාර්යයට පූර්ණ දායකත්වය නොමසුරු ව ලබා දෙමින් සමස්ත සඟරාවෙහි පරිගණක පිටු සැකසුම කළ ආචාර්ය සධීර බණ්ඩාර මහතාට අපගේ ස්තුතිය පිරිනැමිය යුතු ය. එමෙන් ම මෙම සඟරාවට අදාළ සියලු අන්තර්ජාල වෙබ් පිටු නිර්මාණ කළ ආචාර්ය ආර්. එල්. දංගල්ල මහතාටත්, සඟරාවෙහි ලිපිවල අන්තර්ගත ඉංග්‍රීසි බසින් රචිත සාරසංක්ෂේපය සංස්කරණය කොට දුන් ආචාර්ය මහේෂ් හපුගොඩ මහතාටත් සංස්කරණ කටයුතුවලට සහය වුණු තේජා නානායක්කාරටත් අපගේ විශේෂ ස්තුතිය පිරි නැමෙ යි.

සරසවියක සම්පාදනය වන විද්වත් දැනුම මව් බසින් ජනගත කිරීමේ සත්කාර්යයෙහි වගකීම සහ වටිනාකම මැනවින් වටහා ගනිමින්, එම භාරධූර කාර්යය විශ්වාසයකින් යුතුව අප වෙත පවරා, ඒ සඳහා අවශ්‍ය සියලු ප්‍රතිපාදන සපයා දුන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුනිල් ශාන්ත මැතිතුමාටත්, සබරගමුව විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සහ දැනුම ව්‍යාප්ත කිරීමේ ඒකකයේ අධ්‍යක්ෂ මහාචාර්ය නිර්මලී වික්‍රමරත්න මැතිනියටත් අපගේ ගෞරවනීය ස්තුතිය හිමි වෙයි. මෙම සඟරාවෙහි ගමන් මග සක්‍රීය කරන්නට නිරන්තරව මැදිහත් වන සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ පීඨාධිපති ආචාර්ය මනෝජ් ආරියරත්න මැතිතුමාගේ අනගි සහය මෙහි දී ස්මරණය කළ යුතු ම ය. සිංහල බසින් දැනුම සම්පාදනය කරන සබරගමුව විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය සංග්‍රහය ඥාන ගවේෂණය සහ ඥාන සම්පාදනය අරමුණු කර ගත් සක්‍රීය විද්වත් මණ්ඩපයක් බවට පත් කිරීම අපගේ අරමුණ යි. එබැවින් මෙම සබුද්ධික විමර්ශිත සඟරාවෙහි ඉදිරි ගමන සාර්ථක කර ගනිමින් අඛණ්ඩව, කාර්යක්‍ෂම ව සමාජගත කරන්නට විද්වත් ශාස්ත්‍රලෝලී ඔබ සැමගේ පූර්ණ දායකත්වය නිරන්තරව අපි අපේක්‍ෂා කරමු.

ආචාර්ය ආර්.ඒ.ඩී. ප්‍රියංකා වීරසේකර
සංස්කාරක
සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය.

# ලිපි සම්පාදකයෝ

**එස්. ඩී. වික්‍රමසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භූ විඥාපන පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

**ආචාර්ය චම්පා එස්. ද සිල්වා[1] සහ ආචාර්ය මනෝජ් ආරියරත්න[2]**
[1]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.
[2]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

**ආචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

**ආචාර්ය ජයන්ති බණ්ඩාර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය.

**ආචාර්ය මනෝජ් ආරියරත්න[1] සහ ආචාර්ය මහේෂ් හපුගොඩ[2]**
[1]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.
[2]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

**තේජා නානායක්කාර**
ශාස්ත්‍රවේදී (විශේෂ) සිංහල, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

**යූ. ආර්. ටී. ගීතාංජලී**
ශාස්ත්‍රවේදී (විශේෂ) සිංහල, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.

**එච්. එම්. බුද්ධික හේරත්**
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ලංකාව.

# පටුන


| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|
| 1 | තාරකා විද්‍යාව, ජ්‍යොතිෂය සහ මිනිසා කෙරෙහි එහි බලපෑම් පිළිබඳ ගවේෂණයක්<br>**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ඩී. වික්‍රමසිංහ** | 1 |
| 2 | පශ්චාත් යථාර්ථවාදී නවකතාවෙහි නිරූපිත ස්ත්‍රීත්වය හා සබැඳුණු ගැටලු: ගබ්සාව හා ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂ අවධානය සහිත ව කෙරෙන විමර්ශනයකි<br>**ආචාර්ය චම්පා එස්. ද සිල්වා සහ ආචාර්ය මනෝජ් ආරියරත්න** | 10 |
| 3 | ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවලින් ධ්වනිත වන ශ්‍රී ලාංකේය ජන විඥානය: තෝරාගත් නාට්‍ය නිර්මාණ ඇසුරිනි<br>**ආචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර** | 23 |
| 4 | ඌව පළාතේ ගුහා විහාර සිතුවම් පිළිබඳ සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්<br>**ආචාර්ය ජයන්ති බණ්ඩාර** | 30 |
| 5 | ආපතික අනුරාගයේ ඉස්මතු වීම: මනමේ පිළිබඳ මනෝවිශ්ලේෂණාත්මක විචාරයක්<br>**ආචාර්ය මනෝජ් ආරියරත්න සහ ආචාර්ය මහේෂ් හපුගොඩ** | 40 |
| 6 | නූතන සිංහල නවකතාවේ ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (2010-2018 තෝරාගත් නවකතා ඇසුරෙනි)<br>**තේජා නානායක්කාර** | 48 |
| 7 | අද්‍යතන සිංහල නවකතාවේ නිරූපිත පශ්චාත් යථාර්ථවාදී භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: 2010-2018 තෝරා ගත් නවකතා ඇසුරින්<br>**යූ. ආර්. ටී. ගීතාංජලී** | 58 |
| 8 | නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් හෙළි වන සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය පිළිබඳ සංස්කෘතික ස්ත්‍රීවාදී විශ්ලේෂණයක්: අනුරාධා නිල්මිණි, සුහර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳියන්ගේ තෝරාගත් කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙනි<br>**එච්. එම්. බුද්ධික හේරත්** | 71 |

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 1-9
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# තාරකා විද්‍යාව, ජ්‍යොතිෂය සහ මිනිසා කෙරෙහි එහි බලපෑම් පිළිබඳ ගවේෂණයක්

(An Epistemological Survey Concerning Astronomy, Astrology and the Man)

එස්. ඩී. වික්‍රමසිංහ

භූ විඥාපන පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
sunethra@geo.sab.ac.lk

**සාරසංක්ෂේපය**

ග්‍රහතරුවලින් පිරි අහස සොබාදහමේ ආශ්චර්යමත් නිමැවුමකි. සාමාන්‍ය මිනිසාට එය රාත්‍රියට එක ම තලයක සීමාවක් තුළ ඒකාකර ව නගින බසින තරු රටා සිත්තමකි. හිරු දහවලට සඟවන දේ අඳුරත් සමග මතු ව ඒම විමසීමට කරුණකි. මනස දියුණු පුරාණ මිනිසා සොබාදහමේ වෙනස්කම් සහ ග්‍රහතරු එයට කරන බලපෑම ගැඹුරින් හැදෑරීම තාරකා ශාස්ත්‍රයට පදනම විය. ඔවුන් දුටු තරු රටා පෘථිවි ජීවීන් ඇසුරෙන් නිරූපණයත් නාමකරණයත් සේ ම ඉන් ඇති වන ඍතු වෙනස්වීම්, කාලගුණික විපර්යාස ආදි පාරිසරික වෙනස්කම් කෘෂිකාර්මික ජන ජීවිතයට යහපත් අයුරින් යොදා ගැනීමත් එදින සිදු විය. උසස් මානසික චින්තනය සහ අත්දැකීම් තුළින් කාලාන්තරයක් තිස්සේ පැමිණි තාරකා ශාස්ත්‍රය නක්ෂත්‍ර දුරේක්ෂය සොයා ගැනීමත් සමග වෙනස් මගකට පිවිසුණි. ප්‍රතිඵලය වූයේ තාරකා ශාස්ත්‍රය තාරකා විද්‍යාව සහ ජ්‍යොතිෂය සේ අංශ දෙකකට වෙන් කිරීමත් එහි නියැලුනවුන් බෙදී යාමත් ය. අභ්‍යවකාශ තරණය සහ නව සොයා ගැනීම් ග්‍රහතරු ගැන භෞතික කරුණු රාශියක් හෙළිදරව් කළ ද අනාදිමත් කාලයක් පැවති ජ්‍යොතිෂ විද්‍යාවට ඉන් ප්‍රබල බලපෑමක් නොවී ය. ඒ පුරාණ තාරකා ශාස්ත්‍රඥයින් කී බොහෝ කරුණු විද්‍යාත්මක ව පැහැදිලි වීමත් තාරකා විද්‍යාවේ ප්‍රවිෂ්ඨය ජ්‍යොතිෂ ශාස්ත්‍රය දත් විද්‍යාඥයින් මගින් සිදු වීමත් හේතුවෙනි. සාමාන්‍ය මිනිසා ග්‍රහතරු ගැන දන්නේ ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයින්ගේ ඉගැන්වීම්වලින් පමණි. එසේ ම, බෞද්ධ, ක්‍රිස්තියානි මෙන් ම ඉස්ලාම් ධර්මයේ ද මූලික ස්ථානයක් ග්‍රහතරුවලට හිමි වේ. මෙම පර්යේෂණයේ දී පෘථිවියට ඇති හිරු සඳු බලපෑම පමණක් නිගමනයන්ට එළඹීමට තෝරා ගත් අතර තාරකා විද්‍යාව සහ ජ්‍යොතිෂය තාරකා ශාස්ත්‍රයේ දෙආකාරයක් බව පැහැදිලි කර යි.

කේන්ද්‍රීය වචන : ඛගෝලය, රාශි චක්‍රය, තාරකා මණ්ඩල, භූගෝලීය ඛණ්ඩාංක, ග්‍රහණ

Stars and planets consisted sky is a marvelous make of the nature. It is a drawing with uniformly moved stars on a limited space at night. What is observable is the things that are hidden by the Sun at the day time become disclosed in the dark. Changes of the nature that occur along planetary behavior were studied by the spiritually and mentally advanced ancient persons as shastra of stars. Star patterns were represented as human related objects by naming them according to the changes in seasons, climate and environment. At the same time, environmental changes like seasonal and climatic differences were appropriated properly for agriculture. This traditional knowledge developed along human experiences and mental thoughts took a complete different path after inventing the astronomical telescope. Shastra of stars and the engagement of people were separated into two subjects as Astronomy and Astrology. Physical information about the planets that came through the astronautics and new findings couldn.t affect astrology because the knowledge that was historically propagated so far by astrologers was further clarified through science. Ordinary people understand the planetary objects only through what astrologery explains. Religions such as Buddhism, Christian and Islam have given a special place planetary movements and their circumstances. Therefore, research explains that Astronomy and Astrology are two epistemological aspects of studying the planets and their circumstances. This study only focuses on the luminaries of Sun and Moon for its conclusions. .

Key words: Celestial sphere, Zodiac, Constellations, Geographical coordinates, Eclipses

## හැඳින්වීම

තාරකා විද්‍යාව මෙන් ම ජ්‍යොතිෂ විද්‍යාව ද මිනිසා විසින් තමාගේ යහපත සඳහා යොදා ගැනීමට තැත් කරන හෝ යොදා ගන්නා විෂයයන් දෙකකි. පෘථිවියේ ජීවත් වන අපට දෘශ්‍ය වන අහසේ ඇති ග්‍රහ වස්තූන් පිළිබඳ ව මෙම අංශයන් දෙකේ දී ම ගැඹුරින් සලකා බලනු ලබ යි. ඉතා ඈත ඉතිහාසයක් ඇති ජ්‍යොතිෂ විද්‍යාවෙන් හඳුනා ගත් අහස සහ එහි දිස් වන ග්‍රහතරු වඩාත් සියුම් ව නිරීක්ෂණය කොට ඒ මත නිගමනයන්ට එළඹීමට වර්තමානයේ තාරකා විද්‍යාව යම් තරමකට සමත් ව ඇත. යම් තරමකට යනු තවමත් ඒ පිළිබඳ ව පූර්ණ වශයෙන් අධ්‍යයනය කිරීමට නොහැකි වී ඇති අතර ඒ සඳහා විශාල මුදලක් මෙන් ම කාලයක් ද කැප කරමින් සිටී. එහි දී අහස සහ ග්‍රහතරු ගවේෂණය සඳහා නවීන සූක්ෂම උපකරණ යොදා ගන්නා නමුත් යම් තොරතුරක් ළඟා වීමට වසර ගණනාවක් වුව ද බලා සිටීමට සිදු විය හැක. ජ්‍යොතිෂ විද්‍යාව එදා අහසෙහි නිරන්තරයෙන් සිදු වන ක්‍රියාවලි නිසා පෘථිවියට වන බලපෑම පුරාණයේ විසූ ඍෂිවරුන් විසින් අවබෝධ කර ගෙන උරුම කර දුන් ශාස්ත්‍රයක් බව දැක්විය හැකි ය. එසේ ම, එම සොයා ගත් කරුණු එදා මෙන් ම අදත් ඒ අයුරින් ම මිනිසාට බලපෑම් කරන ආකාරයත් ජ්‍යොතිෂ අධ්‍යයනයන් ඔස්සේ පැහැදිලි

වනු ඇත. නමුත්, නිමක් නොමැති අභ්‍යවකාශයේ සැරිසරන යානා මගින් ලබා දෙන නවතම තොරතුරු හේතුවෙන් තාරකා විද්‍යාව දිනෙන් දින අලුත් වෙමින් වෙනස් වෙමින් පවතින බව සඳහන් කිරීමට පිළිවන. කෙසේ වෙතත්, ආදි කාලයේ දී තාරකා ශාස්ත්‍රය සේ එක් ව පැවති මෙම විෂයයන් දෙක අද ඉතා දුරස් ව පිහිටි අන්ත දෙකක ගමන් ගන්නා ආකාරයක් පෙන්නුම් කරයි. කෙළවරක් නැති දෙයක කෙළවරක් සොයන මිනිසා තම එදිනෙදා කටයුතු සාර්ථක කර ගැනීම පිණිස ජ්‍යොතිෂ විද්‍යාවත් දිගු කාලීන අනාගත විසඳුම් බලාපොරොත්තු වන අවස්ථාවන් සඳහා තාරකා විද්‍යාවත් යොදා ගැනීම සිදු කරනු ලබ යි. තාරකා විද්‍යාවෙන් සමස්තයක් වශයෙන් පෘථිවියට ඇති වන ග්‍රහතරු බලපෑම මිස මිනිසාගේ ජීවන ගමනේ ඉදිරියේ දී ඇති වන තත්ත්වයන් පිළිබඳව ප්‍රකාශ කිරීමට හැකියාවක් නොමැති නමුත් ජ්‍යොතිෂ විද්‍යාවේ දී එම කරුණු ගැන පැහැදිලි විග්‍රහයක් ලබා දීමට පිළිවන. මෙතෙක් පැවති සහ පවතින ශාස්ත්‍රයන් අතර එසේ මිනිසාගේ පෞද්ගලික කරුණු සම්බන්ධයෙන් අතීත, වර්තමාන සහ අනාගත යන කාල ත්‍රිත්වයට ග්‍රහ බලපෑම මගින් වූ හෝ විය හැකි ශුභ අශුභ තත්ත්වයන් පැවසිය හැකි එක ම ශාස්ත්‍රය ජ්‍යොතිෂය පමණි. එබැවින් මිනිසා ජ්‍යොතිෂය භාවිතයට නැඹුරුවක් පවතී.

තාරකා විද්‍යාව විෂයෙහි දී අහස සහ එහි තැන් තැන්වල විසිරී පවතින තාරකා පංති මෙන් ම ඒ අතර වන අපේ සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ ව අඛණ්ඩ පරීක්ෂණ සිදු කරනු ලබ යි. මෙහි දී අප ජීවත්වන සෞරග්‍රහ මණ්ඩලය සූර්යයාගේ සිට අනිකුත් ග්‍රහයින් පිහිටි ආකාරයට අර්ථ දක්වනු ලබ යි. මෙය සූර්යයා මධ්‍ය කොට ගත් ග්‍රහ මඩුල්ලක් සේ අර්ථ දක්වන අතර ග්‍රහ ලෝක සේ ග්‍රහයින් අට දෙනෙකු මේ වන විට හඳුනා ගෙන ඇත. සූර්යයාගේ අභ්‍යන්තර සංයුතිය වායුමය ස්වරූපයක් ගන්නා අතර එහි හයිඩ්‍රජන් සහ හීලියම් වායූන් ඇති බවත් ඉතා ඉහළ උෂ්ණත්වයකින් යුක්ත බවත් දැක් වේ. සූර්යයාගේ සිට බලන කළ බුධ සිට අඟහරු දක්වා ඇති අභ්‍යන්තර ග්‍රහයින් සේ නම් ගත් ග්‍රහයින් පඨවි නැති නම් තද හෝ ඝන ස්වරූපයක් ගනී. ඒවායේ ස්වභාවය පෘථිවිය මෙන් වන අතර සංයුතිය සෑදී ඇත්තේ ප්‍රධාන වශයෙන් යකඩ, නිකල් සහ සිලිකේට්වලිනි. අඟහරු ග්‍රහයාගේ මීට අමතර ව ගෙන්දගම් ඇති බවත් පැවසේ. බාහිර ග්‍රහයින් යයි හඳුන්වන ගුරු සිට නැප්චූන් දක්වා පිහිටි ග්‍රහයින් සිව් දෙනාගෙන් ගුරු සහ සෙනසුරු හයිඩ්‍රජන් සහ හීලියම් වායූන්ගෙන් සමන්විත බවත් යුරේනස් හා නැප්චූන් එම වායූන්ට අමතර ව සිලිකේට් හා අයිස්වලින් යුක්ත බවත් සොයා ගෙන ඇත (මූලාශ්‍රය: www.britanica.com) මීට අමතර වශයෙන් පෘථිවිය ආසන්නයෙන් ඒ වටා භ්‍රමණය වන පොළොවේ නොයෙකුත් ස්වභාවික ක්‍රියාකාරකම්වලට සෘජුව ම බලපාන බවට නිගමනය කර ඇති සඳු හෙවත් චන්ද්‍රයා පෘථිවියේ උපග්‍රහයකු සේ තාරකා විද්‍යාවේ දී හඳුන්වනු ලබයි. මෙම ග්‍රහයින් සියල්ල අතර මිනිසාගේ පැවැත්ම රඳා පවතින්නේ ප්‍රධාන වශයෙන් ම තාරකාවක් වන සූර්යයා සහ පෘථිවියේ උපග්‍රහයකු වන චන්ද්‍රයා මත ය. ආලෝකය සහ තාපය ලෙසින් පෘථිවිය වෙත ලැබෙන සූර්ය ශක්තිය සෑම ජීව ක්‍රියාවකට ම අත්‍යවශ්‍ය සාධකයක් වන අතර සඳු උදම් රළ ඇතිවීම වැනි ස්වභාවික ක්‍රියාදාමයන් කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කිරීමට සමත් ය. තාරකා විද්‍යාවේ දී මෙතෙක් මූලික වශයෙන් විමර්ශනයට ලක් ව ඇත්තේ ග්‍රහ වස්තූන්ගේ භෞතිකමය තත්වයන් එනම් පිහිටීම, විශාලත්වය, අභ්‍යන්තර සංයුතිය, ජීවයේ පැවැත්මට අවශ්‍ය පරිසර සාධක පවතී ද ආදී කරුණු සම්බන්ධයෙනි. මීට අමතර ව ගවේෂණය කර ඇති කරුණු අතර පවතින සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහයින්ගෙන් නිකුත් වන නොයෙකුත් කිරණ ස්වරූපයන්ගෙන් පෘථිවි සත්වයන්ට ඇති වන අහිතකර බලපෑම් පිළිබඳව ද තොරතුරු සන්නිවේදනය වේ. එදිනෙදා අත්දැකීමක් වන සූර්යයාගෙන් ලැබෙන දෘශ්‍ය වර්ණාවලිය සැලකූ විට එහි මිනිස් ඇසට නොපෙනෙන එහෙත් වෙනත් සංවේදක උපකරණයන් මගින් සටහන් කර ගනු ලබන අධෝරක්ත සහ පාරජම්බුල කිරණ ඇතුළත් බව සඳහන් කළ හැකි ය. එසේ ම මෙම සූර්යයා ඇතුළු අනිකුත් ග්‍රහයින්ගේ ඉලිප්සාකාර ගමනේදී මුහුණ දීමට සිදු වන නොයෙකුත් අවස්ථාවන් සහ සංසිද්ධීන් ද එමගින් පෘථිවිය මත සිටින මිනිසාට අත් විඳීමට හැකි ප්‍රතිඵල ගැන ද මෙමගින් විවරණය කරනු ලබ යි. අහසෙහි දැකිය හැකි නිශ්චිත තරු පංතීන් එක්කොට හඳුන්වන රාශිචක්‍රය නම් වූ දෘශ්‍ය සූර්ය පථයේ දෙපසට එක් පසකට අංශක 9ක් සේ බෙදා දක්වන අංශක 18ක් තුළට වැටෙන තීරුවට තාරකා මණ්ඩල 13ක් තාරකා විද්‍යාවේ දී ඇතුළත් කරන අතර චන්ද්‍රයා සහ අනිකුත් සියලු ම සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහයින් මෙම කොටසට ඇතුළත් ය. මෙහි දී ප්‍රධාන තාරකා මණ්ඩල 12ක් සේ ගැනෙන තාරකා මණ්ඩල ජ්‍යොතිෂය අනුව ලබා දී ඇති නාමයන් ගෙන් ම එනම් මේෂ රාශියේ සිට මීනය දක්වා නම් කරනු ලැබ ඇත.

ජ්‍යොතිෂයේ දී සෞරග්‍රහ මණ්ඩලය අර්ථ දක්වනු ලබන්නේ පෘථිවිය කේන්ද්‍ර කොට ගෙන වන අතර රාශි චක්‍රය තුළ ග්‍රහ ගමන එනම් ග්‍රහයින්ගේ දෘශ්‍ය චලිතය සැලකිල්ලට ගෙන පෘථිවියේ සිට අනිකුත් ග්‍රහයින් ඛගෝලය තුළ පිහිටන ආකාරය අනුව ජ්‍යොතිෂමය කරුණු හැදෑරීමත් ඒ අනුව නිගමන ඉදිරිපත් කිරීමත් කරනු ලබ යි. මෙහි දී විශේෂ කරුණු වශයෙන් චන්ද්‍රයා (සඳු) ද ග්‍රහයකු සේ සැලකීමත් චන්ද්‍රයාගේ පථයත් සූර්යයාගේ දෘශ්‍ය පථයත් ඡේදනය වන ලක්ෂ්‍යයන් දෙක රාහු සහ කේතු ලෙස හඳුනා ගැනීමත් දැක්විය හැකි ය. මෙහි දී අන් සෑම ග්‍රහයකුට ම වඩා සඳු ගැන වැඩි අවධානයක් දක්වනු ලබන අතර බොහෝ කරුණු සඳුගේ පිහිටීම මත විග්‍රහ කරනු ලබ යි. උපතක් හෝ සිද්ධියක් වූ වේලාව අනුව සකස් කරනු ලබන ඛගෝලය මත ග්‍රහ පිහිටීම දක්වන අහස් සිතියම (sky map) කේන්ද්‍රය, හඳහන හෝ වේලාපත්කඩය සේ සාමාන්‍ය ව්‍යවහාරයේ පවතී. සිතියමක් යනු යම් වස්තුවක් හෝ විස්තරයක් හෝ සංසිද්ධියක් සම්බන්ධයෙන් යම් අවස්ථාවක් සඳහා සකස් කරනු ලබන නිවැරදි සැලැස්මක් වන අතර එය පෘථිවිය හෝ වෙනත් ඕනෑම ස්ථානයක් සඳහා සකස් කරනු ලබන සටහනකි. තවත් විශේෂිත කරුණක් නම් සිතියමක් නිතරම විශාල ප්‍රදේශයක් ආවරණය කිරීමත් සංකේතාත්මක ඉදිරිපත් කිරීමක් වීමත් ය. ඒ අනුව යම් ස්ථානයක් කේන්ද්‍රකොට අඳිනු ලබන අහස් සිතියම


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

"කේන්ද්‍රය" නැතිනම් යම් මොහොතක සඳේ පිහිටීම සටහන් කරමින් අනිකුත් ග්‍රහයන් සමග නිර්මාණය කරන "හඳහන" හෝ එසේත් නැතිනම් වේලාවට අනුව සකස් කරනු ලබන කුඩා පත්‍රිකාව "වේලාපත්කඩය" යන නම්වලින් හඳුන්වන එම සිතියම මත කිසියම් මොහොතක දී පිළියෙල වන අහස් සිතියම ඒ අවස්ථාවේ දී පවතින ග්‍රහ පිහිටීම නිවැරදි ව දක්වන්නකි. මෙහි දී ග්‍රහයින් සහ රාශින් පෙන්වීම සඳහා ශ්‍රී ලංකාවේ සංකේත වශයෙන් අක්ෂර භාවිතයක් පැවතුණ ද විශේෂයෙන් ම බටහිර ඇතුළු බොහෝ රටවල යොදා ගනු ලබන්නේ ඒ වෙනුවෙන් ම පදනම් කර ගත් ජාත්‍යන්තර සංකේත මාලාවකි. අදාළ ස්ථානයේ භූගෝලීය ඛණ්ඩාංක අනුව සකස් කෙරෙන කේන්ද්‍ර සටහනක් සඳහා නිතර ම දෘශ්‍ය ග්‍රහ ගමන ඇතුළත් ලිතක් භාවිතයට ගනු ලබ යි. පෙරඅපර දෙදිග ජ්‍යොතිෂය තුළ සුළු වෙනස්කම් දැකිය හැකි වුවත් උපතක් හෝ සිද්ධියක් සඳහා සකස් කළ කේන්ද්‍ර සටහනක් සහ ග්‍රහ බලපෑම් අධ්‍යයනය සම ප්‍රතිඵල ලබා දේ.

තාරකා විද්‍යාව සහ ජ්‍යොතිෂයේ දී එක ම දත්ත මගින් දෙආකාරයක නිගමන ලබා දෙනවා සේ ම තාරකා විද්‍යාව ග්‍රහතරු පිළිබඳ භෞතික තොරතුරු ලබා දෙන්නක් ලෙසත් ජ්‍යොතිෂය පෘථිවිය මත ඇතිවන සිදුවීම් කෙරෙහි ග්‍රහ තරුවල ඇති බලපෑම විග්‍රහ කරන්නක් සේත් අර්ථ දැක්වීමට පිළිවන. විෂයයන් දෙක අතර ඇති සහසම්බන්ධතාව එතරම් ම දැඩි ය. මෙම ශාස්ත්‍ර දෙක ම ගණිත කර්මයන් මත ගොඩ නැගුණු ඒවා වන අතර ගණනය කිරීම් සාමාන්‍යයෙන් සිදු කෙරෙනුයේ ඛගෝලය මත ග්‍රහ පිහිටීම දැක්වෙන ආකාරයට වේ.

## සාහිත්‍ය විමර්ශනය

තාරකා විද්‍යාව සහ ජ්‍යොතිෂය වෙන් වශයෙන් මාතෘකා කොට ගත් ලේඛන ගත තොරතුරු මෙන් ම පර්යේෂණාත්මක නිගමනයන් විශාල වශයෙන් අධ්‍යයනය කළ හැකි වුව ද මෙම විෂයයන් දෙක එක්ව කරන ලද පර්යේෂණයන් විරල ය. නැති තරම් ය. ග්‍රහ තරු සම්බන්ධයෙන් ලියැවී ඇති තාරකා විද්‍යා ග්‍රන්ථ මගින් බොහෝ සේ සාකච්ඡාවට බඳුන් කොට ඇත්තේ ඒ පිළිබඳ ව කරන ලද ගණිතමය ප්‍රවේශයන් සහ ඒවායේ භෞතිකමය ගුණාංග හෙයින් සෘජුව ම එම කෘතීන් මෙම පර්යේෂණයට දායක කර ගැනීමට නොහැකි විය. නමුත් ඊට වඩා වැඩියමක්, විශේෂයෙන් පෘථිවිය ඇතුළත් වන සෞරග්‍රහ මණ්ඩලයේ තොරතුරු නිරන්තරයෙන් ම යාවත්කාලීන ව සපයන අන්තර්ජාලය මගින් ලබා ගැනීමට හැකි වූ නිසා තාරකා විද්‍යාව සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට අන්තර්ජාලය යොදා ගැනුණි.

ජ්‍යොතිෂය පිළිබඳ ග්‍රන්ථ රාශියක් ක්ෂේත්‍රයේ හඳුනා ගැනීමට හැකි වුව ද ඒ අතරින් සාකච්ඡාවට බඳුන් වන ග්‍රහයින් පිළිබඳව සෘජුව ම සඳහන් වූ ග්‍රන්ථ සතරක් පමණක් භාවිතයට ගත් බව කිව යුතු ය. ඒ අතර හෙන්ද්‍රික් ද සිල්වා හෙට්ටිගොඩ සූරීන් විසින් රචිත ජ්‍යොතිෂ ග්‍රන්ථ දෙකක් වන ජීවිතය හා ග්‍රහයෝ කෘතියත් පලාපල කියන හැටි කෘතියත් ප්‍රධාන වේ. සාමාන්‍ය ජන ජීවිතයේ දී ශුභ අශුභ වශයෙන් වෙන් කර හඳුනා ගත හැකි හිරු සඳු ඇතුළු අනිකුත් ග්‍රහයින්ගේ ජ්‍යොතිෂමය වශයෙන් පෙන්නුම් කරන ලක්ෂණ සහ ඒවායේ විවිධ සංකලන අවස්ථා එමගින් ප්‍රකාශිත ය. හියුබට් ප්‍රනාන්දු සූරීන් විසින් රචිත මීමණ ආර්. රණවීර විසින් සම්පාදිත ජීවිතයක උදාව නොහොත් විදුනැතින් ජීවිත නිරීක්ෂණයට මග නම් ග්‍රන්ථය ද පර්යේෂණයට පාදක කර ගත්තේ විෂයයට ඇති විද්‍යානුකූල බව පෙන්වීමට එම කෘතිය මගින් ගෙන ඇති උත්සාහය හේතුවෙනි. මෙහි සඳහන් බොහෝ කරුණු සියුම් ව පරීක්ෂා කර බැලීමේ දී එම කෘතිය ද මෙම පර්යේෂණය සඳහා භාවිතයට සුදුසු සේ හැඟුණි. මහාචාර්ය බැන්ගලෝර් වෙන්කත රාමන්ගේ මිනිසා කෙරෙහි ග්‍රහ බලපෑම් (Planetary influences on human affairs) පරිවර්තන කෘතිය ද මෙම පර්යේෂණයේ දී මහෝපකාරී වූ බව පෙන්වා දිය හැකි ය. එමගින් දෙස් විදෙස්හි ජ්‍යොතිෂයේ භාවිතයන් මෙන් ම පර්යේෂණයන් පිළිබඳ ව සාකච්ඡා කරනු ලබයි.

මීට අමතර වශයෙන් බෝසත් සහ බුද්ධ චරිතය තුළ ජ්‍යොතිෂ කරුණු මතු කරනු ලබන අවස්ථාවන් පිළිබඳ ව සාකච්ඡා කිරීම පිණිස සද්ධර්මරත්නාවලිය, අමාවතුර සහ ධර්ම සංග්‍රහය වැනි කෘතීන් ද භාවිතයට ගැණුනි. බුදු රජාණන්වහන්සේගේ චරිතය තුළ ඇති වූ යම් යම් විශේෂිත වූ අවස්ථාවන්හි දී පොහෝ දිනයන් තෝරා ගැනීමක් සිදුවීම සහ ඊට ඇති ජ්‍යොතිෂමය සම්බන්ධතාවය ගැන පර්යේෂණාත්මකව බැලීමට මෙයින් ඉඩ ප්‍රස්තාව ලැබෙනු ඇතැයි හැඟුණි.

## පර්යේෂණ ගැටලුව

ග්‍රහ වස්තූන් පිළිබඳ භෞතික, රසායනික අධ්‍යයනයන් කරනු ලබන තාරකා විද්‍යාව හා ඒවා මිනිසා කෙරෙහි ඇති කළ හැකි බලපෑම දක්වන ඉපැරණි ශාස්ත්‍රයක් වූ ජ්‍යොතිෂ විද්‍යාව එකිනෙක නොගැළපේ ද?

## පර්යේෂණ අරමුණ

තාරකා විද්‍යාවෙන් මිනිසා විපුල පල ලබන්නා සේ ම ඉපැරණි ජ්‍යොතිෂ විද්‍යාවෙන් ද සිය ලෞකික මෙන් ම ලෝකෝත්තර සුභ සිද්ධිය සලසා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර ගැනීම පිණිස සමාජීය අවධානය යොමු කිරීම ප්‍රධාන අරමුණ වේ.

ජ්‍යොතිෂය මිථ්‍යාවක් සේ බැහැර කිරීමට වඩා එහි වැදගත්කම අධ්‍යයනයෙන් අවබෝධ කර ගැනීමට සැලැස්වීම සහ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වූ බුදුරජාණන්වහන්සේ ගේ ජීවිතයේ නොයෙක් අවස්ථාවන් තුළින් ජ්‍යොතිෂය භාවිතය හෝ ග්‍රහ බලපෑම් පිළිබඳ ව නිගමනයන්ට එළඹිය හැකි බවට සාධක ඉදිරිපත් කිරීම ද්විතීයික අරමුණු වේ.

## පර්යේෂණයේ වැදගත්කම

පෙරදිග වැසියා කවදත් කෙළෙහි ගුණ සැලකීම ගරු කළ අයෙකි. ඒ අනුව තමාගේ පැවැත්මට අවැසි ආලෝකය, ආහාරපාන මෙන් ම ආගම දහම, සංස්කෘතික අංග ආදී දේ සඳහා මූලික වන ජීවී අජීවී සම්පත් වෙනුවෙන් ගරු කිරීමට මෙන් ම වැඳුම් පිදුම් කිරීමට ද පුරුදු පුහුණු වී සිටියහ.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උදාහරණයක් සේ හෙළ සිරිතට අනුව අලුත් අවුරුද්දේ දී තමන්ට වසරක් පුරාවට ජලය ලබා දුන් ළිඳ අලෙවි කිරීම දැක්විය හැකි ය. සුබ මොහොතකින් සිදු කරන එම කටයුත්ත සඳහා භාවිතයට ගන්නේ ජලය පිරිසිදු කරනු ලබන ද්‍රව්‍යයන් වන අඟුරු, ලුණු, සුදු මල් ආදී දෑ වන අතර එහි විද්‍යාත්මක බව එයින් ම පැහැදිලි කරයි. කළගුණ සැළකීම සිංහල බෞද්ධයා හට බුදු දහම තුළින් ම පෙන්වා දී ඇත. බුදු රජාණන්වහන්සේ ලෝකයාට දුන් ප්‍රථම ආදර්ශය මගින් එය පැහැදිලිව දක්ව යි. බුදු වී දෙවන සතියේ දී "බුදු රදහු බෝ මුලට මඳක් ඊසාන භාගයෙහි සිට බුදු වීමට උපකාර වූ බෝ රුකට කෙළෙහි ගුණ සැළකීමක් වශයෙන් ඇසිපිය නොහෙළා බෝ රුක දෙස සතියක් මුළුල්ලෙහි බලමින් ඇසින් පූජා කෙරෙමින් වුසු සේක" (නාරද මාහිමි, 1966:16) යන්නෙන් පැහැදිලි වේ. කෙසේ වෙතත්, කළගුණ සැලකීම සඳහා මෙවැනි දේ කිරීම මිථ්‍යාවක් හෝ විහිළුවක් සේ දැකීම පෙරදිග සමාජය තුළින් සාරධර්ම ගිලිහී යාමට කරනු ලබන උදව්වක් සේ හැඳින්වීමට පිළිවන. මෙයට ශ්‍රී ලාංකිකයින් වශයෙන් අප මුහුණ දී ඇති එකම අවස්ථාව මෙය නොවේ. අප සතුව ඇති දේශීය වෙදකම ක්‍රමානුකූල ව ගිලිහෙමින් තිබෙන අතර බටහිර වෛද්‍ය විද්‍යාව එම හිඩැස ආක්‍රමණය කරමින් පැවතීම මේ සඳහා උදාහරණයක් සපය යි. වර්තමානයේ පවා අස්ථි බිඳීමක් යථා තත්වයට ගෙන ඒමට නම් කැඩුම්බිඳුම් ප්‍රතිකාර කළ යුතුම වේ. එබැවින් නිවැරදි දේශීය වෙදකම තුළින් මිනිසාගේ යහ පැවැත්මට යම් පිටිවහලක් මිස අවැඩක් හෝ අසාධාරණයක් සිදු නොවනු ඇත. ජ්‍යොතිෂය ද එසේ ම ය. ශුභ මුහුර්තයකින් කටයුතු කිරීමෙන් හෝ සුබ පෙර නිමිති බැලීමෙන් යහපතක් මිස අයහපතක් අත් නොවනු ඇත.

එසේ ම, විශ්වයේ පිහිටි තාරකාවකින් හෝ ග්‍රහ ලොවකින් එන යහපත් අයහපත් බලපෑම් සෑම මොහොතක ම උසස් මනසක් ඇති මිනිසා වෙත ද අන් සතුන් කෙරෙහි බලපාන අයුරින් ම ක්‍රියාත්මක වනු ඇත. අනිකුත් සත්වයින් සතු සහජ ගුණයක් වන "ඉව" ඒ තරමින්ම දියුණු මනසක් ඇති මිනිසාට නොමැතිවීම හේතුවෙන් මෙසේ ළඟාවන අයහපත් දෙයින් බේරීමට නම් විකල්පයන් සෙවිය යුතුම වේ. 2004 වසරේ දී මහා විපතක් කළ සුනාමි ව්‍යසනයෙන් බේරී පළා යාමට සතුන්ට දැනීමක් තිබූ මුත් මිනිසාට සිදු වූයේ විපතට පත් වීමට යි. ජීවිතයේ යම් යම් අවස්ථාවන්හි දී මුහුණ දීමට වන අසාමාන්‍ය තත්වයන් ඇතිවීම කලින් හඳුනා ගැනීමත් ඒ අනුව අදාළ අවස්ථාවේ දී අවශ්‍ය පරිදි පිළියම් යෙදීමත් කළ හැකි වේ නම් අනර්ඝ ය. විශ්වයෙන් පැමිණෙන ශුභ අශුභ තත්වයන් සහ ඒවායේ පල විපාකත් ඊට අවශ්‍ය ප්‍රතිකර්මත් සඳහා මෙතෙක් ලෝකවාසීන් දැනුවත් වී ඇති සහ පරිහරණය කරනු ලබන එක ම ශාස්ත්‍රය ජ්‍යොතිෂය වන අතර එහි ඇති කරුණු කාරණා මැනවින් හදාරා පර්යේෂණ ඔස්සේ යමින් තහවුරු කර ගනිමින් විපුල පල ලබා ගැනීම මිනිසා සතු ය. එබැවින් තාරකා විද්‍යාත්මක සහ එදා ඍෂිවරුන් පැවසූ ග්‍රහ තරු පිළිබඳ තොරතුරු අතර වෙන් කිරීමක් ඇති කරනු වෙනුවට විෂයයන් දෙක ම අනුසාරයෙන් ජන ජීවිතයේ පැවැත්මට උපකාරීවන සහ පෞද්ගලික ව තමාගේ ලෞකික සහ ලෝකෝත්තර දියුණුව පිණිස යොදා ගත හැකි දේ තෝරා බේරා ගනිමින් කටයුතු කිරීම වඩාත් වැඩදායක වනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයේ ක්‍රමවේදය අවස්ථා හතරකින් සමන්විත වන අතර පළමු අවස්ථාව වනුයේ දත්ත රැස් කිරීම යි. මෙහි දී ලේඛනගත දත්ත ග්‍රන්ථ සහ අන්තර්ජාලය පාදක කොට රැස් කෙරුණි. තාරකා විද්‍යාවට අයත් තොරතුරු රැස් කිරීමට අන්තර්ජාලය යොදා ගත් අතර ජ්‍යොතිෂ කරුණු මෙම දෙආකාරයෙන් ම රැස් කර ගැනීම සිදු කෙරුණි. මීට අමතර වශයෙන් සාමාන්‍ය හෙළ ජන ජීවිතයේ දී ස්වභාව ධර්මයාට ගරු කිරීම මෙන් ම කළගුණ සැලකීම කරනු ලබන අවස්ථාවන් මෙන් ම බෞද්ධාගම තුළින් ප්‍රකට වන මීට අදාළ කරුණු ද ශාස්ත්‍රිය ග්‍රන්ථ මගින් උපුටා ගැණුනි. දෙවන පියවර ලෙස එම රැස් කර ගත් දත්ත පර්යේෂණයේ අරමුණට අදාළ පරිදි සකස් කළ අතර තෙවන අවස්ථාව වශයෙන් ඒවා විමර්ශනය කෙරුණි. එහි දී තාරකා විද්‍යානුකූල ව සහ ජ්‍යොතිෂ විද්‍යානුකූල ව තෝරා ගත් කරුණු වෙන් වෙන් වශයෙන් විමර්ශනය කළ අතර එය මිනිසාට කෙසේ බලපාන්නේ ද යන වග ගැඹුරින් අධ්‍යයනය කොට දක්වා ඇත. එසේ ම මෙහි දී තාරකා විද්‍යාවට වඩා ඉපැරණි ශාස්ත්‍රයක් වූ ජ්‍යොතිෂ විද්‍යාවේ ඇතුළත් කරුණු බුද්ධෝත්පත්තියට පෙර සිට භාවිතයේ පැවති බවට සාධකත් බුදු රජාණන්වහන්සේ සිය අභිප්‍රායන් මුදුන් පමුණුවා ගැනීමට තෝරා ගත්තේ කෙසේ ද යන වගත් අවධානයට ගැණුනි. අවසාන වශයෙන් මිනිසාගේ ලෞකික ජීවිතයේ යහපත උදෙසා එම කරුණු බලපාන ආකාරය නිගමනයන් සඳහා පාදක කර ගන්නා ලදී.

## සාකච්ඡාව

ආසියාතිකයන් බොහොමයක් දෙනා සිය ජීවිතයේ යහපත උදෙසා නොයෙක් අවස්ථාවන්හි දී ජ්‍යොතිෂය යොදා ගැනීම වර්තමානයේ විද්‍යාව දියුණු යයි සලකන අවධියක දී වුව ද සිදු කරයි. කිසිවෙකුත් තමන්ට හෝ තම පවුලේ අයට අයහපතක් වෙනවා දැකීමට කැමති නොවේ. සෑමවිට ම ශුභ සිද්ධියම අපේක්ෂා කරයි. ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් ම සිංහල සහ දමිළ ජන කොට්ඨාශ මෙම තත්වය රැක ගැනීමට නිරන්තර උත්සාහය යෙදී සිටිති. ඔවුහු පවුල නැමති ඒකකය තුළ සිදු කරනු ලබන සෑම කටයුත්තකටම ජ්‍යොතිෂ උපදෙස් ලබා ගැනීමට පුරුදුව සිටිති. මෙවැනි පසුබිමක තාරකා විද්‍යාව නොදන්නා සාමාන්‍ය මිනිසා ජ්‍යොතිෂය භාවිතයෙන් සිය අවශ්‍යතාවන් යහපත් අයුරින් මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන බව පෙනේ.

ජ්‍යොතිෂය මිථ්‍යාවක් සේ දක්වමින් විද්‍යාව ආයුධයක් කොට ගෙන යම් ප්‍රකාශ කරන්නන් ද සිටී. කෙසේ වෙතත්, මිනිසා සොබා දහමට ගරු කිරීමටත් එය රැක ගැනීමටත් උත්සුක වන අවධියක් පැමිණ ඇති බව කිව හැකි ය. ඒ බව "විද්‍යාඥයෝ බාහිර ප්‍රකෘතිය (සොබාදහම) සම්බන්ධයෙන් සිය මතයත්, දෘෂ්ටියත් කඩිනමින් වෙනස් කරමින් සිටිති. ඔවුන් කාලය, අවකාශය හා ද්‍රව්‍ය විෂයයෙහි ගෙන හැර දැක්වෙන සුවිශේෂ සංකල්ප ඔස්සේ හින්දු දර්ශනයේ ඥාන


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ක්ෂේත්‍රය විනිවිද දකින්නට පටන් ගෙන ඇත" (පැට්රික්, 2014:10) යන්නෙන් පැහැදිලි ය. ඇතැමෙක් ඉතා දුරින් පිහිටි ග්‍රහ ලෝකයකින් අපට කළ හැකි දෙයක් වේ දැයි ප්‍රශ්න කරති. ග්‍රහ මඩුල්ලේ ප්‍රමුඛයන් වන හිරු සහ සඳු දෙදෙනා පෘථිවියේ පැවැත්මට නිරන්තරයෙන් ම දායක වන බවට සාක්ෂි අනවශ්‍ය ය. හිරු සඳු නොමැති කල ජීවයේ පැවැත්මක් නැත. එමෙන් ම අප සෞරග්‍රහ මණ්ඩලයේ අනිකුත් ග්‍රහයින් ද එපමණක් නොව ඡායා ග්‍රහයින් සේ හඳුන්වන රාහු කේතු ද මිහි මත ඇති ජීවී අජීවී දේ කෙරෙහි බලපෑම් කරනු ලබයි. ග්‍රහලෝක මතට වැටෙන සූර්ය ශක්තිය පරාවර්තනය හෝ සම්ප්‍රේෂණය වීමෙන් වෙනත් ග්‍රහලෝක කරා ඇදී යන අතර එම තරංගයන් හේතුවෙන් ඒ මත යම් බලපෑමක් කළ හැකි වේ. සූර්ය ශක්තිය, සඳ කිරණ සේ ම සෞරග්‍රහ මණ්ඩලයේ අනිකුත් ග්‍රහලෝක වෙතින් ද අවකාශයට කිරණ නිකුතුවක් ඇති බවට සාක්ෂි ඇත. අපට ප්‍රමාණයෙන් සමාන සේ හඳුනා ගෙන ඇති සිකුරු ග්‍රහයා සම්බන්ධයෙන් එය මෙසේ දක්වයි. "Clouds at different levels have different compositions and particle size distributions. These clouds reflect and scatter about 90% of the sunlight that falls on them back into space" (en.wikipedia.org). ඒ අනුව සිකුරු මත ඇති වෙනස් සංයුතීන්ගෙන් සැදි වළාවන් මගින් සූර්යාලෝකයෙන් වැඩි ප්‍රමාණයක් නැවතත් අවකාශයට පරාවර්තනය කිරීම හෝ විසුරුවා හැරීම කරනු ලබයි. අපට බොහෝ ඈතින් මෙන් ම දැනට සෞරග්‍රහ මඩුල්ලේ ඈතින් පිහිටන යුරේනස් ග්‍රහයා පවා අවකාශයට කිරණ නිකුත් කරන බව සොයා ගෙන ඇත. අනිකුත් විශාල ග්‍රහයින්ට වඩා අධික සීතලකින් යුත් මෙම ග්‍රහයා ඉතා කුඩා තාප ප්‍රමාණයක් අභ්‍යවකාශය වෙත නිකුත් කරන බව කියැ වේ. ඒ මෙසේ යි. "It has a much colder core than the other giant planets and radiates very little heat into space" (en.wikipedia.org). මෙසේ ග්‍රහලෝක කෙරෙන් ඍජුව ම හෝ වෙනත් ග්‍රහලෝකවලින් පරාවර්තනයෙන් ද පෘථිවියට ළඟාවන කිරණ නිසා පුද්ගලයකුගේ කායික මෙන් ම මානසික විපර්යාසයන් තාවකාලික ව හෝ ස්ථිර ව ඇති කිරීමට පිළිවන. ඒ බව "සත්වයාගේ චෛතසික බලයට නොහොත් එදිනෙදා ක්‍රියාත්මක වන්නා වූ චිත්ත පරම්පරාවට අනුරූප වූ සූර්යයා ඇතුළු ග්‍රහ මණ්ඩලයේ ආකර්ෂණ බල මහිමය චන්ද්‍රයා විසින් ක්‍රියාත්මක කරන බව ජ්‍යෙතිශ්ශාස්ත්‍රයේ උගන්ව යි. මේ චන්ද්‍රයා සිත පිළිබඳ ආධිපත්‍යයට ඇති ප්‍රධාන හේතුව වෙයි" (රණවීර, 2013:01) යන්නෙන් පැහැදිලි කරයි. ජ්‍යොතිෂ විද්‍යාවේ ඇති පැරණි බව සහ එහි ආරම්භය සම්බන්ධයෙන් විග්‍රහයක් හෙට්ටිගොඩ මහතා විසින් දක්වන්නේ මෙලෙසිනි. "මේ ශාස්ත්‍රය මනුෂ්‍යයා ස්ථිර වාසයට පත් වූ ළඟදී ම පටන් ගත් එකක් බව පෙනේ. පළමුවෙන් ම ඔවුනට වුවමනා කළේ ආහාර දියුණුව පිණිස ගොවිතැන සපල කර ගැනීමට රවි චන්ද්‍ර දෙදෙනාගේ පිහිට සෙවීම ය. පළමුවෙන් ම වර්ෂාව සම්බන්ධයෙන් මේ දෙදෙනාගේ පලය දැනගෙන තිබේ. කල්යාමේ දී ගව මහීෂාදීන් ගාල් කිරීමත් බෝවීම පිණිසත් පිහිට සොයා තිබෙන බව පෙනේ. එවකට සිතා තිබෙන්නේ මිනිසාට ඕනෑ හැටියට ඒ ඒ දේවල් කර ගත හැකි බවයි. මිනිසා ද මේ ග්‍රහ තරුවලට යටත් බව ඔප්පුවීමෙන් පසු මිනිසාගේ යහපත පිණිසත් මේ ශාස්ත්‍රයේ පිහිට සොයන්ට පටන් ගෙන තිබේ" (හෙට්ටිගොඩ, 2015:11). තව දුරටත් ඔහු මෙසේ කියයි. "මේ ශාස්ත්‍රය ලෝකයේ අද තිබෙන සියලු ආගම්වලට වඩා පැරණි වේ. ලෝකයේ සිටි සෑම ආගම් කර්තෘවරයකු ම ජ්‍යොතිශ්ශාස්ත්‍රය ගැන සඳහන් කර තිබේ".

මෙය පැහැදිලි වන අවස්ථා කිහිපයක් ම බුදු රජාණන්වන්සේගේ ජීවිතයේ දී විස්තරවන ආකාරය දැකිය හැකි වේ. සිදුහත් කුමරාගේ පිළිසිඳීම වූ අවස්ථාව ගුරුළුගෝමීන් විසින් රචිත අමාවතුරෙහි සඳහන් කරනුයේ "එ කල්හි අප මහබොසතාණො සරා වලා ගබක් සෙයින් සුදු ඇත්වෙසක් දක්වා, එයට නුදුරු තන්හි එක් රන්ගලෙක් ඇති, එ ගල්හි සැරැ එයින් බැසැ රිදී පව්වට නැඟී උතුරු දිසායෙන් අවුදු රිදීදමක් බඳු අතින් සුදුපියුමක් ගෙනැ, කිලැ, රන් විමනට වැදැ, මෑණියන් හොත් යහන තුන් යලක් පැදකුණු කොටැ දකුණු ඇලයෙන් කුසට වන්නවුන් වැනි වූහු. මෙසෙ ඇසළ පුනු පොහොයැ උත්තරසළ නකතින් මවුකුසැ පිළිසිඳ-ගත්හු" (ඤාණාලෝක ස්ථවිර, 1959:9) යනුවෙනි. යමෙකු රවිට අයත් උත්‍රසල නැකතින් උපන්නේ නම් ගැඹුරු නුවණක් සහ සියුම් කල්පනා ශක්තියකින් යුක්ත වේ. එසේ ම සද්ධර්ම රත්නාවලිය මෙය ම "ඇසළ පුර පසලොස්වක් ලද අඟහරුවැදා උතුරුසළ නැකතින් මධ්‍යම රාත්‍රියෙහි තුසී පුරෙන් චුත ව" (ඤාණවිමල හිමි, 2015:24) යනුවෙන් දක්වයි. උන් වහන්සේගේ මහා අභිනික්මන සිදුවූයේ ද එම නැකැත පැවති දිනෙක බව සද්ධර්ම රත්නාවලියෙහිම දැක්වෙන්නේ "මහ බෝසත්හු ද එකුන් තිස් හවුරුද්දේ දී අත් පත් වූ සක් විති රාජ්‍ය හැර පියා සක් විති රාජ්‍යශ්‍රියට ස්ථාන වූ රජගෙන් නික්ම ඇසළ මස මැදි පොහෝ දවස උතුරුසළ නකතින් නුවරින් නික්ම නුවර බලා පිය මනිනු කැමැති වූ දෑ ය" (ඤාණවිමල හිමි, 2015:1187). පුරාණ පලදාවලිය නම් මුහුර්ත දක්වමින් රචනා කොට ඇති ග්‍රන්ථයෙහි ගමන් බිමන් ආදිය සඳහා හඳුන්වා දෙන ශුභ මුහුර්ත යටතේ මෙම උත්‍රසල නැකත තම ගමනේ අපේක්ෂාවන් ඉටු කරන බව මෙසේ දක්වයි.

> "අස්විද රෙහෙණ රේවති හත පුස නකත
> දෙනට ද මුවසිරස සුවනය මුල නකත
> අනුරද තුනතුරු ද යන මේ සැම නකත
> සිතුලෙද පලදේය ගමනෙහි යෙදුව හොත"
> (පෙරේරා, 2007:54)

කෙසේ වෙතත්, පෙර කරන ලද පින් බලයෙන් සේ ම පෙරුම් බලයෙන් බුදුරදුන්ගේ සියලු ම කටයුතු ශුභ වේලාවක දී ඉටු වී ඇති බව පෙනේ.

අපට දැඩිසේ බලපාන තාරකාවක් සේ ගැනෙන සූර්යයා සහ පෘථිවියේ උප ග්‍රහයකු සේ හඳුනා ගෙන ඇති චන්ද්‍රයා ඈතින් ඇති අනික් ග්‍රහයින්ට වඩා මිනිසාට වැදගත් වේ. එය අතීතයට මෙන් ම වර්තමානයට ද එකසේ බලපායි. තාරකා විද්‍යානුකූල සොයා ගැනීම් අනුව පෘථිවියේ සිට කි. මී. 150,000,000ක් (නක්ෂත්‍ර ඒකක 1කි) ඈතින් පිහිටි සූර්යයාගේ බලපෑම නිසා පෘථිවිය මත ඍතු සහ දේශගුණික වෙනස්කම් ඇති වේ. සූර්යයා මත ඇතිවන විවිධ ක්‍රියාදාමයන්


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හේතුවෙන් ඇතිවන ශක්ති තරංග මෙන් ම අංශුන් පෘථිවිය වෙත පැමිණෙන අවස්ථා ඇත. “The height of the Sun.s activity, known as solar maximum, is a time of solar storms: sunspots, solar flares and coronal mass ejections. These are caused by irregularities in the Sun’s magnetic field and can release huge amounts of energy and particles, some of which reach us here on Earth” (amzuniv.blogspot.com). සූර්යයා විසින් නිකුත් කරනු ලබන අතිවිශාල ශක්ති ප්‍රමාණයෙන් වැඩි පංගුවක් අවකාශය වෙත නිකුත් කරනුයේ දෘශ්‍ය වර්ණාවලිය ද ඇතුළත් ව විද්‍යුත් චුම්බක තරංග ආකාරයෙනි. මෙම විද්‍යුත් චුම්බක වර්ණාවලිය තුළ දෘශ්‍ය කොටස හැරුණු විට ඉන් දෙපස ඇත්තේ මිනිසාගේ පියවි ඇසට නොපෙනෙන එසේ ම අනර්ථකාරී තරංග වන අතර ඒවා අධෝරක්ත, පාරජම්බුල කිරණ මෙන් ම X කිරණ, ගැමා කිරණ ආදියත් සූක්ෂම තරංගත් සේ විද්‍යානුකූල ව හඳුනා ගෙන ඇත. කෙසේ වෙතත්, මෙම හානිකර කිරණයන් අප වෙත ළඟාවීම පෘථිවියේ ඇති ඕසෝන් ස්තරය මගින් පාලනය වුවත් සම්පූර්ණයෙන් ම වැළැක්වීමට නුපුළුවන. සූර්යයාගෙන් නිකුත් කරනු ලබන චුම්බක බලපෑම පෘථිවියේ චුම්බකත්වය හා ගැටීමෙන් ඉහළ වායුගෝලයේ නිරන්තරයෙන් ඇතිවන භෞතික විපර්යාසය ධ්‍රැවාසන්න ප්‍රදේශවල දී පැහැදිලි ව ඌෂාලෝකය (aurora) සේ දිස් වේ. එබැවින් අප වෙත සූර්යයාගෙන් යහපත් කිරණ මෙන් ම අයහපත් කිරණ ද ළඟා වන බව පැහැදිලි කරුණකි.

දෘශ්‍ය සූර්ය පථය (පෘථිවියේ සැබෑ ගමන් මග) හා පෘථිවිය වටා චන්ද්‍රයාගේ පථය එකිනෙක හරහා ඡේදනය වන ලක්ෂ්‍යයන් දෙක චන්ද්‍ර මංසල (lunar nodes) සේ තාරකා විද්‍යාවේ දී දැක් වේ. එම ලක්ෂ්‍යයන් සූර්ය පථයෙන් දෙපස පිහිටීම අනුව උතුරු සහ දකුණු මංසල සේ හැඳින්වෙන අතර මෙම ස්ථානයන් ගණිතමය ලක්ෂ්‍යයන් පමණි. ග්‍රහ වස්තූන් සේ නොසැලකේ. මෙම ස්ථානයන්හි ඇතිවන සාපේක්ෂ අක්ෂභ්‍රමණය පෘථිවියේ උදම් රළ කෙරෙහි සුළු බලපෑමක් ඇති කරන බව මෙසේ පවසයි. “The precession of the lunar nodes has a small effect on Earth’s tides” (en.wikipedia.org).

එසේ ම සූර්යයා, චන්ද්‍රයා හා පෘථිවිය එක් ව ඇතිවන විශේෂිත ග්‍රහණ අවස්ථාවන් දෙකක් වන සූර්ය හා චන්ද්‍ර ග්‍රහණයන් ද තාරකා විද්‍යාවේ දී මෙන් ම ජ්‍යොතිෂ විද්‍යාවේ දී ද සැලකිල්ලට ගනු ලබයි. තාරකා විද්‍යානුකූල ආගණනයන් මගින් පැවති සහ ඉදිරියේ දී සිදු විය හැකි සූර්ය සහ චන්ද්‍ර ග්‍රහණ පිළිබඳ දින වකවානු මෙන් ම බලපානු ලබන සහ දෘශ්‍ය වන ස්ථාන නිවැරදිව ම ප්‍රකාශ කළ හැකි ය. අතීතයේ දී හැදෑරීමෙන් භාවිතයට ගත් ග්‍රහණ පිළිබඳ තත්වයන් ජ්‍යොතිෂයේ දී භාවිතා කළ ද වර්තමානයේ දී තාරකා විද්‍යාඥයින් අතීත සිදුවීම් ගැන ද වැඩි වශයෙන් පරීක්ෂණ පවත්වනු ලබයි. එහි දී එදා ග්‍රහණ හා සම්බන්ධ දින සහ ස්ථානයන් නිශ්චිතව ම ප්‍රකාශ නොවූ බව වත්මන් තාරකා විද්‍යාව අනුසාරයෙන් සොයා ගත්ත ද අදත් එම අතීත තොරතුරු යම් යම් නිගමනයන්ට පාදක කර ගන්නා බව පැහැදිලි කරුණකි. විශේෂයෙන් පෘථිවි භ්‍රමණය පිළිබඳ අතීත තොරතුරු විමසීමේ දී මෙම පැරණි ග්‍රහණ උපයෝගී කර ගන්නා බව “Some ancient eclipse records have been particularly significant to astronomers and historians as they enabled certain historical eras and events to be dated accurately. Astronomers can also examine ancient eclipse records to measure the rate of Earth’s spin about its axis over the past millenniums” (www.bibalex.org) සඳහන් කරයි. අමාවක දිනක දී සිදුවන සූර්ය ග්‍රහණය මෙන් ම පසළොස්වක දිනක දී ඇතිවන චන්ද්‍ර ග්‍රහණය ද පිළිවෙළින් සූර්යයා, චන්ද්‍රයා සහ පෘථිවිය ද සූර්යයා, පෘථිවිය සහ චන්ද්‍රයා ද ඒක රේඛීය වීමෙන් ඇතිවන තත්වයන් වේ. මෙම අවස්ථාවන්හි දී ඍජු ව හෝ පරාවර්තනයෙන් පසු ව පොළොවට වැටෙන සූර්ය රශ්මියේ අයහපත් අන්තරීක්ෂ කිරණ කදම්බයන් ගැබ් වී තිබීමේ හැකියාවක් ඇති නිසා එය මිනිසාට අහිතකර විය හැකි ය. කෙසේ වෙතත්, ආදී නිරීක්ෂණ මත ලබා ගත් නිගමනයන් අනුව ජ්‍යොතිෂයේ දී ග්‍රහණ සිදු වූ දින දෙපසට දින හතක් ශුභ කටයුතු සඳහා යොදා ගනු නොලැබේ. එම කාලයේ දී අයහපත් කිරණ පෘථිවියට ළඟා වන හෙයින් එහි බලපෑමට ලක් විය හැකි බැවිනි. එසේ ම ජ්‍යොතිෂ විද්‍යාව අනුව සූර්යයා (රවි) සලකනු ලබන්නේ ග්‍රහ දෙව් ලොව පියා ලෙසටය. එනම් එහි ප්‍රධානියා වන රවි සතු ගුණාංග කෙටියෙන් දක්වා තිබෙන්නේ මෙලෙසිනි.

> “හිරු වේද ග්‍රන්ථයන්හි විශ්වාත්මන් ලෙස අමතනු ලැබේ. හෙතෙම ඇසට පෙනෙන දෙවියා ය. හිරුගේ උණුසුම සහ ආලෝකයෙන් තොරව ලොව තුළ එක් මොහොතක් පවා පැවතිය නොහැකි ය. වරාහමිහිර හිරු හඳුන්වන්නේ කාලාත්ම (කාලයාගේ ආත්මය) නමිනි. එයට හේතුව කාලය රඳා පවතත්නේ හිරු නිසාම පමණක් හෙයිනි. සත්තකින්ම හිරු ජීව ශක්තියේ උල්පත් ශීර්ෂය යි. පොළොවේත් වෙනත් ග්‍රහලෝකවලත් චක්‍රීය චලිතයේ නිදානය සූර්යයාගේ ශක්තිය යි. සකු බසින් ලියවුණු විද්‍යාවන්හි හිරු හැඳින්වෙන්නේ ත්‍රයීතනු හෙවත් ත්‍රී ආත්ම නමිනි. එයට හේතුව තිපරිවට්ට හෙවත් උත්පත්ති, තිථි, භංග (ඇතිවීම, පැවතීම, නැතිවීම) භෞතික සංසිද්ධිය මෙහෙයවන්නා විය හැකි වීම යි” (පැට්රික්, 2014:48).

පෘථිවිය කෙරෙහි රවිගේ බලපෑම කෙබඳු ද යන්න සූර්ය පථයේ රවි පිහිටි ස්ථානය අනුව වෙනස්වන අතර ඒ මත යම් ස්ථානයකට හෝ තැනැත්තකුට ඇති කරනු ලබන රවිගේ බලදුබලතාවය ද නිශ්චය කරනු ලබයි. චන්ද්‍රයා ගේ භ්‍රමණය සහ පෘථිවිය වටා ඇති වන පරිභ්‍රමණය සඳහා සමාන කාලයක් ගතවන බැවින් චන්ද්‍රයාගේ එක ම පැත්ත පෘථිවියේ සිටින අයකුට සෑමවිට ම දර්ශනය වේ. සූර්යයා හැරුණු කොට එතරම් ම නොවූවත් අපට දිස්වන ආලෝකය විහිදුවන ග්‍රහයා වන්නේ සඳු ය. එම ආලෝකය තමා විසින් ම නිපදවූවක් නොව සූර්යයාගෙන් පැමිණ පරාවර්තනය වන ආලෝක කිරණයන් ය. මෙම ග්‍රහ වස්තූන් දෙක ආලෝක ග්‍රහයින් සේ හැඳින්වෙන අතර චන්ද්‍රයාගේ ගුරුත්වාකර්ෂණ


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බලය හේතුවෙන් පෘථිවියේ උදම් රළ මෙන් ම මිනිස් සිරුරේ සෑතු වෙනස්කම් ද ඇති කරන බව සැබෑ ය. සූර්යයාගෙන් චන්ද්‍රයාගේ අර්ධයකට සෑමවිට ම ආලෝකය වැටුණ ද පෘථිවිය වටා යන ගමනේ දී ආලෝකවත් වූ කොටස සම්පූර්ණයෙන් ම නොපෙනී අඩු වැඩිවන තත්වයකින් පෙනේ. මෙය පිළිවෙළින් පසළොස්වක සිට මාසෙපෝයදා දක්වා දෙපසට සිදුවන දෙයකි. මෙය සඳුගේ අවස්ථාවන් (Phases of the Moon) සේ තාරකා විද්‍යාවේ දී හඳුන්වන අතර ජ්‍යොතිෂයේ දී තිථි නම් වේ.

චන්ද්‍රයා හෙවත් සඳු ජ්‍යොතිෂයේ දී වැදගත් ම ග්‍රහයා වන බව පැවසීම අතිශයෝක්තියක් නොවේ. ඒ බොහෝ ස්වභාවික වෙනස්වීම් කෙරෙහි බලපාන බැවිනි. චංචලත්වයට බලවත් සේ සලකන සඳු "පෘථිවියෙහි වාසය කරන්නා වූ සියලු සත්වයින්ගේ ද ගස් කොළන්වල ද පමණක් නොව ගල් ජලය ආදීන්ගේ ද වෙනස්වීම චන්ද්‍රයා නිසාම වේ. මනුෂ්‍යයාගේ සිතට අධිපතියි" (හෙට්ටිගොඩ, 2015:104). තිථි අනුව සඳුගේ වෙනස්වීම යම් යම් කටයුතුවල දී දැන සිටි බවට සාක්ෂි ඇත. ඒ කෙසේ ද යත්, "ප්‍රධාන වශයෙන් ඒ කොටසට අයිති ගොවිතැන් කරන්නන් ය. මූලික වෘත්තිවල යෙදී සිටින්නෝ ද ටික දෙනෙක් දනිති. දැව දඬු සම්බන්ධ කටයුතු කරන අය හැන්දෑ සඳ කාලයට ගස් කපන්නේ නැත. ඒ කාලයට කපන ගස්වල ලීය මෘදු බවත් එලේ වැඩි බවත් ලීය ගුල්ලන් කන බවත් කාලාන්තර අත්දැකීම්වලින් ඔවුන්ට ඔප්පු වී තිබෙන බැවිනි" (හෙට්ටිගොඩ, 2008:97). මේ අනුව ස්වභාව ධර්මයා කෙරෙහි සඳුගේ බලපෑම ද මිනිසා විසින් අවබෝධ කොට ගෙන ඇති බව කිව හැකි ය. මිනිසාගේ රෝගාබාධ සඳහා ද ග්‍රහ බලපෑමක් ඇති බවත් එය සාමාන්‍ය ව්‍යවහාරයේ දී පහසුවෙන් හඳුනාගත හැකි බවත් උදාහරණයක් වන "හඳ මෝරන විට මානසික රෝගීන්ගේ ආබාධ තත්වයන් වැඩි වේ" යන්න මගින් පැහැදිලි කරයි. එසේ ම මුහුදු රැකියාව කරන්නෝ ද සඳෙහි බලපෑම හොඳින් දනිති. ඒ මුහුදු රළ ස්වභාවය ඒ අනුව වෙනස් වන නිසාය. එසේම බලවත් සේම දුබල සඳු ගේ වෙනස් ආකාර බලපෑම් නිසා ඇති වන තත්වයන් විශේෂයෙන් විශ්ව කේන්ද්‍රයේ හතරවැන්න වන කටකය හා ඊට අධිපති වන සඳු ආශ්‍රයෙන් පෙන්වනු ලබයි. එමගින් සිත සහ මව සම්බන්ධ කරුණු කියයි. සිත සහ එහි ක්‍රියාකාරීත්වය කෙරෙහි සඳුගේ බලපෑම බුදු රජාණන්වහන්සේගේ බොහෝ වැදගත් සිදුවීම් වූ දින මගින් පෙන්නුම් කරයි. උන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වය සහ පිරිනිවන්පෑම යන තෙමඟුල වෙසක් පුන් පොහෝ දිනයන්හි සිදුවීම මේ අතර වැදගත් වේ. එපමණක් නොව පොහෝ දිනයන් මනසේ ඒකාග්‍රතාවයට වැදගත් වන බව පසක් වන අවස්ථා රාශියක් උන්වහන්සේගේ ජීවිතය තුළින් සොයා ගැනීමට පිළිවන. පෙර ජාතිවල දී දස පාරමිතාවන් පෙරූ උන්වහන්සේගේ පිළිසිඳ ගැනීමේ පටන් සිදු වූ ප්‍රධාන කරුණු සඳහා නිසැකවම යෙදී හෝ යොදා ගෙන ඇත්තේ පුන් පොහෝ දිනයන් ය. කිරිඇල්ලේ ඤාණවිමල හිමි (2015:24) සද්ධර්ම රත්නාවලියේ පිළිසිඳ ගැනීම "මහා මායා බිසොවුන් දස මස් සත් දවසකට ආයු ඇති නියාවත් දැන ඇසළ පුර පසළොස්වක් ලද අඟහරුවාදා උතුරුසල නැකතින් මධ්‍යම රාත්‍රී වේලෙහි තුසී පුරෙන් චුතව, දඹදිව මැදුම් පියස කිඹුල්වත් නුවර සුද්ධෝදන රජ්ජුරුවන් නිසා මහාමායා බිසොවුන් කුස පිළිසිඳ ගෙන" යනුවෙන් සඳහනක් තබයි. එසේ ම මහා අභිප්‍රායක් මුදුන් පමුණුවා ගැනීමේ අරමුණින් කළ අභිනිෂ්ක්‍රමණය සිදුවූයේ ද පුර පසළොස්වක දිනක ය.

> "මේ ගමනේ පරම පවිත්‍ර අරමුණ වුණේ සත්‍ය අවබෝධ කර ගැනීමයි. පෙර ජාතිවලදී දස පාරමී පිරූවේත් මේ අවබෝධය ලබා ගැනීම සඳහාමයි. එදා ඇසළ පෝය දවසයි" (කෝවිද හිමි, 2015:29).

මෙයින් ද පුන් පොහෝ දිනක දී ඇතිවන මානසික නිරවුල් බව එනම් සඳ කිරණ මගින් ඇති කළ හැකි මානසික විපර්යාසයට උදාහරණයක් දේ. ඇසළ පුනු පොහෝ දිනක දී දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීමත් මේ අතර වේ. ඒ බව

> "එදින ඇසළ පුනු පොහොය විය. බුද්ධත්වයෙන් දෙමසකට පසු ය. ස්ථානය බරණැස ඉසිපතනයෙහි වූ මුව වනයයි. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ ප්‍රථම මංගල දේශනාව පැවැත්වූ හ" (නාරද හිමි, 1966:26)

යනුවෙන් දක්ව යි. බුදු වී සත්වන වස තම මෑණියන්ට අභිධර්ම දේශනාව පවත්වා වස් පවාරණය කොට නැවතත් මනු ලොවට වැඩීම සිදු වූයේ ද පුර පෝය දිනකදී ය.

> "පුතකු වශයෙන් තම මව්තුමියට කළ උදාර පූජාව මේක යි. ඊට පස්සේ වස් පවාරණය කළ බුදුන් වහන්සේ වප්පුර පෝ දවසේ මනු ලොවට වැඩම කිරීමට සූදානම් වන වේලාවේ" (කෝවිද හිමි, 2015:117) යනුවෙන් මෙය උපුටා දක්වයි.

එම කෘතියේ ම බුදුන් වහන්සේගේ පිරිනිවීමට මාස තුනකට පෙර ආනන්ද මාහිමියන් විසින් පොළොව කම්පාවීම ගැන විමසූ අවස්ථාවේ දී ඊට හේතු පැවසූවේ ද පුරපෝය දිනක බව,

> "ලෝකයාට අප්‍රමාන සේවයක් සිදු කොට උපතින් අසූ වන වියට පා තබන්න මාස තුනක් තිබෙන කොට ඒ කියන්නේ නවම් මාසේ පෙබරවාරි මාසේ පුන් පෝය දවසේ" (2015:177) යනුවෙන් දක්වයි.

බුදු රජාණන්වහන්සේ පොළොව කම්පාවීමට කරුණු අටක් දක්වමින්,

> "ඒ තමයි ආනන්ද
>
> 1. ලෝකේ පවතින පඨවි, ආපෝ, වායෝ, තේජෝ කියන මේ සතර මහා භූතවලින් එකක් කුපිත වුනොත් මේ මහා පොළොව කම්පා වෙනවා. එතකොට ලෝක විනාශයත් සිදු වෙනවා.
> 2. ලොව්තුරා සම්බුදු වන ආත්ම භවයේ දී තුසිත දිව්‍ය ලෝකයෙන් චුත වෙලා මහා බෝසතුන් වහන්සේ මවු කුස පිළිසිඳ ගන්න වේලාව


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

3. දස මසක් මව් කුසේ සිට උපත ලබන අවස්ථාව
4. ලොව්තුරා බුදු වෙන වේලාව
5. ප්‍රථම ධර්ම දේශනය පවත්වන වේලාව
6. අයු සංස්කරණය අත්හරින වේලාව
7. පිරිණිවන් පාන වේලාව
8. සිත දියුණු කර ගත් සෘධි බල ඇති සමහර තාපසවරුන්ගේ යම් යම් චිත්ත බලවේග නිසාත් පොළොව කම්පා වෙනවා

මේ කාරණා අනුව ආනන්ද පොළොව කම්පා වන අවස්ථා හයක්ම බුදු කෙනෙකු නිසා සිද්ධ වෙනවා" (කෝවිද හිමි, 2015:177,178) යනුවෙන් දක්වයි.

මේ අනුව ඉහත කරුණු අටෙන් හයක් ම බුදු රජාණන්වහන්සේ හා සම්බන්ධ වන අතර එම සිදුවීම් සියල්ල පසළොස්වක පෝ දිනයන්හි සිදුවීම ද විශේෂත්වයකි. විශේෂිත පුද්ගලයින්ගේ උත්පත්තීන් සමග ආශ්චර්යමත් දේ සිදුවන බවත් පෘථිවියේ ඇතිවන සංසිද්ධීන් සමග ග්‍රහතරු සම්බන්ධ බවත් ආදි මිනිසා විශ්වාස කළේ ය. ඒ අනුව බෙත්ලෙහෙමට ඉහළින් පැයූ දීප්තිමත් තාරකාව (නත්තල් තරුව) කිතු උපත සිදු වූ බව කියා පෑහ. මේ බව එකළ සිටි ඥානවන්ත පුද්ගලයින් විසින් ප්‍රකාශ කළ බව "In the Gospel of Matthew account, the Magi (often translated as 'wise men', but more accurately astrologers) arrive at the court of Herod in Jerusalem and tell the king of a star which signifies the birth of the King of the Jews" (en.wikipedia.org ) මගින් කියැ වේ. එසේ ම ඉස්ලාම් ධර්මයේ විශේෂයෙන් ම ආගමික උත්සව ආරම්භ කිරීම සිදු වනුයේ නවසඳ බැලීමෙනි. ඉස්ලාමීය කැලැන්ඩරයේ සෑම මාසයක ම අවසාන දින සඳ බැලීමෙන් අනතුරුව අලුත් මාසය පටන් ගැනෙන අතර එම කැලැන්ඩරය නිර්මාණය වී ඇත්තේ චන්ද්‍රයාගේ අවස්ථාවන් වන චන්ද්‍රවංක උපයෝගී කර ගනිමිනි. මේ අනුව ආගම් භේදයකින් තොරව ලෝකවාසීන් විසින් ග්‍රහතරුවල ඇතිවන කාලීන හෝ ක්ෂණික වෙනස්කම් සැලකිල්ලට ගනිමින් එදිනෙදා කටයුතු කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර ගැනීම මෙන් ම වැදගත් අවස්ථාවන් පිළිබිඹු වන ආකාරය තේරුම් ගැනීම ද කර ඇති බව පෙනේ.

## නිගමනය

ආලෝක ග්‍රහයින් වන සූර්යයා සහ චන්ද්‍රයා සැලකූ විට, ජීව ක්‍රියා කෙරෙහි දිවා කාලයේ දී සූර්යයාත් රාත්‍රී කාලයේ දී ප්‍රධාන වශයෙන් සූර්ය කැඩපත වන චන්ද්‍රයාත් බලපාන බව තාරකා විද්‍යාවේ දී මෙන් ම ජ්‍යොතිෂයේ දී ද පිළි ගැනේ. හිරු ආලෝකය සැපයීමට අමතර ව ආහාර නිෂ්පාදනය, ශාරීරික වර්ධනය, නිරෝගී බව ආදී ජීවී පැවැත්මට අවශ්‍ය මූලික දේ සඳහා දායක වන බව මෙම ශාස්ත්‍ර දෙකේදී ම පැහැදිලි ව දක්වයි. එසේ ම, සඳු මනසේ ක්‍රියාකාරිත්වයට ප්‍රබල අයුරින් දායක වන බවත් ස්වභාව ධර්මයාගේ පැවැත්මට අවශ්‍ය වන පාරිසරික ක්‍රියාවන් උත්තේජනය කරන බවත් විෂයයන් දෙකෙන්ම කියැ වේ.

අප සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යයාගෙන් සහ චන්ද්‍රයාගෙන් සේ ම යුරේනස් වැනි ඈතින් පිහිටි ග්‍රහයින්ගෙන් ද ඔවුන්ගේ පිහිටීම අනුව පෘථිවිය වෙත වැඩි අඩු වශයෙන් නොයෙකුත් අන්තරීක්ෂ කිරණ ශක්තීන් ළඟා වන බවත් සූර්යයා ඇතුළු අනිකුත් ග්‍රහයින්ගේ තාරකා විද්‍යාවෙන් සාක්ෂාත් වන ස්වභාවයන් ජ්‍යොතිෂයේ දී ද අතීතයේ පටන් ම පැහැදිලි ව අවබෝධ කරගෙන සිටි බවත් පර්යේෂණයේ දී අනාවරණය වූ කරුණු අනුව ප්‍රකාශ වේ. මින් පෘථිවි ජීවීන්ට ලැබෙන කිරණයේ ස්වරූපය අනුව යම් බලපෑමක් යහපත් හෝ අයහපත් ලෙස ඇති වන අතර මෙයින් මිනිසාගේ සිතෙහි හෝ ගතෙහි නොයෙකුත් වෙනස්කම් ඇති කළ හැකි බව නිගමනය වේ.

චන්ද්‍රයා මිනිස් සිත සහ සිතිවිලි පිළිබඳ කාර්යයේ දී සෘජුව ම ක්‍රියාත්මක වන බව බුදු රජාණන්වහන්සේ සිදු කළ සෑම වැදගත් කටයුත්තක් සඳහා ම පුර පසළොස්වක දිනයක් තෝරා ගැනීමෙන් පෙනේ. එදිනට චන්ද්‍රයාගෙන් ලැබෙන පූර්ණ කිරණ හේතුවෙන් ඇති වන චිත්ත ඒකාග්‍රතාවය සහ මනසේ උපරිම සක්‍රියතාව ප්‍රයෝජනයට ගනිමින් බුද්ධියේ අග්‍රස්ථානයට පත්වීමට තරම් වූ බලයක් නිර්මාණය කොට ගැනීමට උන් වහන්සේ සමත් වූ සේක. මිනිසාට මනස නිරවුල් කර ගෙන සිතිවිලි එක් අරමුණක පිහිටුවා ගැනීමට වඩාත් ම යෝග්‍ය දිනයක් සේ පුන් පොහෝ දිනය සුදුසු බවට මින් පැහැදිලි සාක්ෂි සපයයි. එමගින් සඳු කෙතරම් මිනිස් සිත සහ සිතිවිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වේ දැයි නිගමනය කළ හැකි ය. තව ද, පොළොව කම්පා වීම සිදු වන අවස්ථාවන් අතර දක්වා ඇති උන් වහන්සේ හා සම්බන්ධ සෑම සිදුවීමක් ම පුන් පොහෝ දිනයන්හි ඇති වීමත් ඊට සම්බන්ධ ව අප වෙත ඇති ආසන්නතම උදාහරණය වූ උදම් රළ නිසා ජීවිත රාශියක් නැති කළ සුනාමි ව්‍යසන අත්දැකීමත් පූර්ණ ලෙස සඳ කිරණ පොළොවට ලැබෙන දිනයන්හි සිදු වන උදම් රළ නැගීම හා සඳු අතර ඇති සම්බන්ධතාවයට සාක්ෂි සපයයි. එමෙන් ම, සෑම ආගමක් ම අතීතයේ පටන් අද දක්වා ම ග්‍රහතරුවල ආභාෂය ලබමින් පෝෂණය වී ඇති බව ද කිව හැකි වේ. ඉහත නිගමන අනුව තාරකා විද්‍යාවෙන් සැපයෙන විද්‍යාත්මක තොරතුරු සහ අතීතයේ දී අහස නිරීක්ෂණය සහ ඍෂිවරුන්ගේ අවබෝධතා ඥාණය මගින් සම්පාදනය වූ ජ්‍යොතිෂ විද්‍යාව මගින් සැපයෙන තොරතුරු යන කාණ්ඩ දෙක ම එකසේ මිනිසාට ප්‍රයෝජනවත් වන තාරකා ශාස්ත්‍රය නැමති විෂයයට ඇතුළත් කළ හැකි බවත් එහි දී තාරකා විද්‍යාව මගින් සාමූහික ප්‍රතිලාභයක් අපේක්ෂා කළ හැකි අතර මිනිසාගේ ජීවන ගමන් මගේ දී සිදු විය හැකි බාධක කම්කටොලු හඳුනා ගැනීමට මෙන් ම ඊට සංඥා සැපයීමටත් තිබෙන එකම ශාස්ත්‍රය ජ්‍යොතිෂ විද්‍යාව බවත් අවසාන නිගමනය වේ.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පරිශීලිත මූලාශ්‍රය


කෝවිද හිමි, බොරැල්ලේ (2015), දඹදිව සදහම් සුවඳ, කොළඹ, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම.

ඥාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්) (2015), ධර්මසේන හිමිගේ සද්ධර්මරත්නාවලිය, කොළඹ, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම.

ඥාණාලෝක ස්ථවිර, කෝදාගොඩ (සංශෝධිත) (1959), ගුරුළුගෝමීන් විසින් කරන ලද අමාවතුර "පුරිසදම්මසාරථී" පද වර්ණනාව, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

නාරද මාහිමි (සංශෝධිත) (1966), ධර්ම සංග්‍රහය, ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්.

පැට්රික්, එන්. (පරි) (2014), මහාචාර්ය බැන්ගලෝර් වෙන්කත රාමන්ගේ මිනිසා කෙරෙහි ග්‍රහ බලපෑම් (Planetary influences on human affairs), කොළඹ, සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

පෙරේරා, ජී. එස්. (සංශෝධිත) (2007), පුරාණ පලදාවලිය, නුගේගොඩ, මොඩන් පොත් සමාගම.

රණවීර, මීමණ ආර් (සම්පාදක) (2013), ජීවිතයක උදාව නොහොත් විද්‍යානුකූලව ජීවිත නිරීක්ෂණයට මග, නාත්තන්ඩිය, සුභාෂි ජ්‍යොතිර් විද්‍යා අධ්‍යයන හා පර්යේෂණ ආයතනය.

හෙට්ටිගොඩ, හෙන්ද්‍රික් ද සිල්වා (2008), පලාපල කියන හැටි, රත්මලාන, සී/ස තුසිත පොත්හල.

හෙට්ටිගොඩ, හෙන්ද්‍රික් ද සිල්වා (2015), ජීවිතය හා ග්‍රහයෝ, රත්මලාන, සී/ස තුසිත පොත්හල.


### අන්තර්ජාල වෙබ් අඩවි


Amazing Universe – Random Knowledge, 2017, Knowledge upgrade about the Sun, Retrieved from https://amzuniv.blogspot.com/2017/06/knowledge-upgrade-about-sun.html

Total Solar Eclipse, Solar Eclipses in History and Mythology, 2006, Retrieved from https://www.bibalex.org/eclipse2006/HistoricalObservationsofSolarEclipses.htm

Wikimedia Foundation, 2019, Lunar Nodes, Retrieved from https://en.wikipedia.org/wiki/Lunar_Nodes

Wikimedia Foundation, 2019, Solar system, Retrieved from https://en.wikipedia.org/wiki/Solar_System

Wikimedia Foundation, 2019, Star of Bethlehem, Retrieved from https://en.wikipedia.org/wiki/Star_of_Bethlehem

Wikimedia Foundation, 2019, Venus, Retrieved from https://en.wikipedia.org/wiki/Venus



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 10-22
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# පශ්චාත් යථාර්ථවාදී නවකතාවෙහි නිරූපිත ස්ත්‍රීත්වය හා සබැඳුණු ගැටලු: ගබ්සාව හා ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂ අවධානය සහිත ව කෙරෙන විමර්ශනයකි

(Portrayal of Issues of Woman in the Post-realistic Novel with Reference to Sexual Harassments and Abortion)

චම්පා එස්. ද සිල්වා* සහ මනෝජ් ආරියරත්න†
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
*champasdesilva@gmail.com, †manojsab@gmail.com

**සාරසංක්ෂේපය**

කිසියම් හෝ සමාජයක ප්‍රධාන කොටස්කාරියක ලෙස ස්ත්‍රිය හෙවත් කාන්තාව හැඳින්විය හැකි ය. එක් එක් රටවලට හිමි අනන්‍යතාව අනුව කාන්තාව හෙවත් ස්ත්‍රිය හැඳින්වීම සඳහා විවිධ නම් භාවිත වී ඇති බව ශබ්දකෝෂ අනුසාරයෙන් අධ්‍යයනය කළ හැකි ය. ස්ත්‍රියගේ සමාජ කාර්යභාරය හා භූමිකාව පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී දරුවන් බිහි කිරීම සහ ප්‍රජනන ක්‍රියාවලිය ඇයගේ ජීව විද්‍යාත්මක කාර්යභාරයක් සේ ප්‍රධාන වශයෙන් ම පිළිගැනුණි. මානව සමාජයෙහි පැවැත්ම උදෙසා එය අනිවාර්යයෙන් ම බලපාන්නා වූ විශේෂිත අංගයක් විය. දරුවන් ලද කාන්තාව සශ්‍රීකත්වයේ සංකේතයක් සේ සලකා ඇයට ගරු බුහුමන් දැක්වීමත්, දරුවන් නොලද කාන්තාවන් සමාජයෙහි අවමානයට පාත්‍ර වීමත් ආසියානු සමාජයේ සුලබ ලක්ෂණයක් විය. මෙවැනි කරුණු මගින් සනාථ වන්නේ දරුවන් බිහි කිරීම හෙවත් ප්‍රජනන ක්‍රියාවලිය කාන්තාව සම්බන්ධයෙන් සුවිශේෂ වන බව ය. එනම් සමස්ත විශ්වය ම පවතින්නේ ඇයගේ එම ජීව විද්‍යාත්මක ශක්තිය මත ය. පැරණි ලක්දිව කාන්තාව හඳුන්වනු ලැබුවේ මවක, බිරිඳක, දුවක, ගෘහණියක හෝ සොයුරියක වශයෙනි. විශේෂ අවස්ථාවන්හි දී ඇය රැජිනක, රාජ මාතාවක, මෙහෙසියක ලෙස ද ගරු බුහුමන් ලැබුවා ය. එලෙස සමාජයේ කාන්තාවට හිමි ව තිබූ සමාජ තත්ත්වය අනුව ඇය පිළිබඳ විවිධ ආකල්ප සහ දෘෂ්ටීන් ගොඩ නැගී තිබුණි. සිංහල සාහිත්‍යයෙහි මුල් යුගය නියෝජනය වන බොහෝ ග්‍රන්ථ මගින් විද්‍යමාන වන්නේ කාන්තාව පිළිබඳ ව එතරම් සුබවාදී දැක්මක් නොවේ. එසේ වුව ද යහපත් ස්ත්‍රීන් පිළිබඳ ව සඳහන් වූ අවස්ථා නැත්තේ නොවේ. තතු කෙසේ වුව ද දෙවෙනි ගනයේ පුරවැසියෙකු ලෙසින් අතීතයේ සිට වර්තමානය දක්වා ම කාන්තාව, හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන ම නොයෙක් දුක්ඛ දෝමනස්සයන්ට, චිත්ත වික්ෂෝභකාරී වාතාවරණයන්ට මුහුණ දෙන බව නොරහසකි. තාක්ෂණික අංශයෙන් කෙතරම් හිණි පෙත්තට නැග තිබූ සමාජ පරිස්ථිතියක දී වුව ද වත්මනෙහි පවා කාන්තාව අනාරක්ෂිත ය. ස්ත්‍රීත්වය හා සබැඳුණු ගැටලුසහගත තත්ත්වයන් බොහෝ ය. එය මුල්කාලීන ප්‍රබන්ධකරුවාගේ සිට අද්‍යතන සිංහල නවකතාකරුවා දක්වා ම වස්තු විෂය බවට පත් ව ඇති අයුරින් පසක් වන්නේ කාන්තාව සමාජයේ ප්‍රධාන කොටස්කාරියක ලෙස රඟ දක්වන භූමිකාවෙහි දැවැන්ත ස්වභාවය යි. වත්මනෙහි නීතිවිරෝධී ගබ්සාව හා ලිංගික ප්‍රචණ්ඩත්වය යන කරුණු ද්විත්වය කාන්තාව සම්බන්ධයෙන් අවධානයට ලක් කළ යුතු මූලික ම තත්ත්වයන් ය. කාන්තාව ඉතා අසරණ තත්ත්වයකට හා පීඩනයට ලක් කෙරෙන ප්‍රධාන සාධක වන්නේ ද මෙම කරුණු ය. එම තත්ත්වයන් අද්‍යතන සිංහල නවකතාකරුවා නිරූපණය කොට තිබෙන්නේ කුමනාකාරයෙන් ද යන්න විමසා බැලීම මෙහි මූලික ආධ්‍යාශය වේ. මේ අධ්‍යයනයෙහි ප්‍රතිඵල අනුව පැහැදිලි වන්නේ හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන ම කාන්තාව නොයෙක් ආකාරයෙන් පීඩනයට ලක්වන බව ය.

කේන්ද්‍රීය වචන : ස්ත්‍රිය, ආසියානු සමාජය, අද්‍යතන සිංහල නවකතාව , නීතිවිරෝධී ගබ්සාව, ලිංගික ප්‍රචණ්ඩත්වය

Woman is a major partner in any society in the world. Unfortunately, in many cases, woman is mistreated badly and very often the importance of woman in the society is underestimated. Throughout human history, traditional gender roles have often defined and limited woman's activities and opportunities. With such restriction loosening up during the 20th Century, woman in many societies has access to careers beyond the traditional 'homemaker' and is free to pursue higher education. As far as the social task of woman is concerned, her utmost contribution for the reproduction process is endemic and indispensable for the existence of the human society. Hence, in Asian society, woman with productive ability was venerated and considered as a symbol of prosperity. In the history of Sri Lanka, woman was esteemed as a 'mother', 'wife', and a 'sister'. However, in this house context, violence against woman whether within the families or in communities has a long history and is primarily committed by man. This situation is evident in Sri Lankan society as well. Even in the present technologically developed society, while gender equality is ranked fairly well in Sri Lanka, violence against woman is still a prevalent issue here. In the current Sri Lankan society, sexual harassment and illicit abortions are main issues faced by woman. In the modern Sinhala literature, particularly in novels, writers have made an effort to discuss the above issues encountered by women. Taking selected novels written by contemporary writers as evidence, this study attempts to identify how modern Sinhala novelists have depicted those issues encountered by present day woman. The results show that modern Sinhala novelist have depicted the real issues faced by woman in Sri Lanka.

Key words: Woman, Asian society, Reproduction, Illicit abortions, Sexual harassment, Modern Sinhala novels

## හැඳින්වීම

විශේෂයෙන් ම ආසියානු කලාපයට අයත් රටවල් වන ඉන්දියාව සහ ශ්‍රී ලංකාව කාන්තාව සම්බන්ධයෙන් ඔවුන්ට ම ආවේණික වූ චිත්‍රයක් සකසා ගෙන ඇති බව පෙනේ. විශේෂයෙන් ම හින්දු හා බෞද්ධ සංස්කෘතියේ සම්මිශ්‍රණයෙන් ලාංකේය කාන්තාව සම්බන්ධයෙන් අර්ථ දැක්වීම සිදු ව ඇත. බ්‍රාහ්මණ සමාජයේ දී ස්ත්‍රියට කිසිදු අධිකාරී බලයක් හෝ ස්වාධීනත්වයක් හිමි නොවූ අතර බුද්ධකාලීන භාරතයේ පවා පැවතියේ එවැනි තත්ත්වයකි. කාන්තා නිදහස ප්‍රදානය කොට කාන්තා නිදහස උදා කළ ප්‍රථම විප්ලවීය ශාස්තෘවරයා වශයෙන් බුදුන් වහන්සේට ප්‍රමුඛත්වයක් හිමි වේ. උපනිෂද් ග්‍රන්ථවල සහ හින්දු දර්ශනවලට අනුව ස්ත්‍රියට සිදු වූයේ ඇයගේ ස්වාධීනත්වය පූර්ණ වශයෙන් ම අහිමි වීමකි. ඇයට ආගමික, සාමාජික සහ ආර්ථික වශයෙන් කිසියම් පහත් තත්ත්වයක් හිමි ව තිබූ අතර ඇය ව කිසියම් වහල් ස්වභාවයකින් පාලනය කර තිබූ අයුරු ද 'මනුස්මෘතිය' වැනි ග්‍රන්ථ මගින් අවබෝධ කොට ගත හැකි ය. අපගේ චිරන්තන සාහිත්‍යය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ස්ත්‍රිය සම්බන්ධයෙන් එතරම් සුබවාදී දෘෂ්ටියක් හෙළා නොමැති බවත්, සීමාසහිත වූ පටු රාමුවක සිර වී ඔවුන් ස්ත්‍රිය දෙස බැලූ බවටත් පවතින සාක්ෂ්‍යයෝ බොහෝ වෙති. වත්මන් සිංහල විචාර ක්ෂේත්‍රයෙහි ගැහැනිය යන්නට වඩාත් ප්‍රචලිත වචනය ස්ත්‍රිය යන්න ය. 'ස්ත්‍රී' (Stri) යන වචනය සංස්කෘත භාෂාවෙන් ලත් තත්සම පදයකි. ඉන්දු ඉරාණියානු භාෂා මූලයන්ට අනුව 'Zstri' යනු සහජාත පදයක් නොවන බව පැහැදිලි ය. 'Zstri' යන පදය ඇතැම් විට (Sutri) හෝ (Zsotri) යන මූලයෙන් පැමිණෙන්නට ඇතැයි මොනියර් විලියම්ස් සැක පහළ කරයි (රාජපක්ෂ 2014 : 04). සෝරත හිමියන් විසින් සම්පාදිත සුමංගල ශබ්දකෝෂයෙහි (1963 : 1135) 'Zstri' යන්න පුරුෂ හෝ නපුංසක හෝ නොවන සත්ත්වයා සඳහා යොදා ඇත.

ස්ත්‍රිය හෙවත් කාන්තාව හැඳින්වීම සඳහා බොහෝ අර්ථකථන, නිර්වචන ඇත්තා සේ ම කාන්තාව මූලික කොට ගත් විවිධාකාර වූ සාහිත්‍යාංග රාශියකින් සිංහල සාහිත්‍ය වංශය මෙන් ම විශ්ව සාහිත්‍ය වංශය ද පෝෂණය ලබා ඇත. සමාජයෙහි ඉතා ම කුඩා ඒකකය වශයෙන් ගැනෙන පවුල යන ඒකකය දෙස අවධානය යොමු කළ ද සනාථ වන්නේ ඉමහත් කාර්යභාරයක් එහි දී කාන්තාවක, මවක, සොයුරියක, බිරිඳක, මිත්තණියක වශයෙන් ඇය ඉටු කරනා බව ය. කාන්තාවන්ගෙන් විනිර්මුක්ත වූ සමාජ ක්‍රමයක් හෝ පවුල් සංස්ථාවක් හෝ රාජ්‍යයක් හෝ පිළිබඳ ව සිතීමට පවා නොහැකි තත්ත්වයක් පවතී. එවන් වූ කාන්තා චරිත මුල් කොට ගත්, එසේ ම හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන ම දෙවැනි ගණයේ පුරවැසියා වශයෙන් ඇය සමාජ පරිස්ථිතියෙන් ලබන්නා වූ අනේකවිධ වූ අවමන් සහගත වූ පසුගාමී මුහුණුවර අද්‍යතන සිංහල නවකතාකරුවාට වස්තුවිෂය වී ඇති බැවින් එම කරුණු සම්බන්ධයෙන් සවිඥානක වීම මෙහි මූලික ආධ්‍යාශය වී තිබේ. විශේෂයෙන් ම ඒ අතරින් මුඛ්‍ය ස්ථානයක් හිමි වන්නේ ගබ්සාව හා ලිංගික ප්‍රචණ්ඩත්වය යන කරුණු කෙරෙහි ස්ත්‍රියක වශයෙන් අධිකතර අසරණභාවයට මෙන් ම මානසික වික්ෂෝභකාරී තත්ත්වයේ උච්චතම අවස්ථාවන්ට මෙවන් පසුබිමක දී ඇය මුහුණ දෙන බැවිනි.

## සාහිත්‍ය විමර්ශනය

උක්ත පර්යේෂණ මාතෘකාව සාකච්ඡා කිරීමෙහි ලා සාහිත්‍ය විමර්ශන පාර්ශ්වයෙන් විවිධ විචාර ග්‍රන්ථ මෙන් ම නවකතාවලින් ද බොහෝ ආලෝකයක් ලැබිය හැකි ය. ඒ අතරින් අතීත කාන්තාව දෙස විචාරාක්ෂිය යොමු කළ හැකි මාහැඟි ග්‍රන්ථයක් වශයෙන් ඉන්ද්‍රාණි මුණසිංහ විසින් (1998) රචිත 'පැරණි ලක්දිව කාන්තාව' නම් කෘතිය දැක්විය හැකි ය. අපගේ චිරන්තන සාහිත්‍ය කෘති පරිශීලනය කරමින් ඉදිරිපත් කෙරෙන අතීත කාන්තා ප්‍රතිබිම්බය ඉතා සාරවත් පසුබිමක් පර්යේෂකයෙකුට නිතැතින් ම උදා කරවයි. ඇයට දෙවන ගණයේ පුරවැසියෙකු වශයෙන් නොව කුටුම්බය තුළ දී ඉතා උසස් ස්ථානයක් මවක, බිරිඳක වශයෙන් ලැබුණු ආකාරය එහි දී හඳුනා ගත හැකි ය. එසේ ම ධර්මා එස් රාජපක්ෂ විසින් රචිත 'විපරිණාමයේ ස්ත්‍රී පිළිබිඹුව' (2014), එම් ජී මනුරත්නගේ ස්ත්‍රී, පුරුෂ සමාජභාවය හා පවුල (2014) යන කෘති මගින් සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන්ගේ විචාර ක්ෂේත්‍රය පූර්ණය කර ගත හැකි ය. අද්‍යතන නවකතා හැරුණු විට අනූව දශකය, අසූව දශකය යන යුගයන්හි දී ස්ත්‍රී නමිනතාවකින් යුතු ව ලියැවුණු බොහෝ නවකතාවන් මගින් මෙයට නොමඳ ආලෝකයක් ලබා ගත හැකි ය. ඒ අතරින් අනූව දශකයෙහි අනුලා ද සිල්වා විසින් රචිත සූකර වස්තුව, සුමිත්‍රා රාහුබද්ධගේ දළ රළ පෙළ, ශාන්ති දිසානායක, ඊවා රණවීර යන ලේඛිකාවන්ගේ නිර්මාණ ආශ්‍රයෙන් මතු නොව බෙහෝ නිර්මාණකරුවන්ගේ නිර්මාණ ඇසුරින් මෙම තත්ත්වය විවරණය කළ හැකි ය.

## පර්යේෂණ ගැටලුව

ස්ත්‍රී, පුරුෂ සමාජභාවය කේන්ද්‍ර කොට ගෙන ලාංකේය සමාජ පරිස්ථිතියේ දී ස්ත්‍රිය කුමන ආකාරයෙන් පීඩනයට පත්වේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ.

## පර්යේෂණ අරමුණු

මෙහි දී මතු දැක්වෙන පර්යේෂණ අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් උක්ත පර්යේෂණයෙහි නිමග්න විය හැකි ය.

- ස්ත්‍රී, පුරුෂ සමාජභාවයෙහි ස්වභාවය හඳුනා ගැනීම.
- පැරණි ලක්දිව කාන්තාව හා පශ්චාත් නූතනවාදී කාන්තා භූමිකා ගවේෂණය කිරීම.
- පාරිභෝජන ධනවාදය ශීඝ්‍ර ලෙස ව්‍යාප්ත වීමෙහි අහිතු ප්‍රතිඵල ස්ත්‍රීත්වය කෙරෙහි බලපා ඇති අයුරු අවබෝධ කොට ගැනීම.
- මානවවාදය ගිලිහී යාම.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් මොහාන් රාජ් මඩවල විසින් රචිත (2016) රජින නවකතාව ද සුමිත්‍රා රාහුබද්ධ විසින් රචිත (2010) කන්දක් සේ මා නවකතාව ද පී.බී. ජයසුන්දර විසින් (2015) රචිත අවලමා සහ ඇහැටුව නවකතාව සහ එච්. බී. ගුණරත්න විසින් 2015 වර්ෂයේ දී රචිත හිතුවක්කාරී සහ චම්මින්ද වෙලගෙදරගේ සක්කාරං (2010) යන නවකතා මූලාශ්‍රය කර ගැනීමට අපේක්ෂිත ය. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් තත් විෂය අරභයා විශේෂයෙන් ම ස්ත්‍රීන් හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන මුහුණ දෙන ගබ්සාව හා ලිංගික ප්‍රචණ්ඩත්වය සහ සම්බන්ධිත වෙනත් දශකවල ලියැවුණු නවකතා සහ සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන්ගේ ස්ත්‍රී, පුරුෂ සමාජභාවය පිළිබඳ ව අදාළ වන්නා වූ ලිපි ලේඛන යනාදිය මූලාශ්‍රය වශයෙන් භාවිත කෙරේ.

## සාකච්ඡාව

කිසියම් හෝ සමාජයක ප්‍රධාන කොටස්කාරියක ලෙස ස්ත්‍රිය හෙවත් ගැහැනිය සැලකිය හැකි ය. එක් එක් රටවලට හිමි අනන්‍යතාව අනුව කාන්තාව හෙවත් ස්ත්‍රිය හැඳින්වීම සඳහා විවිධ නම් භාවිත වී ඇති බව ශබ්දකෝෂ අනුසාරයෙන් අධ්‍යයනය කළ හැකි ය.

> "වත්මන් ලෝකයෙහි භාෂා හය දහස් නවසියයක් (6900) පමණ භාවිතයේ පවතී. මේ භාෂාවල ද ස්ත්‍රිය හැඳින්වීම සඳහා ස්වකීය රටට හෝ භාෂාවට අනන්‍ය වූ වචනයක් ව්‍යවහාර කරන බව පැහැදිලි ය" (රාජපක්ෂ 2014: 01).

ස්ත්‍රියගේ සමාජ කාර්යභාරය හා භූමිකාව පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී දරුවන් බිහි කිරීම නම් වූ ප්‍රජනන ක්‍රියාවලිය ඇයගේ ජීව විද්‍යාත්මක කාර්යභාරයක් සේ ප්‍රධාන වශයෙන් ම පිළිගැනුණි. මානව සමාජයෙහි පැවැත්ම උදෙසා එය විශේෂයෙන් ම බලපාන්නා වූ අනිවාර්ය අංගයක් විය. දරුවන් ලද කාන්තාවක බොහෝ සමාජයන්හි ගෞරව බහුමානයට පාත්‍ර වූ අතර දරුවන් බොහෝ සිටීම සශ්‍රීකත්වයේ ලකුණක් සේ පෙරදිග මුල් බැසගත් චින්තනය විය. දරුවන් නොලද කාන්තාව වඳ ස්ත්‍රියක වශයෙන් සමාජ ගර්හාවට ලක් වීම ආසියානු සමාජයේ සුලබ ලක්ෂණයක් විය. මෙවැනි කරුණු මගින් සනාථ වන්නේ ප්‍රජනන කාර්යය හෙවත් දරුවන් බිහි කිරීම කාන්තාව පාර්ශ්වයෙන් සුවිශේෂ වන බව ය.

> "නව ශිලා යුගය (The Neolithic age - ක්‍රි. පූ. 9500* මානවයාගේ නව තාක්ෂණික අවධිය යි. ලිංග භේදය පදනම් කොට ගත් ස්ත්‍රී - පුරුෂ අසමානත්වයට වඩා සමූහ වශයෙන් කණ්ඩායම්ගත වී කුඩා සමාජ තනාගෙන මේ යුගයේ ඔවුන් ජීවත් වූ බව සිතිය හැකි යි. පීතෘමූලිකත්වයට වඩා මාතෘමූලික කණ්ඩායම් තනා ගැනීම සුවිශේෂ විය. දරුවෝ මවගේ පෙළපත් නාමයට උරුමකම් කී අවස්ථා ද ඇත. මාතෘ මූලික සමාජයක් ව තිබූ ඊජිප්තුව ඊට නිදසුන් ය. සිය කැමැත්තට අනුව නිදහසේ තම දේපල පාලනය කිරීමට එහි දී ඇයට හැකි විය. මව් දෙවඟන වන්දනයෙන් හෙළිදරව් වන්නේ ද ස්ත්‍රියට සමාජයේ ප්‍රමුඛත්වයක් හිමි වූ බව ය. අප්‍රිකාව, චීනය, ග්‍රීසිය, ජපානය ද ඇමෙරිකාව, රුසියාව, ඉන්දියාව සහ යුරෝපීය රටවල් පුරා ද මව් දෙවඟන වන්දනය (Mother Goddess) පැවති බවට ඓතිහාසික සාක්ෂි තිබේ. කෘෂිකාර්මික යුගයේ දෙවන අදියර වන විට ස්ත්‍රිය සිය බලයේ සහ ශ්‍රේෂ්ඨත්වයේ උච්චතම ස්ථානයකට පිවිස තිබුණි" (රාජපක්ෂ 2014:08).

මෙම සියලු නාමකරණයන් පසෙක දමුව ද මූලික වශයෙන් ම කුටප්‍රාප්තියට පත් වන්නේ ස්ත්‍රිය සතු දරුවන් බිහි කිරීමේ හැකියාව වේ. සමස්ත විශ්වය ම රඳා පවතින්නේ ඇය සතු එම ජීව විද්‍යාත්මක ශක්තිය මත ය. එසේ ම මිනිසාගේ ජීව විද්‍යාත්මක අවශ්‍යතා පූර්ණය වන්නේ ද ස්ත්‍රියගෙනි. එසේ වුව ද හුදු ස්ත්‍රීත්වය හා සබැඳුණු ගැහැනියක වශයෙන් ඇය මුහුණ දිය යුතු සමාජීය වාතාවරණයන් විවරණය කර දැක්වීම මෙහි දී මූලික වශයෙන් අපේක්ෂිත ය.

සිංහල සාහිත්‍යයෙහි ප්‍රථම අදියර නියෝජනය වන බොහෝ ග්‍රන්ථ මගින් විද්‍යමාන වන්නේ කාන්තාව පිළිබඳ ව එතරම් සුබවාදී වූ දැක්මක් නොවේ. ඒවාහි බොහෝ දුරට අන්තර්ගත වන්නේ යතිවර දෘෂ්ටීන් බව පෙනේ. එළු අත්තනගලු වංශයෙහි ද විද්‍යමාන වන්නේ කාන්තාව පිළිබඳ වූ අවර ගණයේ දෘෂ්ටියකි.

> "තව ද ස්ත්‍රීහු ඇතුළත්හි රැඳවූවාහු ද පිටතැ රඳවන ලද්දාහු ද නාසිකායෙන් පිටතට හා ඇතුළතට නික්මෙන්නා වූ ද ශ්වාසයක් මෙන් තමා රක්ෂා කළ පුරුෂයාට විනාශයක් මැ කෙරෙති. එසේ වූ ස්ත්‍රීන් කෙරෙහි කවර නම් ප්‍රාඥයෙක් විශ්වාස කෙරේ ද? නොකරන්නේ මැයි" (කුමාරතුංග සන්ස්කරණය 2476 බු:ව:09).

ජාතක කතාකරුවාගේ ස්ත්‍රීය සම්බන්ධ වූ දැක්ම බෙහෙවින් ම සමපාත වන්නේ සද්ධර්මරත්නාවලීකාරක කතුවරයා සමඟ ය.

> "ස්ත්‍රී ජාතීහු නම් සියල්ලවුනට සාධාරණ බැවින් සුරාපාන සාලාවක් වැන්නහ. සියලු පුරුෂයන් වංචා කොට පියන හෙයින් ඉන්ද්‍ර ජාලාවක් වැන්නහ. දුර සිට බැලුවත් අත අල්වාගත හැකි වස්තුවක් සේ පෙනී සම්පස්ථ වූයේ කිසිවක් නැත්තා වූ මිරිඟු ජලයක් මෙන් කිසි ස්වාභාවී ගුණය නැත්තාහ. තමන් වසඟ වූ කෙනෙකුන්ට හැමවේලෙහිම ශෝක හා කාසාස්වාසාදී වූ රෝගයන් උපද වන හෙයින් අමනුෂ්‍ය කෙනෙකුන් වැනියාහ. මත්‍යු මාරයා විසින් පුරුෂයන් තමා සමීපයට බඳාගෙන එන පිණිස ගෙයි ගෙයි තබන ලද පාස බන්ධනයක් වැනිය. එසේ වූ ස්ත්‍රිය කෙරෙහි යම් පුරුෂයෙක් සකත් ව මට ම, මාගේ යැයි සිතා නම් එතෙම මනුෂ්‍යයන්ගෙන් අධම වන්නේ ය" (වේරගොඩ 1961:1127).


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තතු එසේ වුව ද සිරි රහල් හිමියන්ගේ කාව්‍යශේඛරයෙහිත්, සැලළිහිණි සන්දේශයෙහිදීත් වර්ණනා කරන උලකුඩය දේවිය හෙවත් ලෝකනාථා කුමරිය ඉතා භක්තිමත්, කාන්තාවක කෙරෙහි පිහිටිය යුතු සෑම ගුණාංගයකින් ම පරිපූර්ණ වූ ස්ත්‍රීයක් වූ බව හඳුනා ගත හැකි ය.

දීර්ඝතම ගද්‍ය ආඛ්‍යානය වශයෙන් හැඳින්වෙන ඇල්.අයිසෙක් ද සිල්වා විසින් රචිත වාසනාවන්ත පවුල සහ කාලකණ්ණි පවුලෙහි එම යුගයට (1888) සාපේක්ෂ ව කාන්තාව පිළිබඳ ව ඉමහත් ප්‍රගතිශීලී අදහස් සමුදායක් ගැබ් වී ඇත.

> “වාසනාවන්ත පවුලෙහි කතුවරයා කාන්තාව පිළිබඳ දක්වන ආකල්පය බෙහෙවින් ප්‍රගතිශීලී ය. පුරුෂයන් විසින් ස්ත්‍රීන් පහත් කොට සැලකීම සිංහල සමාජයෙහි දැකිය හැකි නරක සිරිතක් බව කතුවරයා පවසයි. චාල්ස් ස්වාමියා සහ භාර්යාව අතර තිබිය යුත්තේ සමාන තත්ත්වයක් බවත්, භාර්යාව පුරුෂයාගේ වැඩකාරියක හෝ වහලියක හෝ නොවන බවත් පවසයි. භාර්යාවත්, පුරුෂයාත් එක්කෙනෙකු මෙන් ද එක ශරීරයක් මෙන් ද පැවතිය යුතු බව ඔහු වැඩි දුරටත් කියයි. භාර්යාව, පුරුෂයාගේ ප්‍රේමවන්තිය වන අතර පුරුෂයා භාර්යාවගේ ආදරවන්ත මිත්‍රයාය. එවැනි යුගයක් ඉතා ඉක්මනින් මෙරට උදා වේවායි චාල්ස් ප්‍රාර්ථනා කරයි” (ගමගේ 1999:63).

සිංහල නවකතා ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේ දී ස්ත්‍රී චරිත මූලික කොට ගත්, එම ස්ත්‍රී කතා නායිකාවන්ගේ නමින් ම නම් කොට ඇති නවකතා එසේ නැතහොත් මුල්කාලීන ප්‍රබන්ධ ගණනාවක් ම තිබෙන බව දැක්විය හැකි ය. ඒ අතරින් එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් ගද්‍ය ආඛ්‍යාන නමින් හඳුන්වනු ලබන කෘති අතර විශේෂ වූවක් සේ සැලකෙන විමලා (1892) දැක්විය හැකි ය. එහි කතුවරයා වූ කලී බෙන්තොට ඇල්බට් ද සිල්වා ය. ඇම් සී. ඇෆ් පෙරේරා (1879 - 1922) විසින් රචිත ප්‍රබන්ධ කතා වන මගේ පෙම්බරී (1907) සහ 1908 දී ඔහු විසින් ම කරනු ලබන සිරිමැදුරෙහි නිරූපණය වන්නේ ප්‍රගතිශීලී කාන්තා චරිත ය. එසේ වුව ද පියදාස සිරිසේන රචනා කළ'විමලතිස්ස හාමුදුරුවන්ගේ මුදල් පෙට්ටිය' නම් ප්‍රබන්ධයෙහි යටත්විජිතකරණ බලපෑමට හසු වූ කාන්තාවන් ඉතා දැඩි සේ විවේචනය කොට ඇත. එසේ ම ඔහු විසින් ම රචිත 'යන්තම් ගැළවුණා' (1934) හි ද බටහිරකරණයට නතු වූ කාන්තාවන් දැඩි සේ විවේචනය කොට ඇත. පියදාස සිරිසේන විසින් රචිත (1906) 'ජයතිස්ස සහ රොස්ලින්හි සිට 1944 දී රචනා වන 'ඩෙබර කෙල්ල' දක්වා ම ඔහුගේ පැවතියේ නූතනත්වය හා සමාජ විපර්යාසය කෙරෙහි වූ තදබල අප්‍රසාදය බව පෙනේ. තතු එසේ වුව ද සරච්චන්ද්‍රයන්ට අනුව ඩබ්. ඒ. සිල්වා නිරූපණය කරන ස්ත්‍රී චරිත ප්‍රගතිශීලී ය. සිරියලතාහි ඇග්නස් ද හිඟන කොල්ලාහි මැරියන් ද කැලෑ හඳෙහි මාලනී ද අවිචාර සමයෙහි සුනේත්‍රා ද විජයබා කොල්ලයෙහි නීලමණී ද හඳපානෙහි රන් මැණිකේ ද ප්‍රගතිශීලී දෘෂ්ටි සහිත ස්ත්‍රීහු වෙති. ඉන් පසු මාර්ටින් වික්‍රමසිංහයන් විසින් ලියැවුණු ඔහුගේ ප්‍රථම නවකතාව වශයෙන් හඳුන්වනු ලබන ලීලා (1914) ග්‍රන්ථ නාමය සකස් කොට ඇත්තේ ද කතා නායිකාවගේ නමිනි. ඉන් පසු සෝමා (1920), අයිරාංගනී (1923), සීතා (1923) සහ රෝහිණී (1929) යනාදි වශයෙනි. ප්‍රථම සිංහල නවකතාව වශයෙන් ගැනෙන අලුත්ගමගේ සයිමන් ද සිල්වා විසින් රචිත මීනා (1905) හි ප්‍රධාන චරිතය වූ කලී ද මීනා නම් වූ කාන්තාවකි. ඇය ප්‍රගතිශීලී,නිර්භය ස්ව බුද්ධියෙන් කටයුතු කරනු ලබන අවස්ථාවෝචිත ප්‍රාඥයෙන් ද යුක්ත වූ තරුණ කාන්තාවක සේ නිරූපිත ය. නවකතාව අවසන් වන්නේ ද ස්ත්‍රියට නිසි තැන ලබා දෙන ගෞරව කරන යම් ජාතියක් වෙත් ද ඔවුන් උසස් වන බව දක්වන ප්‍රගතිශීලී අදහස් සමුදායක් සමගිනි.එය ප්‍රකාශ කරනු ලබන්නේ මීනා විසින් වීම විශේෂත්වයකි.එසේ ම මීනා නම් වූ කතා නායිකාව ප්‍රභූ පැලැන්තිය නියෝජනය නොකිරීම ද සාමාන්‍ය නිර්ධන පාංතික කාන්තාවක් වීම ද උභයකුල පාරිශුද්ධ කාන්තාවක් නොවීම ද එම යුගයට සාපේක්ෂ ව ප්‍රගතිශීලී ය.අලුත්ගමගේ සයිමන් ද සිල්වා විසින් රචිත දෙවන නවකතාව වන්නේ ද ස්ත්‍රී චරිතයක් කතා නායිකාව සේ යොදා ගත් 1907 දී රචිත තෙරීසා ය. මුල්කාලීන නවකතා රචකයෙකු වූ පියදාස සිරිසේන විසින් ද කාන්තා කතා නායිකාවකගේ නමින් ඩිංගිරි මැණිකා (1918) නමින් ප්‍රබන්ධයක් රචිත ය. 1944 දී වික්‍රමසිංහයන් විසින් රචිත ගම්පෙරළිය නවකතාව සිංහල නවකතාකරුවන් යථාර්ථවාදී මගට ප්‍රවේශ වන නවකතාව වනවා මෙන් ම සංකීර්ණ වූ කාන්තා චරිතයක් ද අන්තර්ගත ය. එනම් නන්දාගේ චරිතය යි. වත්මන වන විට අතිසංකීර්ණ වූ පශ්චාත් නූතනවාදී කාන්තා චරිත සිංහල නවකතා මගින් නිරූපණය වී තිබේ. මෙලෙස මුල් කාලීන ලේඛකයින් විසින් ස්ත්‍රීන් කතා නායිකාවන් සේ තෝරා ගත්, එම නායිකාවන්ගේ නමින් ග්‍රන්ථ නම් කළ ප්‍රවණතාවක් දිස් වන බව පෙනේ. එම විවිධ වූ කතුවරුන් අතින් ස්ත්‍රියගේ චරිතය විවිධාකාර වූ සංකීර්ණතා සහිත ව විවිධ අර්ථ කථන සහිත ව ඉදිරිපත් ව ඇති බව ප්‍රකට ය.

චිරන්තන සිංහල සාහිත්‍යය දෙස අවධානය යොමු කිරීමේ දී පසක් වන්නේ ස්ත්‍රිය හෙවත් කාන්තාව දෙස සුභවාදී නොවන දෘෂ්ටියකින් බලා ඇති බව ය. අතීතයේ දී ලේඛක ආධිපත්‍යය හිමි ව තිබූ යතිවර පරම්පරාව කාන්තාව අර්ථ දැක්වූයේ ඇය පුරුෂයා ව සංසාරය නමැති බන්ධනයට හසු කර ගනු ලබන මළ පුඩුවක් ලෙසින් ය. එසේ ම ජාතක කතාකරු දක්වනුයේ ද 'මේ මාතුගාමයෝ වනාහී පවිටු වූ සත්ත්ව කෙනෙකු'යනාදී වශයෙනි. කාව්‍යශේඛරය රචනා කළ තොටගමුවේ රාහුල හිමි දක්වනුයේ ද 'අවසර කල් රහස් තැන ගැහැනු කවුරු ද වරදෙ නොබැඳෙන' යනාදී වශයෙන් ස්ත්‍රියගේ චපලත්වයල වංචනිකත්වයල පුරුෂයන් මුලා කරවන ස්වභාවය ඉස්මතු වන පරිදි ය.

මෙලෙස ස්ත්‍රිය හෙවත් කාන්තාව මූලික කොට ගත් විවිධාකාර වූ සාහිත්‍යාංග රාශියකින් සිංහල සාහිත්‍ය වංශය මෙන් ම විශ්ව සාහිත්‍ය වංශය ද පෝෂණය ලබා ඇත. ඉතා ම කුඩා වූ ඒකකය වශයෙන් ගැනෙන පවුල යන ඒකකය දෙස අවධානය යොමු කළ ද සනාථ වන්නේ ඉමහත් කාර්යභාරයක් එහි දී කාන්තාව මවක, ස්වාමි දියණියක


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වශයෙන් ඇය ඉටු කරනා බව ය. කාන්තාවන්ගෙන් විනිර්මුක්ත වූ සමාජ ක්‍රමයක් හෝ පවුල් සංස්ථාවක් හෝ රාජ්‍යයක් හෝ පිළිබඳ ව සිතීමට පවා නොහැකි තත්ත්වයක් පවතී. එතරම් ම ඇයගේ දායකත්වය ප්‍රබල වී ඇත.එවන් වූ කාන්තා චරිත මුල් කොට ගත්, කාන්තාවක වීම හේතු කොට ගෙන ම නොඑසේ නම් ස්ත්‍රීත්වය හේතු කොට ගෙන ම කාන්තාව අගතියට පත් ව ඇති අයුරු මෑත කාලීන ව ලියැවුණු නවකතා කිහිපයක් මූලාශ්‍රය කොට ගනිමින් වුව ද සනාථ කළ හැකි ය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදු වන වෙනස්කම් අතර කාන්තාව අරහයා පහළ සමාජ තත්ත්වයක් උරුම වීම, වරප්‍රසාද හා අයිතිවාසිකම් අසමාන ලෙස බෙදී යාම, බලය සීමා වීම පිළිබඳ විෂමතාවන්, ආර්ථික වරප්‍රසාද අහිමි වීම යනාදිය මෙන් ම ඇය හිංසනයට පත් කිරීම ද දක්නට ලැබේ. පුරුෂ කේන්ද්‍රීය සමාජයන්හි දී කාන්තාව පුරුෂයාගේ හිංසනයට ගොදුරු වේ. මේ අනුව මෙහි ප්‍රධානතම පාර්ශ්වකරුවෙකු වන්නේ පුරුෂයන් ය. සමාජයක පුරුෂයන්ගේ චර්යාව මත කාන්තාවගේ සමාජ තත්ත්වය තීරණය වේ. පුරුෂ පාර්ශ්වය හා සමාජ ක්‍රමයෙහි කාන්තාවන් හිංසනයට ලක් වන ආකාරය විවිධාකාර වේ. ඒ අතර ප්‍රධාන අංශ තුනක් හඳුනා ගත හැකි ය. එනම් මනුරත්නට (2004:27) අනුව

- කායික හිංසනයට ලක් වීම (Physical violence)
- මානසික හිංසනය (Mental violence)
- ලිංගික හිංසනය (Sexual violence)

යනුවෙනි.

කායික හිංසනය යනු ශාරීරික වශයෙන් කාන්තාවට පහර දීම, තුවාල කිරීම හෝ මරණයට ලක් කිරීම ආදිය යි. මානසික හිංසනයට අයත් වන්නේ බැන වැදීම, හාස්‍යයට හෝ නින්දාවට ලක් කිරීම, අපහාසයට පත් කිරීම ආදී වශයෙන් කාන්තාවන්ට පීඩා කිරීම යි. ලිංගික හිංසනය යනු කාන්තාවන් දූෂණය කිරීම, හිරි ඔතප් බිඳීම, බලහත්කාරකම් කිරීම යනාදිය යි. මෙසේ විවිධාකාරයෙන් කාන්තාවන් හිංසනයට ලක් වීම කෙරෙහි බලපෑම් කරන ප්‍රධාන සාධකය වන්නේ ඇය කාන්තාවක් වීම ය.

## ලිංගික ප්‍රචණ්ඩත්වය

මෙලෙස කාන්තාවක වීම හේතු කොටගෙන ම ස්ත්‍රියකට හුදු ස්ත්‍රීත්වය උපස්ථම්භක කොටගෙන ම නොයෙකුත් ආකාරයේ වූ පීඩාවන්ට, වධහිංසාවන්ට, අගතීන්ට මුහුණ පාන්නට සිදු වීම සමස්ත විශ්වයේ ම කාන්තාව සම්බන්ධයෙන් වූ පොදු නියාමනයකි. විශේෂයෙන් ම පුරුෂ මූලික වූ සමාජයක හුදු ස්ත්‍රියට හිමි වන්නේ දෙවන ස්ථානයේ වූ පුරවැසිභාවයකි. කුමනාකාර වූ කාන්තා සංවිධාන, කාන්තා ව්‍යාපාර තිබුණ ද කාන්තාව කෙතරම් ඉහළ වූ නිලතල ඉසුලුව ද ඇයට හිමි ව ඇත්තේ දූර්භාග්‍ය සම්පන්න වූ ඉරණමක් බව බොහෝ සමකාලීන පුවත් රාශියක් ඇසුරෙන් වුව ද තොරතුරු දැක්විය හැකි ය.

එවන් වූ කාන්තා චරිතයක් ප්‍රධාන කතා නායිකාව සේ ගෙන මොහාන් රාජ් මඩවල විසින් 2016 වසරේ දී රචිත රැජින නම් වූ නවකතාව ප්‍රස්තුත කොට ගනුයේ අනුලා හෙවත් ලංකාදීපයේ ප්‍රථම මහරැජිනගේ කතාව ය.

සද්ධාතිස්ස රජුගේ මුනුබුරෙකු වූ මහානාග රජුගේ බිසව බවට ප්‍රථමයෙන් පත්වන්නේ අනුලා බිසව ය. ක්‍රි: පූ: 47 දී අනුලා කුමරිය මහරැජින ලෙස අනුරාධපුර රාජධානියේ කිරුළු පළඳින්නේ ලාංකික ප්‍රථම අගරැජිනිය වශයෙනි. ආසියානු කලාපයේ ම ප්‍රථම මහරැජින වන්නේ ද අනුලා බිසව ය. මෙම නවකතාවෙහි කාලාවකාශය ක්‍රි: පූ: 47 සිට ක්‍රි :පූ: 42 අතර කාලයේ ලංකාදීපයේ සහ මිසරයේ සිදු වූ සිද්ධි සමුදායකි. එම සිද්ධි සමූහය කතුවරයා අතිශය නිර්මාණාත්මක අයුරින් ගොඩ නංවා තිබීම විශේෂත්වයක් ලෙසින් දැක්විය හැකි ය.

මඩවලට අනුව (2016:09)ඉතිහාසගත පුවත්වල අනුලා බිසව වූ කලී අතිශය රාගාධික කාන්තාවකි. ඇය පුරුෂයින් ගණනාවක් සමග සමහන් සුව විඳ, ඒ සියල්ලන් ම මරණයට පත් කළ, අතිශයින් දුෂ්ට වූ රාගාධික කාන්තාවකි. මෙහි කතුවරයා පෙරවදනෙහි දක්වා ඇත්තේ ඉතිහාසය නමැති අඳුරු ගල් ලෙනෙහි සිරගත කළ අනුලා නැමැති කාන්තාවගේ සත්‍ය වූ ජීවිතය හඳුනා ගැනීම සඳහා යම් ප්‍රබන්ධයක් මේ නිර්මාණය මගින් සිදු කරනා බව ය. කතුවරයාගේ උත්සාහය වී ඇත්තේ අලුත් ආලෝකයක් දල්වා අඳුරු ගල් ලෙනෙහි සිර කළ අනුලා නමැති ගැහැනිය සැබෑ ලෙස හඳුනා ගැනීම සඳහා මං පෙත් විවර කර දීම ය. නොඑසේ නම් දහසක් පිරිමි මැද අතරමං වූ ඇගේ අහිංසක ආදරයේ රහස් ඔබ සමග බෙදා හදා ගැනීම සඳහා ය.

> "මහාවංශකරුට අනුව එම අනුලා තොමෝ නීලිය නම් දෙමළ බමුණා කෙරෙහි රාගයෙන් ඇළුණා, ඔහු හා සහවාස කැමැත්ති ඒ දරකැටි තිස්ස රජු මරවා නීලිය බමුණාට රජය දුන්නා ය, (ශ්‍රී සුමංග, 2003:112).

මහාචාර්ය හේමචන්ද්‍ර රායි සංස්කරණය කළ ලංකා ඉතිහාසය අනුව පළමුවෙනි රැජින වූ අනුලා මුළු ස්ත්‍රී පක්ෂය ම නින්දාවට ලක් කළා ය. එක් සොර සැමියෙකුට පසු ව තවත් සොර සැමියෙකු ඝාතනය කළ ඇය තම කාමාශාව තෘප්ත කර ගනු සඳහා අන්තිමේ දී බලතුන් දෙතිස් දෙනෙකු ඇති ව සිටි බව කියනු ලැබේ.

කතුවරයා දක්වන පෙර සටහනට අනුව ක්‍රි: පූ: 543 විජය රජුගේ සිට ක්‍රි:ව: 1815 ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා වර්ෂ 2358 ක කාල පරිච්ඡේදයේ දී රජවරුන් 185 දෙනෙකු පමණ මේ රටේ රාජ්‍යත්වයේ සිටි බවට සාක්ෂ්‍ය ඇතත්, ඒ අතරින් කාන්තාවන් ඇත්තේ සිව් දෙනෙකු පමණ ය. ඒ අතරින් අනුලා රැජින සුවිශේෂ වන්නේ ඇය ලංකාදීපයේ පමණක් නොව ආසියානු කලාපයේ ද ප්‍රථම මහ රැජින වන නිසා ය.

මීට ප්‍රථම දැක්වූ පරිදි මහාවංශය ඇතුළු ඉතිහාස කතාවලට අනුව අනුලා බිසව ඉමහත් සේ ප්‍රසිද්ධියක් ඉසිලුවේ අධික කාමාශා සහිත වූ ස්ත්‍රියක වශයෙනි. මෙම නවකතාව සුවිශේෂ වන්නේ අනුලා නම් ගැහැනිය ව නිසියාකාරයෙන්


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හඳුනා ගැනීමට පාඨකයාට නව ප්‍රවේශයක් සකසා දීම සම්බන්ධයෙනි. ඉතිහාසකරුවා සිංහලයින් හා සම්බන්ධ වූ කතා පුවත ඉදිරිපත් කිරීමේ දී රාගාධික කාන්තාවක සේ නිරූපිත සුප්පා දේවිය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් සිංහබාහු වේදිකා නාටකයේ දී රාගය ප්‍රේමය බවට පරිවර්තනය කළා සේ මෙහිදී ද මඩවල ක්‍රියා කොට ඇති බව පෙනේ. සාම්ප්‍රදායික ආචීර්ණ කල්පිත මඩ ගොහොරුවෙන් වැසී තිබුණු අනුලා චරිතයට සාධාරණයක් ඉටු කරනු වස් මඩවල යම් දායකත්වයක් දක්වා ඇත. එසේ ම ඔහුගේ පරිකල්පන ශක්තිය හඳුනා ගත හැකි අවස්ථාවක් සේ සැලකිය හැකි ය. මොහාන්ගේ රැජින නවකතාවේ දී ඇය සැබවින් ම පෙම් කරනුයේ එක ම පුරුෂයෙකුට පමණි. එනම් යුවරජ තිස්සට පමණි. ඇය ඔහුගේ මරණින් පසු ව ජීවත් වන්නේ ද අතීත ප්‍රේමයේ ස්මරණයන් සමඟ පමණි. සැබෑ ප්‍රේමයේ මර්මදාවන් ඇයගේ චරිතයෙන් විදහා දැක්වීමට කතුවරයා උත්සුක වී ඇත. මනුෂ්‍ය ජීවිතයෙහි සැබෑ ප්‍රේමයෙහි ඉම් පෙදෙස් ඇය හඳුනා ගනු ලබන්නේ යුවරජ තිස්සගෙනි. එනිසා දිවි හිමියෙන් ම ඇය ඔහුට පෙම් කළ බව ප්‍රාණය නිරුද්ධ ඔහුගේ මළකඳ කල්තබා ගැනීමෙන් සනාථ වේ. ඉතිහාසයේ අන්ධකාරයෙන් වැසී ගිය අනුලා නම් සම්, මස්, නහර සහිත සැබෑ ගැහැනියගේ නිකැලැල් අධ්‍යාත්මය මතු කරලීමට මඩවල ගත් ප්‍රයත්නයේ විවිධාකාර වූ හැඩතල නවකතාවෙන් ඉස්මතු වන බව ද මෙහි තේමාව මූලික වශයෙන් ම ප්‍රේමය වන බව ද දැක්විය හැකි ය. තව ද මෙම නවකතාව අනෙකුත් ඓතිහාසික සිද්ධිදාමයෙන් සමුපේත වුව ද ඉස්මත්තට පැමිණෙනුයේ ස්ත්‍රී- පුරුෂ ප්‍රේමය බව දැක්විය හැකි ය.

මීට ප්‍රථම මඩවල ඔහුගේ සියලු කෘති සඳහා භාවිත කළ ඉන්ද්‍රජාලික යථාර්ථවාදී රීතිය සම්මිශ්‍රිත යථාර්ථවාදී රීතියක් මෙහි දී ද ඔහු අනුගමනය කොට තිබීම විශේෂත්වයකි. නවකතාව අවසන් වන්නේ ද ප්‍රේමයේ බරසාරත්වය අනාවරණය කරමිනි.

ප්‍රේමයේ ගැඹුරුතිබව, ගාම්භීරත්වය, ආදරණීයත්වය පරයා තවත් අතකින් රැජින නවකතාව මගින් ස්ත්‍රීත්වය හා බැඳුණු ඛේදනීයත්වයේ දෝංකාරය ද තැවරී ඇති බව හඳුනා ගත හැකි ය. එනම් ලිංගික ප්‍රචණ්ඩත්වය යි. මද්‍යසාර භාවිතයෙන් විකල් වූ මනසක් සහිත වූ කුඩාතිස්ස රජුගේ අගමෙහෙසිය වශයෙන් ද අනුලා බිසව ගැහැනියක වශයෙන් ද දැඩි පීඩනයට, වධ හිංසාවන්ට ලක් වූ වාර ගණන අනන්ත වූ බව නවකතාවෙන් කිය වේ.

සිරියහන් ගබඩාව භාර මහ නිලමේගේ අන්තේවාසිකයන් දෙදෙනාගෙන් කනිත් කොනින් ලද ආරංචි අනුව කුඩා තිස්ස මහ රජ්ජුරුවන්වහන්සේ මහ පාන්දර යාමය තෙක් ම මද්‍ය පානයෙන් සන්තර්පණය වී තිබේ. එසේ ම මධ්‍යම රාත්‍රී යාමයේ දී අග බිසව වූ අනුලා දේවියගේ කුටියෙන් මහරජ්ජුරුවන්ගේ වෛරීමත පිරුණු කෝප මිශ්‍රිත රෞද්‍ර කටහඬ ඇසී තිබේ. එපමණකු ද නොව මටසිලිටි රන්-රිදී මැටි භාණ්ඩ බිඳෙන විසිරෙන හඬත් අනුලා දේවියගේ හීන් කෙඳිරිලි ඉකි බිඳුම් හඬත් හෝරා කිහිපයක් තිස්සේ ඇගේ කුටිය පුරා දෝංකාර දී තිබිණ.

> "සැබැවින් ම මේ සිද්ධීන් කිසිවක් අහඹු, අලුත් ම සිදුවීම් නම් නොවේ. මහරජ්ජුරුවන් වහන්සේ මද්‍ය පානයෙන් සන්තර්පණය නොවන දිනයක් රජ වාසලේ සේවකයන්ට මතකයට නගා ගැනීම අසීරු ය. එසේ ම අනුලා දේවියගේ කුටියෙන් මහ රජ්ජුරුවන්ගේ රෞද්‍ර හඬ නෑසෙන දිනයක්, එහි රන් රිදී මැටි භාණ්ඩ බිඳී නොවිසිරෙන දිනයක් එසේත් නැතිනම් ඒ සද්ද බද්ද සියල්ල අහවර වීමෙන් පසු ඇගේ හීන් ඉකි බිඳුම් හඬ නොනැගෙන දිනයක් ගැන සිතීම පවා අසීරු ය" (මඩවල 2016:16).

ගැහැනියක වශයෙන් හුදු ස්ත්‍රීත්වයේ වේදනාව අනුලාගේ සිහින් කෙඳිරිලි හඬින් නිරූපණය වන අතර ම පුරුෂයාගේ දයාර්ද්‍රබවින් තොර මානසිකත්වය හේතුවෙන් රිදුම් දෙන ස්ත්‍රීත්වයේ දෝංකාරය ද අනුලාගේ චරිතයෙන් නිරූපණය වේ.

අනුලා බිසවගේ සුවච කීකරු සේවිකාව වූයේ මිත්තා ය. රජුගේ නොයෙකුත් අන්දමේ පහර දීම් හේතුවෙන් අනුලාගේ තැලුණු,සීරුණු ශරීර අවයවයන් තෙල් ගල්වා, පිරිමැද සුවපත් කර ලූයේ මිත්තා නම් සේවිකාව විසිනි. මෙනිසා මිත්තා හා අනුලා අතර නොබිඳෙනසුලු මිත්‍රත්වයක් මෙන් ම දැඩි සෙනෙහසක් ද හිතෛෂීවන්තභාවයක් ද නිරන්තරයෙන් ම ගොඩ නැගී තිබුණි. අනුලාට වඩා මිත්තා පස් වසරකින් වැඩිමහල් වුවා ය. එහෙත් ඇය තම දියණියක මෙන් අනුලා දැඩි සෙනෙහසකින් යුතු ව රැක බලා ගත්තා ය.

දූරිවියක වශයෙන් දහතුන් වන වියේ දී අනුලාට තම ළමා විය අහිමි වන්නේ මහානාග රජුගේ අගබිසව වීමත් සමග ය. ඉතිහාසය පිරික්සීමේ දී හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන ඛේදනීය ඉරණමකට මුහුණ දෙන කාන්තා චරිත සම්මුඛ වේ. දෝන කතරිනා හෙවත් කුසුමාසන දේවිය එසේ ඛේදනීය ඉරණමකට මුහුණ දෙන කාන්තාවකි. රාජ්‍යත්වය හේතු කොට ගෙන ළමා විය අහිමි වන කාන්තාවකි දෝන කතරිනා. මීට පහළොස් අවුරුද්දකට පමණ පෙර මේ රජමාළිගාවට සැපත් වන විට අනුලා දහතුන් හැවිරිදි වුවා ය. ඒ මහානාග රජ්ජුරුවන්ගේ අගබිසව ලෙස ය. මහසිළු මහතිස් රජුගෙන් පසු රජ වන විට ඔහු පනස් අවුරුද්දකට ආසන්න මැදි වියේ මිනිසෙකි. එහෙත් සොළොස් විය ඉක්ම වූ කිසි ම කෙල්ලකු ඔහු තම සිරියහන් ගබඩාවට වැද්ද ගත්තේ නැත. කෙසේ වෙතත් ඒ සියලු ම නාඹර කෙල්ලන් අතරින් මහානාග රජුගේ විශේෂ කැමැත්ත අනුලා වෙත යොමු වී තිබිණ. ඒ අනුලා එවකට දහතුන් හැවිරිදි කෙල්ලෙක් වූ නිසා ම හටගත්තක් නොවේ.

> "අනිත් බැල්ලියන්ට වැඩිය උඹේ තියෙනවා මහ අහංකාරකමක්......මං කැමති ඒකට" (මඩවල 2016:35).

දහතුන් හැවිරිදි වියේ දී තම ළමා විය අනුලාට අහිමි වන්නේ සිත් පිත් නැති රජුගේ ග්‍රහණයට ලක් වීමෙනි. අනුලාගේ චරිතය මෙහි දී කතුවරයා අතින් නිර්මිත වන්නේ පාඨක අනුකම්පාවට බඳුන් වන අයුරිනි. ළමා විය අහිමි ව ඇය ගැහැනියක බවට පත් වීමෙන් පසු දින හතක් පුරා කිසි


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ම ආහාරයක් නොමැති ව ඇය වැලපෙද්දී රිදුම් දුන් සිත සුවපත් කරන්නී එවකට දහඅට වැනි වියේ සිටි මිත්තා ය. එම සිදුවීමෙන් පසු අනුලා හා මිත්තා දැඩි හිතෛෂිවන්ත භාවයකින් හා අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතු ව ජීවත් වේ.

මහානාග රජුගේ මරණින් පසු 17 වියැති කුඩාතිස්ස රජ වේ. ඔහුගේ අග බිසව වන්නේ ද එවකට විසිපස් වැනි වියෙහි සිටි අනුලා ය. ගැහැනියක වශයෙන් කුඩාතිස්ස රජු යටතේ ද ඇය දැඩි පීඩනයට හා ලිංගික හිංසනයට ලක් වන අයුරු පාඨකයා මනාව වටහා ගනී. කොතරම් අධික ව නිදිමත දැනුණ ද රජු සිරියහන් ගබඩාවේ දොරට ගසන විට අනුලා එය විවෘත කර, වැඳ නමස්කාර කොට, රජුට සුදුසු අසුන් පැනවිය යුතු ය. රජු පැමිණෙන්නේ පියවි සිහියෙන් නොව අධික ලෙස මද්‍ය පානයෙන් බමන මතින් යුතු ව ය. එහි දී විකෘති කාමාශා සහිත වූ රජු අතින් ලිංගික වධහිංසනයට පත්වන්නී අනුලා ය. කාන්තාවක වශයෙන් ස්ත්‍රීත්වයේ ඛේදනීයත්වය කියා පාන ඉතා සංකීර්ණ චරිතයක් සේ අනුලාගේ චරිතය නිරූපිත ය. රජුගේ අණ පරිදි සියලු සළු පිළි ඉවත් කොට රජු ඉදිරියේ නිරුවත් වීමට සිදු වීම ඇය ව දැඩි මානසික වික්ෂෝභයට පත් කරවනසුලු අවස්ථාවකි.

> "අනතුරු ව ඇරඹෙන්නේ බියෙන් සලිත වන ඇගේ සිරුර නරඹමින් ඔහු කෙරෙන් මතු වන අසාමාන්‍ය සිනා හ යි.ඒ සිනා හඬ අතර මැද විටෙක ඔහු නැඟිට ඇය අසලට ගොස් තම අත දරාගෙන සිටින මධු කුසලානයේ මත් වතුර ඇගේ හිසේ සිට පාදාන්තය තෙක් හලයි. එවිට තෙත බරිත වන ඇගේ සිරුර දෙස බලා රජු හයියෙන් සිනාසෙයි. එසේත් නැතිනම් හිඳගෙන සිටින ආසනය මත සිට අර මධු කුසලානය ඇය වෙත දමා ගසයි" (මඩවල 2016:49).

මෙලෙසින් ඇය කායික ව මෙන් ම මානසික ව ද සිරියහන් ගබඩාවේ දී පීඩනයට හසු වන ආකාරය ස්ත්‍රීත්වයෙහි ශෝචනීය ස්වාභාවය සමඟ සමපාත වන අවස්ථා කිහිපයක් ම අනුලාගේ චරිතය ඔස්සේ විවරණය කළ හැකි ය.

ස්ත්‍රීත්වය හා සබැඳුණු ඛේදනීය ස්වභාවය හෙළි වන තවත් සංසිද්ධියක් වශයෙන් එවකට තිස් තුන් වැනි වියෙහි සිටි මිත්තා නම් අනුලා බිසවගේ ළබැඳි ම දාසිය රජු අතින් කුරිරු ලෙස දූෂණයට ලක් වන අවස්ථාව දැක්විය හැකි ය. ස්ත්‍රී දූෂණය යනු කාන්තාවන් කෙරෙහි ප්‍රචණ්ඩත්වය ප්‍රකාශ වන තවත් ක්‍රමයකි. කාන්තාවගේ පූර්ණ කැමැත්තකින් තොර ව යම් පුරුෂයෙක් ස්ත්‍රියක් ලිංගික කාර්යයන් සඳහා යොමු කර ගනී නම් එය ස්ත්‍රී දූෂණයක් ලෙස දැක්විය හැකි ය. ඇය තදබල ලෙසින් රජු වෙතින් අපයෝජනයට ලක් වෙමින්, රුධිරය වගුරවමින් මළ කඳක් මෙන් අනුලා ඉදිරියේ ක්ලාන්ත වී බිම වැටේ. ඇයගේ සිරුරේ සීරීම් තුවාල හා රුධිරය දැක අනුලා වේදනාවෙන් හැඬුවා ය. ඉන් පසු මිත්තාගෙන් මෙම අපරාධය කළ තැනැත්තා කවුරුන් දැයි වටහා ගන්නා අනුලා රජු බැහැ දැකීමට පිටත් වේ.

මීට ටික වේලාවකට කලින් ඔබතුමා අතින් දූෂණය වෙච්ච අර මිත්තා කියන දාසිය මැරෙන්ඩ යනව. ඉතිං තී කියන්නේ මැරෙන්න යන පර බැල්ලියෙකුට මට පණ දෙන්ඩ කියල ද........

අනික තී කවුද මං කරන වැඩ ගැන මාත් එක්ක කට ගහගෙන එන්ඩ....

> "රජු තවත් පියවරක් ඉදිරියට තැබුවේ ය. ඊළඟට තම දකුණු පය ඔසවා දණ බිම ඔබා ගෙන සිටින ඇයට වැරෙන් පා පහරක් ගැසුවේ ය. එය කෙතරම් වේගවත් පහරක් වීද යත් ඇය උඩින් විසි වී ද්වාරය අසල බිත්තියේ වැදී බිම ඇදගෙන වැටුණා ය.නැවත වේගයෙන් ඇය අසලට ගිය ඔහු වමතින් ඇගේ කෙස් වැටියෙන් අල්ලා ඉහළට එසෙව්වේ ය. පසු ව ඇය දකුණතින් අතමිට මොළවා ඇගේ කම්මුල් දෙකටත් පපුවටත් පහර පිට පහර එල්ල කළේ ය. ඊළඟට නැවත ඇගේ සිරුර ඔසවා හිස බිත්තියේ ගසා කෙස් වැටියෙන් බිම දිගේ ඇදගෙන ඇවිත් හරියටම කුටිය මැද මිය ගිය හිවල් කඳක් වගේ අතහැර හයියෙන් හතිලමින් මෙසේ කීවේ ය" (මඩවල 2016:66).

> "බොල පරට්ටි තී දන ගනින් තී කතා කරන්නේ මේ රටේ මහරජ්ජුරුවන්ට විත්තිය.....මට ඕන ගෑනියෙක් මං ගේනව මගේ සිරියහන් ගබඩාවට.......මොකද උන් ඉපදිලා තියෙන්නේ ඒකට" (මඩවල 2016:66).

මෙලෙස බලය හා පුරුෂාධිපත්‍යය හමුවේ ස්ත්‍රියකගේ ඉරණමෙහි ස්වාභාවය මනුෂ්‍යත්වයට තරම් නොවන අයුරින් මඩවල රැජිණ නවකතාව මඟින් මතු කරනුයේ ලිංගික ප්‍රචණ්ඩත්වය සහ කාන්තා පීඩනය යන්නෙහි උච්චතම අවස්ථාවක් දනවමිනි.

එම්මින්ද වෙලගෙදර විසින් රචිත 'සක්කාරං' නවකතාවෙහි ද ලිංගික ප්‍රචණ්ඩත්වය හා කාන්තාව සම්බන්ධ ව කරුණු ඇතුළත් ය. සුබේ ගුරුන්නාන්සේගේ බිරිඳ වූ රතී පිළිබඳ ව සිත් ඇති ව කටයුතු කරන බස්නායක නිලමේ ඉතාමත් උපක්‍රමශීලී ව ඇය ව සිය ග්‍රහණයට ගනී. සුබේ ගුරුන්නාන්සේ යනු බෙරවා කුලයට අයත් දළදා මාළිගාවෙහි පෙරහැරෙහි නර්තන ශිල්පය බාර ව කටයුතු කරන ප්‍රධාන පුද්ගලයා ය. ඔහු එම ශිල්පයෙහි කෙළ පැමිණියෙකි. ඔහු මාළිගාවෙහි පෙරහැර කටයුතුවලට පිටත් ව ගොස් සිටින අවස්ථාවක දී බස්නායක නිලමේ රතී ව සිය කායික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා යොදා ගනී. කාන්තාවගේ පූර්ණ අනුමැතියකින් තොර ව ලිංගික කටයුතු සඳහා උපයෝගී කොට ගැනීම ලිංගික ප්‍රචණ්ඩත්වය යන කරුණ සනාථ කරවන අවස්ථාවකි.

> "මනෝවිද්‍යාව අනුව ලිංගික ප්‍රචණ්ඩත්වය යනු තර්ජනාත්මක ව බලය පාවිච්චි කිරීමෙන් හෝ අනෙක් පුද්ගලයාගේ කැමැත්තකින් තොර ව එම පාර්ශවය සමඟ සංවාසයේ යෙදීම හෝ ලිංගික ස්පර්ශයන් ය. එය වාචික හෝ වාචික නොවන කුමක් හෝ ආකාරයක ලිංගික ස්පර්ශයක් හෝ අවධානය ඉල්ලීමක් වේ" (කුමාරනායක 2016:212).


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ශිව නම් දොරටු පාලකයා විසින් කුඩාතිස්ස රජුගේ සුරා පානයට වස මිශ්‍ර කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජු මිය යයි. ඉන් පසු ලංකාද්වීපයේ රාජ්‍යත්වය හිමි වන්නේ අනුලා බිසවට ය. එලෙසින් අනුලා බිසව ලංකාවේ ප්‍රථම මහරැජිනිය බවට පත් වේ. කෙසේ නමුත් නවකතාව අවසන් වනුයේ විෂ මිශ්‍රිත මිදි පානය අනුලා බිසව විසින් පානය කරනු ලදුව ඇය ජීවිතක්ෂයට පත් වීමෙනි. තතු කෙසේ වුව ද රැජින නවකතාව හුදු රසාලිප්ත කතාන්තරයක් පමණක් නොවී බහුමාන කියවීමකට ලක් කළ හැකි වීම විශිෂ්ට ලක්ෂණයක් සේ දක්විය හැකි ය. ඒ අනුව නවකතාවෙහි තේමාත්මක අන්තර්ගතයන් තුනක් අපට හඳුනාගත හැකි ය.

- පුරුෂාධිපත්‍යයට යට වුණු සමාජයක ස්ත්‍රියගේ ඛේදවාචකය.
- රාජ්‍ය තාන්ත්‍රිකභාවය හා මානුෂිකත්වය අතර අනවරත ගැටුම.
- ජාතිවාදය හා මිනිස්කම අතර දේශපාලන හැසිරීම (දිවයින 2017.5.20).

**ගබ්සාව**

ගබ්සාව යනු ස්ත්‍රියකගේ ගර්භණීභාවය හිතා මතා ම සාහසික ලෙස විනාශ කිරීම ය. නැතහොත් කෘත්‍රිම වූ ක්‍රම භාවිත කොට කාන්තාවකගේ ගර්භාෂගත කළලය විනාශ කොට දැමීම ය. ශ්‍රී ලංකාවෙහි ගබ්සාව නීතිගත කොට නොතිබුණ ද කාන්තා පාර්ශ්වයෙන් එය යම් යම් අවස්ථාවල දී අවශ්‍ය වන බව හඳුනා ගත හැකි ය. විශේෂයෙන් ම යම් කාන්තාවකගේ අවසරයෙන් තොර ව බලහත්කාරයෙන් වන ලිංගික ක්‍රියාවලියක දී හට ගන්නා කළලය ගබ්සා කිරීමේ අවශ්‍යතාව අත්‍යන්තයෙන් ම එම කාන්තාවට ඇති වේ. එවන් අවස්ථාවල දී කිසිදු නීතිමය පිළිසරණක් කාන්තාවකට හිමි නොවේ. ගැබ විනාශ කර ගැනීම සඳහා නොයෙකුත් අයථා විධි ක්‍රම අනුගමනය කිරීමට යෑම බොහෝ විට ජීවිත අනතුරුවලට මග පාදා දෙයි. තවත් විටෙක එම කාන්තාවට ජීවිත කාලයෙහි ම දරුවන් නොමැති ව සිටින්නට පුළුවන. එමෙන් ම සමාජයීය වශයෙන් කාන්තාවකට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා අපමණ ය. පියෙකු නොමැති දරුවෙකු සමාජගත කිරීමේ දී ශ්‍රී ලාංකේය සමාජ පරිස්ථිතියේ දී බෙහෙවින් අවමන් විඳිය යුතු තත්ත්වයකි. මෙවැනි සියලු කර්තව්‍යයන්ට මුහුණ දීමට සිදු වන්නේ කාන්තා පාර්ශ්වයට පමණි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතු කොට ගෙන, ස්ත්‍රියට දෙවන ගණයේ පුරවැසියෙකු සේ ලැබෙන තත්ත්වය එතරම් සුභවාදී නොවේ. එබැවින් බොහෝ කතුන් නිත්‍යානුකූල නොවන මගකින් පිළිසිඳගත් දරු කළල ගබ්සා කිරීමට පෙළඹීමේ ප්‍රවණතාවක් පවතී.

> "ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ පහළොස්වන පරිච්ඡේදයේ ගබ්සා කිරීම වරදක් ලෙස හඳුන්වා ඇති අතර ඊට දඬුවම් ද නිර්දේශ කොට තිබේ. ගබ්සා කිරීම (Miscarriage)ල නූපන් දරුවන්ට තුවාල සිදු කිරීම (Injuries to unborn children)ල දරුවන් අත්හැර යාම (the exposure of infants) සහ දරු උපත් සැඟවීම (The concelment of births) යන වගන්තිය යටතේ ගබ්සාව තහනම් කොට දඬුවම් නිර්දේශ කොට තිබේ" (රාජපක්ෂ 2016:231).

තව ද,

> "ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයට අනුව ගර්භය මෝරා ඇති, එසේ ම නොඉපදුණු දරුවෙකු මරණයට පත් කිරීම සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් ලෙස සලකා ඊට දඬුවම් නිර්දේශ කොට තිබේ. මේ අනුව බලන විට ශ්‍රී ලංකාවේ නීතිය අනුව ගබ්සාව යනු දඬුවම් ලැබිය යුතු වරදක් බව පැහැදිලි වේ. මෙහි දී නීතියෙන් ඉඩකඩක් සපයා දී ඇත්තේ අදාළ ස්ත්‍රියගේ කැමැත්ත සහ ඇයගේ ජීවිතය ආරක්ෂා කිරීමේ අරමුණින් පමණක් සිදු වන ගබ්සාවලට පමණි. එබැවින් පොදුවේ ගත් කල ගබ්සාව යනු ශ්‍රී ලංකාව තුළ දඬුවම් ලැබිය හැකි වරදකි" (2016:234).

මෙලෙස නීතිය මගින් ගබ්සාව සඳහා බොහෝ දුරට ඉඩකඩ ඇහිරී තිබෙන නමුදු නීති විරෝධී ලෙස ලාංකේය සමාජයෙහි මෙම තත්ත්වයට මුහුණ දෙන කාන්තාවෝ බෙහෝ වෙති. මෙම ප්‍රශ්නය සමකාලීන සමාජ ව්‍යුහය මගින් ම ඇතිකළ ගැටලුවක් බැවින් අද්‍යතන නවකතාකරුවා ද එවැනි තතු තම නිර්මාණ සඳහා වස්තුවිෂය කොට ගැනීමට අවකාශ ලැබී ඇත. මෙම පර්යේෂණය සඳහා තෝරා ගත් නවකතාවන්හි නිරූපිත කාන්තා චරිත කිහිපයක් ම ද මෙවැනි අර්බුදකාරී වාතාවරණයකට මුහුණ දුන් අය වෙති. එයට අමතර ව 70, 80, 90 යන දශක පුරා ලියැවුණු නවකතාවන්හි ද ගබ්සාව නම් ප්‍රපංචය හමුවේ දුර්භාග්‍යසම්පන්න වූ ඉරණම්වලට මුහුණ දුන් කාන්තාවන් පිළිබඳ ව ලියැවී ඇත. ඒ අතරින් සුමිත්‍රා රාහුබද්ධ විසින් 1979 වසරේ දී රචිත උදානය නවකතාවෙහි එන අමරා ද අනුල ද සිල්වා විසින් 1999 වසරේ දී රචනා කරනු ලැබූ සූකර වස්තුව නවකතාවෙහි නිරූපිත කුසුමලතා ද ශාන්ති දිසානායක විසින් 1999 දී රචිත 'වරාමල්' නවකතාවේ එන ආරියවතී ද ඇය විසින් ම 2000 වර්ෂයේ දී රචිත අග්නි නවකතාවෙහි එන බාල මැණිකා ද 2003 දී ඇයගේ ම සංග්‍රාමය නවකතාවෙහි නිරූපිත යසරත්න මැණිකේ ද විශේෂයෙන් සඳහන් කළ හැකි කාන්තා චරිතයෝ වෙති. ඔවුනට විවිධාකාර වූ කායික හා මානසික පීඩනයන්ට ගොදුරු වන්නට සිදු වන්නේ හුදු ස්ත්‍රීත්වය ම හේතුවෙනි.

ස්ත්‍රීත්වය හා බැඳුණු ඛේදනීයත්වය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී අපගේ අවධානයට ලක් විය යුතු තවත් එක් නවකතාවක් වශයෙන් සුමිත්‍රා රාහුබද්ධ විසින් ලියන ලද කන්දක් සේමා දක්විය හැකි ය.

මෙහි කතා නායිකාව නූපා නම් වූ විසිපස් හැවිරිදි කාන්තාවකි. නවකතාව නාභිගත කෙරෙනුයේ නූපාගේ දෘෂ්ටි කෝණයෙනි. නවකතාව ආරම්භ වනුයේ නූපාගේ නූපන් ළදරු කළලය ගබ්සාවකින් ඉවත් කිරීම සඳහා යොමු කෙරෙන අවස්ථාවකිනි. නූපන් ළදරු කළලයේ සංකේතීය


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පියා සුමල් නම් වූ, වීසා නොමැති ව රැකියාවක් සොයා ගැනීම පිණිස ජපානය වෙත ළඟා වූ වයස අවුරුදු තිහක පමණ වූ කඩවසම් තරුණයෙකි. ලාංකේය සමාජ ආර්ථික පරිසරය විසින් පිටමං කරනු ලැබූ නූපා අවසානයේ දී තම සහකරු වශයෙන් තෝරා ගනු ලබන්නේ ගොවි පවුලකින් පැවත එන, නූපාට වඩා බෙහෙවින් ම වයස්ගත වූ ජපන් ජාතික මිනිසෙකි. මෙම නවකතාවෙහි නිරූපිත නූපා ගෝලීය ධනවාදය හමුවේ තම ජීවිතය ම උකස් කොට ජපානය වෙත පිය නැගූ තරුණියකි. ජපානය යනු ආර්ථික සමෘද්ධිය අංශයෙන් ලෝකයේ දෙවන ස්ථානයට හිමිකම් කියනු ලබන රට වීම ද මෙහි විශේෂත්වයකි. කන්දක් සේමාහි පසුවදන මඟින් ම විශද වන්නේ ස්ත්‍රීත්වය හා සම්බන්ධ වූ ශෝකාලාපයෙහි අංශු මාත්‍රයක් මෙන් ම නූපා නම් තරුණියගේ ජීවිතයෙහි ඇතුළාන්තය යි.

නූපා ජපානයේ නීගතාවට යන්නේ සකුරා මල් පිපුණු අරුමය බලන්න නෙවෙයි. තමුන්ගේ රටේ සමාජ ආර්ථිකයයි, සංස්කෘතියයි, දේශපාලනයයි නූපාව ජපානයට පිටුවහල් කරනවා. නූපා නීගතාවෙ සන්ජෝ නගරයේ සැරිසරන්නී කවුරුහරි සොරා ගත්තු තමන්ගෙ තරුණ ජීවිතය නැවත සොයා ගන්නයි. සුමිකාව පරම්පරාවේ මළවුන් ඇවිත් ලංකාවෙන් ආව ඥාතියා ප්‍රතික්ෂේප කළාට සන්ජෝ නගරයේ සැරිසරන්නිය නගරයටයි එහි සංස්කෘතියටයි බද්ධ වෙනවා.

“පෙකණිවැලේ එල්ලිච්ච පුංචි කළල දෙකක් උපන් රටේදියි දීග ගිය රටේදියි එළියට ඇදලා දානවා.. මේ සැරිසරන්නිය සොයා යමු.......” (රාහුබද්ධ 2010:06).

නවකතාව ආරම්භ වන්නේ මීට ප්‍රථම දක්වූ පරිදි නූපා දෙවන වර ගබ්සාවකට මුහුණ දෙන අවස්ථාවක් පාදක කොට ගනිමිනි. ඇය ප්‍රථම වර මෙවැනි ම වූ කටුක යථාර්ථයකට මුහුණ දෙන විට වයස අවුරුදු දාහතක ළාබාල තරුණියකි. එම නූපන් කළලයේ හිමිකරු ඇයගේ පෙම්වතා වූ ජයනාථ ය. ජයනාථට තමා ව විවාහ කර ගන්න යැයි නූපා ඇවිටිලි කළ ද ඔහු යෝජනා කරනුයේ“ළමයා නැති කරමු” යනුවෙන් ය. සමස්ත කාන්තා පාර්ශ්වය ම හුදු කාන්තාවන් වීම හේතු කොට ගෙන ම මුහුණ දෙන්නා වූ මනුසත් බවට තරම් නොවූ කර්තව්‍යයක සැබෑ යථාර්ථය නූපාගේ දෘෂ්ටි කෝණයෙන් කතුවරිය ඉදිරිපත් කරන්නේ මෙසේ ය.

> “මට බැඳිල්ලක් ඕන නෑ මේකෙන් නිදහස් වෙන්න ඕන මම කිව්වා. ජයනාථ දොස්තර කෙනෙකුගෙ ගුබ්බෑයමකට මාව එක්කගෙන ගියා. මං වගේ තව කීප දෙනෙක් ඇවිත්. කවුරුවත් කාගෙවත් මුහුණ බැලුවේ නැහැ. ඔක්කොම හිටියෙ කළ පවක් පඩිසන් දීලා ඉවර වෙන තැනකට ආවා වගේ. මහා අද්භූත ගතියකුත් එතැන තිබුණා. තලත්තැනි ගෑණු කෙනෙක් ඇහුවා මගේ වයස කීය ද කියලා.මම කිව්වා විසිතුනයි කියලා. පහළොවක් විතර ඇති කියලා මං හිතුවෙ කියලා ඒ තැනැත්ති කිව්වා. මේ ඔක්කොම ඇවිත් ඉන්නේ ප්‍රාණඝාතයට. උදේ එන්න පිටත් වෙන්න ඉස්සෙල්ලත් පන්සිල් ගන්න ඇති. සියලු ම දෙවි දේවතාවුන් වඳින්න ඇති. අන්තිමේ දි ප්‍රාණඝාතය කරන්න සිද්ධ වෙන්නේ පුරුෂයාට නෙවෙයි ස්ත්‍රියට. පුරුෂයා අනුබල දෙනවා. ස්ත්‍රිය අවනත වෙනවා. කොහොමටත් ස්ත්‍රියට දීලා තියෙන්නෙ අවනත වීමේ මානසිකත්වය. නූපා උඹට ඒකෙ වෙනසක් වෙන්නෙ නෑ කියලා ඇතුළු හිත කිව්වා” (රාහුබද්ධ 2010:21).

කාමී පුරුෂයින්ගේ ලාලාසාවන් ඉටු කිරීමට යාමේ දී හා සුපුරුදු ස්ත්‍රීත්වයේ මුග්ධත්වය හේතු කොට ගෙන අභාග්‍යසම්පන්න වූ අනාගතයකට මුහුණ දෙන කාන්තාවන්ගේ සංකේතයක් බඳු නූපා නීති විරෝධී ගබ්සාවකට මුහුණ දීමට යාමේදී පවා නැවත ගොදුරු වන්නේ එම වෛද්‍යවරයාගේ ලිංගික ආශාවන් තෘප්ත කිරීමට ය. ස්ත්‍රීත්වයේ නිරුදක යථාර්ථය නූපා තව දුරටත් මෙලෙස හෙළි කරනුයේ තව දුරටත් ස්ත්‍රිය වනාහි දෙවන ගණයේ පුරවැසියා බවත්, පුරුෂාධිපත්‍යයේ ගොදුරක් බවත් ගම්‍යමාන කරවමිනි.

> “ජයනාථ නිවට නියාලු තාලෙන් මාව ඇතුලට එක්කරගෙන ගියා. මීවනපලාන බටහිර දොස්තරෙක්ද? ආයුර්වේද දොස්තරෙක්ද? කියලා මං දැනගෙන හිටියෙ නැහැ. ජයනාථ එළියට ගියා. දොස්තරට උදව්වට කවුරුත් නෑ. දොස්තර ප්‍රශ්න ඇහුවා. කොච්චර කල් ද? අරකද? මේකද? ඊළඟට පරීක්ෂා කළා. දොස්තරගේ මූණ මට පෙනුණෙ දහඅට සන්නියෙන් එක සන්නියක මුහුණක් වගේ. දතක් එළියට ඇවිත් තිබුණා. මම ඇස් දෙක පියා ගත්තා. මම ආතුරයා දොස්තර කපුවා. කපුවා ආවේශ වෙලා. ආතුරයාට වින කරන්නෙ යක්ස දිෂ්ටිය. ඒ යක්ස දිෂ්ටිය කියන්නෙ මගේ බඩ ඇතුළෙ....... කපුවා ආතුරයාගෙ පපුවට නැඹුරු වුණා. ආතුරයා හිතුවා ඒකත් තොවිලෙ කොටසක් කියලා. කපුවා ආතුරයාගෙ ළමැදට මූණ ඔබා ගත්තේ ඊළඟට හත් මාසයක් වතුර පොදක් නොදක්ක පිපාසිතයෙක් වගේ.එළදෙනකගෙ තන බුරුල්ල බලෙන් අල්ලගෙන උරාබොන ගොපල්ලෙක් වගේ තන පුඩු විකන්න පටන් ගත්තා....ඒ වියරුව සංසිඳුනට පස්සෙ දොස්තර එම දේ අයින් කළා. කොන්ද කට කට ගාලා ගැහෙන්න පටන් ගත්තා” (රාහුබද්ධ 2010:22).

දෙවන වර මෙවැනි ම වූ අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ දීමේ දී ඇය ජීවත් වූයේ ජපානයේ ය. එවකට ඇය මසායා සුමිකාවා නම් ජපන් ජාතිකයා හා විවාහ වී එක් දියණියකගේ මවක ද වූවා ය. ජපානයේ නීගතාවට පැමිණ ජපන් ජාතිකයෙකු හා විවාහ වී ආදරණීය දිවියක් අපේක්ෂා කළ නූපාට තමා අපේක්ෂිත සෙනෙහස නොලැබී යාමෙන් ඇය දැඩි සේ අපේක්ෂාභංගත්වයට පත් වන අතර අහිමි සෙනෙහස සොයා ගොස් මංමුලා වූ කාන්තාවක් බවට පත් වේ. ආශාව පසුපස හඹා ගොස් එහි ම ගොදුරක් බවට පත් වූ කාන්තාවකි නූපා. නවකතාව ආරම්භ වන්නේ සුමල් නම් තරුණයාට දාව ගැබ් ගන්නා දරුවා නූපාගේ නීත්‍යානුකූල


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ස්වාමියාගේ අවසරය මත ඔහුගේ මුදලින් ඉවත් කිරීමේ සැත්කමට නූපා මුහුණ දෙමින් සිටින අවස්ථාවකිනි. ස්ත්‍රී කායික ශරීරය වධ වේදනා ලබමින් මානසික ව දැඩි කායික ආතතියකට හසු වන පරිදි මෙම අවස්ථාවන් ඉදිරිපත් කර තිබේ. දරුවා කෙසේ හෝ බිහි කර රැක ගැනීමට දැඩි සේ නූපා ප්‍රයත්න දැරුව ද, සුමල්ගෙන් ඊට අනුබලයක් නොලැබෙන්නේ ඔහු එවකට විවාහක පුද්ගලයෙකු වූ බැවිනි. අනෙක් අතින් නූපාගේ ජපන් ජාතික සැමියා තමාගේ නොවන දරුවෙකු තම වහලය යට ඇති දැඩි වීමේ අප්‍රසන්න සහගතබව නිරන්තර ප්‍රකාශ කළ අතර දරුගැබ ඉවත් කර ගන්නේ නම් පමණක් තමාගේ වහළ යට ජීවත් විය හැකි බව අවධාරණය කිරීමෙන් පසු වෙනත් කළ හැකි විසඳුමක් නූපාට නොවූ බැවින් ඇය මෙම තීරණයට එළඹියා ය.

> “පළවැනි වතාවේ මේ දේම සිද්ද වෙනකොට මගේ වයස අවුරුදු දාහතයි. එතකොට හිටියෙ ලංකාවෙ. ඉස්කෝලෙ යන කාලෙ. ඒක තමයි මුල. ඒක විතරකුත් නෙවෙයි තව හුඟක් දේවල්, මේ දෙවනි වතාව. මම ඉන්නෙ නින්දෙන් ද අවදියෙන් ද කියල දන්නෙ නැහැ. සිහි ඇත්තෙත් නැති නැත්තෙත් නැති අමුතු පාවෙන ගතියක් හීනෙන් ද? හැබැහින් ද? සිහි නැති කරන්න ඇති. ඊත් සිහිය වළාකුලක් වගේ මගේ හිස වටේ කරකැවෙනවා…….එයා මගේ දරුවා. ඉපදුණේ නැති දරුවා…මූණ කට හොඳට වෙන් වෙලා හැදිලා වැඩිලා තිබුණා. පෙකණිවැල තාම මගේ දරුවව මට අල්ලලා දීලා තිබුණා” (රාහුබද්ධ 2010:1).

මෙලෙස කාන්තාවක වීම හේතුවෙන් ද සුපුරුදු ස්ත්‍රීත්වයෙහි පවත්නා ආශාවන්ට අවනත වීමෙහි හේතුවෙන් ද නූපා දැඩි සේ මානසික ව ගිලන් වන අයුරු හඳුනා ගත හැකි ය.

නූපාගේ පියා කාන්තාවන් දෙදෙනෙකු හා විවාහ වූ අයෙකි. ප්‍රථම විවාහයේ බිරිඳ ලොකු ප්‍රේමා වූ අතර දෙවන විවාහයේ භාර්යාව පොඩි ප්‍රේමා නම් වූවා ය. නූපා පොඩි ප්‍රේමාගේ දියණියකි. නවකතා කතුවරිය මෙහි දී පෙම්බරා නමින් අවිඥානික තලයක් ඔස්සේ නූපාගේ බලාපොරොත්තු සිහින හා ප්‍රාර්ථනා හෙළි කරන අවස්ථාව නවකතා ශිල්ප ධර්ම පාර්ශ්වයෙන් වැදගත් අවස්ථාවක් සේ සනිටුහන් කළ හැකි ය.

> “පෙම්බරා නුඹ පලකයෙහි හිඳගෙන වීණාව වාදනය කරයි. ඒ සිහිනයෙහි සැතපෙන කුමරිය මම වෙමි. අහසෙහි පලකයක් බැඳගෙන ආලය කරන්නේ කිම ද? මා නොරවටන්නේ ඔබ පමණකි. මගේ ළය මත ඔබේ හිස පොවන දවස නොව ඔබේ ළය මත මගේ හිස තබා ගන්නා දවස උදා කර දෙන්න. ගත ද සිත ද සතප්පාගෙන සැණෙකින් පැන යන පෙම්වතුන් අතරෙහි සැඟවී නොයන්න. සිහිනය සහ බලාපොරොත්තුව සැබෑව සහ යථාර්ථයට වඩා මට අගනේ ය. පෙම්බරා පලකයෙහි ම හිඳින්න” (රාහුබද්ධ 2010:59).

නූපා පෙම්බරා නමින් කරන ඇමතුම නූපාගේ ම අවිඥානයට අවරෝධනය කරනු ලබන සිතුවිලි මාත්‍රාවක් බව පෙනේ. ඇය සැබවින් ම ජීවිතයෙන් ප්‍රාර්ථනා කරනු ලැබූ සියල්ල පෙම්බරා නම් රූපකයෙහි ස්ථානගත වී ඇත. ඇයගේ සිතෙහි නොවිසඳුණු ආශාවන් හා ඉටු නොවුණු අපේක්ෂාවන් පාඨකයාට හඳුනා ගත හැකි මානය වන්නේ පෙම්බරා නම් සංකල්ප මාත්‍රයෙනි. විශේෂයෙන් ම නූපා සිය විවාහයෙන් සෙනෙහස සහ ප්‍රේමය බලාපොරොත්තු වුව ද වියපත් ස්වාමියා වෙතින් එය නොලැබී නූපාගේ බොළඳ ස්ත්‍රී ආත්මය හඬා වැටුණු අවස්ථා මෙහි දී හඳුනා ගත හැකි ය.

> “සැබැවින් ම ප්‍රේමය යනු විෂයයාගේ නාසිස්මික (ආත්මරාගී) වූ සබඳතාවක් ලෙස ලැකානියානු වහරෙහි නිර්වචනය කෙරේ. ප්‍රේම කිරීමට වීම යනු අහමාදර්ශය (Ideal ego) පෝෂණය කරන්නා වූ නාසිස්මික රූපය හඳුනා ගැනීමකි.(image)එනම් ප්‍රේමයෙන් ආතුරවන විට අපි අපගේ ප්‍රේමයේ වස්තුව (Object of Love) අහමාදර්ශය තුළ ස්ථානගත කරන්නෙමු. අප මේ වස්තුවට ප්‍රේම කරන්නේ අපේ ම ආශාව සම්පූර්ණ ව තිබීමේ වුවමනාව නිසා ය. කෙසේ වෙතත් මේ ප්‍රේමයේ යාන්ත්‍රණය කෙනෙකුගේ පරමාදර්ශ ස්වභාවය ඉක්මවා යන්නක් ලෙස අපට හඳුනා ගැනීමට සිදු වේ. ප්‍රේමය පිළිබඳ ව ලැකාන් නමැති මනෝ විශ්ලේෂකයාගේ සුප්‍රසිද්ධ නිර්වචනයකට අනුව ප්‍රේමය තුළ විෂයයා දෙන්නේ තමා සතු නොවූ කිසිවකි” (වික්‍රමආරච්චි 2009:14).

පෙම්බරා නමින් කතුවරිය නූපාගේ අවරෝධනය කරනු ලැබූ සිතුවිලි හා අදහස් ඉදිරිපත් කරන අවස්ථාව එක් අතෙකින් විඥානධාරා රීතියේ ම දිගුවක් ලෙසින් සැලකිය හැකි ය.

> “ජේම්ස් ජොයිස් විසින් හඳුන්වා දෙනු ලැබූ රීතියෙහි ම උච්ච අවස්ථාවක් සේ මෙම අවස්ථාව සැලකිය හැකි ය. පාඨකයාට නවකතාවෙහි එහි ඒකාකාරීත්වයෙන් මිදීම සඳහා ද මෙම පෙම්බරා නම් වූ ටූලය (tool) භාවිත කොට ඇති අන්දමින් පසක් වන්නේ නවකතා ශිල්ප ධර්ම පාර්ශවයෙන් ඇයගේ පරිණත වූ ඥානය යි” (වික්‍රමආරච්චි 2009:193).

මෙම නවකතාවෙන් එක්තරා දුරකට ලාංකේය සමාජ - ආර්ථික විශ්ලේෂණයක් සිදු වී ඇතැයි කිව හැකි ය. වියපත් ජපන් ජාතිකයින් හා විවාහ වන තාරුණ්‍යයේ සිටින ලාංකේය ස්ත්‍රීන්ගේ ආධ්‍යාත්මික තතු මනාව අනාවරණය වන පරිදි ස්ත්‍රී චිත්තයෙහි පතුළ ස්පර්ශ කරමින් ඔවුන් මුහුණ දෙන සැබෑ මානව ඛේදවාචකයෙන් පැතිකඩක් නිරූපණය වනුයේ විවාහ සංස්ථාවෙහි ස්ත්‍රිය පෙළෙන හරසුන් යථාර්ථය කටුක ලෙස අනාවරණය වන පරිදි ය. තාරුණ්‍යය පිරී ඉතිරී යන තරම් යෞවනත්වයෙහි සිටි නූපා හැරුණු විට රෝසි නමැති කාන්තාව ද සිතින් මෙන් ම කයින් ද සෙනෙහස බලාපොරොත්තු ව ජීවිතය යදින අයුරු ඉතා සංවේදී අවස්ථා වශයෙන් සැලකිය හැකි ය. වීසා නොමැති ව රැකියා අපේක්ෂිත ව ජපානය වෙත



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ළඟා වන සුමල් වැනි තරුණයන්ට ආශක්ත වී මෙම කාන්තාවන් ජීවිතයෙන් පරාජය වන අයුරු එක් අතෙකින් පෘථග්ජන මනුෂ්‍ය චිත්තයේ සංකීර්ණත්වය අනාවරණය වන අවස්ථා වශයෙන් දැක්විය හැකි ය. නූපා - සුමල් ප්‍රේමයෙන් ආතුර වන්නේ කුමන කරුණු අරබයා දැයි විශ්ලේෂණය කළ හොත් ඔවුන්ගේ සංකීර්ණ වූ මනෝ ගතිකයින් හඳුනා ගත හැකි ය. නූපා යනු වැඩි දුර අධ්‍යාපනය ලැබූ කාන්තාවක් නොවේ.එබැවින් යමක් දුර දිග සිතා බලා එයින් අත්වන ප්‍රතිඵලය පිළිබඳ ව පෘථුල ව විශ්ලේෂණය කිරීමට සමත් ස්ත්‍රී විඥානයක් ඇය සතු නොවී ය. එබැවින් ඇයගේ සිතැඟියාවන්ට සරිලන අයුරින් කතුවරිය භාෂාව හසුරුවා ගෙන ඇති සැටි මතු දැක්වෙන නිදසුන් ඔස්සේ ද දැක්විය හැකි ය.

> "සුමල් හයියෙන් හිනා වුණා. සතුට තියෙන්නෙ ඔය වගේ පුංචි පුංචි දේවල්වල බව හිත දැනගෙන හිටියා. ඉතින් තවු සලා පියාඹන්න හදන්නේ ඒ හිත." (රාහුබද්ධ 2010:204).

නූපාගේ ළාමක වූ ස්ත්‍රී චින්තනයේ ස්වභාවය මෙවැනි කුඩා නිදසුනකින් වුව ද සනාථ කළ හැකි ය.

> "ලැකානියානු අර්ථයෙන් ස්ත්‍රියක් වනවා යනු සාරාත්මක නිරූපණයක් නොවේ .ලැකාන්ට අනුව ස්ත්‍රියක් වීම තුළ ඇත්තේ කතිකාවෙන් පිටතට විසරණය වන ශේෂයක නිරූපණයකි. මේ නිසා ලැකාන් ස්ත්‍රියක් ලෙසින් හඳුන්වන්නේ හිස් හැඟවුම්කාරකයකි. රැඩිකල් ආකාරයට ප්‍රකාශ කරන්නේ නම් ස්ත්‍රියක් යනු පුරුෂයා නින්දාවට පත් කරන්නියකි. ඇය පිරිමියාගේ අභ්‍යන්තරික ආත්මීය ප්‍රතිවිරෝධ ඔහුට බාහිරින් සංකේතීය ලෝකය තුළ සංගත කරයි. සරල ව කිව හොත් ස්ත්‍රිය පුරුෂයාගේ අවිඥානික විශ්වාසයකි. පිරිමි සාරය ඔහුගෙන් පිටතට විසරණය වී හෙවත් බැහැර වී යථාර්ථයක් වන්නේ ස්ත්‍රී ශරීරය මගින් ය. මේ හේතුව නිසා ස්ත්‍රිය සෑම විට ම භූමිකා රඟ දක්වයි. ස්ත්‍රිය පුරුෂයාට අභිමුඛ වන්නේ ඔහු සිතනා තැන දී නොව ක්‍රියාකාරී වන තැනේ දීය" (වික්‍රමආරච්චි 2019:110).

මෙලෙස කුමන විශ්ලේෂණයන්ට අනුව ස්ත්‍රිය අර්ථ ගැන්වුණ ද පවතින යථාව වන්නේ ඇයගේ පවත්නා අසරණත්වය යි. පුරුෂ මූලික සමාජයක දී ඇයට හිමි වන සමාජභාවය සමාන නොවන බව යි. එනිසා ම නූපා සුමල් විසින් ඇති කරනු ලැබූ ළදරු කළලය හේතු කොට ගෙන අනන්තවත් දුක්ඛ පීඩාවන්ට හසු වේ. කළලයේ සැබෑ හිමිකරු සුමල් දරුවා හදා ගැනීම ප්‍රතික්ෂේප කරන අතර නූපාගේ විවාහක සැමියා අනුන්ගේ දරුවෙකු තම වහළය යට ජීවත් වීම තරයේ ම ප්‍රතික්ෂේප කරයි. එයින් වඩාත් අසරණවන්නී නූපා ය. එබැවින්ම ඇය අවසාන තීරණයට පැමිණේ. එනම් සියදිවි හානි කර ගැනීමට ය. ඇය ඒ සඳහා ඔකිගහාරා නම් වනාන්තරයට පිවිසේ. එහෙත් ඇයගේ දියණිය වන කසුමිගේ වේදනාබර වදන් ඇයගේ දෙසවනට පතිත වද්දී ඇය දියණිය වෙනුවෙන් දිවි තොර කර ගැනීමේ අපේක්ෂාව අත් හරියි. එසේ ම අවසානයේ දී කළ සියලු ආයාචනා වැලපීම්, කැරලිගැසීම් කිසිවක් සාර්ථක නොවූ ස්ත්‍රිය පවසන්නේ ,මං අස්කරගන්න කැමතියි, යන අවසන් ප්‍රකාශය යි.

> "කළලය අස්කරගන්න කැමතියි ?
> ඔව් මම කැමතියි.
> සුමල්ට අයිති කළලය මංචංගෙ මුදලින් අස්කර ගන්න මංචං විවාහයේ නිල මුද්‍රාව තැබුවා" (රාහුබද්ධ 2010:265-266).

මෙලෙස නවකතාව අවසන් භාගය වෙත ළඟා වන විට කතුවරිය අංග ගණනාවකින් මනුෂ්‍ය ජීවිත විවරණයක මෙන් ම සමාජ ආර්ථික විවරණ පාර්ශ්වයන් ගණනාවක් ද තම දෘෂ්ටි පථයට හසු කර ගෙන ඇති බව පෙනේ. නූපා, රෝසි මෙන් ම නයෝමිට ද අත් වන ඉරණම්වල ඛේදනීය ස්වභාවය හා ස්ත්‍රීත්වය අතර පවත්නා සහසම්බන්ධතාව පිළිබඳ ව සුවිශේෂ වූ අර්ථ කථන දැක්විය හැකි ය. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය යන කරුණු අරභයා ද සාරගර්භ සංකථන ඉදිරිපත් කළ හැකි නවකතාවක් වීම අංශයෙන් ද මෙය විශේෂ ය.

බටහිර සංස්කෘතිය තුළ යම් සුවිශේෂ මොහොතක ලිංගිකත්වයේ තිබෙන කේන්ද්‍රීය වැදගත්කම මනෝ විශ්ලේෂණය විසින් එළිදරව් කර තිබෙන කරුණකි. මිචෙල් ෆූකෝ ඔහුගේ The History of Sexuality (1961) නම් වියමන මගින් ගවේෂණය කරන්නේ පුනරුදයේ සිට ම ලිංගිකත්වය නම් වූ ප්‍රපංචය පුද්ගලත්වය (Selfhood) පිළිබඳ තීරණය කරන එක ම කාරණය වූයේ මක්නිසාද යන්නයි. එසේ ම එය කතිකාවක් පමණක් නොව ආයතන (Institutions) සහ භාවිතාවන් (practices) පාලනය කිරීමට එළඹුණේ කෙසේ ද යන්නත් ෆූකෝ මෙහිලා සාකච්ඡා කොට තිබේ (සත්හඬ 2015.12.13).

පුනරුදයේ සිට පමණක් නොව මෙම විශ්වය පවතිනතාක් හෝ මනුෂ්‍ය ප්‍රජාව පවතින තාක් කල් ලිංගිකත්වය යන කරුණ මනුෂ්‍ය ජීවිත මත පතිත කරන්නා වූ ආධිපත්‍යයේ ස්වභාවය කවරාකාර වූ ස්වරූප ගනී දැයි නිශ්චිත ව ම කිව නොහැකි ප්‍රපංචයක් වන බව නූපා, සුමල්, ජයනාථ, ලනිල්, මසායා සං හෙවත් මංචං, රෝසි, නයෝමි, චන්දනා මෙම කුමන චරිතයක් ගෙන බැලුව ද විශ්ලේෂණය කළ හැකි ය. එසේ ම කාන්තාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී එය වඩාත් තීව්‍ර ස්වභාවයකින් කටයුතු කරමින් ස්ත්‍රී චිත්ත වික්ෂෝභය ඇති කරලනු ලබන බවත් විද්‍යමාන වේ.

සැබෑ ප්‍රේමය සොයමින් යාදිනියක සේ නොදන්නා රටක, සන්ජෝ නම් නොදන්න නගරයක සැරිසරන නූපා නම් කාන්තාව අවසානයේ දී සැබෑ ප්‍රේමයක සුගන්ධය හෝ හඳුනා ගනුයේ සිය වියපත් ස්වාමියා වන මසායා සාන්ගෙනි. ව්‍යාජ ප්‍රේමය සහ සැබෑ ප්‍රේමයේ මාත්‍රාව අවසානයේ දී පාඨකයා හඳුනා ගනී. මසායා සාං හෙවත් මං චං සැබැවින් ම නූපාටත්, දියණිය කසුමිටත් පෙම් කළ බව නවකතාව අවසානයත් සමඟ සනිටුහන් වේ.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

"මං චං වෙව්ලන දෑත් එක් කොට මගේ දෑත අල්ලා ගත්තා. අතීතයයි අනාගතයයි බෙදා වෙන් කර ගන්නට අඳින ඉරක් මත අප දෙදෙනා ඔවුනොවුන් දෙස බලා සිටියා" (රාහුබද්ධ 2010:270).

නවකතාව අවසන් වන්නේ ,පෙම්බරා ඔබ පලකය මත වැඩ හිඳින්නං,යනුවෙන් ය (රාහුබද්ධ 2010:270).

මසායාසාන් හෙවත් නූපාගේ ජපන් ජාතික ස්වාමියා තරුණ කල පෙම් කරනුයේ සායෝසාන් නමැති කාන්තාවකට ය. සායෝසාංගේ නික්ම යාමෙන් හැඟීම් විරහිත පුද්ගලයෙකු වූ මං චං නවකතාව අවසායේ දී නූපාට පෙම් කිරීමට පෙලඹීම අතිශයින් මනෝවිද්‍යාත්මක ය. ප්‍රේමය නම් ප්‍රපංචය කාන්තා - පුරුෂ දෙපාර්ශ්වය කෙරෙහි ම පවත්වන ආධිපත්‍යයේ ස්වභාවය ද, ප්‍රේමය අභිමි වීමෙන් මනුෂ්‍යයින් ක්‍රියා කරනු ලබන ආකාරය ද හෙළි කරන නවකතාවක් වශයෙන් නවකතා මාධ්‍යය නමැති ශානරයේ ශක්‍යතා තව දුරටත් හඳුනා ගත හැකි නිර්මාණයකි කන්දක් සේ මා. එසේ ම ශිල්පීය පාර්ශ්වයෙන් දක්වන ප්‍රාගුණ්‍යය පෙම්බරා නමින් විඥානධාරා රීතියේ ම ප්‍රති ශානරයක් වශයෙන් භාවිත රූපකාර්ථවත් සංඥා සිංහල නවකතාවෙහි පර්යේෂණාත්මක පාර්ශ්වය පිළිබඳ ව ද සුභවාදී බවක් ප්‍රකට කරයි. සුලබ තේමාවක් අපූර්වත්වයෙන් යුතු ව විවරණය කිරීමට කතුවරිය ගත් ප්‍රයත්නයක් සේ මෙම නවකතාව දැක්විය හැකි ය.

කන්දක් සේ මා මෙන් ම හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන අගතියට පත් වන කාන්තා චරිතයක් ගැන කියවෙන නවකතාවක් වශයෙන් 2015 වර්ෂයේ දී පී.බී.ජයසේකර විසින් රචිත අවලමා සහ ඇහැටුව දැක්විය හැකි ය.

මෙය හුදු කාන්තා පීඩනය හැරුණු විට සමකාලීන සමාජ සංස්ථාව විවරණය කරනු ලබන නවකතාවක් වශයෙන් ද විවිධ පාර්ශ්වයන්ගෙන් සංකථනය කළ හැකි නවකතාවකි. මීට ප්‍රථම කතුවරයා විසින් ලියන ලද මරියා සිලෝනිකා වස්තුව (2013) නම් නවකතාව ද එතරම් සම්භාවනාවට පාත්‍ර නො වූව ද නවකතා පාර්ශ්වයෙන් ප්‍රබල කතිකාවක් ගොඩ නැංවිය හැකි සාර්ථක ශිල්ප ධර්ම භාවිත කළ නිර්මාණයක් වශයෙන් දැක්විය හැකි ය.

මුතුමිණි නම් වූ යුවතිය පෞද්ගලික වෛද්‍යවරුන් සේවය කරන ආයතනයක සේවය කරන ගැමි, නිර්ධන පාන්තික රූමත් යුවතියකි. ඇයගේ මව රං මැණිකා ය. පියා මුතු බණ්ඩා ය. ඇයට බාල සොයුරෙක් හා සොයුරියක් සිටිති. රැකියාව අවසන් වී නිවෙස බලා එමින් සිටි එක්තරා දිනක දී දංකුට්ටා නම් සමාජ විරෝධී දාමරිකයා විසින් ඉතා තදබල ලෙස ඇය අපයෝජනයට ලක් කෙරේ. ඒ වන විට ඇය ධීර නම් යහපත් ගතිගුණැති තරුණයාගේ පෙම්වතිය බවට පත් ව සිටියා ය. අපයෝජනයට ලක් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇය ගැබ් ගනී. වරෙක ඇය සිය දිවි නසා ගැනීමට සැරසේ. පවුලේ අයගේ මැදිහත් වීමෙන් එය වැලකේ. ඇය ප්‍රේමයෙන් බැඳුණු පෙම්වතා වන ධීර පිළිබඳ ව සිතමින් අතිශය මානසික කැලඹීමකට පත් වේ.

නීතිය හා සාමය රැකීමට පවත්නා ආයතන අවිහිංසක අසරණ මිනිසුන් තව දුරටත් තලා පෙලා දමමින් නීතිය අවනීතිය බවට පත් කරවන අයුරුත් මුතුමිණි වැනි පාපතර කාමාතුරයින් අතින් අපයෝජනයට ලක් වන යුවතියන් තව දුරටත් පොලිසි වැනි ආයතනයන්හි නිලධාරීන් අතින් ප්‍රතිදූෂණයට ලක් වන අයුරුත් වටහා ගත හැකි ය. මුතුමිණි තමාට වූ අපරාධය පිළිබඳ ව පැමිණිලි කිරීම සඳහා මව සහ සොයුරා වන ගජමිණි සමඟ පොලිස් ස්ථානය වෙත පැමිණේ. පැමිණිල්ල ලියා ගැනීමට සිටින පොලිස් නිලධාරියා ද දංකුට්ටා හා සමාන පහත් තත්ත්වයකට වැටී ඇති අයුරු පෙනෙන්නේ ඔහු විසින් මුතුමිණිගෙන් අසනු ලබන අවර ගණයේ ප්‍රශ්න මාලාවෙනි. එම අසන දෑ හිරිඔතප් සහිත යුවතියක ප්‍රතිදූෂණය කරනවා හා සමාන ය.

"මනුස්සයො මේක පොලීසිය මෙතැන කෙරෙන්නෙ නීතිය, උසාවියේ විත්ති පාර්ශ්වය ප්‍රශ්න අහනවා. අඩි පොළොවෙ ගහලා අහන්නෙ. කෑ ගහලා අහන්නෙ. ඇයි තමා හුදකලා පාරක ගියේ? යුෂ්මතී ඇයි දිව්වේ නැත්තේ? ඇයි පොරකෑවෙ නැත්තෙ? එහෙම විත්ති පාර්ශ්වය අහනකොට කියාපු කුණු හරුප කියන්ඩ ඕන. තමාගේ අකමැත්තෙන් බලහත්කාරයක් වුණානන් ඒක වුණ හැටි කියන්ඩ ඕනෑ........." (ජයසේකර 2015:95).

ලිබරල් ධනවාදී සමාජයක පුද්ගල චරිත විගලිත තත්ත්වයට පත් ව ඇති අයුරු ද මානව පුරුෂාර්ථ හිම කැට මෙන් දිය ව යන පශ්චාත් නූතන මිනිසාගේ කාර්ය සාධනය පිළිබඳ ව ද විවරණය වන නවකතාවක් වශයෙන් මෙය දැක්විය හැකි ය.

මුතුමිණි අපයෝජනයට ලක් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇය ගැබ් ගනී. ඒ බව ධීරට ප්‍රකාශ කිරීමෙන් පසු ඔහු දැඩි සේ මානසික ව ගිලන් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අධික සේ මත්ද්‍රව්‍ය පානය කොට යතුරු පැදියෙන් යාමේදී අනතුරකට පත් ව ඔහු ජීවිතක්ෂයට පත් වේ.මෙම සියලු ම සිදුවීම් පිටුපස ඇත්තේ මුතුමිණි කුරිරු ලෙස රාගාධික කාමාතුරයෙකුගේ ග්‍රහණයට හසු වී එයින් ගැබ් ගැනීම ය. හුදු ස්ත්‍රීත්වය හා බැඳුණු ඛේදනීය සිදුවීම් දාමයක් එකිනෙකට සම්බන්ධ වී ඇත.

ධීර මිය ගිය ද සැබැවින් ම ඇය ජීවත් වූයේ හදවතින් ඔහු සමඟ ය. කළලය ගබ්සා කිරීමට ඇය කිසිසේත් කැමති නොවන අතර ඇයට දියණියක් උපදී.ඇය පුංචි මැණිකේ නම් වේ.පුංචි මැණිකේ ධීරගේ ම දියණිය යයි සිතමින් ඇය ජීවත් වේ.පාසැල් යන පුංචි මැණිකේ හා ඇය බලා ගැනීමට සිටි මාන්දි නම් කාන්තාව පැහැර ගෙන යාමෙන් පසු මරා දමෙන අතර දරුවා නැති සොවින් මුතුමුණි ද ජීවිතක්ෂයට පත් වේ.

පශ්චාත් නූතනවාදී ලිබරල් සමාජ වාතාවරණයක දී සිදු නොවිය හැක්කක් නොමැත. දංකුට්ටා වැනි සමාජ අපගාමීන්ට නීතියේ පිළිසරණ ලැබේ. මත් කුඩු ජාවාරම්, පැහැර ගැනීම්, කප්පම් ඉල්ලීම්, කුරිරු ඝාතනල කාන්තා අපයෝජන ආදී සියල්ලක් ම අති සරල අයුරින් සිදු විය


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හැකි ය. මාක්ස් කී පරිදි මනුෂ්‍ය වටිනාකම් හර පද්ධතීන් යනාදි සියල්ල ද්‍රව්‍ය බවට පත් ව ඇත.

මෙම නවකතාව ආරම්භ වන්නේ ද ස්ත්‍රීත්වයෙහි වෙළී පැටලී පවතින ඛේදනීයත්වය සමග ම යයි කිව හැකි ය. නවකතාව ආරම්භයේ දී ම මුස්ලිම් මිනිසා සමග ප්‍රතිකාර ගැනීමට පැමිණෙන කාන්තාව පරඬැල්පතක් මෙන් ඔහුගේ රළු පරළුබව හමුවේ ක්‍රියා කරන අයුරුත්, ඉන් අගතියට පත් වන අයුරුත් වටහා ගත හැකි ය. තම ස්වාමියා වෙනත් ස්ත්‍රියක් හා ලිංගික ඇසුරක් පැවැත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම මුස්ලිම් කාන්තාව රෝගී ව වේදනාවට පත් වන අතර ප්‍රතිකාර ලබා ගැනීමට යොමු වන වෛද්‍යවරයා මුතුමිණි සේවය කරන වෛද්‍ය ස්ථානයේ වෛද්‍යවරයා වන බැවින් මුතුමිණිගේ දෘෂ්ටි කෝණයෙන් පාඨකයා සියල්ල අවබෝධ කොට ගනී. එම මුල් අවස්ථා ඉදිරිපත් කොට ඇත්තේ දැඩි පිළිකුලක් ඇති වන පරිදි ය.

පෙරදිග සංස්කෘතිය අගයන රටක් වශයෙන් පියෙකු නොමැති දරුවෙකු ලාංකේය වටපිටාවේදී "අවජාතක" යන නාම ප්‍රඥප්තිය ලබයි. මුතුමිණි මුහුණ දෙන ආභාග්‍යසම්පන්න අතවරය හේතුකොට ගෙන දරු ගැබක් ඇති වන අතර එය ගබ්සා කිරීම සඳහා ඇයගේ සොයුරිය වන "රන්මිණි" යෝජනා කළ ද මුතුමිණි එයට විරුද්ධ වේ. ඇයගේ මව ද ඊට සපුරා ම විරුද්ධ වේ. කාන්තාව හා ගබ්සාව යන වචන යුගළය ස්ත්‍රී ඛේදවාචකය හා සහසම්බන්ධිත වචන යැයි හැඟේ. කන්දක් සේ මාහි නූපා දෙවරක් ම ගබ්සාවට ලක් වන්නේ ස්ත්‍රීත්වයේ එක් අඳුරු පැතිකඩක් හෙළි කරවමිනි.

## නිගමනය

අද්‍යතන බොහෝ නවකතා විමර්ශනය කිරීමේ දී පසක් වන්නේ හුදු ස්ත්‍රියක වීම හේතු කොට ගෙන ම දුර්භාග්‍යසම්පන්න ඉරණම්වලට මුහුණ පාන කාන්තා චරිත නිර්මාණකරුවන්ට බෙහෙවින් ම වස්තුවිෂය වී ඇති බව ය. පාරිභෝජන ධනවාදය ඉස්මතු වීමත්ල මානව සබඳතා ද්‍රවශීලී බවට පත් වීමත් මගින් වත්මන වන විට ඉතා ශීඝ්‍රයෙන් මානව සබඳතා හිම කැට මෙන් දිය ව යන යුගයකට අපි අවතීර්ණ වී සිටින්නෙමු. වත්මනෙහි හෝ වුව ද අතීතයෙහි හෝ වුව ද ස්ත්‍රිය හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන ම පීඩනයට පාත්‍ර වන ස්වභාවය සාමාන්‍ය තත්ත්වයකි. එය සිදු වන්නේ පුරුෂ කේන්ද්‍රීය සමාජයක දී ස්ත්‍රියට දෙවන පෙළ සාමාජිකත්වය හිමි වීම මගිනි. එහි දී ගබ්සාව සහ ලිංගික ප්‍රචණ්ඩත්වය යන කරුණු ද්විත්වය හේතු කොට ගෙන ස්ත්‍රිය, කාන්තාවක වශයෙන් දැඩි පීඩනයට පත් වන ආකාරය බොහෝ නිර්මාණකරුවන්ට වස්තුවිෂය වීම මගින් හඳුනා ගැනීමේ ශක්‍යතාව පවතී. එමෙන් ම ලිංගිකත්වය යන සංකල්පය මානව සමාජයෙහි පවතිනතාක් ස්ත්‍රිය පීඩනයට පත් වීමේ ප්‍රවණතාව ඉහළ තලයක පවතින බවත් දැක්විය හැකි ය. එසේ ම සංස්කෘතික මිනිසා වියෝව පවතින අද්‍යතන සමාජ පරිස්ථිතියේ දී අතීතයේ නොවූ විරූ අයුරින් ස්ත්‍රිය කෙරෙහි වූ ප්‍රචණ්ඩත්වය මුදා හැරෙමින් පවතින බව ද හඳුනා ගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


රාජපක්ෂ. ධර්මා. (2014). විපරිණාමයේ ස්ත්‍රී පිළිබිඹුව. කොළඹ - 10. රත්න පොත් ප්‍රකාශකයෝ.

මුණසිංහ. ඉන්ද්‍රාණි. (1998). පැරණි ලක්දිව කාන්තාව. දෙහිවල. ශ්‍රී දේවී ප්‍රින්ටර්.

මනුරත්න. එම්. ජී. (2004). ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පවුල. වරකාපොළ. ආරිය ප්‍රකාශකයෝ.

රාජ්. මඩවල. මොහාන්. (2016). රැජින. නුගේගොඩ. බිසෝ ප්‍රකාශන.

රාහුබද්ධ. සුමිත්‍රා. (2010). කන්දක් සේ මා. නුගේගොඩ. ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ජයසේකර. පී.බී. (2015). අවලමා සහ ඇහැටුව. කොළඹ - 10. ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සෝමරත්න. නිමල්. (2017 මැයි 05 වැනි සිකුරාදා). දිවයින. වටමඬල. ප්‍රබන්ධය මත නිමැවුණු ප්‍රබන්ධය.

වෙලගෙදර. චම්මින්ද (2016). සක්කාරං. නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ.

වික්‍රමාරච්චි. සමන් (2009). මළගිය ඇත්තෝ යළි උපදිති. නුගේගොඩ. සංහිඳ මුද්‍රණ හා ප්‍රකාශන.

සත්හඬ (2015.12.13) සිහිනය, 05පී, කර්තෘ සඳහන් නොවේ.



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 23-29
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවලින් ධ්වනිත වන ශ්‍රී ලාංකේය ජන විඥානය: තෝරා ගත් නාට්‍ය නිර්මාණ ඇසුරිනි

(Sri Lankan Indigenous Consciousness Depicted in the Adaptation Dramas by Gunasena Gallappatti: Evidence from Selected Works)

ආචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර

භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
priyanka@ssl.sab.ac.lk

**සාරසංක්ෂේපය**

සිංහල නාට්‍ය කලාවේ පර්යේෂණාත්මක අවධියෙහි එහි ප්‍රගමනයට ප්‍රබල දායකත්වයක් දුන් නාට්‍යකරුවෙකු ලෙස ගුණසේන ගලප්පත්ති හැඳින්විය හැකි ය. වර්ෂ 1957 ‘සඳකිඳුරු’ නාට්‍යය අධ්‍යක්ෂණයෙන් නාට්‍යය ක්ෂේත්‍රයට පිවිසෙන වෘත්තියෙන් ගුරුවරයෙකු වූ ගලප්පත්ති අනුවර්තන, ස්වතන්ත්‍ර නාට්‍ය රැසක් අධ්‍යක්ෂණය කළේ ය. ඒ අතර වළහැඩියා (1962), මුහුදුපුත්තු (1962), දේවතාඑළි (1963), ලියතඹරා (1967), තාත්තා (1969), ආදී නාට්‍ය ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රියත්වයට පත් විය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ඇසුර ගලප්පත්තියේ නාට්‍ය දිවිය දීප්තිමත් කිරීමට හේතු සාධක විය. වර්ෂ 1959 ඇමරිකාවේ බ්‍රොඩ්වේ යේල් විශ්වවිද්‍යාලයේ නාට්‍යකරණය හැදෑරීම පිණිස ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වයක් ලැබ ඇමරිකාවට යන ගලප්පත්තිට එහි දී රුසියානු ජාතික කීර්තිමත් නාට්‍යවේදියෙකු වූ කොන්ස්තන්තීන් ස්ටැනිස්ලාව්ස්කිගේ රංග රීතිය හැදෑරීමට අවස්ථාව උදා විය. පසුකාලීනව ගලප්පත්තිගේ නාට්‍ය නිර්මාණ බොහොමයක ස්ටැනිස්ලාව්ස්කිගේ රංග රීතියෙහි ආභාෂය දක්නට ලැබේ. සමස්තයක් ලෙස ගලප්පත්ති නාට්‍ය නිර්මාණවල සුවිශේෂත්වය වන්නේ අන්තර්ගතය සහ ආකෘතිය මගින් ශ්‍රී ලාංකේය ජන විඥානය මැනවින් විශද වීම යි. දේශීය නාට්‍ය කලාවක් සොයා යන යුග මෙහෙවරෙහි ශ්‍රී ලාංකේය නාට්‍යකලාවේ අද්‍යතන වර්ධනයට පාදක වුණු නව පර්යේෂණාත්මක අත්හදා බැලීම් විශ්ලේෂණය කිරීමේ දී ගුණසේන ගලප්පත්ති නම් ප්‍රතිභාපූර්ණ නාට්‍යවේදියාගේ නාට්‍ය නිර්මාණ සුවිශේෂ ස්ථානයක් හිමි කර ගනී.

කේන්ද්‍රීය වචන: ශ්‍රී ලාංකේය ජන විඥානය, අනුවර්තන නාට්‍යය, පර්යේෂණාත්මක නාට්‍ය යුගය, දේශීය නාට්‍ය සම්ප්‍රදාය

Gunasena Galappatty could be identified as a dramatist who immensely contributed to the advancement of Sri Lankan theatrical tradition in the experimental theatrical era. In 1957, Galappatty entered the theatrical arena by directing the drama “Sadakiduru”. By profession, he was a teacher, and in times to come he directed numerous adaptations and autonomous drama. Among them “Walahediyawa”(1962), “Muhuduputtu”(1962), “Dewathaeli”(1963), “Liyatabara”(1967), “Thatha”(1969) were famous among the audience. The company of Professor Ediriweera Sarachchandra had a tremendous impact on enriching Galappatty’s career as a playwright. In 1959, Galappatty received the Fulbright scholarship to study drama at Broadway, Yale University in the United States. There he gained the opportunity to study the naturalistic performance technique known as the “Stanislavski Method” which was developed by the renowned theatre practitioner Constantin Stanislavski. Later on, it was possible to identify Stanislavski’s influence in many of Galappatty’s creations. In general, the significance of Galappatty’s drama is embedded in the content and structure which depict indigenous consciousness outstandingly. In the process of investigating a local theatrical tradition which enhanced the Sri Lankan theatre with innovative experimentations, Gunasena Galappatty fortifies a paramount position.

Key words: Indigenous consciousness, Adaptation, Local theatrical tradition, Experiment theatrical Era

## හැඳින්වීම

සිංහල නාට්‍ය කලාවේ පර්යේෂණාත්මක යුගය ලෙස සැලකෙන වර්ෂ 1950 දශකයේ නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වන ගුණසේන ගලප්පත්ති නම් නාට්‍යවේදියා වර්ෂ 1927 ජුනි මස 07 වන දින දික්වැල්ලේ උපත ලබා දික්වැල්ල විජිත විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබුවේ ය. පාසැල් අවධියේ සිට ම නාට්‍යකලාවට මහත් ඇල්මක් දැක් වූ ගලප්පත්තිට වර්ෂ 1952 දී කොළඹ විශ්වවිද්‍යාල කොලිජියට ඇතුලත් වීමට භාග්‍ය උදා විය. කොළඹ විශ්වවිද්‍යාලයේ කලා අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ගෙන යාමත් සමග ම ගලප්පත්තිට පේරාදේණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු බවට පත් වීමට ලැබීම නාට්‍යකරුවෙකු ලෙස ඔහුගේ කලා ජීවිතයේ සුවිශේෂ සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමට හේතු සාධක විය. වෘත්තීයෙන් ගුරුවරයෙකු වූ ගලප්පත්ති රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක තනතුරෙහි ද සේවය කළේ ය. පසු කාලයේ වෘත්තිය නාට්‍යකරුවෙකු බවට පත් වන ගලප්පත්ති වර්ෂ 1984 නොවැම්බර් මස 27

වන දින මිය යන තෙක් ම ගුරු සේවයෙහි නිරත වුවේ ය.

පාසල් වියේ සිට ම නාට්‍යවල විවිධ චරිත නිරූපණයට, නාට්‍ය පිටපත් රචනයට හා අධ්‍යක්ෂණයට දැඩි ඇල්මක් දැක් වූ ගලප්පත්තිට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මුණ ගැසෙන්නේ පේරාදෙණිය රසවියේ දී ය. පේරාදෙණිය සරසවියේ සිංහල නාට්‍ය මණ්ඩලයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු බවට පත් වන ගලප්පත්තිට මෙම යුගයේ ශ්‍රී ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණාත්මක නාට්‍ය අත්හදා බැලීම්වලට සක්‍රීය ව දායක වෙමින් එහි පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ ගුරු ඇසුර ලැබීම නාට්‍යකරණය පිළිබඳ ඔහු තුළ තැම්පත් ව තිබුණු ආශාව සහ උනන්දුව තීව්‍ර කිරීමට ප්‍රබල හේතුවක් විය. මෙකල මහාචාර්ය සරච්චන්ද්‍ර විසින් නිර්මාණය කරන ලද “බහින කලාව හෙවත් සංස්කෘතික කොමසාරිස්” නාට්‍යයේ,ජෝතිපාල, නම් වූ භූමිකාවත්, පබවත නාට්‍යයේ දූතයෙකුගේ භූමිකාවත් නිරූපණය කිරීමට අවස්ථාවක් උදා විය. මහාචාර්ය සරච්චන්ද්‍ර පවසන පරිදි මනමේ නාට්‍යයේ සාර්ථකත්වයට තිරයෙන් පිටුපස භාරධූර කාර්යයක් ගලප්පත්ති විසින් ඉටු කොට ඇත.

> “ගලප්පත්ති තුළ ගොනුව තිබූ නිර්මාණ කුසලතා මා දුටුවේ ඔහු නාට්‍ය නිෂ්පාදනය කොට මෙරට ප්‍රේක්ෂකයන් අතරට පිවිසෙන්නට පෙර සිට ය. මගේ මනමේ නාටකය හා පුරා කියා සිංහල නාට්‍ය ලොවට පිවිසීමේ බරපතල හා දුෂ්කර ප්‍රයත්නය පිටුපස සිටියේ ඔහු” (ලංකාදීප 1984.12.21)

වර්ෂ 1959 දී ගුණසේන ගලප්පත්තිට ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වයක් ලැබ ඇමරිකාවේ බ්‍රොඩ්වේ යේල් විශ්වවිද්‍යාලයේ නාට්‍යකරණය හැදෑරීමට භාග්‍ය උදා විය. ඇමරිකාවේ ගත කළ වසර එකහමාරක පමණ කාලයක් තුළ ගලප්පත්ති නාට්‍යකලාවේ බටහිර සම්ප්‍රදාය අවසානය කළේ ය. පසු කාලයේ ඔහුගේ නාට්‍ය නිර්මාණ සඳහා පදනම සකස් කළ රුසියානු ජාතික නාට්‍යවේදියෙකු වූ කොන්ස්තන්තීන් ස්ටැන්ස්ලාව්ස්කියේ රංග රීතිය අධ්‍යයනයට මෙහි දී ඔහුට අවකාශය උදා විය. යේල් විශ්ව විද්‍යාලයේ ඔහුගේ නාට්‍ය උපදේශකවරු වූයේ ස්ටැනිස්ලාව්ස්කිගේ ගුරුකුලයේ විශිෂ්ටයින් වන හර්බට් බර්ගෝෆ් සහ ස්ටාෆ් බර්ගෝෆ් ය. ලී ට්‍රාස්බර්ග්ගේ ප්‍රමුඛත්වයෙන් ඇරඹුණු ඇමරිකාවේ නිව්යෝර්ක් “ඇක්ටසේ ස්ටුඩියෝ” ශාලාවේ දී රංගගත වුණු වේදිකා නාට්‍යයක චරිතයක් නිරූපණය කිරීමට ද ගලප්පත්තිට භාගය උදා විය. නාට්‍ය අධ්‍යක්ෂණයේ දී නළුනිළියන් පුහුණු කිරීමේ දී දක්ෂ නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු ගලප්පත්ති තුළින් බිහි වන්නට ප්‍රබල හේතුවක් වන්නේ ද ස්ටැනිස්ලාව්ස්කි රංග සම්ප්‍රදායේ තදාක්මීකරණ රංග විලාසය පිළිබඳ ඔහු ලද දැනුම සහ පරිචය බව විචාරක මත යි.

> “ඔහු පෙරළා ලංකාවට පැමිණ නිෂ්පාදනය කළ ෂොන් පෝල් සාත්‍රේගේ ‘ලියතඹරා’ නාට්‍යයේ සමන් බොකලවල, සතිච්චන්ද්‍ර එදිරිසිංහ හා සෝමපාල සුබසිංහ යන රූපණ ශිල්පීන්ගේ භූමිකා නිරූපණය හා නාට්‍ය අධ්‍යක්ෂණය මෙතරම් විශිෂ්ටත්වයට පත් වූයේ ගලප්පත්ති ස්ටැනිස්ලාව්ස්කිගේ රූපණ විධි ක්‍රමයෙන් ලත් පෝෂණය නිසා ය” (ධර්මකීර්ති 2016:136).

මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ වන්නේ ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවලින් ධ්වනිත වන ශ්‍රී ලාංකේය ජන විඥානය හඳුනා ගෙන ගලප්පත්ති නාට්‍ය නිර්මාණවල සුවිශේෂතා අධ්‍යයනය කිරීම යි.

## සාහිත්‍ය විමර්ශනය

නාට්‍ය වනාහි බැලීමෙන් ම රස විඳින කාව්‍ය විශේෂයකි. මේ නිසා ම නාට්‍ය දෘශ්‍ය කාව්‍යය ලෙස හඳුන්වනු ලබ යි. ඒ අනුව ගුණසේන ගලප්පත්ති විසින් අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය නැරඹීමෙන් ලද සජීවී අද්දැකීම් මෙම පර්යේෂණ කාර්යයේ ප්‍රාථමික මූලාශ්‍ර ලෙස භාවිත වූ බව කිව යුතු ය. එමෙන් ම එම නාට්‍ය පිටපත් පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍ර ලෙස විමර්ශනයට ලක්විණි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල නාට්‍ය අනුමණ්ඩල විසින් ප්‍රකාශිත අභිනය - 4: ගුණසේන ගලප්පත්ති සමරු කලාපයෙහි අන්තර්ගත ගුණසේන ගලප්පත්ති නාට්‍ය නිර්මාණ පිළිබඳ ලිය වී ඇති ශාස්ත්‍රීය ලිපි පෙළත්, ගලප්පත්ති නාට්‍ය නිර්මාණ පිළිබඳ ලිය වී ඇති වෙනත් ශාස්ත්‍රීය ලිපි ලේඛන සහ අන්තර්ජාලයේ ලිපි පර්යේෂණයේ ද්විතික මූලාශ්‍ර ලෙස භාවිත කෙරිණි.

## පර්යේෂණ ගැටලුව

ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවලින් ශ්‍රී ලාංකේය ජන විඥානය ධ්වනිත වේ ද?

## පර්යේෂණ අරමුණු

පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවලින් ශ්‍රී ලාංකේය ජන විඥානය ධ්වනිත වේ ද? යන්න තෝරා ගත් නාට්‍ය ඇසුරෙන් විමර්ශනය කිරීම යි.

ද්විතික අරමුණු ලෙස ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවල විශේෂතා හඳුනා ගැනීම සහ නාට්‍යකරුවෙකු ලෙස ගලප්පත්ති ශ්‍රී ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයේ සුවිශේෂත්වයට පත් වීමට හේතු වූ සාධක ඔහුගේ නාට්‍ය නිර්මාණ ඇසුරෙන් හඳුනා ගැනීම දැක්විය හැකි ය.

## පර්යේෂණ වැදගත්කම

දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය විමර්ශනයට ලක් කරන විට එහි පර්යේෂණාත්මක අවධියෙහි නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන ගුණසේන ගලප්පත්ති නම් ප්‍රතිපූර්ණ නාට්‍යකරුවා දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට සුවිශේෂ දායකත්වයක් ලබා දුණි. 1957 “සඳකිඳුරු” නාට්‍යය අධ්‍යක්ෂණය කිරීමෙන් සිංහල නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන ගුණසේන ගලප්පත්ති නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පමණක් නොව නළුනිළියන් පුහුණු කරවන පරිණත නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු ද විය. ස්ටැනිස්ලාව්ස්කිගේ රංග රීතිය හදාරා එහි ශිල්පීය නිපුණත්වය ලාංකේය නාට්‍ය


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ක්ෂේත්‍රයට ප්‍රදානය කළ ගුණසේන ගලප්පත්තිගේ නාට්‍යවල තිබුණු සුවිශේෂත්වය වන්නේ අපරදිග සම්ප්‍රදායේ නාට්‍යයක් වුව ද ලාංකේය වේදිකාවට ගැලපෙන පරිදි නිර්මාණය කිරීමට ඔහු තුළ තිබූ අපූරු කුසලතාව යි. මේ නිසා ශ්‍රී ලාංකේය පර්යේෂණාත්මක නාට්‍ය යුගයෙහි බිහි වූ බොහෝ අනුවර්තන නාට්‍ය අතර ගලප්පත්තිගේ නාට්‍ය ලාංකේය ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රසාදයට පත් විය. බටහිර නාට්‍ය බොහොමයක් අනුවර්තනය කළ ගුණසේන ගලප්පත්ති එහි අන්තර්ගතය පමණක් නොව ආකෘතිය ද ශ්‍රී ලාංකේය වේදිකාවට ගැලපෙන පරිදි සාර්ථකව ප්‍රතිනිර්මාණය කළේ ය. මෙනිසා ගුණසේන ගලප්පත්ති නම් නාට්‍යකරුවා ශ්‍රී ලාංකේය නාට්‍ය ඉතිහාසයේ දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් අතර පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ නාට්‍යකරුවෙකු බවට පත් වෙයි. මේ අනුව ශ්‍රී ලාංකේය නාට්‍ය ඉතිහාසයේ දේශීය නාට්‍ය කලාවක් සොයා යන ගමන් මගෙහි සුවිශේෂ මෙහෙවරක් ඉටු කළ ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවල සුවිශේෂතා හඳුනා ගැනීම, ශ්‍රී ලාංකේය නාට්‍ය ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට පමණක් නොව, විදේශීය නාට්‍ය නිර්මාණයක් වුව ද ශ්‍රී ලාංකේය වේදිකාවට ගැලපෙන අයුරු ප්‍රතිනිර්මාණය කරන ආකාරය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හේතු සාධක වෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Qlitative Research Methodology) පර්යේෂණය ක්‍රමවේදය ලෙස භාවිත කෙරිණි. ශ්‍රව්‍ය-දෘශ්‍ය කලා මාධ්‍යයක් වූ නාට්‍ය කලාව දැකීමෙන් ම රස විඳින කලා මාධ්‍යයක් බැවින් පර්යේෂණය සඳහා තෝරා ගත් ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණ වූ මුහුදු පුත්තු (1961), ලියතඹරා (1967), තාත්තාල (1969) අනුවර්තිත නාට්‍ය නැරඹීමෙන් සහ එහි පිටපත් පරිශීලනයෙන් ලබන අද්දැකීම් පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍ර ලෙස භාවිතා කෙරිණි.

ද්විතික මූලාශ්‍ර ලෙස ගුණසේන ගලප්පත්ති නාට්‍ය නිර්මාණ පිළිබඳ ලිය වී ඇති ශාස්ත්‍රීය ලිපි ලේඛනල අන්තර්ජාලයේ අන්තර්ගත ශාස්ත්‍රීය ලිපි භාවිත කෙරිණි.

## සාකච්ඡාව

ගාර්ෂියා ලෝකා නම් ස්පාඤ්ඤ ජාතික නාට්‍යකරුවාගේ යෙර්මා (Yerma) නම් නාට්‍යයේ සිංහල අනුවර්තනයක් වූ මුහුදු පුත්තු නාට්‍යය (1961) ගුණසේන ගලප්පත්ති නම් නාට්‍යවේදියා ශ්‍රී ලාංකේය නාට්‍ය ඉතිහාසයේ අමරණීයත්වයට පත් කළ නාට්‍ය නිර්මාණයක් ලෙස සැලකිය හැකි ය. විශ්ව නාට්‍ය කලාවේ ගාර්ෂියා ලෝකා යනු අපූරු කවීත්වයක් ඇති ප්‍රතිභාපූර්ණ නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකි. යෙර්මා යනු ඔහුගේ දෙවන ඛේදාන්ත (Tragedy) නාට්‍යය යි. මුහුදු පුත්තු නාට්‍යයේ වස්තු විෂය වන්නේ දරුවකු ලැබ මව්පදවිය අපේක්ෂාවෙන් කටුක අද්දැකීම් වුව ද විඳ දරා ගනිමින් තම එක ම අරමුණ සාක්ෂාත්කර ගැනීමට වෙහෙසෙන ස්ත්‍රියකගේ කතා පුවතකි. මෙහි ප්‍රධාන ස්ත්‍රී භූමිකාව වූ 'සරා' විවාහ වී සත් අවුරුද්දක් ගත වන තුරු දරුවකු නොලැබ සමාජයේ ඇනුම්පදවලට ලක් ව දැඩි මානසික පීඩාවෙන් පෙළෙයි. සාම්ප්‍රදායික සමාජයට අනුගත වූ සරාගේ සැමියා වන තේගිරිස් තුළ දරුවකු පිළිබඳ සිහිනයක් නොපවතී. තම සොහොයුරා වූ දියෝනිස්ගේ කේන්ද්‍රය පෙන්වා සරාව විවාහ කර ගන්නා තේගිරිස් තමන්ට දරුඵල නොලැබෙන්නේ නොපෙනෙන බලවේගයක ප්‍රතිඵලයක් ලෙස යැයි සිතයි. කේන්ද්‍ර වංචාව තේගිරිස්ගේ ම ඔිනෑකමකට සිදු නොවුවත් ඊට තමා ද හවුල්කරුවකු බව ඔහුගේ යටි හිත පවසයි. මෙය පසු කාලයේ ගමෙහි ප්‍රචලිත වන ඕපදූප මගින් දැන ගන්නා සරා තමාගේ එක ම අභිප්‍රාය වූ දරුවකු ලැබ මව්පදවිය ප්‍රාප්තකර ගැනීමට කිසිදු උනන්දුවක් නොදක්වන තම සැමියා වූ තේගිරිස් පිළිබඳ කලකිරීමට පත් වෙයි. මේ අතර තේගිරිස්ගේ සොහොයුරා වූ දියෝනිස්, සරා ගැහැණියක ලෙස පෙළෙන අභ්‍යන්තර චෛතසික වේදනාව හඳුනාගෙන ඇයට අනුකම්පා කර යි. මේ අතර දරුවකු ලැබීමේ අපේක්ෂාවෙන් භාරහාර වීමට කතරගම වන්දනාවේ යන්නට සරා සමග එකතු වන දියෝනිස් මගින් සරා දරුවකු ලබා ගනි යි. කතරගම වන්දනා ගමනට සහභාගී වන ඉසෝ මගින් මේ ගැන දැන ගන්නා තේගිරිස් දරුවා ඉපදුණු පසු උමතු වූවකු ලෙස ක්‍රියා කොට ගෙල මිරිකා දරුවා මරණයට පත් කරයි. නාට්‍යය අවසානයේ සිදු වන දරුවාගේ මරණයත් සමග ම අසීමිත වේදනාවට පත් වන සරා, සේගිරිස්, දියෝනිස්ගේ ජීවිත අපේක්ෂාභංගත්වයට පත් ව ඛේදාන්තයකින් නාට්‍යය සමාප්ත වෙයි. මුහුදු පුත්තු නාට්‍යයට පාදක වන යෙර්මා නාට්‍යයෙහි කතා පුවතෙහි යෙර්මා සහ යුවාන් ඛේදාන්තයට පත් වන්නේ ඔවුන්ගේ වරදිනි. ගලප්පත්තිගේ මුහුදු පුත්තු නාට්‍යයෙහි සරා, තේගිරිස්, දියෝනිස්ට අත්වන ඛේදනීය ඉරණම කිසිවකු දැන සිදු කරන වරදකින් නොව, තමන්ගේ අභිලාෂයන් ඉටුකර ගැනීමට පෘතග්ජන මිනිසුන් ලෙස ක්‍රියා කරන විට එහි අන්තර් ප්‍රතිඵල ලෙස අත්වන ඵලයෙහි විපාක ලෙස දැක්විය හැකි ය. එයින් මිදීමට ඔවුනට කිසිදු අවකාශයක් නැත.

> "තේමාවෙන් ද මුහුදු පුත්තු නාටකය යෙර්මා නාටකයෙන් බෙහෙවින් වෙනස් විය. ලෝර්කාගේ නාටකයේ ඛේදාන්තය ඇති වන්නේ යෙර්මා සහ යුවාන්ගේ වරදින් ය. ගලප්පත්තිගේ නාටකයේ සරා, තේගිරිස්, සහ දියෝනිස් වරදකරුවන් නොවේ. ඔවුන්ට සිදුවන දේ ගැන ඔවුන්ට කළ හැකි දෙයක් නැත. මුහුදු පුත්තු නාටකයේ පොතේ ගුරෙක් සිටියේ නම් නාට්‍ය අවසානයේ දී ඔහු 'නොදනිම් කාගේ වරදා' යැයි ගයනු නියත ය" (ජයවර්ධන 1999:63).

මෙහි දී ගලප්පත්ති සිය නාට්‍යයේ ප්‍රධාන භූමිකා වූ සරා, තේගිරිස්, දියෝනිස්ගේ ක්‍රියා සිදුවීමට බලපෑ අභ්‍යන්තරික චෛතසික බලවේග සහ බාහිර ප්‍රතිචාර හේතුඵලවාදී ව මතු කරමින් නාට්‍යයේ ගැටුම උච්චතම අවස්ථාවට රැගෙන යන පරිදි සිද්ධි සහ අවස්ථා මනා ව ගළපා ඇත. ගලප්පත්තිගේ මුහුදු පුත්තු නාට්‍යය වර්තමාන ප්‍රේක්ෂකාගාරය වුව ද අභිරුචියෙන් වැළඳ ගන්නේ එහි වස්තුවිෂයෙහි ඇති සදාතනික විශ්වීය අගය සහ ගලප්පත්ති විසින් එය


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හේතුඵලවාදී සජීවී මානුෂීය දෘෂ්ටියකින් ප්‍රතිනිරූපණය කළ නිසා ය. මෙහි සුවිශේෂත්වය වන්නේ ගලප්පත්ති යෙර්මා නාට්‍යයෙහි වස්තුවිෂය පමණක් නොව කතා වින්‍යාසය, ආකෘතිය ද ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකාගාරයට ගැළපෙන පරිදි දේශීයකරණය කරමින් ප්‍රතිනිර්මාණය කිරීම යි.

යෙර්මා නාට්‍යයෙහි කතා පුවත දිග හැරෙන්නේ කෘෂිකාර්මික සමාජ පසුබිමක ය. ගලප්පත්තිගේ මුහුදු පුත්තු නාට්‍යයෙහි කතා පුවත වස්තුවිෂයට ගැළපෙන පරිදි මසුන් මරන්නන්ගේ දිවිපෙවෙත පාදක කර ගත් අත්දැකීමක් ලෙස විග්‍රහ කර යි. මෙහි දී ගලප්පත්ති මිනිස් ජීවිතයේ ඇති ගැඹුර, එහි ඇති අවිනිශ්චිත බියකරු බව ගැඹුරු සාගරයේ ඇද්දැකීම් ඇසුරෙන් සංකේතවත් කරයි. මුහුදු ජීවිතයේ අද්දැකීම් ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකාගාරයට ආගන්තුක නොවෙ යි.

"එපා පුතුනේ මුදු යන්න
රෑ දවාලෙයි හිතුමතේ
ඔරුව යන්නේ මකර කටටයි
සුළං පහරට අසුවෙතේ
මහා මේරුව හැපී පොඩි වී
ඔරුව සුන්වනු ඇත පුතේ
ටිකිරි පුතුනේ නැසුණු ඔරුවෙන්
කවුරු මෙගොඩට ගොඩ වෙතේ... "
(ගලප්පත්ති: මුහුදු පුත්තු නාට්‍යය).

සරා තම විවාහක සැමියා සිටිය දී දියෝනිස්ගෙන් දරුවකු අපේක්ෂා කරන්නේ හුදු කායික අවශ්‍යතාවක් සන්සිඳුවා ගැනීමට නොවෙ යි. විවාහයෙන් කාන්තාවක අපේක්ෂා කරන මව්පදවිය නම් උත්තරීතර පදවියට පත් වීමට ගැහැණියක ලෙස ඇය සිත තුළ පවත්නා අසීමිත ආශාව හා බලාපොරොත්තු ව සාක්ෂාත් කර ගැනීමට ය.

සරා: උඹලට කොච්චර කිව්වත් මේවා තේරෙන්නේ නැහැ මල්ලියේ. උඹත් ගැහැණියෙක් වෙලා ඉපදුනා නම් උඹටත් මන් විඳින දුක තේරේවි. බලපන් මගේ ඇඟ දිහා උකුළ දිහා මොනව හරි අඩුපාඩුවක් උඹට පේනව ද? මේ උකුලෙන් දරුවෝ කී දෙනෙක් බිහි කරන්න පුළුවන් ද? දීග ගිය ගැහැණියෙකුට ළමයි හම්බනුනොත් ඇගේ ලේ විස වෙනවලු"
(ගලප්පත්ති: මුදු පුත්තු නාට්‍යය).

ගලප්පත්ති සිය නාට්‍යයෙහි වස්තුවිෂය ලාංකීය ගැමි සමාජයේ මුල් බැසගත් විශ්වාස, සංකල්ප එකතුකොට ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකාගාරයට ගැළපෙන පරිදි කලාත්මක ව විශ්වාසනීය ලෙස ගොඩ නග යි. දරුවකු නොමැති විට ගැහැණියකට සමාජයේ අත් විඳින්නට සිදු වන පීඩා, එම පීඩාවෙන් මිදෙන්නට ගැමියන් නොපෙනෙන බලවේග "දෙවියන්" ලෙස ආමන්ත්‍රණය කොට ඒ පිළිබඳ දක්වන දැඩි විශ්වාස, විවාහයේ දී කේන්දරය ගැළපීම වැනි අදෘශ්‍යමාන බලවේගයන් කෙරෙහි ගැමියන් දක්වන සැලකිල්ල ආදී කරුණු ගලප්පත්ති මුහුදු නාට්‍යයේ වස්තුවිෂයට එකතු කරන්නේ අනුවර්තන නාට්‍යයක් වුව ද ශ්‍රී ලාංකේය ජන විඥානය පාදක කර ගනිමින් දේශීය නාට්‍ය වේදිකාවට අපූරුවට ගැළපෙන ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කිරීමේ ඔහු සතු කුසලතාව ප්‍රකට කරමිනි. මෙනිසා ම මෙම යුගයේ බොහෝ අනුවර්තන නාට්‍ය අසාර්ථක වෙද් දී ගලප්පත්තිගේ මුහුදු පුත්තු නාට්‍යය සාර්ථක නාට්‍යයක් බවට පත් වෙයි. දෙබස් සංවාද සහිත ව කතා වින්‍යාසය ගොඩ නැගෙන මුහුදු පුත්තු නාට්‍යයේ සංවාද, ගීත, නාට්‍යෝචිත කාව්‍යාත්මක බවින් යුක්ත ය. සාගරයක් සේ ඉමක් නොදැකිය හැකි මිනිස් ජීවිතයේ අපේක්ෂා, සිතිවිලි සරා ගයන මෙම ගීතයෙන් ධ්වනිත වෙයි.

"මුදු පතුල යට ඉඳලා
මුතු ඇටයක නිදි කරවා
පෙණ කැටියක පා කරලා
මගෙ දෝතට පුතු ආවා....

සුදු පාටින් පහන් තරුව දුර අහසේ දිළිසෙනවා
සුදු පාටින් ටිකිරි සිනා පුතුගෙ මුවින් ගිලිහෙනවා

වෙරළෙන් කිරි කවඩි සොයා කෙනෙක් පුතුට ගෙන එනවා
තවත් කෙනෙක් පාට පාට පබළු කඩෙන් ගෙන එනවා
ඒ පබළුයි මේ කවඩියි එක නූලේ අමුනනවා
ඒවායින් කවඩි සදා පුතුගෙ ඉණේ පළඳනවා
පුතුගෙ ඉණේ පළඳනවා..."
(ගලප්පත්ති: මුහුදු පුත්තු නාට්‍යය).

මුහුදු පුත්තු නාට්‍යයේ භාෂාවෙහි ද ජන වහරෙහි ඇති යෙදුම්, උපමා, රූපක බහුල ව දැකිය හැකි ය.

"හින්නි හාමි ගැබ්බර වෙලාලු මම ඒක අම්මට කිව්වහමයි කතාව දිග්ගැස්සුනේ...."
"කුසෙන් හැල්ලු වෙනවා.... "
"කතරගම දෙයි හාමුදුරුවන්ගෙ පිහිටයි.... "
"ගොඩක් වළක් නොපෙනෙන දුර ඔරුව පැදගෙන යනවා .... "
"පුතේ උඹට නින්ද ගිහිල්ල මම නැහැ උඹ කුද්දන්නේ ... "
" ඒ ගැනි ලීයෙන් හදාපු ඔරුවක් නෙවෙයි.... "
(ගලප්පත්ති: මුහුදු පුත්තු නාට්‍යය).

මෙලෙස නාට්‍යයෙහි වස්තුවිෂයට අපූරුවට ගැළපෙන මුහුදු පුත්තු නාට්‍යයේ බස් වහර සහ සංවාද නාට්‍යයෙහි නිරූපිත චරිතයන්හි අභ්‍යන්තර චෛතසිකය මැනවින් විශද කිරීමට සමත් වෙයි. මේ අනුව මුහුදු පුත්තු වූ කලී යෙර්මා නාට්‍යයේ පරිවර්තනයක් හෝ අනුවර්තනයක් නොව යෙර්මා කියවීමෙන් ලත් වින්දනය නිසා ලියන්නට යෙදුණු අභිනව නාට්‍යයක් ලෙස සරච්චන්ද්‍ර සහ සුනිල් ආරියරත්න යෙර්මා නාට්‍යය පරිවර්තනයට ලියා ඇති පරිවර්තන සටහන්වලින් පැහැදිලි වෙයි. මුහුදු පුත්තු නාට්‍යයෙහි වස්තුවිෂය, ආකෘතිය, කතා වින්‍යාසය ගොඩ නැගීමේ දී ගලප්පත්ති තුළ ජීවත් වූ අපූරු ශ්‍රී ලාංකේය ජන විඥානයෙන් ගොඩ නැගුණු කලාකරුවා ඉස්මතු වීම නාට්‍යයෙහි සාර්ථකත්වයට ප්‍රබල

 © 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

හේතුවක් වී ඇති බව මුහුදු පුත්තු නාට්‍යය රසවින්දනයේ දී තහවුරු වෙයි.

මුහුදු පුත්තු නාට්‍යයෙන් අනතුරුව වර්ෂ 1967 ගලප්පත්ති විසින් නිර්මාණය කළ ලියතඹරා නාට්‍යය ප්‍රංශ ජාතික නාට්‍යවේදියෙකු වූ විශ්ව කීර්තියට පත් ජීන් පෝල් සාත්‍රේගේ ‘ලේ මාසලේ’ නාට්‍යයෙහි අනුවර්තනයකි. ලියතඹරා නාට්‍යය ද ගලප්පත්තිගේ මුහුදු පුත්තු නාට්‍යය මෙන් ම ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකාගාරය බෙහෙවින් ප්‍රතිචාර දැක් වූ නාට්‍යයක් බවට පත් විය. හැටේ දශකයේ දේශපාලන අද්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණය වූ ලියතඹරා සමස්ත ශ්‍රී ලාංකේය දේශපාලන ව්‍යුහය විචාරාත්මක ව නිරූපණය කරයි. මේ අනුව සාත්‍රේගේ දෘෂ්ටියට නව අරුතක් එක් කළ ගලප්පත්තිගේ ලියතඹරා නාට්‍ය නිර්මාණයෙන් ඔහු සතු ශ්‍රී ලාංකේය දේශපාලන දැක්ම සහ දැනුම කලාත්මකව විවරණය කරයි. මෙම නාට්‍යය මගින් ගලප්පත්ති දේශපාලන සටන් පාඨකරුවෙකු නොවී ශ්‍රී ලාංකේය ජන විඥානය තුළ තැම්පත් ව ඇති දේශපාලන දැක්ම සහ අද්දැකීම් මනාව හඳුනා ගෙන සිය නාට්‍ය නිර්මාණය මගින් ශික්ෂණයකින් යුතුව අපූරුවට විවරණය කරයි. කලාකරුවෙකුට ඇවැසි සමාජ දේශපාලන දැනුමෙන් සන්නද්ධ ගලප්පත්ති සිය ලියතඹරා නාට්‍යය නිර්මාණය මගින් ශ්‍රී ලාංකේය අනාගත දේශපාලන දෘෂ්ටිය ද ස්පර්ශ කළ බව වර්තමාන දේශපාලනය තුළ සුලභ ව භාවිත වන ‘ත්‍රස්තවාදී’ යන වචනය ද සිය නාට්‍ය නිර්මාණයට භාවිත කිරීමෙන් සනාථ වෙයි. මෙම නාට්‍යයට පාදක වන්නේ දේශපාලන ඝාතනයකි. ආණ්ඩු පක්ෂයත්, ජනතා පක්ෂයත් අතර සමගි සම්මුතියක් ඇති විය යුතු යැයි යෝජනාවක් ඉදිරිපත් වෙයි. මාක්ස්වාදී සංවිධානයක් වන ජනතා පක්ෂයේ පිරිසක් ඊට විරුද්ධ වූවත් වැඩි ඡන්දයෙන් යෝජනාව සම්මත වෙයි. සම්මුතිය පිළිබඳ සාකච්ඡාව ඊට පක්ෂව කටයුතු කළ නිකලස්ට පැවරෙයි. ඊට විරුද්ධ කණ්ඩායම නිකලස් ව මරා දැමීමට කුමන්ත්‍රණය කරන අතර එහි මූලිකත්වය ගන්නේ නිකලස්ගේ ලේකම්ධුරය දැරූ හියුගෝ ය. මෙම රහස හියුගෝ විසින් තම බිරිඳ වූ ජෙසිකාට පවසා යි. නිකලස් කෙරෙහි අනුකම්පාව උපදවන ජෙසිකා හියුගෝව ඉන් වැලැක් වීමට තැත් කරයි. එයට සවන් නොදෙන හියුගෝ නිකලස් මරා තම පක්ෂයේ අරමුණ ඉටු කිරීමට ඉදිරිපත් වෙයි. ඒ අනුව පක්ෂයේ නියෝජිතයන් සමඟ සම්මුති සාකච්ඡාව පවත්වන අවස්ථාවේ නිකලස්ට වෙඩි තබා මරා දැමීමට හියුගෝ සූදානම් වුවත් පිටතින් කිසිවකු බෝම්බයක් දමා ගැසීම නිසා ප්‍රයත්නය අසාර්ථක වෙයි. මේ අතර ජෙසිකා විසින් නිකලස් කෙරෙහි ඇල්මක් දක්වා තම ස්වාමියාගේ කුමන්ත්‍රණය නිකලස්ට පවසා යි. කෙසේ හෝ නිකලස් තම ප්‍රතිවාදියා වූ හියුගෝ ව තමාගේ පැත්තට හරවා ගනිමින් තමාගේ අරමුණ පක්ෂ ප්‍රතිපත්ති පාවා දීමට නොව හැකි උපරිම ශක්තියෙන් ආණ්ඩු බලය අල්ලා ගෙන පොදු ජනතාවට සේවය කිරීම බව නිකලස්ට අවබෝධ කර දෙයි. නාට්‍යය අවසානයේ තම බිරිඳ ජෙසිකා නිකලස් සමඟ අයුතු සම්බන්ධතාවක් පවත් වන්නේ යැයි දැන ගත් හියුගෝ නිකලස්ට වෙඩි තබා මරා දමයි. සමස්තයක් ලෙස බැලූ කල ගලප්පත්ති විසින් ‘ලියතඹරා’ නාට්‍යයෙන් මතු කරන සමකාලීන දේශපාලන ව්‍යුහය තුළ සිදු වන මෙම ගැටුම සිද්ධි, ලාංකේය සමාජ දේශපාලන සංස්ථාව විචාරාත්මක ව චිත්‍රණය කරයි. ලියතඹරා නාට්‍යයෙහි ගැටුම පියවර දෙකකින් සිදු වේ. මෙම නාට්‍යය සන්දර්භයෙහි මුඛ්‍ය ගැටුම පවතින දේශපාලන ව්‍යුහයේ බල අරගලය මුල්කොට ගෙන ඇති වන අතර ද්විතියික ගැටුම ස්ත්‍රී - පුරුෂ සම්බන්ධතා නිසා මතු වන චෛතසික හැඟීම් නිසා ඇති වෙයි. මෙම ගැටුම් දෙක නාට්‍යයේ කථා වින්‍යාසයේ තල දෙකක ක්‍රියාත්මක වන අතර අවසානයේ නාට්‍යකරුවා විසින් අපූරුවට මේවා ගළපා සමස්ත මානව සමාජයේ ජන විඥානයෙහි අන්තර්ගත අද්දැකීමක් වන දේශපාලන ව්‍යුහය තුළ සිදුවන බල අරගලය මුල් කරගත් අක්‍රමිකතා සහ අවසානයේ පොදු ජනතාවට උරුම වන අපේක්ෂාභංගත්වය උපහාසයකින් යුතුව නිරූපණය කරයි.

මෙලෙස විදේශීය නාට්‍ය කෘතියක් පාදක කර ගත්ත ද එය ශ්‍රී ලාංකේය ජන විඥානය ඉස්මතු වන අයුරින් ප්‍රතිනිර්මාණය කළ බැවින් ගලප්පත්තිගේ ලියතඹරා නාට්‍යය දේශීය නාට්‍ය කලාවේ පර්යේෂණාත්මක අවධියෙහි බිහි වූ සමකාලීන සමාජ දේශපාලන ව්‍යුහය යථාර්ථවාදී ව චිත්‍රණය කළ සාර්ථක නාට්‍යයක් බවට පත විය.

> “ලියතඹරා නාට්‍යයේ විශේෂත්වය ලෙස දැක්විය හැක්කේ එය අනුවර්තනය කර ඇති ආකාරය යි. සාත්‍රේගේ මූලික තේමාව උපුටා ගෙන එය මෙරට දේශපාලන තත්වය හා ප්‍රේක්ෂක රුචියට අනුකූල වන පරිදි මැනවින් සකස් කර ඇත. මෑතකදී ඉදිරිපත් කර ඇති අසාර්ථක අනුවර්තන නාට්‍ය අනුව සලකන කල මෙම ප්‍රයත්නය වඩාත් අගය කළ යුතුය” (එදිරිසිංහ 1999:20).

ජපන් ජාතික නාට්‍යවේදියෙකු වූ කිකුචිං කං ගේ ‘චිචිකපුරු’ නම් කෘතිය පාදක කරගෙන ගලප්පත්ති විසින් වර්ෂ 1969 දී ‘තාත්තා’ නම් කෙටි නාට්‍ය අධ්‍යක්ෂණය කරන ලදි. පසු කාලයේ නාට්‍යකරුවන් කිහිප දෙනෙකු ම මෙම නාට්‍ය කෘතිය පාදක කරගෙන සිංහල අනුවර්තන නාට්‍ය නිර්මාණය කළ ද, මහාචාර්ය ආරිය රාජකරුණා විසින් සිංහල බසට පරිවර්තනය කොට සකස් කරන ලද සිංහල නාට්‍ය පෙළ අනුව ගලප්පත්ති විසින් අධ්‍යක්ෂණය කළ ‘තාත්තා’ නාට්‍යය සාර්ථක ම නාට්‍යය වූ බව විචාරක මතය යි. මධ්‍යම පාන්තික පවුලක පිය පුතු සබඳතා වස්තුවිෂය කර ගනිමින් නිර්මාණය වන මෙම නාට්‍යයට විදේශීය කෘතියක් පාදක වුව ද නාට්‍යයේ තේමාව සහ වස්තුවිෂය ශ්‍රී ලාංකේය ජන සමාජයේ ජීවත් වන පවුල හා එහි සාමාජිකයින්ට අතිශයින් ම සමීප ලෙස ගොඩ නගා ඇත. මෙම කතා පුවතට මුල්වන පවුලෙහි පියා තම දරුවන් තිදෙනා හා බිරිඳ අත්හැර යයි. සියලු දුෂ්කරතා විඳදරා ගනිමින් පවුලෙහි වැඩිමහල් පුතා පවුලෙහි වගකීම තම උරමතට ගෙන එය පවත්වා ගෙන යාමට වෙර දරයි. අවුරුදු විස්සකට පසුව පියා තම දරුවන් වෙත පැමිණෙන්නේ කිසිවක් කර කියා ගත නොහැකි රෝගියකු බවට පත් අසරණයකු ලෙසට ය. පියා නැති පවුලේ සියලු වගකීම් දැරූ ලොකු පුතා විසින්


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තම පියා ප්‍රතික්ෂේප කරන අතර බාල පුතුන් දෙදෙනා පියා වෙත සෙනෙහස පායි. අනතුරුව නාට්‍යය පුරා ම දක්නට ලැබෙන්නේ පෙරදිග සංස්කෘතියෙහි කුටුම්භයෙහි දක්නට ලැබෙන සදාතනික ප්‍රශ්නයක් වන පිය-පුතු ආකල්ප ගැටුම යි. මෙම නාට්‍යයෙහි පසුතල නිර්මාණය, ඇඳුම් පැළඳුම් ජපන් සංස්කෘතියට අනුව සකස් කර තිබුනත්, මෙහි වස්තුවිෂය හා කතා තේමාව ශ්‍රී ලාංකේය ජන විඥානය අපූරුවට මතු කරයි. ශ්‍රී ලාංකේය මධ්‍යම පාන්තික පවුල් පසුබිමක පියා සහ පුතා අතර ඇති බැඳීම, එම අභ්‍යන්තර බැඳීම පවත්වා ගෙන යෑමේ දී ඇතිවන මානසික සට්ටන, එහිදි එක ම පවුලක දරුවන් දක්වන ප්‍රතිචාරවල විවිධත්වය, ආදී අතිශය සියුම් මානව හැඟීම් ගලප්පත්ති විසින් අපූරුවට සිය නාට්‍ය මගින් කතිකාවට ලක් කරයි. මෙහි දී ඔහු විසින් සිය නාට්‍යය අධ්‍යක්ෂණය සඳහා භාවිත කරන ස්ටැනිස්ලාව්ස්කිගේ රංග සම්ප්‍රදාය බෙහෙවින් දායක වී ඇති බව පෙනේ. මෙම රංග රීතිය ඔස්සේ තමා ලබා ගත් දැනුම හා ශික්ෂණය ගලප්පත්ති විසින් තම නාට්‍යයේ නළු නිළියන් පුහුණු කිරිමේ දී භාවිත කළ බව මෙහි ප්‍රධාන භූමිකා රඟ දැක් වූ සමන් බොකලවෙල (තාත්තා භූමිකාව) වික්‍රම බෝගොඩ (ලොකු පුතා භූමිකාව) එස් ලියනගේ (පොඩි පුතා භූමිකාව) කුසලතාපූර්ණ රංගනයන්ගෙන් සනාථ වෙයි. මේ අනුව ගුණසේන ගලප්පත්ති සිය නාට්‍ය නිර්මාණ සඳහා ශ්‍රී ලාංකේය ජන විඥාන පාදක කර ගත්තා පමණක් නොව ඒ තුළින් ජන සමාජයේ ජීවත් වූ චරිත, අද්දැකීම්, සියුම් මානව සම්බන්ධතා අපූරුවට ප්‍රතිනිර්මාණ කළේ ය. ඔහු ශ්‍රී ලාංකේය නාට්‍ය ඉතිහාසයේ විශිෂ්ටත්වයට පත් වන්නේ ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් නොව අනුවර්තන නාට්‍ය ද ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකාගාරයට හැම අතින් ම ගැළපෙන පරිදි නිර්මාණය කිරිමට දැක් වූ කුසලතාව නිසා ය.

> "දේශීය නාට්‍ය කලාවක් සොයා යාමේ යුග මෙහෙවර මෙන් ම නාට්‍ය කලාවේ අද්‍යතන වර්ධනයට හිතකර නව පර්යේෂණාත්මක අත්හදා බැලීම් පිළිබඳ ආවර්ජනය කරන විට ගුණසේන ගලප්පත්ති අමතක කළ නොහැකි ය"
> (අබේපාල 1999:35).

## නිගමනය

සිංහල නාට්‍ය ඉතිහාසයේ පර්යේෂණාත්මක අවධියෙහි නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන ගුණසේන ගලප්පත්ති නාට්‍ය නිර්මාණවල දැකිය හැකි සුවිශේෂත්වය වන්නේ ඔහු විසින් නිර්මාණය කළ ස්වතන්ත්‍ර මෙන් ම අනුවර්තන නාට්‍ය නිර්මාණවලින් සමස්තයක් ලෙස ධ්වනිත වන ශ්‍රී ලාංකේය ජන විඥානය යි. ගලප්පත්ති ඔහුගේ සෑම නාට්‍ය නිර්මාණයක් ම අන්තර්ගතය පමණක් නොව ආකෘතිය ද දේශීයකරණය කරමින් ලාංකික ප්‍රේක්ෂකාගාරයට ගැළපෙන පරිදි නිර්මාණය කළේ ය. ගලප්පත්තිගේ අනුස්මරණීය නාට්‍යය නිර්මාණය වූ මුහුදු පුත්තු නාට්‍ය සර්ව කාලීන නාට්‍යය නිර්මාණයක් බවට පත් වන්නේ කලාකරුවකු වශයෙන් ඔහු තුළ ජීවත් වූ මානවහිතවාදී අපූරු මිනිසා නිසා ය. මෙම නාට්‍යයෙහි එන චරිත, සිදුවීම් සියල්ල එදිනෙදා ජීවිතයේ දී අපට මුණ ගැසෙන ජීවමාන චරිත සහ සිදුවීම් ය. ඔවුන්ගේ සිතුම් පැතුම් ක්‍රියාකලාප පොදු මානව ධර්මතා අනුව ගොඩ නැගුණු විශ්වාසනීයත්වයෙන් පිරි සජීවී බවින් යුක්ත ය. ගලප්පත්ති ලියතඹරා නාට්‍යයෙන් සංකීර්ණ සමාජ දේශපාලන ප්‍රශ්නයක් කලාත්මක ව විග්‍රහ කරයි. අනුවර්තිත නාට්‍යයක් ලෙස නිර්මාණය වුව ද ලියතඹරා තුළින් කතිකාවතට ලක් කරන සමාජ දේශපාලන ප්‍රශ්න, එහි ක්‍රියාත්මක වන චරිත සහ සිදුවීම් වර්තමාන ශ්‍රී ලාංකේය දේශපාලන ව්‍යුහය අපූරුවට චිත්‍රණය කරයි. මෙහි දී සුවිශේෂත්වය වන්නේ දේශපාලනය වැනි කටෝර සංකීර්ණ සමාජ ප්‍රශ්නයක් වුව ද ප්‍රතිභාපූර්ණ කලාකරුවකු ලෙස අතිශය සංයමයකින් යුතුව කලාත්මකව සිය නාට්‍ය නිර්මාණයෙන් විග්‍රහ කිරිමට ගලප්පත්ති දැක් වූ අපූරු කුසලතාව යි. එකිනෙකට වෙනස් පරාසයන්වල විහිදුණු තේමා සිය නාට්‍ය සඳහා භාවිත කළ ගලප්පත්ති සිය 'තාත්තා' නම් අනුවර්තිත නාට්‍යයෙන් ශ්‍රී ලාංකේය ජන සමාජයේ මධ්‍යම පාන්තික පවුලක පියා සහ පුතුන් අතර ඇතිවන අන්තර් සම්බන්ධතා සහ එහි ප්‍රතිඵල ලෙස ඇති වන ගැටුම් කලාත්මක ව නිරූපණය කරයි. සමස්තයක් ලෙස ගුණසේන ගලප්පත්ති නාට්‍ය නිර්මාණ විමර්ශනයේ දි පැහැදිලි වන්නේ ඔහුගේ නාට්‍යවල වස්තු විෂය, චරිත, සිදුවීම් සහ සමස්ත හරයන් සර්ව කාලීන බවින් යුක්ත වීම යි. සිය නාට්‍ය සඳහා පාදක කර ගත් විදේශීය නාට්‍ය කෘති සියල්ල තෝරා ගැනීමේ දී එහි තේමාවන් ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකාගාරයට ගළපා ගත හැකි නිර්මාණ ලෙස හඳුනා ගෙන එම තේමා සිය ප්‍රතිභාපූර්ණ නිර්මාණ කෞෂල්‍යය විදහා දක්වමින් දේශීය ප්‍රේක්ෂකාගාරය ජය ගත හැකි පරිදි ප්‍රතිනිර්මාණය කිරිමට ගලප්පත්ති තුළ තිබූ නිසග හැකියාව නිසා ඔහු සිංහල නාට්‍ය ඉතිහාසයේ සටහන් වන්නේ ශ්‍රී ලාංකේය ජන විඥානය මැනවින් හඳුනාගෙන නාට්‍ය නිර්මාණකරණයෙහි යෙදුණු දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වුණු ප්‍රතිභාපූර්ණ නාට්‍යකරුවෙකු ලෙසට ය.

> "බොහෝ විට ඔහුගේ නාට්‍යවල චරිත මනුෂ්‍යත්වයේ හොඳ නරක ප්‍රබල දුබලතා මිශ්‍ර වූ පොදු සාධාරණ චරිත විය. එසේ ම ඔහු නිර්මාණය කළ චරිත බොහෝ විට විදේශීය කෘති අනුවර්තවල දී පවා දේශීය පොළොවේ මුල්බැසගත් ස්වභාවයේ චරිත විය. අප නාට්‍ය ඉතිහාසය දෙස බලන විට දේශීය ජන විඥානය මත පදනම් වූ අනන්‍යතාව පළ කළ නාට්‍යකරුවා ලෙස ගලප්පත්ති හැඳින්වීම ඔහු වෙනුවෙන් යුක්තිය ඉටු කිරිම වනු ඇතැයි සිතමි" (අබේපාල 1999:35).

## පරිශීලිත මූලාශ්‍රය

### ග්‍රන්ථ

අබේපාල, රෝලන්ඩ් (2016), ගුණසේන ගලප්පත්ති සහ ඔහුගේ නාට්‍ය කලාව, අබේපාල රෝලන්ඩ් (සංස්:) අභිනය ගුණසේන ගලප්පත්ති 4 සමරු කලාපය, සංස්කෘතික දෙපාර්තමේන්තුව බත්තරමුල්ල.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

එදිරිසිංහ, සතිස්චන්ද්‍ර (2016) ගුණසේන ගලප්පත්ති නම් වූ නාට්‍යවේදියා පිළිබඳ සජීවී සටහන්, අබේපාල රෝලන්ඩ් (සංස්:) අභිනය ගුණසේන ගලප්පත්ති 4 සමරු කලාපය, සංස්කෘතික දෙපාර්තමේන්තුව බත්තරමුල්ල.

ජයවර්ධන, බන්ධුල (2016) සිංහල නාට්‍ය කලාවේ අභාග්‍යයට ඔහු අතරමග නතර විය. ගුණසේන ගලප්පත්ති පිළිබඳ මතක සටහන්, අබේපාල රෝලන්ඩ් (සංස්:) අභිනය ගුණසේන ගලප්පත්ති 4 සමරු කලාපය, සංස්කෘතික දෙපාර්තමේන්තුව බත්තරමුල්ල.

ධර්මකීර්ති, රන්ජිත් (2016) ස්ටැනිස්ලොව්ස්කි හා ඔහුගේ රූපණ විධි ක්‍රමය, මධු ප්‍රින්ටින් වර්ක්ස්, දෙල්ගොඩ.

**දෘශ්‍ය කාව්‍ය**

ගලප්පත්ති, ගුණසේන, මුදු පුත්තු නාට්‍යය (1962).

ගලප්පත්ති, ගුණසේන, ලියතඹරා (1967).

ගලප්පත්ති, ගුණසේන, තාත්තා (1969).

**පුවත්පත් ලිපි**

ලංකාදීප 1984-12-21, සරච්චන්ද්‍ර එදිරිවීර, කොළඹ, සීමාසහිත විජය පුවත්පත් සමාගම.

**වෙබ් අඩවි**

https://www.leclife.com/index.php?alec=search\&qlec=Mudu\%20Pathula\%20Yata\%20Idala

http://www.ebooklibrary.org/article/whebn0011368924/gunasena\%20galappatty

 © 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 30-39
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ඌව පළාතේ ගුහා විහාර සිතුවම් පිළිබඳ සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

## (A Cultural and Archeological Study of Cave Temple Paintings in Uva Province)

ජයන්ති බණ්ඩාර

සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

jayanthi@sinh.cmb.ac.lk

**සාරසංක්ෂේපය**

මෙය ඌව පළාතේ බෞද්ධ ආරාමවල ඉතිහාසය පිළිබඳ කෙරුණු විශ්ලේෂණාත්මක පර්යේෂණයකි. ඒවායින් බොහෝමයක් 18වන සහ 19වන සියවස්වලට අයත් ය. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ බොහෝ බෞද්ධ විහාරස්ථානවල සහ දිවයිනේ දකුණු වෙරළබඩ ප්‍රදේශවල පිහිටි බෞද්ධ විහාරස්ථානවලත් සිතුවම් බහුල ලෙස පින්තාරු කර ඇත. ඌව පළාතේ බෞද්ධ ආරාම සහ රටේ අනෙකුත් ප්‍රදේශවල සමකාලීන විහාරස්ථානවල නිරූපිත සිතුවම්වල බොහෝ වෙනස්කම් තිබේ. ප්‍රධාන වශයෙන් ඒවා කලා සම්ප්‍රදායේ ශෛලිය හා අන්තර්ගතය පිළිබිඹු කරයි. 18 වන සහ 19 වන සියවස්වල පන්සල් සිතුවම් බොහොමයක් කේන්ද්‍රගත වී ඇත්තේ මහනුවර සහ එහි තදාසන්න ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමිනි. එසේ ම වෙරළබඩ ප්‍රදේශවල සාම්ප්‍රදායික සිතුවම් යුරෝපීය සංගමය විසින් වර්ධනය කරන ලද සමාජ-දේශපාලනික ප්‍රතික්‍රියාවලින් ආස්වාදයක් ලබා ඇත. ආනුභවික පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් ගුණාත්මක ව සහ ප්‍රමාණාත්මක ව දත්ත විශ්ලේෂණය කර ඇත. දත්ත රැස් කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය භාවිත කර ගෙන ඇත.

කේන්ද්‍රීය වචන : ලෙන්විහාර, සම්ප්‍රදාය, ශෛලිය, සිතුවම්, බෞද්ධ ආරාම

This study analytically investigates of the cave temple paintings in the Buddhist monasteries in the Uva Province. It is noteworthy that there are many Buddhist temples in the Central Province as well as in the Southern coastal areas of the Sri Lanka, which have historically valuable paintings in abundance. Most of them dated from the $18^{th}$ and $19^{th}$ centuries. The paintings in the Uva Province significantly differ from those in the other Buddhist monasteries in other parts of the country. These paintings mainly reflect both the style and the content of the art tradition. Most of the temple paintings of the $18^{th}$ and $19^{th}$ centuries were centered around Kandy city and its suburbs. In addition, traditional paintings in the coastal areas are inspired by the socio-political reactions developed with colonial influence. Data were analyzed both qualitatively and quantitatively using empirical research methods. The field study survey has been used primarily to collect the data.

Key words: Cave temple, Tradition, Style, Paintings, Buddhist monasteries

## හැඳින්වීම

මේ අධ්‍යයනය ඌව පළාතේ පිහිටි බෞද්ධ විහාරාමවල ක්‍රිස්තු වර්ෂයෙන් දහඅටවන සහ දහනවවන සියවස්වලට අයත් චිත්‍ර පිළිබඳ ව කෙරෙන විශ්ලේෂණාත්මක විමර්ශනයකි. මේ කාලයේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ බොහෝ බෞද්ධ විහාරවලත් දකුණේ මුහුදුබඩ පළාත්වල පිහිටි බෞද්ධ විහාරවලත් සබරගමුවේ ඇතැම් විහාරවලත් බහුල ලෙස චිත්‍ර ඇඳ තිබේ. එසමයට ගිණිය හැකි ඌව පළාතට අයත් බෞද්ධ විහාරාරාමවල දක්නට තිබෙන චිත්‍ර සහ දිවයිනේ සෙසු පළාත්වල සමකාලීන විහාර චිත්‍ර අතරත් පැහැදිලි වෙනස්කම් රාශියක් දක්නට තිබේ. ප්‍රධාන වශයෙන් ඒවා එම චිත්‍ර සම්ප්‍රදායවල ශෛලිය සහ අන්තර්ගතය යන අංශ දෙකෙන් ම පිළිබිඹු වෙයි. සමකාලීන ශෛලීන්හි සම විෂමතා සහ ඒවා වර්ධනය වීමට තුඩු දුන් සමාජ - ආර්ථික - දේශපාලනික කරුණු මොනවාදැයි සොයා බැලීම මෙහි දී සිදු කර ඇත.

ඌව පළාත යනුවෙන් මේ අධ්‍යයනයේ දී අදහස් කරනු ලබන්නේ දැනට පරිපාලනමය වශයෙන් ඌව පළාත යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශය යි. ඊට බදුල්ල දිස්ත්‍රික්කය ද, මොණරාගල දිස්ත්‍රික්කය ද අයත් වෙයි. ඌව පළාත සංකීර්ණ භූගෝලීය විවිධතාවකින් යුක්ත ය. එවැනි භූගෝලීය සංකීර්ණතාවකින් යුත් ප්‍රදේශයක් සමාජ-සංස්කෘතික සංවර්ධනයේ දී විශ්ලේෂණය සඳහා වැදගත් ඒකකයක් බවට පත් වේ (Seligman 1908, Hartly 1913, 1914, Deraniyagala 1992). ඌවේ ජන ජීවිතය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය පදනම් කරගෙන සකස් වී ඇත.

## සාහිත්‍යය විමර්ශනය

මෙම පර්යේෂණයේ දී ඉවහල් කර ගන්නා ලද මූලාශ්‍රය වර්ග තුනකට වෙන් කළ හැකි ය. එනම්,

- ක්ෂේත්‍ර කටයුතු මගින් රැස් කළ නිරීක්ෂණ
- 18-19 සියවස්වල සිතුවම් කළ චිත්‍ර පිළිබද ව ලියැවී ඇති සාහිත්‍යය
- එම චිත්‍රවලට සමකාලීන වූ සමාජ ඉතිහාසය විග්‍රහ කෙරෙන සාහිත්‍යය

## ක්ෂේත්‍ර කටයුතු මගින් රැස් කළ නිරීක්ෂණ

18-19 වන සියවස්වල බෞද්ධ විහාරාරාමවල සිතුවම් කළ චිත්‍ර සම්ප්‍රදායේ සමාජ අන්තර්ගතය මෙතෙක් ගැඹුරු විශ්ලේෂණයකට බඳුන් වී ඇති අධ්‍යයන ඒකකයක් නොවේ. විසිවන සියවසේ දී එම චිත්‍ර සම්ප්‍රදායේ කේන්ද්‍රීය නිදර්ශන කිහිපයක් සමාජ දේශපාලන දෘෂ්ටි කෝණයකින්, එසේ නොවේ නම් පුළුල් මානව විද්‍යාත්මක පර්යාවලෝකනයකින් විග්‍රහ කිරීමට සාර්ථක උත්සාහයක් දරා තිබේ (Bandanayake, S., 1986, Marie, G., 1983, John Clifford Holt, 1996, කුමාරස්වාමි. ආනන්ද 1962). එහෙත් එම අධ්‍යයන මහනුවර චිත්‍ර සම්ප්‍රදායේ මුල් අවධියට අයත් එනම් 17 වන සියවසේ මැද භාගයේ සහ අවසාන භාගයේ මහනුවර තදාසන්න ප්‍රදේශවල පිහිටි බෞද්ධ විහාරාරාමවල චිත්‍ර කිහිපයකට පමණක් සීමා වී ඇත. මෙහි දී අවධානය යොමු කර ඇත්තේ මහනුවර අවධියේ චිත්‍රවල ශෛලිය, රේඛාකරණය, තේමාවන් ලෙස භාවිත ජාතක කතා සහ අනෙකුත් සිද්ධීන්, සිතුවම් නිරූපණය කිරීම සහ චිත්‍රකරණයෙහි නියැලීමේ දී බලපවත්නා අනෙකුත් අත්‍යවශ්‍ය කාරණා ඌවේ ලෙන්විහාර චිත්‍ර සමඟ සන්සන්දනාත්මක ව සාකච්ඡා කිරීමට ය.

17-18 ශතවර්ෂවලට අයත් ලාංකික චිත්‍ර සම්ප්‍රදාය උඩරට සිතුවම් කලාව, නුවර අවධියේ සිතුවම් කලාව ලෙස වෙසෙසා දැක්වුව ද මේ සම්ප්‍රදායට අයත් බිතුසිතුවම් විශාල ප්‍රමාණයක් හමුවන්නේ 18-19 ශතවර්ෂවලට අයත් විහාරවලිනි (රත්නායක 1995). පොලොන්නරු සහ මහනුවර පාලන අවධි දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ලියැවුණු සාහිත්‍ය කෘති රැසක ම සිතුවම් කලාව හා සම්බන්ධ තොරතුරු රැසක් සඳහන් වී තිබේ. එයින් පොලොන්නරු අවධියේ රචිත සසදාවත, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ යන කෘති කැපී පෙනෙයි. එහෙත් දහනවවන සියවසට අදාළ ව සිතුවම් පිළිබඳ ලියැවුණු සාහිත්‍යය තරමක් දුලබ ය. රාජසිංහ රාජ්‍ය සමය තුළ සිදු වූ මෙම වෙනස චූලවංසයෙහි සහ රාජාවලියෙහි දීර්ඝ ව දක්වා ඇත. කොණ්ඩදෙණිය සන්නස, බඹරගල සන්නස, වළල විහාර තුඩපත, වළල විහාර තල්පත, මැදවල සන්නස, දඹුලු විහාර තුඩපත හා සන්නස යනාදි ලේඛනවල මෙකල වෙහෙර විහාර රැසක් කරවූ බවත් ඒවා සියල්ල බිතුසිතුවමින් අලංකාර කර තිබූ බවත් සඳහන් වේ (ධම්මානන්ද නාවුල්ලේ 1969). කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රාහකත්වය හිමි වූ හෙයින් එකල බිහි වූ බොහෝ බිතුසිතුවම් මහනුවර කාලයට අයත් වන අතර සිතුවම් කලාවේ පුනරුදයක් ද දක්නට ලැබිණි (විජේසේකර 1960). ආනන්ද කුමාරස්වාමි ප්‍රකාශ කරන්නේ කලාවේ ඉෂ්ට මිත්‍රයකු වූ කීර්ති ශ්‍රී රාජසිංහගේ උද්‍යෝගයේ ප්‍රතිඵලයක් ලෙස දහඅටවන සියවසේ සිතුවම් කලාවේ වර්ණ, ශෛලිය සහ ක්‍රමවේදයන් දැන ගැනීමට ප්‍රමාණවත් තරම් සිතුවම් රැසක් තවමත් ශේෂ ව පවතින බව යි.

දෙගල්දොරුව විහාර සන්නසට අනුව එහි චිත්‍ර නිම කොට ඇත්තේ රාජාධිරාජසිංහ රජුගේ කාලයෙහි දී ය. මීට පසුකාලීන ව අංකුඹුර විහාරයට කරන ලද ප්‍රදානයන් පිළිබඳ බුද්ධ වර්ෂ 2341 දී ලියැවුණු සන්නසක සඳහන් වේ. එම විහාරයෙහි පිහිට වූ ප්‍රතිමාවලට අමතර ව මාර පරාජය, සූවිසි විවරණය, සත් සතිය සහ සොළොස්මස්ථාන වැනි දෑ සිත්තමට නැගූ අතර නේත්‍ර මංගල්‍යය පවත්වා සිත්තරුන්ට රන් රිදී ද, ගවයින් හා රෙදි පිළි ඇතුළත් ව රිදී එක්දහස් පන්සියයක දෑ බරපැන් පිණිස ගෙවන ලද බවත් ඉන් කියැවේ (A.C. Lawrie 1989)ග තිලගම සන්නසෙහි මෙන් ම දඹුලු විහාර තුඩපතෙහි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් දඹුලු විහාරයේ අන්දවන ලද චිත්‍ර පිළිබඳවත් ඔහුගේ අමාත්‍ය පිළිමතලාවේ විසින් හයගිරි විහාර පිළිම ගෙයි අන්දවන ලද චිත්‍ර පිළිබඳවත් සඳහන් කරයි (Senaka Bandaranayake 1986). මේ සමයේ අඳින ලදැයි සැලකෙන චිත්‍රයක් ජෝන් ඩේවි විසින් වාර්තා කර ඇත. එම විස්තරයෙන් පෙන්නුම් කරන්නේ විහාරාරාමවල චිත්‍ර කර්මාන්තය සඳහා සැලකිය යුතු රාජානුග්‍රහයක් ලැබී ඇති බව යි. කොට්ටිඹුල්වල විහාර සන්නස ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ රාජෝෘාදයෙන් දසවැන්නෙහි දී කරන ලද ප්‍රතිසංස්කරණයක් පිළිබඳ සඳහන් කරයි. රිදී 1285ක බරපැන දී පිළිම තුනක් සාදවා එහි නේත්‍ර ප්‍රතිෂ්ඨාපනය කරවූ බව ද එහි සඳහන් වේ (කිරිඇල්ලේ ඥානවිමල 1942). සිරි ගුනසිංහට අනුව කුරුණෑගල ප්‍රදේශයේ පිහිටි පාදෙණිය විහාරයේ තිබෙන චිත්‍ර ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයට අයත් යැයි සැලකිය හැකි අතර ලියන්ගස්තැන්න, හල්ඔළුව සෙල්ලාවැලි විහාරය යන ස්ථානවල තිබෙන චිත්‍ර ද මෙම අවදියට අයත් සේ සැලකිය හැකි ය (Siri Gunasinghe 1960).

දිවයිනේ විහාරාරාමවල ඇඳ තිබෙන චිත්‍ර පිළිබඳ විවිධ විවාදාත්මක අදහස් විද්වතුන් විසින් පළ කරනු ලැබුයේ විසිවන සියවස අග භාගයේ දී පමණ ය. කලා ක්ෂේත්‍රයේ නිපුණත්වයක් ලද එම විද්වතුන් ප්‍රකාශ කළ අදහස් තීරණාත්මක වෙයි. මෙසේ ලංකාවේ කලාව පිළිබඳ අදහස් ඉදිරිපත් කළ අය අතර ආසියානු විද්වතුන් මෙන් ම දේශීය විද්වත්තු ද වෙති. ඒ අතර රීස් ඩේවිඩ්ස් (1875), ආනන්ද කුමාරස්වාමි (1907, 1908) සහ ස්ටෙල්ලා ක්‍රාම්රිෂ් (1925), ඇල්. ටී. පී මංජු ශ්‍රී (1977), පී. ඊ. පී දැරණියගල (1951), සිරි ගුනසිංහ (1978, 1979, 1960), සේනක බණ්ඩාරනායක (1986) ඩී. බී. ධනපාල (1956, 1964), ජෝන් හෝල්ට් (1996), විජේසේකර (19), සෝමදේව (2011) යන විද්වතුන්ගේ අදහස් ප්‍රමුඛ වෙයි.

උඩරට සිතුවම් සම්ප්‍රදාය ඉන්දියාවේ ඩෙකෑන් ප්‍රදේශයේ මුස්ලිම් රාජ වංශිකයන්ගේ අනුග්‍රහයෙන් ව්‍යාප්ත වූ සිතුවම් කලාවට නෑකම් කියන බව මහාචාර්ය පරණවිතානගේ අදහස යි. සිරි ගුනසිංහගේ මතය වන්නේ මේ චිත්‍ර කෙරෙහි සියම් චිත්‍ර කලාවේ ආභාසය ලැබී ඇති බව යි. සේනක බණ්ඩාරනායකගේ අදහස වන්නේ ද කුමාරස්වාමිගේ අදහසට සමාන අදහසකි. එනම් මහනුවර සිතුවම් නව සම්ප්‍රදායක ආරම්භයක් නොව පැරණි ගැමි චිත්‍ර සම්ප්‍රදායේ නව විකාසයක් බව යි. (Bandaranayaka 1986:109-113).

විජේසේකර 1984 දී රචිත කෘතිය මගින් ලංකාවේ බෞද්ධාගම හා බැඳුණු කලාවන් සමඟ චිත්‍ර කලාවේ විවිධ මානයන් සම්පූර්ණ කරගැනීමටත් එමගින් ආගමික පුහුණුව හා සහසම්බන්ධ කාරණා සපුරා ගැනීමටත් හැකි වූ බව


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කියයි. ප්‍රංශ ජාතික මාරි ගැතලි ද (1991) මහනුවර චිත්‍ර පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කළා ය. ඇය අවධානය යොමු කර ඇත්තේ මහනුවර චිත්‍ර කලාවට පාදක වූ වස්තු විෂය පිළිබඳව ය. ඇයගේ ප්‍රවේශය අනෙකුත් විද්වතුන්ගේ විචාර මඟට වඩා වෙනස් වූවකි. නමුත් වර්තමාන පළාත් බෙදීම් සහ දිස්ත්‍රික් සීමා වැනි දෑ අනුව යමින් ඇය සිදු කරන වර්ගීකරණය අතීතය දෙස වර්තමාන දෘෂ්ටි කෝණයෙන් බැලීමකි. ඩී. බී. ධනපාල (1956) චිත්‍ර කලාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස් ද වැදගත් වෙයි. මොහු වැඩි වශයෙන් අවධානය යොමු කර ඇත්තේ පැරණි ලාංකේය චිත්‍ර කලාව කෙරෙහි ය. උල්ලුවිස්හේවාගේ (1994) අධ්‍යයනය ධනපාලගේ අධ්‍යයනවලට සාපේක්ෂ ව අඩුපාඩු රැසකින් සමන්විත ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් මුද්‍රණය කරන ලද ශ්‍රී ලංකා බිතුසිතුවම් (1990) යන ශත සාංවත්සරික කලාපයෙහි දිවයිනේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වී තිබෙන ඓතිහාසික මෙන් ම පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුත් විහාර තිස් එකක විස්තර ඇතුළත් කෘති තිස් එකක් මුද්‍රණය කර ඇත (චුටිවොංගස්, ප්‍රේමතිලක, සිල්වා 1990). මංජු ශ්‍රී විසින් 1977 රචිත සිංහල බිතිසිතුවම් කෘතිය, තම්මිට (2006) විසින් රචිත කෘතියේ රිදී විහාරයේ ඇඳ තිබෙන චිත්‍ර පිළිබඳ කෘතිය, 2002 වර්ෂයේ දී සෝමතිලක විසින් රචිත මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ සිතුවම් කලාව යන කෘතිය, සෝමදේව (2012) විසින් රචිත Rock Painting and Engraving Sites in Sri Lanka කෘතිය ලංකාවේ දේශීය පර්වත චිත්‍ර සහ ආලේඛ්‍ය රූප සම්ප්‍රදාය පිළිබඳ මෑත කාලයේ සිදු කරනු ලැබූ විශිෂ්ට පර්යේෂණ කෘතියකි. එමගින් මහනුවර සිතුවම් සම්ප්‍රදාය පිළිබඳ දීර්ඝ ව සාකච්ඡා නොකළත් ඊට පෙර මෙරට පැවති ගුහා සිතුවම් පිළිබඳ විමර්ශනාත්මක විශ්ලේෂණයක යෙදී ඇත. උඩරට සමාජය පැවති ආකාරය පිළිබඳ කාරණ පිළිබඳ දැනුවත් වී සිටීම සිතුවම් අර්ථනිරූපණය කර ගැනීමේ දී වැදගත් වෙයි. ඒ සඳහා රැල්ෆ් පීරිස් (1964) දී රචිත සිංහල සමාජ සංවිධාන මහනුවර යුගය යන කෘතිය, ලීච් (1961) දී ප්‍රකාශයට පත් කළ කෘතිය ලංකාවේ පුල්එළිය, විල්හෙල්ම් ගයිගර් විසින් 1942 දී රචිත Society in Medival Ceylon කෘතිය 1969 දී එම්. බී. ආරියපාල විසින් මධ්‍යකාලීන ලංකා සමාජය ලෙස සිංහලට පරිවර්තනය කරනු ලැබී ය. වංසකතා මූලාශ්‍රය කර ගනිමින් රචනා කළ මෙම කෘතිය වංසකතාවලින් හෙළිවන සමාජ තොරතුරු බොහෝ ප්‍රමාණයක් අනාවරණය කිරීමට ගත් උත්සාහයකි. Ryan 1958 දී රචිත Sinhalese Viallage කෘතිය, කුමාරි ජයවර්ධන විසින් රචිත Nobodies to Somebodies කෘතිය 2006 දී සොක්කන් ලොක්කන් වූ වගයි යනාදී කෘති උඩරට සමාජය පැවති ආකාරය පිළිබඳ දැනගැනීමට ඉතා වැදගත් වෙයි.

## පර්යේෂණ ගැටලු

ඉහත සඳහන් කළ පර්යේෂණ අරමුණු සාධනය කිරීම සඳහා නිශ්චිත පර්යේෂණ ගැටලු තුනක් වෙත අවධානය යොමු කර තිබේ.

i. 18 වන සියවසේ ඌවේ විහාරාමවල ඇඳ තිබෙන චිත්‍ර දිවයිනේ අනෙකුත් පළාත්වල විහාරාමවල ඇඳ තිබෙන චිත්‍ර ශෛලිය, අන්තර්ගතය සහ ඉඩ සැලසුම්කරණය අතින් වෙනස්කමක් පිළිබිඹු කරන්නේ ද?

ii. එසේ නම් ඒ වෙනස්කම්/විශේෂතා පැහැදිලි කරන්නේ කෙසේ ද?

iii. එකී වෙනස්කම්/විශේෂතා ජනනය කරනු ලබන ප්‍රතික්‍රියක ගම්‍යතා (interactive dynamics) හඳුනා ගන්නේ කෙසේ ද? ඒ ගම්‍යතාවන් මොනවා ද?

iv. එවැනි තත්ත්වයක් ඇතිවීම කෙරෙහි 18 වන සියවසේ ඌවේ පැවති ආගමික, සමාජීය, ආර්ථික, දේශපාලනික කාරණා බලපෑවේ ද?

## පර්යේෂණ අරමුණු

දහඅටවන සහ දහනමවන සියවස්වලට අයත් විහාර චිත්‍ර බොහෝ ප්‍රමාණයක් කේන්ද්‍රගත වී තිබෙන්නේ මහනුවර හා තදාසන්න ප්‍රදේශයේ ය. ඒ හැරුණු විට මුහුදුබඩ ප්‍රදේශවල සිතුවම් කර තිබෙන එම සම්ප්‍රදායට අයත් චිත්‍ර සමකාලීන ව ඒ ප්‍රදේශවල පැවති යුරෝපීය ජාතීන්ගේ සම්මිශ්‍රණය හා එමගින් වර්ධනය වූ සමාජ - දේශපාලනික ප්‍රතික්‍රියාවල ආභාසය ප්‍රකට කරයි. 18-19 සියවස්වල දේශපාලන බලය කේන්ද්‍රගත ව පැවති මහනුවරත්, යුරෝපීය බලය පැවති මුහුදුබඩ ප්‍රදේශයත් යන උභයස්ථානයෙන් ම පරිබාහිර ව පිහිටි ඌවේ සමකාලීන විහාර චිත්‍රවල ස්වරූපය අධ්‍යයන කිරීමේ අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත ව ඉදිරිපත් කළ හැකි ය.

- 18 සහ 19 වන සියවස්වල ඌවේ පැවති ආගමික, ආර්ථික, සමාජ සහ සංස්කෘතික පසුබිම මෙම චිත්‍රවලට අනන්‍ය වූ ශෛලිය, අන්තර්ගතය හා සන්දර්භය සමග දක්වන ඓන්ද්‍රීය සබඳතාවේ ස්වරූපය තේරුම් ගැනීම.

## පර්යේෂණයේ වැදගත්කම

ඌව පර්යේෂකයන්ගේ අවධානය ඉතාමක් අඩුවෙන් යොමු පළාතකි. විශේෂයෙන් ලෙන්විහාර සිතුවම් පිළිබඳ අධ්‍යයන කෙරී නැති තරම් ය. නමුත් ඌව යනු පුරාවිද්‍යාත්මක මෙන් ම බහු සංස්කෘතික ලක්ෂණවලින් පෝෂණ වූ ප්‍රදේශයකි. ඌවේ ලෙන්විහාර සිතුවම් පිළිබඳ කරණු ලැබූ මෙම පර්යේෂණයේ වැදගත් කාරණය වන්නේ මෙහි නිරූපිත සිතුවම් මහනුවර යුගය නියෝජනය කළ ද එයට පරිබාහිර වූ ඌවට ආවේණික සම්ප්‍රදායක් ගොඩ නගා ගෙන තිබීම යි. එවැනි සම්ප්‍රදායක් බිහිවීමට බලපෑ හේතු මොනවාදැයි සොයා බැලීමට මෙම පර්යේෂණයේ දී හැකියාව ලැබුණි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයට විෂය වූ පර්යේෂණ තේමාව මගින් ප්‍රශ්න කරනු ලබන්නේ කිසියම් නිශ්චිත කාල අවකාශීය රාමුවක් තුළ සමාජයක් සිය ප්‍රකාශනයට, එනම් විශේෂයෙන් ම සිය ප්‍රජානන ආකෘතීන් ගොඩ නගා ගැනීමටත්, ඒවා


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විමෝචනය කිරීමටත් උපයෝගී කර ගන්නා සංකල්පීය පසුබිම කුමක් ද යන කරුණ යි. සමාජයක වෙසෙන පුද්ගලයින් වෙන් වෙන් වශයෙන් ස්වාධීන ව කල්පනා කරන ආකාරයත්, ඒ කල්පනාවට පසුබිම් වන සංජානනය පුළුල් විවිධත්වයකින් යුක්ත වුව ද ඒ පුද්ගලයින් සාමාජිකත්වය දරන සමස්ත සමාජයේ ප්‍රකාශනය හා සංජානනය ඊට වෙනස් මුහුණුවරකින් යුත් වාස්තවික ප්‍රපංචයක් වෙයි.

සමාජ සංකල්පාවලි (Social ideology) සම්බන්ධයෙන් ලියවුණු පුළුල් සාහිත්‍යයක් තිබේ. කාල් මාක්ස් (1867) හා ලුවිස් අල්තුසර් (1979) මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කර තිබෙයි. මාක්ස් අනුව සමාජ සංකල්පාවලිය යනු නිෂ්පාදනයට අදාළ තත්ත්ව ප්‍රතිනිෂ්පාදනය කිරීම යි (Reproduction of the condition of production). මාක්ස්ගේ මෙම ප්‍රකාශයෙන් අදහස් කරන පැහැදිලි අර්ථය නම් සමාජයක් අරා පැතිරී යන අධිපතිවාදී සමාජ සංකල්ප ජනනය කරනු ලබන්නේ එම සමාජය විසින් අනුගමනය කරන නිෂ්පාදන සම්බන්ධතාවලට සමාන්තරව බව යි. මෙහි දී මාක්ස් විසින් හඳුන්වාදෙන පදනම් ව්‍යුහය (Intrastructure) හා උපරිව්‍යුහය (Super structure) යන සංකල්ප දෙක වෙත අවධානය යොමු කිරීම ප්‍රයෝජනවත් ය. මෙම සංකල්ප දෙක කිසියම් සමාජයක වාස්තවික සමාජ සංකල්පාවලිය නිර්මාණය කිරීමට හේතුවන ආකාරය පැහැදිලි කිරීම මාක්ස්ගේ අරමුණ යි.

සමාජයක පදනම් ව්‍යුහය ගොඩනැගෙන්නේ එකී සමාජයේ ආර්ථික මූලය මත බව ඔහු විසින් පෙන්වා දෙනු ලබන්නකි. ඉතිහාසයේ පටන් සමාජ එකිනෙකට වෙනස් ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලීන් අනුගමනය කර තිබේ. ඒ ඒ අනුව සමාජවල ආකෘතික වෙනස්කම් හට ගනී. මාක්ස්ට පෙර මෙම අදහස් ප්‍රකාශ කරන ලද්දේ සමාජ මානව විද්‍යාඥයෙකු වූ ලූවිස් හෙන්රි මෝර්ගන් විසිනි. වනචාරී සමාජ, එඬේර සමාජ හා ශිෂ්ටාචාරගත සමාජ යනුවෙන් ඔහු සමාජ පරිණාමය වර්ගීකරණයකට ලක් කළේ ය (Morgan 1877). මෝර්ගන් විසින් පැහැදිලි කරනු ලැබූ එම සමාජ වෙනසේ මූලික දර්ශකය නම් අදාළ සමාජ ඒ ඒ අවස්ථාවේ අනුගමනය කරමින් සිටින ආර්ථික නිෂ්පාදන ක්‍රමය යි. මාක්ස්ගේ පැහැදිලි කිරීමට අනුව සමාජයක පදනම් ව්‍යුහය බවට පත්වන අර්ථික ආකෘතියට අමතර ව ඒ සමාජයේ උපරිව්‍යුහය නිර්මාණය කිරීමට අවැසි පදනම සකස් වෙයි. කිසියම් සමාජයක උපරි ව්‍යුහයට අදාළ අංග නම්, එම සමාජය මගින් අනුගමනය කරන නීතිය, ආචාරධර්ම, සෞන්දර්යාත්මක ප්‍රකාශන, රාජ්‍යයේ ස්වභාවය ආදිය යි (Althusar 1970:5). මෙහි දී සමාජයක පදනම් ව්‍යුහය සහ එහි උපරිව්‍යුහය අතර ගොඩනැගෙන සමවාය සබඳතාව කුමක් දැයි යන්න පැහැදිලි ව අවබෝධ කරගැනීමට අවශ්‍ය ය. කිසියම් සමාජයක පවතින ආර්ථික ක්‍රමය දීර්ඝකාලීන පදනමකින් පවත්වාගෙන යාමට නම් එකී ආර්ථික ක්‍රමය මගින් ප්‍රතිලාභ ලබන්නන්ට කිසියම් ධාරක-පෝෂක ව්‍යුහයක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය වේ. නිදසුනක් ලෙස පැහැදිලි කරතොත් ඇතැම් භුක්තිය පදනම් කරගත් සමාජයක් මගින් අනුගමනය කරන ඉඩම් හිමියා හා ප්‍රවේණියා අතර පවතින සමාජ-දේශපාලන ද්වන්ධනාත්මක සබඳතාව (Dialectic relationship) අවම ආතතියකින් යුක්ත ව දීර්ඝකාලීන පදනමකින් පවත්වාගෙන යාම සඳහා සමාජ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. එහි දී සිය ශ්‍රමය වැය කරමින් ඊට සරිලන සමාජයේ නීති ප්‍රතිලාභ නොලබමින් ඉඩම් හිමියා වෙනුවෙන් වෙහෙසෙන ප්‍රවේණිදාසයන්ගේ ජීවන දුක්ඛදායක බව ප්‍රවේගකාරී ආතතියක් බවට පත් නොකිරීමට අවශ්‍ය විධිවිධාන සම්පාදනය කිරීමට ඔවුන්ගේ ශ්‍රමය අසීමාන්තික ව භාවිතයට ගැනීම ඉඩම් හිමියන්ගේ අභිලාෂය වේ. එසේ ශ්‍රමය උදුරා ගැනීමට ඉඩම් හිමියා සතු අයිතිය නෛතිකරණය වීම සඳහා ඔවුන් විසින් නොයෙකුත් විධි ක්‍රම සම්පාදනය කරනු ලැබේ. ආර්ථික ක්‍රමය සහ නිෂ්පාදන සම්බන්ධතා වැඩවසම් වන අතර ඒ ක්‍රමය දීර්ඝකාලීන ව නඩත්තු කිරීමට සම්පාදනය කරන සෙසු සමාජ - දේශපාලනික උපාංග අයත් වන්නේ එකී සමාජයේ උපරිව්‍යුහයට ය. පැරණි බෞද්ධ විහාරවල ඇති ඇතැම් කුලුනු හිස්වල දක්වා තිබෙන බහිරව රූප නිරූපණය කර තිබෙන්නේ ඒ ගොඩනැගිලිවල බර උහුලාගෙන එහෙත් සංගීත භාණ්ඩ වයමින්, නර්තනයේ යෙදෙමින් ප්‍රීතිමත් ව සිටින පිරිසක් ලෙස ය. බහිරව යන සාහිත්‍යමය සංකල්පය උද්ධරණය කිරීමෙන් එලෙස බලය සමග තිබෙන ඍජු සබඳතාව සංකේතවත් කරන අතර එක් අතකින් එය ඉඩම් හිමියන් සතු බිම් ඇස්වැද්දීමට දායක කර ගන්නා ප්‍රවේණිදාසයන් පිළිබඳ සාදෘශ්‍යගත සංකල්ප රූපයක් ද වෙයි.

කිසියම් ජන කණ්ඩායමක් සිය නිෂ්පාදන ක්‍රමයට අවශ්‍ය යාන්ත්‍රණය ප්‍රතිනිෂ්පාදනය කිරීමේ දී අදාළ ජන කණ්ඩායමට අයත් සමාජයේ උපරිව්‍යුහය එමගින් සකස්වන ආකාරය පෙර සඳහන් කරන ලදි. මෙම අධ්‍යයන මගින් අවධානයට ලක් වන ප්‍රදේශයේ ජීවත් වන පිරිස් අතර අවම වශයෙන් මීට සියවස් දෙකකට පමණ පෙර පැවති ජීවන ශෛලිය හා තදනුබද්ධ ව පැවති සංකේතාත්මක චරිත ප්‍රකාශන ශීඝ්‍රයෙන් වෙනස්වීම්වලට ලක් ව ඇති අතර ඇතැම් කණ්ඩායම් මුළුමනින් ම අතුරුදහන් වී ගොස් ය. එසේ වුව ද ඇතැම් ඓතිහාසික ලේඛනවල හා ඉතා සුළුතරයක් වූ වයෝවෘද්ධ ප්‍රදේශවාසීන්ගේ මතකයේ ඉතිරි වී තිබෙන චර්යාත්මක ව්‍යවහාර ද මෙහි දී ජන ජීවිතය ප්‍රතිනිර්මාණය කිරීමට වහල් කොටගෙන තිබේ.

සමාජ සංකල්පාවලි (Social ideologies) ගොඩනැගීම සඳහා ඉතිහාසය හා සම්ප්‍රදාය මතින් ද යම් තරමක බලපෑමක් ඇති කරයි. කිසියම් නිෂ්පාදන ක්‍රමයක් විවිධ හේතු නිසා යම් වෙනස්කම් අත් කර ගන්නා විට සංශෝධිත නිෂ්පාදන ක්‍රමය ප්‍රතිනිෂ්පාදනයේ දී සාම්ප්‍රදායික ඇගයුම් වෙනස්වීම් තීව්‍ර කොට පාලනය කිරීමට අතරමැදි වෙයි. ශ්‍රී ලංකාවේ අලුත් අවුරුදු චාරිත්‍ර මේ සඳහා දැක්විය හැකි පැහැදිලි නිදසුනකි. තවදුරටත් කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමයකට ඍජු ලෙස අසම්බන්ධිත නාගරිකයින් කෘෂිකාර්මික සමාජය උත්පාදනය වූ එම ක්‍රමයට ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවශ්‍ය කරන යාන්ත්‍රණය නිර්මාණය කළ අලුත් අවුරුදු චාරිත්‍ර මහත් ආයාසයෙන් අනුගමනය කිරීමට උත්සාහ කරනු දැකිය හැකි ය. එහෙයින් කිසියම් සමාජයක ඉතිහාසය වෙත


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අවධානය යොමු කිරීම ඒ සම්බන්ධයෙන් වැදගත් ප්‍රතිඵල ලබා දෙයි.

ඌවේ ඓතිහාසික පසුබිම, ඌව වෙල්ලස්ස කැරැල්ල, ඌවේ ජන ජීවිතයේ විශේෂතා, සන්නස්, තුඩපත් සහ අභිලේඛන මගින් ඌවේ ඉතිහාසය ගොඩනැංවීමට පිටුවහලක් ලැබේ. මෙතෙක් ඌවේ ලෙන්විහාර චිත්‍ර පිළිබඳ සිදු කරනු ලැබූ ප්‍රාමාණික පර්යේෂණ දුර්ලභ ය. එහෙයින් ලෙන්විහාර චිත්‍ර පිළිබඳ ද්විතීයික මූලාශ්‍රය සොයා ගැනීම අපහසු ය. එබැවින් තොරතුරු රැස් කර ගත හැක්කේ ඌව පිළිබඳ ලියැවී ඇති සාමාන්‍ය මූලාශ්‍රය ඇසුරෙන් පමණි.

## කරුණු රැස් කිරීම

අධ්‍යයනයේ මූලික උපන්‍යාස පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීමට ක්ෂේත්‍ර අධ්‍යයන වාර 4ක් ක්‍රියාත්මක කෙරිණි. එහි දී තොරතුරු රැස් කළ ආකාරය ශීර්ෂ දෙකක් යටතේ විස්තර කළ හැකි ය. එනම්,

- සාර්ව පරිමාණයේ තොරතුරු වාර්තා කිරීම (documentation of macro scale information) (මේ යටතට පරීක්ෂා කරන ලද එක් එක් බෞද්ධ විහාරස්ථානවල තිබෙන භෞතික හා සමාජීය සන්දර්භය ගැනෙයි).
- ආංශුක පරිමාණ තොරතුරු වාර්තා කිරීම (documentation of micro scale information) (පරීක්ෂා කරන ලද එක් එක් විහාරයේ අභ්‍යන්තර විස්තර මේ යටතට ගැනෙයි).

සාර්ව තොරතුරු යටතේ අදාළ චිත්‍ර සහිත පන්සල්වල සාර්ව සන්දර්භය, ප්‍රාදේශික ඉතිහාසය, සම්මුඛ සාකච්ඡා සහ ලේඛන වාර්තාගත කරන ලදී. ආංශුක තොරතුරු යටතේ සිතුවම් ස්ථානගත කර ඇති අවකාශය, සිතුවම් ව්‍යාප්තියේ ස්වභාවය, දිශානතිය, වර්ණ භාවිතය, සංරචනාත්මක ශෛලිය, නිරූපිත තේමා සහ නිරූපණය කර ඇති සිතුවම්වල මිනුම් වාර්තා ගත කරන ලදී.

මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර චාරිකා මගින් රැස් කරන ලද තොරතුරු පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සලකා තිබේ. මෙහි දී ඌව පළාතේ දිස්ත්‍රික්ක දෙක තුළ පිහිටා ඇති තෝරා ගත් ලෙන්විහාර 10 තනි වශයෙන් විස්තරාත්මක ලෙස වාර්තාගත කරනු ලැබිණි. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී වාර්තාගත කිරීම සඳහා මූලික පියවර දෙකක් අනුගමනය කරනු ලැබිණි. ඉන් පළමුවැන්න නම් ලෙන්විහාරවල ඇති සිතුවම් සම්පූර්ණ වශයෙන් වාර්තා කිරීම යි. එහි දී අදාළ ලෙන්විහාරය ස්ථානගත වී ඇති ස්ථානය භූගෝල ස්ථාන ග්‍රාහකය (GPS) ආධාරයෙන් සලකුණු කෙරිණි. සාර්ව ස්ථානීය වාර්තා කිරීමට අමතර ව තොරතුරු ලබා ගැනීමේ දී තීරණාත්මක වූයේ අධ්‍යයනයට ලක්වන චිත්‍ර සහිත ආංශුක පරිසරය ක්‍රමානුකූල ව වාර්තා කිරීම යි. එහි දී අනුගමනය කරන ලද්දේ එක් එක් පතේලවල නිරූපණය කර ඇති සිතුවම් ස්ථානගත කර ඇති අවකාශය, සිතුවම් ව්‍යාප්තියේ ස්වභාවය, දිශානතිය, වර්ණ භාවිතය, සංරචනාත්මක ශෛලිය, නිරූපිත තේමා, නිරූපණය කර ඇති සිතුවම්වල මිනුම් (දිග, පළල) යනාදිය වාර්තා කිරීම යි.

සාර්ව තොරතුරු වාර්තා කිරීමේ දී ලෙන්විහාරය පිහිටා ඇති ප්‍රදේශය, ඒ අවට ඇති රක්ෂිත, මුහුදු මට්ටමේ සිට උස, ලෙන්විහාර පිහිටා ඇති ස්ථාන අවට ඇති භූ භෞතික ලක්ෂණ සහ එකී ප්‍රදේශය පිළිබඳ ලියැවී ඇති සාහිත්‍යය කියවීම සිදු කළ අතර අවශ්‍ය මූලික කරුණු වාර්තාගත කර ඇත. අධ්‍යයනයේ දී එක්රැස් කර ගන්නා තොරතුරු සියල්ල හතරවන පරිච්ඡේදයේ දී විශ්ලේෂණාත්මක ව ඉදිරිපත් කර ඇත.

පර්යේෂණයේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට එවක ඌවේ ජීවත් වූ මිනිසුන්ගේ ජන ජීවිතය, ඔවුන් අනුගමනය කළ සිරිත්-විරිත්, ඇදහිලි-විශ්වාස, චත්-පිළිවෙත්, එම කාලයේ ජීවත් වූ මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපායන්, දේශපාලනික වශයෙන් එම කාලය තුළ ඔවුන්ට මුහුණ දීමට සිදු වූ තත්ත්ව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගැනීමට විවිධ පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ප්‍රයෝජනවත් ක්‍රමයක් විය. 18 සහ 19 වන සියවස්වල ඌවේ පැවති ආර්ථික, සමාජ සහ සංස්කෘතික පසුබිම මෙම චිත්‍ර හරහා කුමන අයුරෙන් නිරූපණය වූයේ දැයි සොයා බැලීමට එමඟින් ලබා ගත් තොරතුරු වැදගත් වෙයි. ඌවේ එම කාල වකවානුවේ පැවති සාම්ප්‍රදායික ගුරුකුලවල අනුප්‍රාප්තිකයන් වර්තමානය වන විටත් එම ප්‍රදේශවල ජීවත් වනු දැක ගත හැකි ය. එම ගුරුකුල වෙතින් ලෙන්විහාර චිත්‍ර නිර්මාණයට කෙබඳු ආකාරයේ දායකත්වයක් ලැබුණේ ද යන්නත් කේන්ද්‍රීය මහනුවර අවධියේ චිත්‍ර ශිල්පීන් භාවිත කළ චිත්‍ර ඇඳීමේ ක්‍රමෝපායන් ප්‍රාදේශික ශිල්පීන් විසින් කොතෙක් දුරට අනුගමනය කරනු ලැබ තිබේ ද? යන්නත් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට මෙයින් හැකියාව ලැබිණි.

තථ්‍යකාල වාර්තාකරණ (real-time recording) ඉතා වැදගත් වාර්තාකරණ උපාය මාර්ගයක් වූයේ ක්ෂේත්‍ර කටයුතු අතරවාරයේ අධ්‍යයනයට ලක් වූ චිත්‍ර නියැදිවල යථා තත්ත්වය එලෙසින් ම වාර්තා කර ගැනීමට යි. එම ක්‍රමවේදය ඔස්සේ පර්යේෂණයට අදාළ වන ලෙන්විහාර පිහිටා ඇති සෑම ස්ථානයකට ම ගොස් ඒවායේ ඇති විශේෂත්වය නිරීක්ෂණයට ලක් කෙරිණි. Canon 20 mega pixcel කැමරාවක් මේ භාවිත කර ඡායාරූප ගැනීම සිදු කෙරිණි. ලෙන්විහාරවල ඇති සිතුවම් අඩු ආලෝක තත්ත්වයක් යටතේ තිබීම නිසා ඒ සඳහා කුඩා විදුලි උත්පාදක යන්ත්‍ර භාවිත කිරීමට සිදු විය. මේ සඳහා ආලෝක ප්‍රභවය 500ක් වූ විදුලි උත්පාදක යන්ත්‍රයක් භාවිත කරන ලදි. මෙම ක්‍රමය ඔස්සේ සිතුවම් 3000ක් පමණ ඡායාරූප ගත කෙරිණි. ඡායාරූපවල මිනුම් ප්‍රමාණ වාර්තාගත කිරීමට ලේසර් දුරමැනීම් උපකරණයක් භාවිත කෙරිණි. සිතුවම් බොහෝ ප්‍රමාණයකට දැඩි ලෙස හානි සිදු වී ඇත. එනිසා එවැනි සිතුවම් විශ්ලේෂණය කිරීමේ දී එම සිතුවම්වල ඇති වූ හානිය සහ ඒවායේ පැවති විකෘතිතා අවබෝධ කොට ගෙන සංස්කරණය කිරීමට Photoshop අනුවාදයේ 8.0 මෘදුකාංගය භාවිත කර තිබේ.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වර්ණ විශ්ලේෂණ සිදුකරනු ලැබුයේ පර්යේෂණයට ලක්කෙරුණු ලෙන්විහාරවල දැනට ශේෂ ව පවතින සිතුවම් නියැදිය ඔස්සේ එක් ස්ථානයකින් සිතුවම් තුන බැගින් ලබා ගැනීමෙනි. මෙම ක්‍රියාවලියේ දී සිතුවමේ ඇති වර්ණ වෙන්කර ගැනීම සඳහා සිවුරැස් (Raster) තාක්ෂණය ද දත්ත විශ්ලේෂණය කරන ක්‍රමවේදයක් වන Unsupercrise Classification technique ද යොදා ගැනිණි. සිතුවම් තෝරා ගැනීමේ දී හානි අවම වූ සිතුවම් පමණක් තෝරා ගැනිණි. වර්ණයක ප්‍රාණය එහි අගය හා තීව්‍රතාව මත රැඳී පවතී. අගය වූ කලී වර්ණයක පවතින ආලෝකවත්භාවයේ සහ අන්ධකාරභාවයේ ප්‍රමාණය යි. ලා පැහැයේ සිට තද පැහැය දක්වා වූ වර්ණයක අගය විවිධ විය හැකි ය. එබැවින් මෙහි දී ලා පැහැයේ සිට තද පැහැය දක්වා වූ වර්ණ පරාසය එක් වර්ණයක් ලෙස ගෙන ඇත. නිදසුනක් ලෙස රතු වර්ණ ගත් විට එහි ලා පැහැයේ සිට තද පැහැය දක්වා වූ වර්ණ පරාසයක් ඇත. මෙම විශ්ලේෂණයේ දී එම සියලු පරාස රතු වර්ණ ලෙස ගෙන ඇත.

## දත්ත විශ්ලේෂණය

ඌවේ සිතුවම් නිරූපණයේ දී ශෛලින් තුනක් අනුගමනය කර ඇත. ඒ මහනුවර ශෛලිය, ප්‍රාදේශීය ශෛලිය සහ පුද්ගල ශෛලිය යි. දෝව, බුදුගේ කන්ද, රක්ඛිතාකන්ද, මයුරගිරිය, සහ කටුගහගල්ගේ යන ස්ථානවල ඇති සිතුවම් එයට සාක්ෂි වෙයි. මෙකී ස්ථානවල ඇඳ ඇති සිතුවම්වල ශෛලීය ඒකමිතියක් දක්නට ලැබෙයි. සිතුවම් ඉදිරිපත් කර ඇති ස්වභාවය, රේඛා භාවිතය, වර්ණ සංයෝජනය සහ සංරචනාත්මක ලක්ෂණ බොහෝ සෙයින් සමාන ලක්ෂණ පිළිබිඹු කරයි. රාවණා ඇල්ල, බෝගොඩ, බුදුගල්ලෙන සහ බුද්දම යන ස්ථානවල නිරූපිත සිතුවම්වල විද්‍යමාන වන්නේ කේන්ද්‍රීය මහනුවර ශෛලිය සහ පුද්ගල ශෛලිය පමණකි. රාවණා ඇල්ල, බෝගොඩ සහ බුදුගල්ලෙන යන ස්ථානවල ඇති සිතුවම් ප්‍රතිසංස්කරණයට ලක්ව ඇති බැවින් මහනුවර යුගයේ ලක්ෂණවලින් තරමක් බැහැර වී ඇති බවක් පෙනෙයි. රාවණා ඇල්ල ලෙන්විහාරයේ වියන් සිතුවම් පමණක් ශේෂ ව ඇති අතර බෝගොඩ එක් ජාතක කතාවක් සහ සත්සතිය පනේල සිතුවම් කර ඇත. බුදුගල්ලෙනෙහි නිරූපණය කර ඇත්තේ බුද්ධ චරිතය හා සම්බන්ධ සිද්ධීන් කිහිපයක් පමණි. මෙම සිතුවම්වල සංරචනාත්මක ලක්ෂණ සහ භාවිත වර්ණ පරාසයෙහි වෙනසක් මහනුවර යුගයේ සිතුවම් හා සසඳන කළ පැහැදිලි ව පෙනෙයි.

දෝව විහාරයේ ප්‍රවේශ දොරටුව දෙපස සිතුවම් කර තිබෙන ශිව අසෝර රූපය මෙයින් විශේෂ වෙයි. මනුෂ්‍ය රූපයක තිබෙන පෘථග්ජන සංජානනයක් අද්භූත ලෝකයට අයත් තැතිගන්වන ප්‍රකාශනයක් එම රූපයෙහි දක්නට ලැබේ. අතිශයින් විවෘත ඇස්, සියල්ල ඥානනය කර ගැනීමේ අපේක්ෂාවේ ප්‍රකාශනයකි. ඔහුගේ පාදවල දක්නට තිබෙන සංචලනාත්මක අභිනය ඔහු ක්‍රියාකාරී බව හඟවයි. ප්‍රධාන රූපයේ පාද මූලයේ සිටින පුරුෂ රූපය ප්‍රධාන රූපයට වඩා පරිමාණයෙන් කුඩා ය. ඔහු සාමාන්‍ය වැසියකු විය යුතු ය. ශිවගේ අත් සතර ඔහුගේ ප්‍රබලත්වය පිළිබඳ සංකේතයකි. මේ ප්‍රබලත්වය වනාහි ඓහලෞකික වූවක් නොවේ. එහෙත් එය ඓහලෞකික ප්‍රාර්ථනයකි. කුඩා මිනිසා හා ප්‍රධාන රූපය අතර පෙනෙන පරිමාණ වෙනස යථාර්ථයත් ප්‍රාර්ථනයත් අතර වෙනස හඟවයි.

යටත්විජිත බලපෑම්වලින් විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දුන් ඌවේ ජනයාගේ සිත තුළ උපන් සර්වභෞමික බලවේග පිළිබඳ විශ්වාසයන් ඉන් ධ්වනිත ය. පරම මෛත්‍රීය හා ලෞකික අපේක්ෂාවල බිඳවැටීම් උපේක්ෂා සහගත ලෙස සලකන්නට උගන්වන බුදුන් වැඩ සිටින විහාරයක් තුළ මෙවැනි තැතිගන්වන සුළු රූප සිතුවම් කිරීම පමණක් නොව ඊට ඇවැසි ශෛලීන් ප්‍රකාශනය උත්පාදනය කිරීම ද කාලීන සමාජ යථාර්ථයේ ම ඇණවුමකි. සම්භාව්‍ය හින්දු සාහිත්‍යයේ එන ශිව ඌවේ විහාර තුළ වෙස් ගන්වන ලද්දේ ඔවුන්ගේ අවශ්‍යතා සපුරනු සඳහා ය. ශිවගේ රූපය නිරූපණයේ දී ශිල්පීයා පර්යාවලෝකය ගැන යම් තරමක අවබෝධයකින් සිටි බව පෙනේ. ශිව සෘජු ව ඉදිරියට හෝ සෘජු ව පාර්ශවික ව නිරූපණය කරනු වෙනුවට කිසියම් කෝණයකට භ්‍රමණය වී සිටින ආකාරයක් පෙන්වා තිබේ. ඔහුගේ මුවින් මෙසේ ප්‍රක්ෂේපණය කර තිබෙන දළ යුගලය දෘශ්‍යමය ගැඹුර පිළිබඳ තිබූ සංවේදීතාව පෙන්නුම් කරයි. එහි එක් දළයක් අනෙක් දළයට වඩා තරමක විශාලත්වයකින් පෙන්නුම් කිරීම වනාහි ඒ සංවේදීතාව ප්‍රකාශ කිරීම යි. ඇස්වල කළු ඉංගිරියාව ඉදිරියට යොමු කිරීමෙන් ඔහුගේ එල්ලය පිළිබඳ සංවේදනයක් දකින්නා තුළ ඇති කරයි. ඔහුගේ පසුපස පාදය වළලුකර ඉහළින් නැමෙන ආකාරයට නිරූපණය කිරීමෙන් ඔහුගේ සංචලතාව අවධාරණය කරන අතර එය කේන්ද්‍රීය මහනුවර සිතුවම් සම්ප්‍රදායට ආවේණික රේඛාවේ ආධිපත්‍යය වෙනුවට සිතුවම් තලයට මුදුන්පත් වීමට ඉඩ හැරීමකි. මෙහි අනෙක් පස නිරූපිත අසෝර රූපය ද ශිවගේ එක් ස්වරූපයකි. අසෝර නිරූපණය කර ඇත්තේ භීතිය දනවන ආකාරයෙනි. ඔහුගේ දැස් ඉතාමත් තියුණු මෙන් ම එක් එල්ලයක් දෙස බලා සිටී. ඔහුගේ නලලේ තෙවන ඇසක් ඇත. එයින් ඔහුගේ තියුණු වූ එල්ලය පිළිබඳ සංවේදනයක් නරඹන්නා තුළ ජනිත කරයි. ඔහු සිය මුඛයෙන්, කන්වලින්, දෙඅත්වලින් දරා සිටින්නේ සහ කකුලෙන් යට කරගෙන සිටින්නේ අලි ය. අලියා පෙරදිග කලාවේ සංකේත ගන්වා තිබෙන්නේ පංචමහා භූත නිරූපණයට ය. ඒ පදනම මත අසෝර විසින් දරා සිටින අලින් සතු පංච මහා භූතයන් පිළිබිඹු කරයි. මෙම ආදේශනය කේන්ද්‍රීය මහනුවර සම්ප්‍රදායේ සිතුවම් අතර නිරූපිත ශිව රූපවල දක්නට නොමැත. ඉන් අදහස් කරන්නේ ඌවේ වැසියන් ශිව දුටු ආකාරය යි. සියල්ල ශිව යැයි ඔවුහු කල්පනා කළහ. අළු පැහැයක් ගන්නා සිරුරේ ගෙල වටා සර්පයින් වෙළී සිටියි. මුඛය දෙපස වූ දළ මගින් බිහිසුණු බව නිරූපිත ය. ආයුධ අත දරා සිටින අයුරින් නිරූපිත දෝව විහාරයේ සිතුවම් කර තිබෙන අසෝර ඔහු සතු බලය සංකේත ගන්වයි. ඔහුගේ කර්ණාභරණවලින් බහිර්වර්තීව ප්‍රක්ෂේපිත නාග රූප ඒ අදහස තවදුරටත් තීව්‍ර කරයි. අසෝරගේ අස්වාභාවික, විකෘති ස්වරූපය සාමාන්‍ය ජනයා තුළ භීතියත් ඇති කළ ද එය ඇදහීමට මනස නිරායාසයෙන් පොළඹව යි. මැරට්ට (Marett, 1909) අනුව ස්වභාවික ධර්මතා කෙරෙහි තමා තුළ ජනිත වන භීතිය හා උද්වේගය නිසා මිනිසා එයට


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සංචේතනිකත්වයක් ආරෝපණය කරයි.

මිනිසා තමාගේ පැවැත්මට අවශ්‍ය මාර්ගය නිෂ්පාදනය කරනු ලබන්නේ පරිසරය වෙත සවිඥානික ව ක්‍රියා කිරීමෙනි. මිනිසාගේ පැවැත්මේ පදනම වන්නේ පරිසරය යි. ඌවේ ජනයා සම්බන්ධයෙන් මෙය සාධාරණීකරණය වන්නේ ඔවුන් අතරින් බහුතරය ගොවීන් නිසා ය. පරිසරය සමග මිනිසා පවත්වන සහභොජී සබඳතා විටෙක අනපේක්ෂිත අභියෝග ජනනය කරයි. සුළඟ මරුත් ලෙස ද ගින්න අග්නි ලෙස ද වර්ෂාව පර්ජන්‍ය ලෙස ද මිනිසා විසින් දේවත්වයට නගා ඇත්තේ එහෙයිනි. විටෙක ප්‍රහර්ෂය දනවන සුළඟ විටෙක ගම්බිම් කෙත්වතු විනාශ කරමින් හමා යයි. එනිසා පරිසරය වෙත මිනිසාගේ සංවේදනය උභයවේගීතාවකින් යුක්ත ය. එය ආනන්දය සහ සංත්‍රාසය අතර සංකථනයකි.

සංත්‍රාසය ආනන්දයට වඩා පෙලීමක් ඇති කරයි. පෙලීමෙන් මුක්ත වීමේ අපේක්ෂාව නිරායාසකර ය. සංත්‍රාසයේ ප්‍රතිඵලය වන අපේක්ෂාභංගත්වය දිගුකාලීන පීඩාවක් ගෙනේ. එහෙයින් ඒ පීඩනය මගින් ජනනය කරන චිත්ත සංක්ෂෝභය මුදා හැරීම කළ හැක්කේ තමා සදිසි තවත් පුද්ගල රූපයකට නොව තමාගේ පීඩනය සාදර සිතින් ඉවසන සුලු යැයි තමා විසින් හඟින පුද්ගල රූපයක් වෙත ය. මනුෂ්‍යත්වය ඉක්මවන සුලු රූප බිහිවන්නේ මේ අවශ්‍යතා පදනම් කර ගැනීමෙන් බව සෛද්ධාන්තික ව පෙන්වා දී තිබේ. සිය මානස ලෝකය තුළ සිට තමන්ගේ දුක්ඛ දෝමනස්ස කිසියම් පිළිමයකට හෝ දේවත්වයෙන් සලකනු ලැබූ ගසකට කීමෙන් මනස නිදහස් කර ගැනීමට උත්සාහ ගත්තේ ය. ස්වභාවික ධර්මතා මගින් මිනිසාට ඇති කරන බලපෑම නිසා ඔවුන් එයට සංචේතනිකත්වයක් ආරෝපණය කර ඒවාට දිව්‍යමය තත්ත්වයක් සමාජ තුළ ආරෝපණය කර තිබේ. ඌවේ ජනයා ශිව වැනි දෙවිවරුන් අදහනු ලබන්නේ ද එම පදනමේ සිට ය. එබැවින් ඌවේ බෞද්ධ වෙහෙර විහාරවල මෙම දේව රූප නිරූපණය වන්නේ එම සමාජයේ ජීවත්වන්නවුන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා ය.

එබැවින් ඌවේ ලෙන්විහාර පනේල තුළ නිරූපිත මෙවැනි සිතුවම් මගින් සාමාන්‍ය වැසියාගේ භීතිය, ප්‍රහර්ෂය, අපේක්ෂාභංගත්වය, ආනන්දය යනාදි පුද්ගල අපේක්ෂාවන් පූර්ණය කර ගැනීම උදෙසා යොදා ගනු ලැබූ සංකේත බවට පත් වෙයි. පරිසරය නිරූපණයේ දී කිසියම් දර්ශනයක පාත්‍ර වර්ගයා හැසිරෙන පරිසරයට අයත් අංග දක්වා ඇත්තේ ඉතා සීමා සහිත ලෙස ය. එහි දී රූප රාමුවට අදාළ මානව රූප, සත්ව රූප, ශාක, බඩුබාහිරාදිය, පාරවල්, ගොඩනැගිලි, අහස, දියපාරවල්, කඳු පංති යනාදි වශයෙන් රූප රාමුවට උචිත වන අයුරින් පරිසර පද්ධතිය නිර්මාණය කර ඇත. මහනුවර සම්ප්‍රදායේ සිතුවම්වල බොහෝ විට සාර්ව පරිමාණ පරිසර නිරූපණයක් දක්නට ලැබෙයි. එහෙත් ඌවේ ලෙන්විහාර සිතුවම්වල පරිසරය නිරූපණය කිරීමේ දී ඉහත ලක්ෂණය දෙක ම භාවිතා කර ඇත. ඌවේ විහාරවල ජාතක කතා නිරූපණය කිරීමේ දී සාර්ව පරිමාණ පරිසර පද්ධතියක් සහිත ව ජාතක කතාවල සිද්ධි සහ බෝසත් අවදිය හා සම්බන්ධ සිද්ධීන් නිරූපණය සිදු කර ඇත. නමුත් බුද්ධ චරිතය හා සම්බන්ධ සිදුවීම් සහ ඓතිහාසික (ඉතිහාසය හා සම්බන්ධ) සිද්ධීන් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් තේමාවන් නිරූපණය කර ඇත්තේ ආංශුක පරිමාණ පරිසරක් තුළ ය. සිතුවම්කරණයෙහි නියැලුණ ශිල්පීන් තුළ ආංශුක පරිමාණ සහ සාර්ව පරිමාණ පරිසර නිරූපණය පිළිබඳ න්‍යායාත්මක දැනුමක් නොමැති වුවද ඔවුන් ජීවත් වූ පරිසර පද්ධතියේ දක්නට ලැබුණ පරිසරය (කඳු පන්ති, ගහ කොළ, සතා සිව්පාවා, දිය ඇළි යනාදිය) තම සිතැගි පරිදි වර්ණාත්මක ව සිතුවමට ගැලපෙන ආකාරයෙන් නිරූපණය කිරීමට උත්සාහ ගෙන තිබේ.

මහනුවර පාලන අවදිය තුළ කුල කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ ද පහත් කුල කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ ද ඇඳුම්වල ස්වභාවය එකිනෙකට වෙනස් ස්වරූපයක් ගත්තේ ය. ඉහළ කුල කාන්තාවන් සම්පූර්ණ සිරුර වැසෙන පරිදි ඇඳුම් ඇඳීම සිදු කළ අතර පිරිමි පාර්ශවය උඩුකය විශාල බොත්තම් ඇල්ලූ කෝට් එකක් ද හිසට නැවුණු පනාවක් ද යටිකය වැසෙන පරිදි සරමක් හෝ චේට්ටියක් ද ඇඳ ඇත. පහත් කුල කාන්තාවන් උඩුකය කුඩා රෙදි කැබැල්ලකිනුත් යටිකය සම්පූර්ණ රෙදි කඩකිනුත් වසා සිටින අතර පිරිමි පාර්ශවය උඩුකයට තුවාලයක් ද යටිකය වැසෙන පරිදි සරමක් ද අඳියි. පහත් කුල කාන්තාවන් ගායනය, නර්තනය මෙන්ම වහලුන් ලෙස වැඩ කිරීමටත් හුරු වූ අය වූහ. පිරිමි පාර්ශවය බොහෝ විට කුලී වැඩවල නිරත විය. උසස් කුල කාන්තාවන් ඔවුන්ගේ එම සේවය ලබාගනිමින් ආර්ථික, සමාජීය සහ දේශපාලන වශයෙන් කැපී පෙනෙන ලෙස වැජඹුන පිරිසකි. මෙකී සමාජය තත්ත්වය මත තීරණය වූ කාන්තා සහ පිරිමි ඇඳුමේ පැහැදිලි වෙනස්කම් දක්නට පිළිවෙන. මහනුවර අවදිය තුළ පමණක් නොව යටත් විජිත පාලන සමය තුළ ද මෙවැනි ම ආකාරයේ ඇඳුමෙහි වෙනස්කම් රාශියක් එකල පැවති සමාජ තත්ත්වයට සමගාමී ව සිදු වී ඇත. ධනපති පංතියට අයත් කාන්තාවන් යුරෝපීය පන්නයට අයත් ගවුම්, සාය සහ බ්ලවුසය යනාදිත් පිරිමි පාර්ශවය කලිසම සහ කෝට් එක ආදී ඇඳුම් ඇඳීමටත් නිර්ධන පංතියේ කාන්තාවන් කම්බාය සහ හැට්ටය ඇඳීමටත් වැඩි කැමැත්තක් දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වැඩවසම් ක්‍රමය ක්‍රමානුකූල ව වර්ධන වී පරිණතභාවය ට පත් වී මෙන් පසු ව ඊට වඩා ප්‍රගතිශීලී සමාජ ක්‍රමයක් හෝ අනතුරු ව ධනේෂ්වරවාදී ක්‍රමයක් ඇති නොවී ය. ඒ වෙනුවට සිදු වූයේ යටත්විජිතවාදීන් විසින් බලයෙන් පැවති වැඩවසම් ක්‍රමය වෙනස් කිරීමයි. එම වැඩවසම් නෂ්ටාවශේෂ මත ධනේෂ්වර ක්‍රමය ස්ථාපිත වීමයි. සමාජ අවශ්‍යතා අනුව තාර්කීකරණය තුළින් මෙම තත්ත්වය ගොඩනැගීම නිසා මිනිසුන්ගේ මානසික තත්ත්වය ධනේෂ්වර ක්‍රමයට උචිත පරිදි සකස් නොවී ය.

මහනුවර යුගයේ දී රට පාලන කළ රජුගේ සහ ප්‍රභූන්ගේ බිරින්දෑවරු සම්පූර්ණයෙන් සිරුර වැසෙන සේ සිය විලාසිතා කර ඇත. එයට හේතුව ස්වකීය පුරුෂයන් සහ දේශපාලන බල පරාක්‍රමය යි. සාමාන්‍ය පවුල්වල සහ කුල හීන පවුල්වල පුරුෂයන්ගේ බිරින්දෑවරු අඳින ඇඳුම් ප්‍රභූ කාන්තාවන්ගේ ඇඳුම්වලින් වෙනස් වන්නේ ද මෙම


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දේශපාලන බලපෑම නිසා ය. බලය පිළිබඳ සංඥාර්ථවේදය, කේන්ද්‍රය මහනුවර සිතුවම් හරහා සෙසු ප්‍රදේශවල සිතුවම් කෙරෙහි ද බලපා ඇති අයුරු ඒවා නිරීක්ෂණයේ දී පිළිබිඹු වෙයි. සංඥාර්ථවේදයෙහි අරමුණ වන්නේ සමාජයෙහි සංඥා භාවිතා කෙරෙන ආකාරයත් සංඥා මගින් අර්ථ නිෂ්පත්තිය සිදු වන ආකාරයත් පිළිබඳ අධ්‍යයනය කිරීම යි. සංකේතයකින් ධ්වනිත වන්නේ කිසියම් වස්තු දෙකක් අතර පවත්නා සම්මුතිපාත සම්බන්ධය යි. ඒ අනුව සමාජයක සංස්කෘතික සන්දර්භය තුළ සුවිශේෂ අංගයක් වූ ඇඳුම තුළින් ද එම සමාජයේ යම් යම් කේත පිළිබඳ ව අදහස් ඉදිරිපත් වේ. සමාජය පමණක් නොව අදාළ පුද්ගලයා ඇතුළත් වන දේශපාලන සංස්කෘතිය, ආර්ථිකය සහ සමාජ තත්ත්වය වැනි සාධක ද මෙමගින් ඉස්මතු වෙයි. එසේම නිරූපිත ඇඳුම මගින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය පිළිබඳවත් ඔවුන් අයත් දේශපාලන සංස්කෘතිය හා ආර්ථික තත්ත්වය පිළිබඳවත් යම් අදහසක් කියා පායි.

සිතුවම්කරණයේ දී අදාළ සිද්ධීන් නිරූපණය කිරීමට භාවිතා කර ඇති පසුබිම් වර්ණය ද තීරණාත්මක සාධකයක් බවට පත් වෙයි. තත් සම්ප්‍රදායේ වැඩි වශයෙන් පසුබිම් වර්ණ ලෙස භාවිතා කර ඇත්තේ රතු සහ කහ පැහැති වර්ණ ය. සිතුවම්කරණයෙහි දී යොදාගන්නා ලද පසුබිම් වර්ණය නිරූපිත වස්තුව හෝ දෙය වඩාත් හොඳින් ඉස්මතු වී පෙනීමට බල පායි. ශිල්පීන් මෙහි දී උත්සාහ ගෙන ඇත්තේ සිතුවමක ඇති විසංගත තත්ත්වය මග හැරීමට යි. ප්‍රධාන වර්ණ දෙකට අමතරව නිල් සහ කොළ පැහැති වර්ණ යොදා ගෙන ඇත්තේ කලාතුරකිනි.

රේඛාව මෙන් ම වර්ණ භාවිතය ද සිතුවමක් නිරූපණයේ දී වැදගත් කාර්යයභාරයක් ඉටු කරන බව ඉහත දී සාකච්ඡා කර ඇත. මහනුවර සම්ප්‍රදායේ දී සිතුවම් සඳහා සීමිත වර්ණ පරාසයක් උපයෝගී කොට ගෙන ඇත. ඒ රතු, සුදු, නිල්, කහ, කොළ සහ කලු ය. විසංගත බව මගහැරීම පිණිස තත් යුගයේ ශිල්පීන් දීප්තිමත් වර්ණ භාවිතයට යොමු වූ බවත් ඉහත ප්‍රකාශ කොට ඇත. එසේ වුවත් පර්යේෂිත ඌවේ ලෙන්විහාර සිතුවම්වල වර්ණ භාවිතයේ දී මූලික වර්ණවලට අමතරව මිශ්‍ර වර්ණ භාවිතයක් පැහැදිලි ව දැකිය හැකි ය. මෙය මහනුවර සම්ප්‍රදාය තුළ භාවිත වර්ණ ඉක්මවා ගිය අවස්ථාවකි. මිශ්‍ර වර්ණ අතරින් දුඹුරු, අලු සහ රෝස වර්ණ වැඩි වශයෙන් යොදා ගෙන ඇත. මහනුවර ශිල්පීන් පසුබිම් වර්ණ ලෙස රතු පැහැය බහුල ලෙස යොදා ගත්ත ද ඌවේ ශිල්පීන් රතු පැහැයට අමතර ව සුදු සහ කලු පැහැය ද යොදා ගෙන ඇත. මෙම වර්ණ වැඩි වශයෙන් භාවිතා කර ඇත්තේ වියන් චිත්‍ර සඳහා ය. නිල් පැහැති වර්ණය මහනුවර ශිල්පීන් භාවිතා කර ඇත්තේ විරලව ය.

ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායේ ජාතක කතා පන්සිය හතලිස් හතක් (547) දක්වෙන නමුත් ඒවා අතරින් මහනුවර යුගයට අයත් පන්සල්වල සිතුවමට නගා ඇත්තේ හතලිස් හයක් පමණි. සිතුවමට නගා ඇති ජාතක කතා අතුරින් වඩා ජනප්‍රිය ව ඇත්තේ වෙස්සන්තර ජාතක යයි. සිදුහත් කුමරු ලෙස ඉපදීමට පෙර අවසන් ආත්මභාවය දක්වෙන මෙකී පුවත බෞද්ධ රාජ්‍යත්වය සම්බන්ධ වැදගත් කරුණු කිහිපයක් පිළිබිඹු කරයි. නිරූපිත සෙසු ජාතක කතා මගින් වඩාත් ඉස්මතු කරන්නේ ගිහි බෞද්ධයන්ට වැදගත් වන උපදේශාත්මක හා ආධ්‍යාත්මික සංවර්ධනය වැඩි දියුණු කරවන කාරණා ය. එබැවින් ඌවේ බෞද්ධ විහාරවල නිරූපිත සිතුවම්වල තේමා සියල්ල කොටස් තුනකට වර්ග කර දක්විය හැකි ය. එනම්, බුද්ධ චරිතය හා සම්බන්ධ සිද්ධීන්, බුදුසමය හා සම්බන්ධ ඓතිහාසික සිද්ධීන් සහ සම්භාව්‍යය සිද්ධීන් ලෙස ය. මෙයින් ජාතක කතා අයත් වන්නේ සම්භාව්‍ය සිද්ධීන් ගණයට ය. නිරූපිත අනෙකුත් සියලු සිතුවම් බුද්ධ චරිතය හා සම්බන්ධ සිද්ධීන් සහ සම්භාව්‍ය සිද්ධීන් යන ගණයට ඇතුළත් වෙයි.

## නිගමනය

බෞද්ධ සිතුවම් කලාවේ සන්නිවේදනාත්මක අරමුණ වෙත බලපවත්වන ප්‍රාදේශීය මට්ටමේ ගම්‍යතාවල ක්‍රියාකාරීත්වය කලාපීය අනන්‍යතා තිර කිරීමෙහි ලා තීරණාත්මක සාධක බවට පත් වෙයි. මෙකී ප්‍රකාශනය ඌවේ ලෙන්විහාර සිතුවම් සම්බන්ධයෙන් ද වඩා යෝග්‍ය වෙයි. ආචාර ධර්ම, මතවාද, සංස්කාර, වත් පිළිවෙත් හා අන්‍යෝන්‍යතාව පිළිබඳ නිර්ණායක බදුදහමේ මූලික තේමා සමග ද්වටෙමින් ප්‍රකාශයට පත් ව තිබෙන ආකාරය අධ්‍යයනයට ලක් කළ විහාර බිතුසිතුවම්වල, නිරූපිත ජාතක කතා, බුද්ධ චරිතය හා සම්බන්ධ සිද්ධි මගින් ප්‍රකාශ වන අයුරු එමගින් තහවුරු කර පෙන්වා දෙයි. මෙම සිතුවම්වලට අනුග්‍රාහකත්වය දැක්වූ ප්‍රභූන්ගේ අනන්‍යතා පිළිබඳ ප්‍රකාශනය ද ඊට අන්තර්ගත වී ඇත.

## පරිශීලිත මූලාශ්‍රය

### ග්‍රන්ථ (ප්‍රාථමික මූලාශ්‍රය)


මන්දාරම් පුවත 1958. සංස්. ලබුගම ලංකානන්ද හිමි, මරදාන: අනුල මුද්‍රණාලය.

සුළුරාජාවලිය 1959, සංස්. ඩී. පී. ආර් සමරනායක, මරදාන: ශ්‍රී ප්‍රෙස් සමාගම.

චූලවංසය (ඉ) 1925-1930. පරි. ඩබ් ගෛගර්, පාලි පාඨ සමාගම, ලන්ඩන්: ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, කාණ්ඩ I සහ II.


### ග්‍රන්ථ (ද්විතීය මූලාශ්‍රය)


අභයවර්ධන, එච්. ඒ. පී. 1978. කඩයිම් පොත් විමර්ශන, කොළඹ: රජයේ මුද්‍රණාලය.

අභයසිංහ, ටිකිරි සහ වෙනත් අය. 1977. උඩරට රාජධානිය, කොළඹ: ලේක් හවුස් ඉන්වෙස්මන්ට්.

ආරියපාල. එම්.බී. 1962. මධ්‍යකාලීන ලංකා සමාජය, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උල්ලුවිස්හේවා. පී., 1994. උඩරට බිතිසිතුවම් මග, කොළඹ: රජයේ මුද්‍රණාලය.

කුමාරස්වාමි, ඒ. කේ. 1962. මධ්‍යකාලීන සිංහල කලා, පරි. එච්. එම්. සෝමරත්න, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

ගොඩකුඹුර, සී. ඊ. 1969. තිවංක පිළිමගෙයි බිතුසිතුවම්, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

චුටිවොංග්ස් එන්., ප්‍රේමතිලක එල්., සිල්වා ආර්., 1990. ශ්‍රී ලංකා බිතුසිතුවම් දෝව, කොළඹ: ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

චුටිවොංග්ස් එන්., ප්‍රේමතිලක එල්., සිල්වා ආර්., 1990. ශ්‍රී ලංකා බිතුසිතුවම් බුදුගේකන්ද, කොළඹ: ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

චුටිවොංග්ස්, එන්., ප්‍රේමතිලක, එල්., සිල්වා, ආර්., 1990. ශ්‍රී ලංකා බිතුසිතුවම් මුප්පනේ, කොළඹ: ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ජයවර්ධන, කේ., 2006. සොක්කන් ලොක්කන් වූ වගයි (Nobodies to Somebodies), කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ඥානවිමල හිමි, කිරිඇල්ලේ., 1942. සපරගමුවේ පැරණි ලියවිලි, කොළඹ: ජිනාලංකාර මුද්‍රණාලය.

ධම්මානන්ද හිමි, එන්., 1966. ඌව ඉතිහාසය, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මානන්ද හිමි, එන්., 1969. මධ්‍යම ලංකා පුරාවෘත්ත, කොළඹ: ඇම්. ඩී. ගුණසේන මුද්‍රණාලය.

පීරිස්, රැල්ෆ්., 1964. සිංහල සමාජ සංවිධාන මහනුවර යුගය, කොළඹ: සමන් ප්‍රකාශකයෝ.

බණ්ඩාර තිලකසිරි, වි. වා. මු., 1991. සංස්. ඌව වංශකථාව, බදුල්ල: ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය: පළමු කාණ්ඩය.

බණ්ඩාර තිලකසිරි, වි. වා. මු., 1991. සංස්. ඌව වංශකථාව, බදුල්ල: ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය: දෙවන කාණ්ඩය.

මංජු ශ්‍රී, එල්. ටී. පී., 1977. ලංකා බිතුසිතුවම් සටහන්, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය, කර්තෘ ප්‍රකාශන.

මංගල හිමි, කේ., 1995. සංස්. මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම් පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්.

රාහුල හිමි, වල්පොල., 1993. ලක්දිව බුදු සමයේ ඉතිහාසය, කොළඹ:ඇම්. ඩී. ගුණසේන සමාගම .

ලීච්, ඊ. ආර්., 2003. අනු. එම්. ඩී. එම්., සෙනවිරත්න, පුල්එළිය, කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

විජේසේකර, එන්., 1990. සංස්. මූර්ති කලාව, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසේකර, එන්., 1890-1990. චිත්‍රකලාව, පස්වන වෙළුම, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය

විජේසේකර, එන්., 1964. පැරණි සිංහල බිතුසිතුවම්, කොළඹ: ලේක් හවුස් ඉන්වෙස්මන්ට්.

වික්‍රමගමගේ, සී., 1995. ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු, නාවින්න: තරංජී ප්‍රින්ට්ස්.

හේරත්, එස්., 2003. ඌව අභිමන, මරදාන: සමයවර්ධන ප්‍රකාශකයෝ.

සැබිහෙළ, එ. ඉ., සහ දිසානායක, එච්., 1966. ඌව දනව්ව, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

සෝමතිලක, එම්., 1995. ලංකාවේ බිතිසිතුවම් කලාව සහ කාල නිර්ණය, මධ්‍යම පළාතට අනුබද්ධ ව ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකාවකි.

සෝමදේව, ආර්., 2007. රුහුණු පුරාණය, මහරගම: මහරගම තරුණසේවා මුද්‍රණාලය.

**ග්‍රන්ථ : ඉංග්‍රීසි**

Babbie, Earl R, 1979. 3rd (Ed) The practice of Social Research, Callifornia: Wads worth Publishing Company, Belmont.

Bandaranayake, S., 1986. The Rock & Wall Painting of Sri Lanka, Colombo: Lake House.

Bandaranayake, S., 1974. Sinhalese Monastic Architecture, Leiden: E.J Brill.

Coomaraswamy, A. K., 1969. Mediaeval Sinhalese Art, New York: Pantheon Books.

Coomaraswamy, A.K., 1907. Notes on Painting, Dyeing, Lacwork, Dumbara Mats and paper in Cyelon; JRAS (CB), Vol.xix, No.58.

Coomaraswamy, A.K., 1957. An Open letter to the Kandyan Chiefs, Colombo: Published by the Art Council Government Printers.



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Danapala, D.B., 1956. The Story of Sinhalese Paintings, Maharagama: saman Press; 1964, Buddhist Paintings from Shrines and Temples in Ceylon, Milan Amilcare Pizzi SPA.

Dehijia, V., 1972. Early Buddhist rock temple achronological study, London, Thames & Hudson.

Deraniyagala, S.U., 1992. The Prehistory of Sri Lanka, Government of Sri Lanka, part 1.

Deraniyagala, S.U., 1992. The Prehistory of Sri Lanka, Government of Sri Lanka, part 11.

Dissanayake, J. B., 1987. Mihintale, Colombo: Lake House Invesment.

Duncan, J.S., 1990. The City as text, Cambridge: Cambridge University Press.

Edmund, J., 2004. A Guide to the Cultural Triangle of Sri Lanka, Central Cultural Fund, Ceylon Printers Limited.

Gethali, M., 1991. Peintures Murales du Sri Lanka Ecole Kandyenne xviii-xix Siecles: Paris France.

Gunasinghe, S., and Manjusri, L.T.P., 1960. Survey of Temple Paintings (First and second Reports) Submittted to the Art Council of Sri Lanka.

Gunasinghe, S., 1978. An Album of Buddhist Paintings from Sri Lanka, Colombo: Department of Government Printers.

Gunasinghe, S., 1979. Art and Achitecture, Modern Sri Lanka: A Society in Transition, ed. Tissa Fernando and Robert N Kearney, New York: Syracuse University.

Gunasinghe, S., 1980. Buddhist Paintings in Sri Lankan Art of Enduring Simplicity, Spolia Zeylanica, Vol.xxxv. No 122.pp.479-488.

Hartley, C., 1911. An exploration of the Beligalge near Balangoda, Spolia Zeylanica 7(28).

Hartley, C., 1913. The Stone implements of Ceylon, Spolia zeylanica 9(34).

Hartley, C., 1914. Review: Ceylon stone implements by J.Pole Thacker, Spink & co.Calutta, 1913, Spolia zeylanica 9(35).

Hartley, C., 1914 a: On the occurrence of Pigmy implements in Ceylon, Spolia zeylanica 10(36).

Hartt, F., 1993. A History of Painting, Sculpture and Architecture, 4th ed, New York: Prentice-Hall.

Indrapala, K., 2005. The Evolution of an Ethnic Identity, Sydney: the South Asian Studies Center.

Kail Owen, C., 1975. Buddhist Cave Temple of India, India: Taraporevala.

Lewis, W., David, J., 1983. The rock art of Southern Africa the imprint of man, Cambridge: Cambridge University.

Leach, E.R., 1961. PUL ELIYA A VILLAGE OF CEYLON, Cambridge: Cambridge University Press.

Marx, K., 1867. Capital Vol 1, Humburg: Verlag von otto Meissner, German.

-ib- 1885. Capital Vol 11, Humburg: Verlag von otto Meissner, German.

Morgan, H.L., 1877. Ancient Society, Kingship and Socail organization, New York: Henry Holt Company.

Malalagoda, K., 1976. Buddhisam in Sinhalese Society 1750-1900, London: University of California Press.

Paranavithana, S., 1970. Inscription of Ceylon, Archaeological Survey of Ceylon, Department of Government, Vol 1.

Paranavithana, S., 1970. Inscription of Ceylon, Archaeological Survey of Ceylon, Department of Government, Vol 11.

Paranavitana, S., 1971. Art of the Ancient Sinhalese, Colombo: Lake House Invesment.

Robert, K., 1981. A Historical relation of Ceylon, Dehiwala: Tissara preakasakayo, (Third Edition).

Ryan, B., 1958. Sinhalese Village, Florida: University of MIAMI Press, Coral Gables.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 40-47
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ආපතික අනුරාගයේ ඉස්මතු වීම: මනමේ පිළිබඳ මනෝවිශ්ලේෂණාත්මක විචාරයක්

(The Contingent Rise of Passion: A Lacanian Psychoanalytical Profile on 'Maname')

මනෝජ් ආරියරත්න* සහ මහේෂ් හපුගොඩ†

භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
*manojsab@gmail.com, †hapugoda@gmail.com

**සාරසංක්ෂේපය**

මනමේ කුමරිය ප්‍රදර්ශනය කළ පුරෝකතනය කළ නොහැකි බව (unpredictability) සහ ආපතික පෞරුෂය (contingent personality) එම නාට්‍යය ලියවුණු සමයේ පුරුෂ මනස ව්‍යාකූල කිරීමට සමත් විය. එම ස්ත්‍රිය සම්බන්ධ වූ පුරුෂ පුරෝකතන අසමත්භාවය (චපල බව ලෙස අර්ථකතනය කරන) ජාතක කතාවෙහි ද දක ගත හැකි ය. අවසන් මොහොතේ කිසිවෙකුට සිතා ගත නොහැකි පරිදි ඇයගේ ආශාව ආදරණීය මනමේ නම් 'ශිෂ්ට' පිරිමියාගෙන් වැදි රජ නම් තමා නොදන්නා 'අශිෂ්ට' පිරිමියා වෙත විතැන්වීමේ ආශා ප්‍රහේලිකාවේ පෙරළුම (Twist in the paradox of desire) ඉතා ම වැදගත් විසිවන සියවසේ චිත්‍රපටයක් වන The Silence of the Lambs (1991) හි පවා දක ගත හැකි වන අතර මිනී මස් කන රෝගියෙක් සහ සිරකරුවෙක් වන හැනිබල් ලෙක්ටර් විශ්වාස කරන තැනකට ක්ලැරිස් ස්ටාලින් පත්වීම මෙහි දී මනමේ නාටකයේ වැදි රජු කෙරේ මනමේ කුමරිය විශ්වාස තැබීමට සෑම අතින් ම සමාන වේ. ඉහත සන්දර්භයෙහි මනමේ නාටකය ලැකානියානු විශ්ලේෂණය මගින් නැවත අර්ථකතනය කිරීම කාලීන අවශ්‍යතාවක් වන අතර ඒ සඳහා නූතන ලැකානියානු විශ්ලේෂණය මෙම පත්‍රිකාවෙහි යොදා ගැනෙ යි. මනමේ නාට්‍යයේ තර්ග සහ සන්දර්භයන් එනයින් මෙහි දී සායනික විශ්ලේෂණ කතිකාව මගින් නැවත අර්ථකතනය කරන අතර අර්ථකතනවේදය ඒ සඳහා භාවිත කෙරේ. ස්ත්‍රී ආශාව යනු ඓතිහාසික හා සර්වකාලීන ප්‍රහේලිකාවක් (නොවිසඳුණු) වශයෙන් වන ඓතිහාසික හා සාර්වත්‍රික සෞන්දර්ය නිගමනය සමගින් මෙම පත්‍රිකාව අවසන් කෙරේ.

කේන්ද්‍රීය වචන: ආපතික පෞරුෂය, විතැන් වීම, ආශා ප්‍රහේලිකාවේ පෙරළුම, ලැකානියානු විශ්ලේෂණය, සායනික විශ්ලේෂණ කතිකාව.

The contingent personality and unpredictability that princess Maname displayed in the drama 'Maname' (1956) could shake the masculine mind at that time. This unpredictable nature from the side of man was often linked to the feminine 'essencelessness' which can even be seen in Jataka stories. The shift in the paradox of desire that princess Maname epitomizes takes place from decent and civilized prince 'Maname' whom the princess was familiar with to an unknown jungle king who seems roudy and non-civilized. The same contingent shift in the feminine desire can be observed in the popular blockbuster 'The Silence of the Lambs' (1991) in which Clarice Starling obstinately starts desiring the cannibalistic Hannible Lecter who was under treatment under severe security measures. In this context, reinterpreting the drama 'Maname' seems timely since there has not been any psychoanalytical attempt made to understand the unpredictable desire in woman which in itself a challenge for masculine imaginations. This paper uses modern psychoanalysis (in relation to Jacques Lacan and Slavoj Zizek) and critical hermeneutics to recontextualize the dialogues and events in the drama 'Maname' to derive at the conclusion that feminine desire has eternally being an unsolved paradox and it is that unsolved paradox of contingency that exotically attracts man to her more.

Key words: The drama 'Maname', Paradoxical shift of desire, Contingent personality, Lacanian psychoanalysis

## හැඳින්වීම

මනමේ නාටකය එදිරිවීර සරච්චන්ද්‍රයන් අතින් නිෂ්පාදනය වන්නේ (1956) බටහිර නාට්‍ය සම්ප්‍රදාය වෙනුවට විකල්පීය නාට්‍ය ප්‍රකාශන මාධ්‍යයක් සෙවීමේ ප්‍රතිඵලයක් ලෙස ය. මේ තත්ත්වය සුචරිත ගම්ලත් හඳුන්වන්නේ 'ජන රංග කලාව සමතික්‍රමණය' කිරීමක් ලෙස ය (ගම්ලත්, 1998:39). මනමේ නාට්‍යයට පදනම් වූ චුල්ල ධනුග්ගහ ජාතකය සින්දු නාඩගමක් ලෙස ගැමි නාට්‍යකරුවන් උපයෝගී කර නොගත්තා වුව ද ජපන් නාට්‍ය කලාව වෙත ආශක්ත වීමෙන් පසු ව, විශේෂයෙන් රෂෝමාන් චිත්‍රපටය බැලීමෙන් පසු ව, සරච්චන්ද්‍ර මනමේ කතාවේ සහ රෂෝමාන් කතාවේ තේමාත්මක සාදෘශ්‍යයන් දකීම ඔස්සේ මනමේ නූතන රඟමඩලට ගළපා ගැනීමට උත්සාහ කර ඇත. රෂෝමාන් කතාවේ එන රදලයා සහ ඔහුගේ බිරිඳගේ තරමක් ගුප්ත කතා වස්තුව සරච්චන්ද්‍රයන්ගේ සිත් ගන්නට ඇත. රදලයා සහ බිරිඳ කැලේ මැදින් යන විට සොර දෙටුවෙකුට අසුව ස්වාමි පුරුෂයා මරා දැමූ කතා වස්තුව පස් දෙනෙක් විසින් පස් විදියකට අර්ථකථනය කරන ආකාරය ඔහු මිනිස් අවිඥානයේ ආත්ම මූලිකත්වයෙහි එක ම වාස්තවික යථාර්ථය විවිධ ආකාරයෙන් ෆැන්ටසිගත කර තිබූ ආකාරයෙහි අපූර්වත්වයක් දුටුවා විය හැක. එමගින් චුල්ල ධනුග්ගහ ජාතකයෙහි පවා දක්නට ලැබුණු මිනිස් ආශාවේ අර්ථකතනය කළ නොහැකි අඳුරු අන්තර්ගතය

මනමේ නාට්‍යය ලෙස ඔහු නූතන වේදිකාවට ගෙන ඒමට උත්සාහ කළා විය හැකි ය.

පන්ති විචාරයක මනමේ නාටකය අර්ථකතනය කරන සුචරිත ගම්ලත් (1998) සඳහන් කරන්නේ ජාතක කතාවේ ඉස්මතු කරන "මාතුගාමයෝ නම් පවිටු සිත් ඇත්තා හ" යන යති සංස්කෘතික දෘෂ්ටිය විසංයෝජනය කිරීමට මනමේ නාටකය සමත් වී ඇති බව යි (ගම්ලත්, 1998:159). "ඔහු (සරච්චන්ද්‍ර) පැරණි කෝලමේ මුළුමනින් ම කපාහල දෙයක් ඇත්නම් ඒ මේ දෘෂ්ටිය ම යි. මෙය නොදක්නෝ අන්ධයෝ ය" (එම, 159). එමෙන් ම ගම්ලතුන් අවධාරණය කරන්නේ "මනමේ නාටකය වනාහි විශිෂ්ට කලාකරුවෙකුගේ දුර්ලභ ප්‍රතිභා ශක්තියෙහි ව්‍යක්තියකි යනුවෙනි. වර්තමාන සිංහල නාට්‍යයට පදනම දමූ එය පැරණි ගම්බද නාඩගම් කලාව ද විශ්ව නාට්‍යයේ සුසාධිත සන්දර්භය ද වනල වීන ජපන් නාට්‍ය කලාව හා භාරතීය ජන නාට්‍ය විශේෂයෙහි සුරැකී තිබෙන සම්භාව්‍ය සංස්කෘත රංග කලාව ද උත්තරීතර මට්ටමකින් සංශ්ලේෂණය කොට සමතික්‍රමණය කිරීමකි" (ගම්ලත්, 1998:155). එමෙන් ම රෂෝමාන් චිත්‍රපටයේ පෙන්වන අයුරින් ම 'සත්‍යය' (අවධාරණය අපගේ) අවිනිශ්චිත ව තැබීමට සරච්චන්ද්‍ර උත්සාහ කර ඇති බව ගම්ලත් සරච්චන්ද්‍ර උපුටා දක්වමින් ප්‍රකාශ කරයි. වඩා පශ්චාත් නූතන ස්වරූපයක් නාට්‍ය අවසානයට ආරූඪ කරමින් 'නාට්‍යයේ සත්‍යය' පිළිබඳ ව අවසන් අර්ථයක් දෙනු වෙනුවට ප්‍රේක්ෂකයාට ඒ පිළිබඳ ව විනිශ්චයක් ගනු පිණිස ඉහත සත්‍යය විවෘත ව තැබූ බව පවසයි. අවසන් වශයෙන් 'පුරුෂෝත්තමවාදී' දෘෂ්ටියකින් ගත් විට මනමේ කුමරු කුමරියගේ මව්පියන්ගේ කැමැත්ත පවා නොවිමසා තම හිතුමනාපයේ ඒකපාර්ශ්වික පරිභෝජන වස්තුවක් ලෙස එම කුමරිය තම ගම් රට බලා රැගෙන ඒම විවේචනය කරයි. ඒ අර්ථයෙන් වැදි රජුට මෙන් ම මනමේ කුමරුට ද තිබූ ශිෂ්ටත්වයක් නොමැති බවට තවදුරටත් තර්ක කරන ගම්ලත් 'ශිෂ්ට' යන දෘෂ්ටිමය කඩතුරාවට වසන් වී ස්ත්‍රියගේ ශරීරය පරිභෝජනය කරන බවට පුරුෂ මූලික සමාජයට දොස් පවරයි (එම, 109).

තවදුරටත් මනමේ කුමරිය කඩුව වැදි රජ වෙත දෙන අවස්ථාව විග්‍රහ කරන ගම්ලත් ස්ත්‍රිය යනු ස්වාධීන සිතුවිලි සහිත අයෙක් ලෙස සැලකීම අප අමතක කරන බවත් සඳහන් කරයි. "ඔබ කියන දේ මට නොතේරේ" යන මනමේ කුමරුගේ වැකියෙහි ඒ බව පදනම් කරන බව ගම්ලත් කියා සිටී. ඇය ස්වාධීන තීරණයක් ගැනීමට උත්සාහ ගත් මොහොතේ ඇයගේ ජීවිතයේ ඇත්ත ඛේදවාචකය ආරම්භ වන බව ගම්ලත් ප්‍රකාශ කරන්නේ පුරුෂෝත්තම සන්දර්භයක ස්ත්‍රියට සිතීම තහනම් කර ඇති නිසා බවට තර්ක කරයි (ගම්ලත්, 1998:111).

කෙසේ වුව ද මෙම පත්‍රිකාව මගින් ගෙන එන තර්කය වන්නේ ස්ත්‍රිය තම ස්වාධීන තීරණය (නැත්නම් ස්වච්ඡන්දතාව) (Freewill) ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන ආපතික නිමේෂයෙහි (Contingent moment) අවිනිශ්චිත බව (uncertainty) සහ 'පසුබට වීම' (Hesitation) (Gunaratne, 2003:41) සහ අනපේක්ෂිත හැසිරීම (ගම්ලත්, 1998:115) යනු පුරුෂෝත්තම සමාජයේ පීඩනය නිසා ඇති වූ තත්ත්වයකට වඩා ඉහත පුරුෂෝත්තම සමාජයේ වංශවත්, කුලවත් පුරුෂයා තුළ නොතිබූ ආශා අතිරික්තයක් (Surplus of desire) විසින් කුළු ගැන්වුණු බව හදිසි තත්ත්වයක් (contingent situation) බවට තර්ක කළ හැකි ය. එහි දී ඇය නාට්‍යයේ මුල් අවස්ථාවේ ප්‍රේමය ප්‍රකාශ කරන විට ඇය තුළ තම ස්වාධීන ස්වච්ඡන්දතාව කිසිදු විටක පිළිබිඹු වීමට ඉඩකඩ නොදීමත්, තම ප්‍රේමය කුමරා සමග සම්පූර්ණ වශයෙන් ඒකාත්මික (harmonize) කරන අභිනයත් (Ha can 2003, Zizek 2002) හේතුකරගෙන ඇය පූර්ණ ලෙස පිරිමියාගේ ආශාව නිරූපණය කරන බවටත් මෙහි දී තර්ක කළ හැකි ය. නමුත් එම පූර්ණ සංගතභාවය සහ ඒකාත්මික බව සියයට සියයක් ආපසු හරවමින් ඇය වැදි රජු කෙරේ අනුකම්පා දක්වන 'බෞද්ධ' ප්‍රවේශය ඔස්සේ ඇගේ චරිතය ගුප්ත ආසියාතික අන්තර්ගතයක ගිලී යන බවට ද මෙහි දී වැඩි දුරටත් තර්ක කළ හැකි ය. මේ පෙරළුමෙහි (Twist in the desire) ඇය 'ශිෂ්ට නොවන' වැදි රජෙක් තුළ ඇතැයි අනුමාන කරන ආශා අතිරික්තයක් (හැඩි දැඩි පෞරුෂය) වෙත ඇදී යන බවට ද මෙහි දී ලැකානියානු සහ ජිජැකියානු විශ්ලේෂණය හරහා පෙන්වා දිය හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

මනමේ නාට්‍යයේ නිර්මාතෘවර මහාචාර්ය සරච්චන්ද්‍ර වරෙක මෙසේ කියයි,

> "ගැමි ජනතාව අතර ප්‍රකට වූ මනමේ කථාව මා නාට්‍යයක ස්වරූපයෙන් ඉදිරිපත් කළේ එම බිසව චපල ස්ත්‍රියක ලෙස නිරූපණය කිරීමේ අදහසින් නොවේ. කථාව පළමු වර මා ඇසූ අවස්ථාවෙහි කුමාරිකාව ප්‍රේක්ෂකයන්ගේ අනුකම්පාවට පාත්‍ර වෙතැයි මට සිතිණි. පේරාදෙණි විශ්වවිද්‍යාලයේ එළිමහන් රංග භූමියෙහි එය ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ඇතැම් ආචාර්යවරුන් ඉදිරියෙහි රඟපාන අවස්ථාවෙහි ඔවුන් බිසව කෙරෙහි අනුකම්පා සහගත දෘෂ්ටියකින් බලන බවක් පෙනිණි. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රතිචාරය කුමක් වේ දැයි මම නොදැන හුන්නෙමි. එහෙත් ඔවුන් කිසියම් ලෙසකින් නාට්‍යයෙන් කම්පා වුණු බව මම දුටිමි. එසේ වූයේ නාට්‍යයට ආශ්‍රය වූ කථාව නිසා ද, එහි සංගීතය නිසා ද යනාදී තතු පිළිබඳ ව මම නොදනිමි. ඔවුන් හැම දෙනාම කුල්මත් වී මුල සිට අග දක්වා මහත් කුතුහලයකින් එම නාට්‍යය නැරඹූ බව මට පෙනිණි. එහෙත් කොළඹ (බොරැල්ලේ) පිහිටි රංග ශාලාවෙහි ඇතැම් ප්‍රේක්ෂකයන් මනමේ කුමරිය වෙත මහත් ක්‍රෝධයෙන් රඟහලේදී ම ඇයට බැණ වදින්නට වූ බව කිව යුතු ය. ඔවුන් මා විසින් ඉදිරිපත් කරන ලද නාට්‍යය දෙස බැලුවේ වෙනත් ආකල්පයකින් බව කිව යුතු ය. ඔවුන් දකින්නට ඇත්තේ ඇය චපල ස්ත්‍රියක ලෙස ය. ඇය තම සැමියාට ලැදි නොවී වැදි රජ්ජුරුවන් කෙරෙහි පිළිබඳ සිතක් ඇති කරගත් ස්ත්‍රියක ලෙස ය, ඔවුන් දුටුවේ. තම සැමියා මිය යාම අනපේක්ෂිත ව සිදු වූවක් ලෙස ඔවුන්ට නොපෙනුණි. එය අහම්බෙන් සිදු වූවක් නිසා බිසව කෙරෙහි අනුකම්පාවක් ඔවුන් දැක්වූයේ නැත. සමහර ප්‍රේක්ෂකයෝ බිසවට බැන


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වඳිමින් ඇයට අපහාස කළෝය.

එහෙත් මගේ අදහස වූයේ බිසව අහිංසක ස්ත්‍රියක ලෙස නිරූපණය කිරීම ය. සිදු වූ දෙයින් ඇය තිගැස්සුණා ය. අන්දුන්කුන්දුන් වූවා ය. ඒ අවස්ථාවෙහි ඇයට පිහිට වීමට සිටියේ වැදි රජු පමණි. එබැවින් ඇය ඔහුට සමීප වූවා ය. තමා අනාථ වූ බැවින් අන්දුන්කුන්දුන් වී වැදි රජු වෙත තම සහාය දැක්වූවා ය. මුළු නාට්‍යයෙන් ම කියවෙන්නේ මනුෂ්‍යයාට අනපේක්ෂිත ව සිදු විය හැකි අභාග්‍ය ගැන ය. මනුෂ්‍ය ජීවිතයෙහි මෙබඳු අනපේක්ෂිත අභාග්‍ය සිදු විය හැකි හෙයින් මනුෂ්‍ය ඉරණම වෙත ප්‍රේක්ෂකයා කම්පා වනු ඇතැයි මම සිතුවෙමි. මනුෂ්‍ය ලෝකයෙහි මෙවැනි අභාග්‍ය ඉරණමක් කෙනෙකුට අත් විය හැකි බව දැක්වීම ය, මගේ අදහස වූයේ. එනම් ජීවිතයෙහි අනිත්‍යය මෙන්හි කිරීමට ප්‍රේක්ෂකයාට තුඩු දීම ය" (මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර : මනමේ නාටකය).

මෙහි දී සරච්චන්ද්‍ර නිරීක්ෂණය කරන කරුණ නම් මනමේ නාට්‍යයේ සිදු වූ 'හදිසි පෙරළුම' විසින් ප්‍රේක්ෂකයා අන්දුන් කුන්දුන් වූ බව සහ ඔවුන් ගැහැණියගේ මෙම වෙනස් වීම ප්‍රචණ්ඩ ලෙස භාරගත් බව යි. බෞද්ධ දර්ශනයේ උපේක්ෂා (indifference) සංකල්පය ඔස්සේ සිදු වූ හදිසි වෙනස් වීම අමාරුවෙන් ග්‍රහණය කර ගන්නවා වෙනුවට ඔවුන් කර ඇත්තේ එකෙනෙහි ම ප්‍රතිචාර දැක්වීම යි. ජාතක කතාකරු විසින් ම ස්ත්‍රිය චපල සහ විශ්වාස කළ නොහැකි විශ්වයක් ලෙස දිගින් දිගට අර්ථකතනය කර තිබියදීත්, ඒ ඔස්සේ චිරාත් කාලයක් බණ දේශනා කර තිබියදීත්, ඒ ඔස්සේ වසර දෙදහස් පන්සියයක සිංහල බෞද්ධ ජීවන ලෝකය සකසා තිබියදීත්, තරමක් ප්‍රබුද්ධ යැයි කියත හැකි සරච්චන්ද්‍ර ප්‍රේක්ෂක පිරිසක් මෙසේ ප්‍රචණ්ඩ වන්නේ ඇයි? අනුභූතික තලයක ගත් විට එසේ නම් මෙම ප්‍රේක්ෂකයින් හැසිරී ඇත්තේ ගැහැණියගේ සද්භාවී වෙනස (Ontological shift) සම්බන්ධයෙන් ළමා -වැඩිහිටියන් ලෙස ද? වෙනත් විදියකින් කිවහොත් දෙන ලද නිමේෂයක ඇයට අවශ්‍යනම් ඇයගේ පෙම්වතා පාවා දිය හැකි නිදහසක් තිබිය යුතු අතර එය ඇතැම් විට අතාර්කික විය හැකි ය. නමුත් පැවැත්මේ ගැඹුරු ම අර්ථයෙන් පිරිමියාට මේ පාවා දීම ඉවසිය නොහැකි බව තේරුම් ගත හැකි සත්‍යයක් වුව ද ස්ත්‍රී ආශාව යනු සංකීර්ණ තත්වයක් වන බවත් ඇය පරිණත වීම සහ වෙනත් සවිඥානික බවක් වෙත යන ගමනේ දී පුරුෂයා යනු ඇගේ සමාජ - ඓතිහාසික අනෙකා වන්නේ ද මෙතැන දී බව තේරුම් ගත යුතු ය.

ඉහත ප්‍රපංචය පමණක් ගත්ත ද එමෙන් ම නාට්‍යයෙහි තේමාත්මක ව මනමේ කුමරියගේ අභව්‍ය හැසිරීම සුවිශේෂයෙන් ගත්ත ද ස්ත්‍රිය විසින් සිදු කරන ලද මේ පුරුෂ ෆැන්ටසිය අර්බුදයට ලක් කිරීම සැලකිල්ලට ලක් විය යුතු යැයි හැඟේ. මනමේ නාට්‍යය සම්බන්ධ පර්යේෂණාත්මක සහ පාඨශාලීය මනෝ විශ්ලේෂී විචාරයක් මේ දක්වා දක්නට නොහැකි විය. මනමේ කුමරියගේ ආශාව 'බලය සම්බන්ධ වසඟයක් යන්න' (හපුගොඩ 2018) මීට පෙර අධ්‍යයනයට ලක්කර තිබෙන්නේ ද ශාස්ත්‍රීය කෘතියක් ලෙස නොව හුදු විචාරයක් ලෙස පමණි. මහාචාර්ය ආරිය රාජකරුණා සමඟ කරන ලද සංවාදයක් පදනම් කරගෙන ආචාර්ය මයිකල් ප්‍රනාන්දු (2014) මහතා ගෙනහැර දක්වන විග්‍රහය පවා මනමේ බිසවගේ අනුරාගය සහ චපල බව වෙනුවට ස්ත්‍රී සිත චංචල වීමකට මනමේ නාට්‍යය පසුව සංස්කරණ වීම පරිණත වීමක් ලෙස සලක යි. නමුත් ඇත්ත වශයෙන් එහි දී සිදුවන්නේ මිනිස් සිතේ (ස්ත්‍රී සිතේ පවා) ඇතිවිය හැකි ප්‍රබල අනුරාගී චිත්තවේගයක් ඔස්සේ කරන පාවාදීමක්හි (betrayal) අඳුරු බව අඩුකිරීමේ උපක්‍රමයකි. දුක්ඛාන්ත බව තනුක කිරීමේ ප්‍රයත්නයකි. එසේ වූ විට මිනිස් සන්තානයේ අඳුරු අහුමුලුවල ඇති අඳුරු පැල්ලම් සඳහා මිනිසා සුදානම් කිරීමක් සිදු වන්නේ නැත. ස්ත්‍රියට පවා එවන් අඳුරු පාවාදීමක් කළ හැක, චපල විය හැක, සියල්ල දමා ගසා යම් බැඳීමකින් ඉවත් විය හැක, යන ආපතික සිදුවීම අප මිනිස් පැවැත්මෙන් අමතක කළ යුතු නැත. මිනිසා යනු ඕනෑ ම අඳුරු ක්‍රියාවක් සඳහා නැඹුරු විය හැකි ජීවියෙක් බව විසි වෙනි සියවස ඔප්පු කර ඇත. ඒ නිසා ඒ මිනිස් නිමේෂයන්ගේ නොසිතූ නොමිනිස් කඩාවැදීම් (contingent intrusions) අප කිසිසේත් අමතක කළ යුතු නැත. මේ විශ්ලේෂණය ඒ සඳහා වන සමාරම්භක ප්‍රවේශයකි. විශේෂයෙන් උපාධි අපේක්ෂකයින් මෙන් ම පශ්චාද් උපාධි අපේක්ෂකයින් ද මෙයින් අනාගත සාහිත්‍ය විමර්ශනය නව දිශාවක් කරා රැගෙන යනු දැකීම අපගේ අභිලාෂය යි.

## පර්යේෂණ ගැටලුව

පුරුෂ ලෝකයට අරුමයක් වන මනමේ කුමරියගේ හදිසි වෙනස් වීම මනමේ නාට්‍යය ලැකානියානු විශ්ලේෂණය මගින් අර්ථකතනය කළ හැකි ද? යන්න මෙම පත්‍රිකාවේ ප්‍රධාන ම පර්යේෂණ ප්‍රවාදය යි. ඒ සමග ම මෙතෙක් නොවිසඳුණ ස්ත්‍රියගේ ආශා ප්‍රෙහේලිකාව හේතුවෙන් කොතෙක් දුරට මනමේ කුමරියගේ චරිතය අවමානුෂික කර ඇත් ද යන්න සඳහා විස්තර විභාගයක් ද මෙහි දී කරනු ලැබේ.

## පර්යේෂණ අරමුණ

ගැහැණියගේ ආශාව කුමක් ද යන්න පොදුවේ බටහිර මනෝ විශ්ලේෂණය තුළ හැඳින්වෙන්නේ ප්‍රෙහේලිකාවක් ලෙස ය. එසේ ම ජාතක කතාකරු මනමේ කුමරිය සහ පොදුවේ ස්ත්‍රිය සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නේ ස්ත්‍රිය යනු අවසර තැන වරදේ බැඳෙන විශ්වාස කළ නොහැකි චපල ආත්මයක් ලෙස යි. මෙම පත්‍රිකාව ඔස්සේ සාකච්ඡා කිරීමට උත්සාහ කෙරෙන්නේ පිරිමි විෂය ගැහැණිය සම්බන්ධයෙන් දක්වන මෙම මානසික දුරස්ථභාවය යනු ඇත්ත වශයෙන් දුරස් වීමකට වඩා ඇය වෙත තව තවත් ගුප්ත ලෙස ආශා කිරීමේ යාන්ත්‍රනයක රෝග ලක්ෂණ විය හැකි බව යි. ප්‍රෙහේලිකාවක් හෝ චපල වස්තුවක් හෝ ගුප්ත තේරුම් ගත නොහැකි බව ම යනු පිරිමි ආශාවේ ෆැන්ටසි නිර්මිතයක් විය හැකි බව මෙයින් දැක් වේ. සියල්ල හෙළිදරව් වන, සියල්ල විවෘත, සියලු දේ දන්නා, සියල්ල අර්ථකතනය කළ හැකි දෙයක් වෙත ආශා කිරීමේ 'යමක්' ශේෂ නොවන බව මෙයින් ගම්‍ය යි. ස්ත්‍රිය යනු කිසිවිටක සියල්ල හෙළිදරව් වූ


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වස්තුවක් නොවේ යන්න පෙන්වා දීම මෙහි අරමුණ යි. ඊට අමතර වශයෙන් මනමේ නාට්‍යය ගැන නව අර්ථකථනයක් ඉස්මතු කර දීම මෙහි තවත් අරමුණකි. ලැකානියානු - ජිජැකියානු විශ්ලේෂණය ලාංකික සම්භාව්‍ය කලා මුලධර්ම සමඟ ගළපාගන්නේ කෙසේ ද යන්න අත්හදා බැලීම මෙහි තවත් පර්යේෂණ අරමුණක් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

සරච්චන්ද්‍ර විසින් නිර්මාණය කරන ලද මනමේ නාට්‍යයෙහි එන මනමේ කුමරියගේ 'ආශා පෙරළුම' තුළ දක්නට හැකි ප්‍රහේලිකාමය ස්වරූපය (Enigma, paradox) ලැකානියානු මනෝ විශ්ලේෂණ මූලධර්මයන් ඔස්සේ නැවත අර්ථකතනය කෙරේ. ඒ සඳහා නාට්‍යයේ දෙබස් සහ ගීත කොටස් උපුටා දක්වමින් කතිකා විචාරය (discourse analysis) සහ ලක්ෂණ මීමංසාව ඔස්සේ (Semiotics) අර්ථකතනය කෙරේ. මේ සඳහා 1956 පළ කරන ලද සිව්වන නාට්‍ය පිටපත (පෙළ) භාවිත කෙරේ. එමෙන් ම මනමේ වේදිකා නාට්‍යයේ එන දෘශ්‍ය අන්තර්ගතය ද මෙහි දී යොදා ගැනෙයි.

සාකච්ඡාව සන්දර්භගතකරණය කිරීම සඳහා අවශ්‍ය වැදගත් දෙබස් සහ ගීත ඛණ්ඩ අර්ථකතනයේ අවශ්‍යතාව මත මෙහි දී තෝරා ගැණිනි.

## සාකච්ඡාව

"දුලා නෙතු පුලා - දිසි ස්වර්ණලතා සේ මෙ ළඳා
ලත් හිරු රැස් ලෙස පද්ම විකසිත
සිත් මාගේ පත් වේය තෘප්ත විලසට
කතුන් ලොව තුළා - රසඳුන් නයනාලේප කරන
මේ කුමරුන් හට වන්නට පියඹ
සන්තෝස වේ ද සිත් අසනු කුමට"
(සරච්චන්ද්‍ර, 1986:21)

ඉහත ගීත දෙබසෙහි දක්නට ලැබෙන්නේ කුමරු පූර්ණ ලෙස මනමේ කුමරියගේ රූපයට සහ රූපය රැගත් මනස්ශ්‍රැතිය (Fantasy) කෙරේ පූර්ණ ලෙස ආශක්ත වී ඇති බවයි. 'ස්වර්ණලතාවක් ලෙස දිස් වූ මෙම කාන්තාව' දුටු විට හිරු රැස් ලද පද්මය වහා විකසිත වන්නාක් මෙන් කුමරුගේ සිත කුමරියගේ රූපය දුටු සැනින් තෘප්තියට පත් වූ බව නාට්‍යකරුවා දක්වයි. මෙය,

"නාහං, භික්ඛවෙ, අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං, භික්ඛවෙ, ඉත්ථිරූපං ඉත්ථිරූපං, භික්ඛවෙ, පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතී"ති. පඨමං"
"මහණෙනි, යම්සේ ස්ත්‍රීරූපය පුරුෂයාගේ සිත හාත්පසින් මැඩගෙණ සිටීද, මහණෙනි, එබඳුවූ අනික් එකම රූපයකුදු මම නොම දකිමි. මහණෙනි, ස්ත්‍රීරූපය පුරුෂයාගේ සිත හාත්පසින් අල්වාගෙණ සිටී"
(අංගුත්තර නිකාය, ඒකක නිපාත පාළි, රූපාදිවග්ගෝ)

යන බෞද්ධ දාර්ශනික ඉගැන්වීම හා සම්බන්ධ ය. එම 'තෘප්ත හේතුව' පදනම් වන්නේ ඇයගේ රූපය හා සම්බන්ධ ෆැන්ටසි මානය පදනම් කර ගනිමිනි. එහි දී කුමරුගේ ෆැන්ටසි ගොඩනැංවීම කෙරෙහි (Zizek, 1998:2006) කිසිදු ආකාරයකින් නිශ්ප්‍රභා කිරීමක් කුමරිය කරන්නේ නැත. ඒ වෙනුවට ඇය කුමරුගේ ආශා වස්තුව රඟ දක්වනු අපට පහත ගීතයෙන් උදාහරණ ලෙස දැක්විය හැක.

"මේ කුමරුන් හට වන්නට පියඹ
සන්තෝස වේ ද සිත් අසනු කුමට"
(සරච්චන්ද්‍ර, 1986:21)

ඇය මෙම එකතු වීම සම්බන්ධයෙන් සංතෝෂ වන බව කුමරු වෙතට ආශා ප්‍රක්ෂේපණයක් ලෙස දනුම් දෙයි. එය තවත් තීව්‍ර කරමින් ඇය කියන්නේ මනමේ කුමරුගේ තෙද බල මහිමය සහිත රාජ්‍යත්වය කෙරෙහි ඇය ආශක්ත වී ඇති බවයි.

"ඔබ වැනි තෙද - පත් නිරිඳුන්ගේ - අග මෙහෙසිය වන්
මා පින් කළ - සැටිය පෙනෙන්නේ"
(සරච්චන්ද්‍ර, 1986:21)

නම් ප්‍රකාශය මගින් ඇඟවෙන්නේ ඇය රාජ සම්පත් සහ රාජ්‍යත්වයේ බලය වෙත ෆැල්ලස ආශක්ත බවක් (Phallic contact) පෙන්නුම් කරන බවයි. එම ආශක්ත බව විසින් කුමරුගේ අනන්‍යතාව ඇය ධනාත්මක කරන අතර ඔහුගේ ආශාව රඟ දැක්වීම සඳහා වන සූදානම ද ඇය හැඟවුම්කරණය කරයි. ඔහුගේ ආශා විෂය බවට ඇය පත් වන අතර මනමේ කුමරු එම ප්‍රක්ෂේපණය තම සංකේත බල ව්‍යාපෘතියෙහි ස්ථානගත කරයි (ජිජැක්, 1994:32 - 33). ඒ අනුව විෂයෙ පැවැත්මෙන් ස්වාධීන ව මනමේ කුමරු ඇයගේ පැවැත්මේ සෙවණැල්ල තම බල ව්‍යාපෘතිය තුළ ඇයගේ ඒකාග්‍රතාව කුමක් වුව දළ වාස්තවික කර ගනී. ඇය ප්‍රකාශ කරන 'අග මෙහෙසිය' නම් වචනය ඔස්සේ ඇය තහවුරු කරන්නේ ඔහුගේ එම සෙවණැල්ල පිළිබඳ රෙජිස්තරය (Registry) තමා තවත් ස්ථිර කරන බවයි.

"බරණැස්පුර යසිසුරු
ඉවසිලි නැත නරඹන තුරු"
(සරච්චන්ද්‍ර, 1986:21)

නම් වැකිය හරහා ඇය වසඟකාරී ලෙස ඔහුගේ ෆැල්ලස ක්‍රියාකාරිත්වය (බලය) තව තවත් තහවුරු කරන අතර ගම්ලත් සඳහන් කරන පරිදි හුදු පාරිභෝගික වස්තුවක් යන්නෙන් ඇය ඔබ්බට ගමන් කරමින් ඇය ආශා වස්තුවක් ලෙස ඔහුගේ මනස තුළ සෙවණැල්ලක් (Shadow) ලෙස ප්‍රතිස්ථාපනය වේ. එවිට ඇය අර්චන වස්තුවක් ලෙස ගම්ලත්ට සඳහන් කළ හැකි වුව ද අපගේ තර්කය වන්නේ ඇය තම ආශා කරන්නාගේ (මනමේ කුමරු) ආශාව වෙනුවෙන් විෂය මූලික නියෝජනයක් (Stand in for the subject) කරන බවයි. එවිට එය අර්චන පෙනී සිටීම

 © 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉක්මවා යන 'මනුෂ්‍ය දෙයක්' බවට පත් වේ. එය ඇය ප්‍රකාශ කරන්නේ, මා පින් කළ - සැටිය පෙනෙන්නේ, යනුවෙනි.

ඉහත ආශා ප්‍රතිබිම්බයෙහි ඇය ස්ථානගත කරන මනමේ කුමරුට බාහිර ලෝකය පෙනී යන්නේ මෙලොව සුරපුරයක් ලෙස ය. ඔහු එම ආශා නියෝජනයෙහි මහ වනය මැද වුව ද කුමරු කියන්නේ 'වසන්ත ශ්‍රීයෙන් අලංකාර වූ, මඟුල් මඩුවකට බඳු වූ වනාන්තරයේ ශෝභාව නරඹමින් යන විට ගමන් විඩාව මඟ හැරෙන' බවයි. වනාන්තරය සෞන්දර්යකරණය කරන සරච්චන්ද්‍රයන් එහි රෞද්‍ර-අනියත - භයානක ස්වරූපය වඩා මටසිලුටු කරන අතර එය ප්‍රේමය තහවුරු කර සංකේතයක් බවට පත් කරයි. මෙය සුළුකලිඟු දා වතේ වනය සංකේතයක් ලෙස භාවිත කිරීම හා සමාන ය.

> "ඉක්බිති නන් කුසුම් රෙජෙන් ලොව් තවරමින්,
> කෙවුලන් කුල්වමින් මත් මොනරගණා පිළඹරා
> කෙකා ගන්වමින්, වෙහෙල්මියුල්ගණා මනදොළ
> පුරවමින්, ගඳගජන් ඔකඳකරවමින්, මල්පල්ලෙන්
> සාමඹුලු සදමින්, බඹරකැල ගුම් ගන්වමින් වනවිල්හි
> තිසරු උරගසෙන් බුන් රළ සැතින් පුල් මහනෙල්
> ගලවමින්, පියුම්තඹුරුවෙනෙහි රොන් උදහවමින්
> සපුසළලසල්වෙනෙහි බිඟුමමන ගන්වමින්"
> (ඒකනායක, 2000:3-4)

මනමේ නාට්‍යයේ ශබ්ද ධ්වනිය වෙත භක්තිමත් වන නාට්‍යකරු මේ දෙදෙනාගේ ප්‍රේමය වනයේ සුන්දර බව ඔස්සේ වඩාත් තීව්‍ර කරයි.

> "ප්‍රේමයෙන් මන රංජිත වේ - නන්දිත වේ
> පුෂ්පයෙන් වන සුන්දර වේ - ලංකෘත වේ "
> (සරච්චන්ද්‍ර, 1986:22)

ආලයෙන් වෙලී සිටින ලතා මණ්ඩපය ඔස්සේ හිරු එළිය ඛණ්ඩනය වී ඔවුන්ට සිසිලස ලබා දේ. හිරුගේ රශ්මියෙන් ඔව්හු නොපෙළෙති. මුළු වනය ම ප්‍රේම සංකේතයකි. අනෙකා වෙත ප්‍රදානය කරන ආදරය වනයේ සුන්දර බව නම් සංකේතනය ඔස්සේ වඩාත් ගැඹුරු සාන්ද්‍රෂ්ටික අත්දැකීමක් බවට පත් කරයි. සංකේතනය නම් නිර්මාණයෙහි පිහිටි මේ වන ලැහැබ මනමේ තුළ පිහිටි ෆැන්ටසියේ ගමන් මඟ දේශපාලනික අර්ථයෙන් (රාජ්‍යත්වය වෙත යන ගමන) ඔහු තුළ ම ප්‍රතිනිර්මාණය කර ඇයගේ ආදරය ඔහු කෙරෙහි නින්නාද නංවයි (revibration) (Groys, 2008). එවිට කුමරිය ඔහුගේ එම ආශා ප්‍රක්ෂේපණය තව තවත් පාසය (Knot of desire) වෙත ගමන් කරවයි.

> "කෝකිල හිඩ කන් පිනවයි - රන් ස්වරයයි
> රැන ගිරව් දෙන ගී සින්දු - අම බින්දු
> සැම දෙසේ සංගීත ඇසේ
> පිපි තඹරන නඳ බඹරන පිය රැව් දෙන
> ලිය කිඳුරන "
> (සරච්චන්ද්‍ර, 1986:22)

ආදී වශයෙන් ඔහුගේ සංකේත ව්‍යුහයෙහි ඇති පුරුෂ ආශාව තමා දන් සිටින පරිසරයේ වාස්තවික බව මෙන් ම තමා මනමේ කුමරුගේ ආශා වස්තුව වීම යන විෂය මූලික අත්දැකීම් දෙක ම ඉක්මවා ගිය පාර - අනුභූතික යථාර්ථයක් බවට ඉහත සෞන්දර්යකරණය ඔස්සේ පත් කරවයි. එනයින් මෙය ගම්ලතුන්ගේ පාරිභෝගික භාණ්ඩ යථාර්ථයෙන් ඔබ්බට ගිය පාර -යථාර්ථයකි. ඔහුට හැඟවුම්කරණය කළ නොහැකි ආශාවේ- කුඩා - වස්තුව (object - petit - a) බවට ඇය ඇය විසින් ම විපරිණාමය වේ. එනයින් ඇය මනමේ කුමරුන් වෙතින් විගලිත වූ වස්තුවක් බවට පත් නොවේ. ඒ වෙනුවට ඇය ඔහුගේ ආශාව පූර්ණ ලෙස නියෝජනය කරයි. මනමේ විසින් කරන එක ම වරද නම් මේ තමා ඉදිරියේ දිග හැරෙන පූර්ණ - ෆැන්ටසි වස්තුවේ ආපතික බව වෙත සවිඥාණික නොවීම යි. සීලාවෝ ජිජැක් දක්වන ආකාරයට ආපතික අවස්ථාවක් යනු යමක පූර්ණ ප්‍රතිවිරුද්ධ දෙය ද සිදුවිය හැකි ය යන්න පිළිබඳ ව ඇති අවබෝධය යි. මනමේ කුමරියගෙන් ආපතික ලෙස යක්ෂණියක් මතු විය හැකි ය යන්න පිළිබඳ අවබෝධය මනෝවිශ්ලේෂණයේ එක ම දයලෙක්තික පාඩම ලෙස හඳුන්වන ජිජැක් (1994:34) පෙන්වා දෙන්නේ එම ප්‍රතිරෝධය වෙත උපේක්ෂා සහගත වීම ඉහත ද්‍රව්‍යමය සත්‍යය නම් ප්‍රහේලිකාව (Enigma) මඟ හැරීමක් බවයි. මනමේ කුමරුට මිය යාමට සිදු වන්නේ මෙම දයලෙක්තික ලෙස නැවත තමා කරා එන භෞතික ලෝකයේ ආපතික යථාර්ථය අමතක කිරීම හේතුවෙනි.

**ආපතික යථාවේ ඉස්මතු වීම: වැදි රජ**

සුන්දර, ලංකෘත වන ලැහැබෙන් එක්වර ම ඉස්මතු වන්නේ වැදි රජ ය. මෙය මනමේ කුමරු බලාපොරොත්තු නොවූ අනපේක්ෂිත මොහොතකි. ඔල මොල පෙනුමැති රාක්ෂයෙක් බඳු වැදි රජ (monstrous rise) වනයේ නිශ්චල බව දුදුරු කරමින් රුදු හඬින් ගොර දෙමින් වනයෙන් ඉස්මතු වේ. එවිට වැද්දන් දැක භීතියට පත්වන කුමරිය පිළිවිසින්නේ,

> "බිහිසුණු පෙනුමෙන් යුත් මොවුන් රකුසන් ද
> නැතහොත් වනචරයින් ද"

යනුවෙනි. ඉන් අනතුරුව ඇය ප්‍රකාශ කරන,

> "මොහුගේ නම් භයංකාර විලාසයක් නොමැත්තේය
> හිමිතුමනි, ඔහුගේ තේජස් පෙනුමෙන් ඔහු රජෙකු
> විය යුතු යැයි සිතමි"
> (සරච්චන්ද්‍ර, 1986:24)

යන ස්ථානය දක්වා ඇය රූපාන්තරණය වන විට ඇයගේ අවිඥාණයෙහි සංක්‍රාන්තියක් මෙහි දී දක්නට ලැබේ. දෛවෝපගත විය හැකි මේ පැසේජය තුළ මනමේ කුමරියගේ ආශා පැල්ම (spilt in desire) නැතහොත් බෙදුම නිරූපණය කරයි. මනමේ කුමරු වෙතින් බලය වැදි රජු වෙත ගමන් කරවන ඇය නිරීක්ෂණය කරන 'ෆැල්ලස පැසේජ්'යෙහි ඇයගේ ආශා නිරූපණය ද එක් වස්තුවකින් තවත් වස්තුවක් දෙසට ගමන් කරයි. වඩාත්


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මනෝවිශ්ලේෂී අර්ථයකින් මෙය සඳහන් කළහොත් මුලින් මනමේ කුමරුගේ දැක්මේ :gaze) වස්තුවක් ලෙස පවතින ඇය දැන් වැදි රජුගේ දැක්මේ වස්තුවක් ලෙස තම අනන්‍යතාව නැවත සකස් කර ගැනීමේ කොරිඩෝව ඔස්සේ ගමන් කිරීමේ අකාලික නිමේෂය මේ මොහොතේ උදා වෙයි (ජිජැක් 1994:60). ඇයගේ අශ්ලීල සුපිරි අගම මෙතන දී එළිදරව් වන්නේ වැදි රජුගේ දැක්මෙහි සිරගත වන ඇය මනමේ රජුට කඩුව දීම නම් තීරණාත්මක ස්ථානයේ දී ආචාරධාර්මික කුකුසක් (Ethnical doubt) ඉස්මතු කිරීමෙනි. මෙය බුද්ධාගමේ මහා කරුණා ගුණය සමඟ පටලවා ගතයුතු නැති අතර ශුද්ධ අර්ථයෙන් ඈ ගත යුතු ව ඇත්තේ දේශපාලන තීන්දුවකි. එම දේශපාලන තීන්දුව මඟ හරින ඇය තම විනිවිදිය නොහැකි ආත්ම මුල් තත්ත්වයට ඉස්මතු වීමට ඉඩ දේ. දේශපාලනයෙන් වියුක්ත වන ඇය ඇයගේ ගුප්ත අන්තර්ගතය මෙහි දී එළියට එයි. ඇය සදාචාරාත්මක ව වගකිව යුත්තේ තමා විසින් කුළු ගැන්වූ ආශාවේ හිමිකරුට වන අතර ඇයගේ සුපිරි ආගමේ විනෝදයට නොවේ (ජිජැක් 1994:61). මෙම 'ස්වාධීන' තීරණය යනු දේශපාලනික නොවන සුපිරි අගමේ විනෝදය පදනම් කරගත් හිස් - සදාචාරයක් ඉස්මතු කරන්නකි. ඒ ඔස්සේ අදටත් නොවිසඳුණු ප්‍රහේලිකාවක් අප ඉදිරියේ ඇත. එනම් ඇය ඇත්තට ම ආදරය කළේ කාට ද යන පැනය යි. ඇයගේ ආශාව මෙන් ම ආදරය ද ප්‍රහේලිකාවක් (Enigma) වන්නේ ද? නිශ්චිත මොහොත එළඹෙන්නේ මනමේ කුමරු වැදි රජ තම ශරීර ශක්තියෙන් මර්දනය කර ඔහු ව මරා දැමීම සඳහා අසිපත ඉල්ලා සිටින මොහොතේ ය. 'කඩුව දීම නම් ක්‍රියාව' සිදු කිරීම සඳහා ඇය පෙළඹවීමට ආචාරධාර්මික මැදිහත්කරුවෙක් නොමැති අතර එය ඇය විසින් ම ගත යුතු 'ස්වාධීන' තීරණයකි. නමුත් එම තීරණය පූර්ණ වශයෙන් 'ස්වාධීන' (ගමලත්, 1998:14) නැත්තේ ඇය විසින් තම ආශා දැල වෙත පොළඹවන ලද පුරුෂයෙක් සිටින නිසා ය. එනිසා ඇයට එහි දී ඇති වන කුකුස නම්, ඔහු මරා දැමීම නොවටනේ ය. හිමියනි, ඔහුට සමාව දෙනු මැනවි, (සරච්චන්ද්‍ර, 1986:26) යන්න ඇය සදාකාලික වරදකාරීත්වයක සිරගත වනු විනා ස්වාධීන බව ඔස්සේ නිදහසක් වෙත ගමන් නොකරයි. දෘෂ්ටිවාදය වන්නේ පුරුෂමූලික බව නොව ඇය තුළ ඇති ආචාරධාර්මික කුකුස යි. ඉනුත් නොනැවතී ඇය වැදි රජු වෙත තම වසඟය ප්‍රක්ෂේපණය කරයි. එය මනමේ කුමරුට ඇය කළ වසඟයට ම සමාන ය. එහි දී ඇය කියන්නේ වැදි රජ දුටු මොහොතේ පටන් ඇය තුළ මෙම ආපත බෙදුම (spilt in desire) තිබූ බව යි.

> 'දිරියෙන් යුද කළ - ඔබ දුටු වේලේ
> මොහොතින් සිත මා - පිරුණයි ආලේ
> නැති මුත් රජකම - ඔබමයි පතන්නේ
> ඇත මට හිමගිර - ඔබ සමඟින්නේ"
> (සරච්චන්ද්‍ර, 1986:26)

මුලින් මනමේ සමඟ රාජ්‍යත්වයට ආශා ප්‍රක්ෂේපණයක් කළ ඇය දැන් හිමගිර නොහොත් වැදි රජ ජීවත් වන වනය ඇයගේ උත්කෘෂ්ට වස්තුව බවට ප්‍රති - ප්‍රක්ෂේපණය කරයි. එමෙන් ම මටසිලුටු මනමේ කුමරුගේ ශරීරය වෙනුවට රකුසෙකු මෙන් වූ ගොරහැඩි සිරුර වෙත ද ඉහත ආශා ප්‍රක්ෂේපණය ම ප්‍රති - ප්‍රක්ෂේපණය කිරීමට තරම් ඇය වසඟකාරී වේ. මේ වනවිට ඇය කරනා දෙය ඇය ද නොදන්නා අතර ඇය ප්‍රකාශ කරන්නේ,

> "කළ තැත දුටුව ද - ඔබ ගලවන්නටා
> සිතුනෙ කඩුව ඔබ - අතට ම දෙන්ටා "
> (සරච්චන්ද්‍ර, 1986:28) යනුවෙනි.

ඇය කවුරුන් වෙත ආශා කරනවා ද යන්න ප්‍රහේලිකාවක් වන්නේ සත්‍ය වූ සාරයක් ඇය මේ වන විට නියෝජනය නොකරන බැවිනි. ඇයට අවශ්‍ය වන්නේ 'පැවතීමට' (Survival) පමණි. නමුත් ඇය අභිමි කරගන්නේ භූමිය යි. (Ground). මන්ද ඇයගේ චපල සිත නිසා වැදි රජු ඔහුගේ ආශාවෙන් පසු බසින අතර එම චපල ස්ත්‍රී ආත්මය තරණය කිරීමට තරම් ධෛර්යයක් ඔහු ප්‍රදර්ශනය කරන්නේ නැත. ඔහුගේ ආශාව අත්හරින වැදි රජ ඇයගේ ආපත ප්‍රහේලිකාවෙන් ගැල වී නැවතත් තමාගේ ආරක්ෂිත පැවැත්ම කරා පසු බසී. නමුත් ඇය තුළ උපතින් ම පවතින පරස්පරතාව (නෛසර්ගික උගුල) තරණය කිරීම මගින් ඔහුගේ ආශාව ඔහුට මුණ ගැසිය හැකි වන බව වැදි රජ මෙහි දී අමතක කරන කරුණ යි. ඔහු තරණය කළ යුත්තේ මනමේ බිසවගේ චපල බව ම ය.

ගුස්ටාව් ෆ්ලෝබෙයාගේ 'එමා බොවාරි' නවකතාවේ එන එමා සියලු ජීවන අත්හදාබැලීම්වලින් පරාජය වී නැවත තම පෙම්වතා වූ රුඩොල්ෆ් වෙත යයි. නමුත් එම පරාජිත අනුරාගික ගැහැනිය භාර ගැනීමට තරම් ධෛර්යයක් රුඩොල්ෆ් වෙත නොවී ය:සැම විට ම පුරුෂ සමාජය මෙම අධි - අනුරාගික ස්ත්‍රියට බිය වේ. එම බිය ම අපට වැදි රජු වෙතින් ද දෘශ්‍යමාන වේ. ඔහු චපල මනමේ කුමරිය වෙතින් පලා යයි. පිරිමියා විසින් තමා වෙත ආරක්ෂාකාරී ව තබා ගැනීමට උත්සාහ කරන දෛව ස්ත්‍රිය (Femme fatale) යනු මෙම පෙරුම් පුරන ආදර වස්තුව වන අතර (Courtly love) මෙම පෙරුම් පුරන ස්ත්‍රිය නම් වස්තුවෙන් ඔබ්බෙහි පවතින්නේ වසඟකාරී අනුරාගික ස්ත්‍රිය නම් විනිවිදිය නොහැකි යථාව යි (Impexetrable Real). ඉදින් මනමේ කුමරිය එක් වරෙක මනමේ කුමරාගේ දෛව ස්ත්‍රිය (සුකොමල ආශා වස්තුව) ලෙසින් ද තවත් වරෙක ඔහුට සිතාගත නොහැකි පතුළක් නැති අනුරාගයේ නියෝජිතවරිය වශයෙන් ද ආශා පෙරළුමක් සලකුණු කරයි. එවිට පුරුෂයා ඇය වෙතින් බියපත් ව පලා යන නමුත් සත්‍ය ස්ත්‍රිය යනු මේ පෙරළුම සහිත දෛව ස්ත්‍රිය සහ අනුරාගික ස්ත්‍රිය යන පාර්ශ්ව දෙකේ ම (සුදු + කළු)එකතුව යි. වෙනත් විදියකින් කිවහොත් කුලවමිය (Lady) සහ අශ්ලීල ස්ත්‍රිය යන අපෝහකයන් දෙක ම ඇය එක විට තම ශරීරයෙහි දරා සිටී. දහවල සහ රාත්‍රිය එකවිට ම ඇය තුළ පවතී. 'එමා බෝවාරි' නවකතාවෙහි චාල්ස් ව විවාහ කර ගන්නා අවකාශයේ එමා කුලවමිය ලෙසත් රුඩොල්ෆ් වෙත මහ පාන්දර දිවයන විට අශ්ලීල - පාලනය කරගත නොහැකි අනුරාගික - අතාර්කික 'දෙය' බවට පත් වේ. එහි දී ඇයගේ අතාර්කික බවට පතුළක් නැත. ඇය

 © 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

‘අමානුෂික කොටස්කරුවෙකි’ (Inhuman partner: Zizek 1994, 102).

මේ අනුව න්‍යායික ව ගත් විට ‘පෙරුම් පුරන ආදරය’ (මනමේ) සහ එම ආදරයේ අනුරාගික විතැන් වීම (වැදි රජ) අතර ඇත්තේ අසමමිතික සම්බන්ධයකි. (Asymmetrical relationship). එනයින් ඔවුන් තිදෙනාගේ අර්බුදය දෙස බැලීමට දයලෙක්තික විචාරය ප්‍රමාණවත් නොවන අතර එම ආශා පෙරළුම දෙස බැලිය හැකි වනු ඇත්තේ අසම්පාත විචාරයක් මගිනි. (Parallax critique) ජිජැක්ගේ (2006) ඉගැන්වීමට අනුව මනමේ කුමරියගේ චරිතය විචාරය කිරීමේ දී පැහැදිලි වන්නේ ඇයගේ ක්‍රියාවේ ආචාරධාර්මික අන්තර්ගතය (කාන්ටියානු ක්‍රියාව) එක් ආකාරයකටත් ඇයගේ අනුරාගික ක්‍රියාව තවත් ආකාරයකටත් (ඓතිහාසික ආර්ථික - සමාජ පරිණාමය නොහොත් ගම්ලත්ගේ දෘෂ්ටිය) සන්දර්භ ගත කළ යුතු ය යන්න ය. එසේ නොමැතිව මේ සිදු වූ මහා ව්‍යසනය (ද්‍රක්ඛාන්තය) (Trajedy) සමස්තයක් ලෙස තේරුම් ගත නොහැක යන්න මේ අධ්‍යයනයේ අවසාන තර්කය යි.

## නිගමනය

මනමේ කුමරියගේ ‘ආශා පෙරළුම’ යනු හුදු ආත්ම මූලිකත්වයක් හෝ ඓතිහාසික ගතිකයන්ගේ ප්‍රතිඵලයක් හෝ ලෙස තනි තනි ව ගැනීම ඒ පිළිබඳ ව කරන අසම්පූර්ණ විචාරයක් වේ. ඇය ඇයගේ ම වූ ස්වරූපයෙන් (in herself) තේරුම් ගැනීමට ඓතිහාසික දයලෙක්තික විචාරය මෙන් ම නව මනෝ විශ්ලේෂණය පිළිබඳ මෑතකාලීන සංවර්ධනයන් දෙස ද බැලීමට සිදු වේ. මේ අනුව මේ දක්වා මනමේ කුමරිය පිළිබඳ වූ විචාරයන් ඥාන විභාගාත්මක සහ සද්භාවී අර්ථයෙන් ඇයගේ අඳුරු ආශා මහද්වීපය ගැන පුරුෂ දෘෂ්ටිකෝණයෙන් සැලකූ විට ඇයගේ විනිවිදිය නොහැකි මදය වටා කැරකුන සින්තෝමයන් වේ. ඇය යනු ම අසංගත (Inconsistent) ආශාවේ පුරුෂ ප්‍රක්ෂේපණයක් වන අතර එය එක වරෙක මනමේ කුමරුගේ පෙරුම් පුරන ආදරය ලෙසින් ද අනෙක් වර වැදි රජුගේ අශ්ලීල ආශාව ලෙසින් ද විපරිණාමය වේ. මෙහි දෙවන පෙරළුම වනාහි පුරුෂ ක්ෂිතියක් වන හෙයින් පුරුෂයා එයින් පැන දුවයි. මෙම ගැලවීමේ මානසික ස්වභාවය (Escapism) නිසා ගැහැනියගේ දෙවන උත්පත්තිය ඔහුට අත් විඳීමට නොහැකි වන අතර මාර්ටින් වික්‍රමසිංහගේ ‘විරාගය’ නවකතාවේ දක්වෙන පරිදි ගැහැනිය නම් සබඳ අනෙකා (බතී) විනිවිදීමට අපොහොසත් පිරිමියෙක් අපට මෙහි දී මුණ ගැසේ (හපුගොඩ, 2017).

මනමේ කුමරිය යනු ආදරය සහ අවදානම (Contingency) යන දෙක ම එකට කැටිකරගත් මාරක ස්ත්‍රියකි (Fatal woman). එය බටහිර සිනමාවේ Basic Instinct(1992) නැත්නම් Casino(1995) වැනි චිත්‍රපටයක ෂෙරොන් ස්ටෝන් විසින් පන පොවන චරිතවලට සමාන වේ. මේ මාරක ස්ත්‍රිය පුරුෂ පරිකල්පනය පැත්තෙන් ක්ෂිතියක් වුවත් පුරුෂයා විසින් ද මේ ෆැන්ටසිය රඟපාන ලෙස ස්ත්‍රියගෙන් ඉල්ලා සිටියි. එනයින් මනමේ කුමරිය යනු කුමරියගේ පැත්තෙන් පමණක් නොව පුරුෂ ෆැන්ටසිය පැත්තෙන් ද විරුද්ධාභාෂයකි. විසි වන සියවසේ තුන්වන කාර්තුවේ ෂෙරොන් ස්ටෝන් නිරූපණය කරන වසඟ ස්ත්‍රිය අපගේ ජාතක කථාකරු විසින් මීට වසර සිය දහස් ගණනකට පෙර නිරූපණය කර ඇතත් අන් සියලු සමාජයන්ට මෙන් ම සිංහල බෞද්ධ සමාජයට ද ඇය තේරුම් ගැනීමේ හැකියාවක් නොතිබූ බව මෙහි දී සඳහන් කර තැබිය යුතු ය. ආදරය තුළ ආදරයේ ප්‍රතිපක්ෂය වන පතුලක් නැති අනුරාගය ද ඇති බව ජාතක කථාකරු තේරුම් ගෙන තිබුනත් එය අර්ථකතනය කර ගැනීමේ මාර්ගයක් ඔහු දැනසිට නොමැත. එය යම් ප්‍රමාණයක තේරුම් ගැනීමට සරච්චන්ද්‍ර උත්සාහ ගෙන ඇත ද (යති සංස්කෘතික දෘෂ්ටියෙන් මනමේ කුමරිය ගලවා ගැනීම), ඔහුට පවා අනුරාගයේ පතුලක් නොපෙනෙන (Fathomless bottom) ඇද වැටීම ගැන පුළුල් සාන්දෘෂ්ටික සහ උපේක්ෂා සහගත දෘෂ්ටියක් ගොඩ නැඟීමට හැකි වූවා දැයි සැක සහිත ය. මනමේ කුමරියගේ පෙරුම් පුරන ආදරයේ සදාකාලික පොරොත්තු වීම අවසන හමුවන ගුප්ත පෙරළුම නම් අනුරාගී ඉස්මතු වීම ඉදිරියේ අද දක්වා ලාංකික පුරුෂයා අසමත් ය යන දේශපාලන ප්‍රකාශය සහිත ව මෙම වියමන අවසන් කෙරෙයි.

## පරිශීලිත මූලාශ්‍රය

### ග්‍රන්ථ (සිංහල)


අංගුත්තර නිකාය, ඒකක නිපාත පාළි, රූපාදිවග්ගෝ.

ඒකනායක, පුංචි බණ්ඩා (2000) කලිඟු කුමර දන්තපුරයෙහි රජ වී, සුළුකලිඟුදාවත, කොළඹ, සමයවර්ධන පොත්හල.

ගම්ලත්, සුචරිත (1998) මනමේ නාට්‍ය සේවනය, මරදාන, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණරත්න, ආර්. ඩී. (2003) සරච්චන්ද්‍ර දාර්ශනිකයා හා කලාකරුවා, කර්තෘ ප්‍රකාශන.

ගුස්ටාව් ෆ්ලොබෙයාර් (1993) එමා බෝවාරි (පරි. සිරිල් සී. පෙරේරා). සමයවර්ධන. කොළඹ.

ප්‍රනාන්දු, මයිකල් (2014) මනමේ පරිණත වීම. කතිකා. අන්තර්ජාලය.

සරච්චන්ද්‍ර, එදිරිවීර (1958) මනමේ, කොළඹ, සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම.

හපුගොඩ, මහේෂ් (2018) මනමේ නූතනවාදී නාට්‍යයක් ද? ශ්‍රී ලංකා ගාඩියන්.

හපුගොඩ, මහේෂ් (2017) අනෙකා හමුවීම නම් ක්ෂිතිය මඟ හැරීම නොහොත් පරිකල්පනීය අනෙකා දිග්ගැස්සවීම නම් වූ ස්වරූපරාගී අගාධය, විරාගයේ අරවින්ද පිළිබඳ සාකච්ඡාවක්, සබරගමුව විශ්ව විද්‍යාල ශාස්ත්‍රීය සංග්‍රහය (8), පිටු 109 - 124.


 © 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ග්‍රන්ථ (ඉංග්‍රීසි)

Groys. B.(2008) Art Power, Cambridge, MIT Press

Zizek, S.(2006) The Parallax view, Massachusetts, MIT Press.

Zizek, S.(1994) Metastates of Enjoyment, London and Newyork, Verso

වෙබ් අඩවි

http://www.sinhala.slguardian.org/2018/12/blog-post_89.html



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 48-57
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# නූතන සිංහල නවකතාවේ ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (2010-2018 තෝරාගත් නවකතා ඇසුරෙනි)

## (The Usage of 'Registers' in the Modern Sinhala Novels: An Analytical Study with Special Reference to Selected Modern Sinhala Novels from 2010 to 2018)

තේජා නානායක්කාර
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
thejananayakkara93@gmail.com

**සාරසංක්ෂේපය**

භාෂක සමාජයක පවතින විවිධතා නිරූපණය වන්නේ අදාළ භාෂක සමාජයේ සාමාජිකයන් වහරනු ලබන භාෂාව මඟිනි. අධ්‍යාපන සාකච්ඡා, සුහද සාකච්ඡා, රාජකාරී ලිපි ලේඛන, අධිකරණ කටයුතු ආදී සියල්ල භාෂාව උපයෝගි කර ගනිමින් සිදුකරන සමාජීය කාර්යයන් වේ. එම එක් එක් කාර්යය හා සම්බන්ධිත ව පවතින වෙන් වෙන් වූ භාෂා ස්වරූප "ප්‍රාස්තාවික ස්වරූප" නම් වේ. එම භාෂා ස්වරූප ශබ්ද සංවිධානය, පද සංවිධානය, උච්චාරණ ධ්වනිය මෙන් ම වාග් කෝෂය අතින් ද වෙනස් වේ. භාෂකයා එක් එක් සමාජ කාර්යයට අනුකූල ව භාෂා ස්වරූපය වෙනස් කර ගනී. නූතන සිංහල නවකතා ශානරය නියෝජනය කරන නිර්මාණයන්හි ප්‍රස්තුත කාල අවකාශයට හා චරිතයන්ට අනුකූල ව ප්‍රාස්තාවික ස්වරූප භාවිත කර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ නූතන සිංහල නවකතාවේ චරිත නිරූපණය උදෙසා ප්‍රාස්තාවික ස්වරූප දක්වන උචිතානුචිත බව පිළිබඳ ව විමසීම යි. ඒ අනුව නවකතාවේ භාවිත භාෂා ස්වරූප චරිත ප්‍රතිනිර්මාණ ක්‍රියාවලියෙහි ලා දක්වන දායකත්වයත් නිර්මාණයට ප්‍රස්තුත වූ සමාජ පරිසරය, සිද්ධීන්, චර්යාවන්, සිතුවිලි නිරූපණයෙහි ලා අවස්ථානුකූල ව වාංමාලා වෙනස් වන ආකාරයත් එකී ව්‍යවහාරයන් නවකතාවෙන් අපේක්ෂිත මුඛ්‍යාර්ථ සාධනයෙහි ලා ඉවහල් වන ආකාරයත් මෙහි දී අධ්‍යයනය කර ඇත. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් 2010-2018 තෝරාගත් නවකතා පදනම් කරගත් අතර ද්විතීයික මූලාශ්‍රය ලෙස වාග් විද්‍යාව මෙන් ම සිංහල නවකතාවේ භාෂා භාවිතය සම්බන්ධ ග්‍රන්ථ, සඟරා, විචාර ලිපි හා අන්තර්ජාලය භාවිත කර ඇත. චරිතයක භාෂාව තීරණය වන්නේ එයට ප්‍රස්තුත වූ සමාජ සන්දර්භය මත පදනම් ව ය. එබැවින් නූතන සිංහල නවකතාවෙන් නිරූපිත සමාජ පරිසරයට හා ඒ ඒ සමාජ කාර්යයයන්ට අනුකූල ව චරිත නිරූපණය ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමෙහි ලා ප්‍රාස්තාවික ව්‍යවහාර උපස්ථම්භක වන බව නිගමනය කළ හැක.

කේන්ද්‍රීය වචන : ප්‍රාස්තාවික ව්‍යවහාර, නවකතාව, සමාජ පරිසරය, චරිත නිරූපණය, උචිතභාවය

The differences shown in a particular speech community are represented through the language utilized by the members of that society. The social functions such as educational or mutual discussions, official letters, court proceedings are done by the use of language. The "Register" is a variety of a language used for a particular purpose or in a particular social setting. These language forms differ from each other by varying factors such as phonology formation, morphology formation, pronunciation and vocabulary. The speaker tends to change his language form to suit the relevant social function. In the modern Sinhala novels, the usage of "Register" in accordance with the particular time and space and the characters is evident. The purpose of this study is to ascertain the suitability of registers for the characterization in the modern Sinhala novels and to study the contribution of language forms in the process of reconstruction of characters in the particular novels. In addition to that, the adapting nature of the vocabulary which depicts matters such as social context, incidents, behaviors and emotions involved in the creation is scrutinized here while observing how these "Registers" contribute for the success of a novel as expected by the author. In this study, selected novels from 2010 to 2018 were referred as primary sources and books, magazines, critical writings and web sources related to Linguistics and the usage of language in Sinhala novels were referred as secondary sources. To conclude, it is evident that the language of a character is determined by the social context. Moreover, this study proves that "Registers" assist for the effective characterization in accordance with the social context in the modern Sinhala novels.

Key words: Registers, Modern Sinhala novel, Social context, Characterization, Suitability

## හැඳින්වීම

භාෂාව යනු ශූන්‍යත්වයෙහි පාවෙමින් පවතින වස්තුවක් නොව, යම්කිසි භූමි ප්‍රදේශයක, යම්කිසි සමාජයක, යම්කිසි ප්‍රස්තාවක භාවිත කරනු ලබන ආකෘතික සංස්ථිතියකි. එබැවින් භාෂා ව්‍යවහාරයන් ප්‍රාදේශික, සාමාජික හා ප්‍රාස්තාවික වශයෙන් විවිධ වෙයි. සමාජයේ විවිධ කටයුතු සඳහා භාෂාව භාවිත කිරීමේ දී පෙනී යන කරුණක් වන්නේ ඒ ඒ කටයුතු සම්බන්ධ ව යෙදෙන භාෂා ස්වරූප එකිනෙකින් වෙනස් බව යි. මෙසේ එක් එක් කාර්යය හා සම්බන්ධිත ව පවතින වෙන වෙන භාෂා ස්වරූප "ප්‍රාස්තාවික ස්වරූප" යනුවෙන් හඳුන්වනු ලැබේ (ධර්මදාස 1996: 72).

භාෂණය සමාජ ප්‍රස්තරයෙන් සමාජ ප්‍රස්තරයට වෙනස් වේ. විශේෂයෙන් ම භාෂකයන්ගේ සමාජ තත්ත්වය (Social Status) අනුව ව්‍යවහාර ප්‍රභේද වෙනස් වන අයුරු සිංහලයේ දී හඳුනාගත හැක. සිංහල භාෂක සමාජය දෙස බලන විට ගිහි-පැවිදි, උගත්-නූගත්, ග්‍රාමීය-නාගරික ආදී සමාජීය ප්‍රභේද මෙන්ම විවිධ ජීවන වෘත්තීන් ආශ්‍රිත භාෂා ව්‍යවහාරයන් හා විවිධ සමාජ ප්‍රස්තර ආශ්‍රිත භාෂා ස්වරූපයන් ද පිළිබිඹු වේ. ඒ අනුව ප්‍රාස්තාවික ව්‍යවහාර යනු එකම භාෂාවක් තුළ පවතින ව්‍යවහාර ප්‍රභේද වේ. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ ප්‍රාස්තාවික ස්වරූපය හඳුන්වා දී ඇත්තේ මෙසේය.

> "Linguistics each of several forms of a language (colloquial,formal,literary etc) usually used in particular circumstances" (දිසානායක සහ මිල්ලගහතැන්න 2010: 75).

වාග්විද්‍යාවේ මුල්වරට "Register" යන යෙදුම භාවිත කර ඇත්තේ තෝමස් බර්ට්‍රම් රෙඩ් (Thomas Bertram Reid) නම් වාග්විද්‍යාඥයා ය. වර්ෂ 1956 දී ඔහු විසින් මෙය හඳුන්වා දෙනු ලැබුව ද එය පොදු ව්‍යවහාරයට සම්බන්ධ කොටගෙන ඇත්තේ 1960 දී පමණ ය. භාෂකයා සහ ව්‍යවහාර ප්‍රභේද අතර වෙනස අධ්‍යයනය කරලනු පිණිස වාග්විද්‍යාඥයන්ගේ සංගමය මඟින් මෙම යෙදුම භාවිතයට ගෙන ඇත. ප්‍රාස්තාවික ව්‍යවහාර යෙදීම ඔස්සේ සිදුවන්නේ එකම භාෂාවක් භාවිත කරන භාෂක සමාජයක් විසින් සම්මත කරගෙන ඇති පරිදි අවස්ථානුකූල ව භාෂාව ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය වෙනස් වීම යි. ඒ අනුව "කිසියම් භාෂක සමාජයක සාමාජිකයෙකු ඒ ඒ සමාජීය ප්‍රස්තාවට උචිත වන පරිදි තෝරා ගනිමින් යොදනු ලබන භාෂා ව්‍යවහාර ප්‍රභේදය සමාජීය වාග්වේදීන් විසින් ප්‍රාස්තාවික ව්‍යවහාර යන්නෙන් හඳුන්වනු ලැබේ"(එම 2010:76). ප්‍රාස්තාවික ව්‍යවහාර මඟින් අප කතා කරන ව්‍යවහාරයන්හි විධිමත්භාවය තීරණය කරයි. කිසියම් භාෂක සමාජයකට අයත් සාමාජික පිරිසක් විසින් සමාජ ආචරණයක් සිදුවන කාලසීමාවෙහි දී පමණක් ව්‍යවහාරයට ගනු ලැබීම ප්‍රාස්තාවික ව්‍යවහාරයන්හි විශේෂත්වය යි. මෙම ව්‍යවහාර භාවිත කරන්නන් කිසියම් උපභාෂක සමාජයක සාමාජිකත්වය දරන්නන් වීම ද ප්‍රස්තුත ක්‍රියාවලියට බාධාවක් නොවේ. වෙන වෙන උපභාෂක සමාජවලට අයත් සාමාජිකයන්ට ද අදාළ සමාජ ප්‍රස්තාවට අනුකූල ව ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිත කළ හැකි ය.

උපභාෂාව යනු භාෂකයා සම්බන්ධ ව්‍යවහාර ප්‍රභේදයක් වන අතර, ප්‍රාස්තාවික ස්වරූපය භාෂාමය ආචරණය සිදුවන ප්‍රස්තාව හා සම්බන්ධ ව්‍යවහාර ප්‍රභේදයකි. එකම භාෂකයා වෙන් වෙන් ප්‍රස්තාවන්හි දී වෙන වෙන භාෂා ස්වරූප යොදා ගැනීම මෙහි දී සිදුවේ. ඒ අනුව භාෂා ව්‍යවහාරයේ දක්නට ලැබෙන ස්වරූපවල විවිධත්වය, සමාජමය කාර්යය විවිධත්වයේ ප්‍රතිඵලයක් යැයි කිව හැකි ය. උපභාෂාමය සාමාජිකත්වය ස්ථිර වුවද ප්‍රාස්තාවික ස්වරූප තාවකාලික වූවකි. එය යළි යළිත් සහභාගී විය හැක්කක් වුව ද ස්ථිර නොවේ. එසේ වුවද ඇතැම් වාග්වේදීන් විසින් මෙම ව්‍යවහාර විශේෂය උපභාෂා ගණයෙහි ලා සලකනු ලැබේ.

> "ඉංගිරිසියෙහි 'register' යන්නෙන් හඳුන්වනු ලබන භාෂාමය ව්‍යවහාර ප්‍රභේදය හැඳින්වීමට සිංහල වාග්වේදීන්ගෙන් ඇතැමෙකු 'ප්‍රාස්තාවික උපභාෂා' යන්නත්, තවත් අයෙකු 'ප්‍රාස්තාවික ස්වරූපය' යන්නත් යොදාගෙන ඇත"(බලගල්ලේ 2012: 94).

කවර භාෂක සමාජයක සාමාජිකයෙකු වුව ද තමන් සහභාගී වන සමාජ ප්‍රස්තාවට ගැළපෙන සුදුසු බස් වහරක් තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමුකළ යුතු ය. විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයෙකු ස්වකීය ශිෂ්‍යයන් උදෙසා පාඨමාලා දේශනයක් කිරීමේදීත්, විද්වත් සංසදයක් ඉදිරියේ සම්මන්ත්‍රණ දේශනයක් කිරීමේදීත්, ග්‍රාම සංවර්ධන සමිති රැස්වීමක කතා කිරීමේදීත්, මිත්‍රයන් පිරිසක් සමඟ සංවාදයක් පැවැත්වීමේදීත්, පවුලේ සාමාජිකයන් සමඟ කතාබහ කිරීමේදීත් යොදාගනු ලබන භාෂා ස්වරූප එකිනෙකට වෙනස් බව ප්‍රත්‍යක්ෂ කරුණකි. භාෂක සමාජයේ කවර සාමාජිකයෙකුට වුවත් මෙබඳු එක් එක් ප්‍රස්තාව සඳහා සුදුසුතම සේ හැඟෙන ව්‍යවහාර ප්‍රභේද තෝරා ගනිමින් භාෂණයෙහි යෙදීමට සිදුවේ. මෙසේ කිසියම් භාෂක සමාජයක සාමාජිකයෙකු ඒ ඒ සමාජීය ප්‍රස්තාවට උචිත වන පරිදි තෝරා ගනිමින් යොදනු ලබන භාෂාමය ව්‍යවහාර ප්‍රභේදය සමාජ වාග්වේදීන් විසින් 'ප්‍රාස්තාවික ව්‍යවහාර' (register) යන්නෙන් හඳුන්වනු ලැබේ. සම්මත භාෂණ (standard) හා අසම්මත භාෂණ හෙවත් අපභාෂණ (slang) යන ප්‍රභේද ද්විත්වය ද ප්‍රාස්තාවික ව්‍යවහාර ගණයෙහි ලා සැලකිය හැකි බව විමල්.ජී.බලගල්ල ස්වකීය භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය ග්‍රන්ථයෙහි දක්වා ඇත (එම 2012: 94).

'register' යන සංකල්පය පිළිබඳ ව සිංහලයෙන් මුල්වරට විස්තරයක් කරන ලද්දේ ආචාර්ය එම්.ඩබ්ලිව්. සුගතපාල ද සිල්වා විසිනි. ඔහු මෙම සංසිද්ධිය සම්බන්ධයෙන් යොදාගෙන ඇත්තේ 'පරිමිත භාෂා' යන ශිල්ප වචනය යි. පරිමිත භාෂා යන සංකල්පය ප්‍රාස්තාවික ව්‍යවහාර හා අත්‍යන්තයෙන් ම බැඳී පවතින්නකි. සමාජයේ පවතින අතිශයින් විශේෂ වූ කාර්යයන් සඳහා පමණක් යෙදෙන භාෂා ස්වරූප පරිමිත ස්වරූප යනුවෙන් හැඳින්විය හැකි ය. ජේ.ආර්.ෆර්ත් මෙම සංකල්පය පරිමිත භාෂා ස්වරූපය හෙවත් Restricted Language නමින් හඳුන්වා ඇත. 'පරිමිත' යන්නෙන් කිසියම් සමාජීය ප්‍රස්තාවකට සීමා වූ යන අරුත ගම්‍යමාන වේ. භාෂක සමාජයක සාමාජිකත්වය දරන සාමාජිකයන් සමූහයක් කිසියම් සුවිශේෂී කර්තව්‍යයක් සඳහා සහභාගී වන කාලය තුළ දී පමණක් වවහාරයට ගනු ලබන භාෂා ස්වරූප මෙම ගණයට අයත් වේ. මෙම ව්‍යවහාරයන් ඒ ඒ අවස්ථාවට ඒ ඒ ස්ථානයට ඒ ඒ කාර්යයට පමණක් සුවිශේෂී වේ (දිසානායක සහ මිල්ලගහතැන්න 2010:71).

මෙසේ සමාජයේ විවිධ කාර්යයන් හා සම්බන්ධ ව පුද්ගලයන් සතුව පවතින ප්‍රාස්තාවික ස්වරූප හා පරිමිත ස්වරූප එකිනෙකින් වෙනස් වේ. ප්‍රාස්තාවික ස්වරූප හා පරිමිත ස්වරූප පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ භාෂක සමාජයක පවත්නා විවිධ කාර්යයන්ට


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සමාන්තර ව එකී භාෂාව මඟින් විද්‍යමාන වන විවිධත්වයේ ස්වභාවය යි. ලේඛනය හා භාෂණය යන ප්‍රධාන ප්‍රාස්තාවික ස්වරූප දෙකෙහි ද එකිනෙකට වෙනස් අනු ප්‍රාස්තාවික ස්වරූප පවතින බව ද ගම්‍යමාන වේ. එවැනි අනු ප්‍රාස්තාවික ස්වරූප කිහිපයක් පහත දක්වා ඇත.

**වෙන්දේසි කිරීමේ ව්‍යවහාරය**

"රුපියල් පහයි ඇවරයි, රුපියල් පහයි ඇවරයි, රුපියල් පහයි ඇවරයි, රුපියල් පහයි දෑවරයි, රුපියල් පහයි දෑවරයි..." (ධර්මදාස 1996:71).

**අධිකරණ කාර්යයේ භාවිත වහර**

"යුෂ්මතාට දිවුරල කියන්න පුළුවන් ද තමා මේ විත්තිකාරයව ඔය සිද්ධියට ඉස්සෙල්ල අඳුනගෙන සිටියෙ නැහැයි කියල?" (ධර්මදාස 1996:71).

**දේශපාලන වේදිකාවේ භාවිත වහර**

"මැණිවරුනි, පියවරුනි, සහෝදර සහෝදරයෙනි, ලබන විසිහත්වැනිදා අපේ මේ මවුබිමේ අනාගතේ තීරණය වෙන දවසය කියල කියන්න ඕනෑ" (එම 1996: 71).

**වෙළඳපොළෙහි ප්‍රාස්තාවික ස්වරූපය**

"හා! ලාබයි ලාබයි කඩේ සාප්පුවේ ගන්න බෑ. රාත්තල දෙකයි. රාත්තල දෙකයි" (ධර්මදාස 1983: 21).

**හිඟාකෑමේ ප්‍රාස්තාවික ස්වරූපය**

"හානේ මහත්වරුනේ දෑත දෙපය හදා වඩා ඇති දැඩි කළ දෙමාපියන්ට පිං අයිති වෙන්ඩ මේ දෑස් නොපෙනෙන අන්ධයාට පිනට මොකුත් ලැබෙන්ඩ" (එම 1983:21).

**පොල් කැඩීම සම්බන්ධ ප්‍රාස්තාවික ස්වරූපය**

"කැඩුවා හතරයි ගහේ තුනයි" (සිල්වා 1963:13).

**ආර්ථික විද්‍යාවේ ප්‍රාස්තාවික ස්වරූපය**

"පරිභෝජනය හා ආයෝජනය බොහෝ දුරට රඳා පවතින්නේ රටක නිපදවනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රමාණය උඩ ය. ජාත්‍යන්තර වෙළඳාමක් රහිත රටක නම් පරිභෝජනය හා ආයෝජනය ඒ රටේ මුළු නිෂ්පාදනයට සමාන වීම සිරිත ය" (එම 1996:71).

**භූගෝල ශාස්ත්‍රයේ ප්‍රාස්තාවික ස්වරූපය**

"මහාද්වීපික අධික පීඩන හේතු කොටගෙන ශිශිරයේ සුළං ගොඩබිම සිට හමයි. එහෙයින් ඒවා වියළි සුළං වෙයි. ඒවා තාපය ද අඩු කරයි..." (එම 1996:71).

**ප්‍රවෘත්තිමය ලේඛනය**

"රජයේ වෛද්‍යවරුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් මෙතෙක් විසඳුම් ලැබී නොතිබීම නිසා ගත යුතු ඉදිරි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය පිළිබඳ තීරණය කිරීම සඳහා හෙට (24) සංගමයේ මහා සභා රැස්වීමක් කැඳවා ඇතැයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පවසයි...- දිවයින" (කෝපරහේවා 2018:48).

**නෛතික ලේඛනය**

"(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් වේ නම් එසේ පරිච්ඡින්න කරනු ලබන්නා වූ හෝ වෙනස් කරනු ලබන්නා වූ හෝ එකතු කරනු ලබන්නා වූ විධිවිධාන ද ආනුෂංගික සංශෝධනයක් වෙතොත් එය ද පනත් කෙටුම්පතෙහි නිශ්චිත ව ප්‍රකාශිත ව ඇත්නම් මිස...- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" (එම 2018:49).

**ශාස්ත්‍රීය ලේඛනය**

"සිංහල භාෂාවේ සම්භවය කවදා කෙසේ සිදු වුවත් සිංහල භාෂාව පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක යෙදෙන කවරෙකු විසින් වුවත් අනිවාර්යයෙන් ඇසුරු කළ යුතු වන, භාෂා ප්‍රයෝගමය වූ වාර්තාගත පැරණිතම නිදසුන් වන්නේ, ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ පටන් සියවස් කිහිපයක් යන තුරු පිළිවෙළින් හා අඛණ්ඩවත් බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියැවී ඇති දහස් ගණනක් වූ සෙල්ලිපි සමූහයයි...-සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය" (එම 2018:49).

ව්‍යවහාර සිංහලයේ පවතින මෙකී සංකීර්ණතාව නවකතාව වැනි ජනප්‍රිය මුද්‍රිත මාධ්‍යයක් ඔස්සේ මනාව විවරණය වේ. එක් එක් භාෂකයාට අනුව පරිසරය, පසුබිම, සමාජ තත්ත්වය, වයස වෙනස් වන්නා සේ ම අනන්‍ය වූ වාග්කෝෂයක් ද පවතී. චරිතයක් විශ්වසනීය ලෙස නිරූපණය කිරීමට නම් ඒ ඒ චරිතයට ඔබින වචන, උචිත ශෛලියකින් එකී චරිත ලවා කතා කරවිය යුතු ය. චරිතයේ තත්ත්වය, ඒ ඒ අවස්ථාවල දී ඇතිවන චිත්ත ස්වභාවය මෙන් ම එක් එක් සමාජ පරිසරයන්හි දී චරිතයන්ගේ ක්‍රියාකාරීත්වය පෙන්වීමට උචිත භාෂා ස්වරූප භාවිත කළ යුතු ය. කතාව ඉදිරියට ගෙන යාමේ ශක්තිය පවතින්නේ එකී භාෂා ස්වරූප මත ය. මෙම අධ්‍යයනය මඟින් තෝරාගත් නවකතාවන්හි ප්‍රබල චරිත නිරූපණයක් උදෙසා ප්‍රාස්තාවික ව්‍යවහාර දක්වන ශක්‍යතාව අධ්‍යයනය කෙරේ. එක් එක් චරිතයන් සමාජයේ විවිධ ප්‍රස්තර හා සංස්ථානය වන ආකාරය මත භාෂා ස්වරූපයන්හි ඇති වන වෙනස්වීම් පිළිබඳවත් එමඟින් චරිතයන්හි බාහිර හා අභ්‍යන්තර ගුණාංග විවරණය වන ආකාරය පිළිබඳවත් මෙහි දී සාකච්ඡා කෙරේ. විශේෂයෙන් ම එක ම භාෂකයා විවිධ සමාජ පරිසරයන්හි දී භාවිත කරනු ලබන භාෂා ස්වරූපයන්හි විවිධත්වයත් එකී චරිතයන් යථාර්ථවාදී ලෙස රූපණය සඳහා එම භාෂා ස්වරූපයන් දක්වා ඇති දායකත්වයත් මෙහි දී විමර්ශනයට ලක් කෙරේ. එමඟින් අදාළ නිර්මාණයේ අභිප්‍රේත මුඛ්‍යාර්ථ සාධනය වී ඇත් ද යන වග මෙහි දී විමසා බලනු ලැබේ. මේ සඳහා තෝරාගත් නවකතා ලෙස සමන් වික්‍රමාරච්චිගේ අප්පච්චි ඇවිත්, කීර්ති වැලිසරගේ ගේ කාල සර්ප, කෞශල්‍ය කුමාරසිංහගේ මේ රහස් කවුළුවෙන් එබෙන්න හා ලියනගේ අමරකීර්තිගේ කුරුලු හදවත පාදක කොටගෙන ඇත.

## සාහිත්‍ය විමර්ශනය

මෙහි දී මූලික අවධානය යොමු කරනු ලබන්නේ ප්‍රාස්තාවික ව්‍යවහාර සංකල්පය පිළිබඳ ව රචිත වාග්විද්‍යානුකූල ග්‍රන්ථ කෙරෙහි ය. කේ.එන්.ඕ.ධර්මදාස විසින් රචිත භාෂාව හා සමාජය(1996) ග්‍රන්ථයෙහි ඇතුළත් සමාජය තුළ විවිධතා සහ භාෂාව තුළ විවිධතා, සමාජයේ ව්‍යාප්තිය හා භාෂාවේ ස්වරූප, සමාජයේ කටයුතු හා භාෂාවේ ස්වරූප, සමාජ ප්‍රකරණ හා භාෂාව යනාදී ලිපි මෙම පර්යේෂණයේ සාහිත්‍ය ක්ෂේත්‍රය පෝෂණය කිරීම සඳහා උපයෝගී කරගනු ලැබිණි.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

එමඟින් සමාජයේ විවිධ කාර්යයන් හා සමාජ ප්‍රස්තර කෙරෙහි බැඳුණු වෙන් වෙන් වූ භාෂා ප්‍රභේද පිළිබඳ ව හඳුනාගත හැකි විය. ජේ.බී.දිසානායකගේ මානව භාෂා ප්‍රවේශය(2005) ද භාෂාවේ විවිධ ස්වරූප හඳුනාගැනීම උදෙසා මෙහි දී උපස්ථම්භක කර ගැණුනි. එහි සඳහන් භාෂාව හා සමාජය, භාෂාව හා අර්ථ රටා, භාෂා ප්‍රභේද යනාදී පරිච්ඡේද මෙම පර්යේෂණ පත්‍රිකාව පෝෂණය සඳහා උපයුක්ත කර ගැණුනි. භාෂණය හා ලේඛනය වශයෙන් භාෂාවේ ප්‍රධාන ස්වරූප ද්විත්වයක් පැවතුණ ද සන්නිවේදන කාර්යයේ දී එම ප්‍රභේදයන්හි තවත් අනු ප්‍රභේද භාවිත වන ආකාරයක් හඳුනාගත හැකි ය. එක් එක් සමාජ කාර්යයට හා අවස්ථාවට අනුකූල ව භාෂණයේ මෙන් ම ලේඛනයේත් ස්වරූප බහුලත්වයක් විශද වේ. උක්ත කාරණා සනාථ කරනු වස් සඳගෝමි කෝපරහේවා විසින් රචිත භාෂාව හා සන්නිවේදනය(2018) ග්‍රන්ථයෙහි ඇතුළත් භාෂණයේ ස්වරූප විවිධත්වය හා භාෂණයේ හා ලේඛනයේ අනු ස්වරූප යන ලිපි දායක කර ගැණුනි. සඳගෝමි කෝපරහේවාගේ විසිවන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරය(2018) ග්‍රන්ථයේ සඳහන් සමාජ සන්දර්භය තුළ භාෂා අධ්‍යයනය හා භාෂක සමාජය හා භාෂාවේ ස්වරූප යන ලිපි මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රාස්තාවික ව්‍යවහාර පිළිබඳ න්‍යායාත්මක අංශය පෝෂණයෙහි ලා ඉවහල් විය. කුරුපිට අස්සජිතිස්ස හිමිගේ වාග්විද්‍යා විමර්ශන(2017) කෘතියේ සඳහන් ප්‍රකරණ විචාරයෙහි ලා ඉගැන්වෙන භාෂණ ක්‍රියා පිළිබඳ ව සිංහල භාෂාව ඇසුරෙන් විමර්ශනයක් ලිපිය ද මෙහි සාහිත්‍ය ශානරය පෝෂණය සඳහා ඉවහල් විය. එමඟින් භාෂාවේ වාගාලාප හා බැඳී පවතින ප්‍රකරණ අර්ථ පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකි විය. ආරියදාස මිල්ලගහතැන්න විසින් රචිත අද්‍යතන ව්‍යවහාර භාෂාව(2018) කෘතියේ ඇතුළත් විවිධ කර්මාන්ත භාෂාව යන ලිපිය වෘත්තීයබද්ධ ප්‍රාස්තාවික ස්වරූප පිළිබඳ කාරණා සනාථ කර ගැනීමට උපස්ථම්භක විය. විමල් ජී.බලගල්ලේ විසින් රචිත භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය(2012) කෘතියේ එන භාෂාව, පුද්ගලයා හා සමාජය පරිච්ඡේදයේ සඳහන් පරිමිත භාෂා හා ප්‍රාස්තාවික ව්‍යහාර යන ලිපිය ද මෙහි සාහිත්‍ය ශානරය පෝෂණයෙහි ලා දායක කර ගැණුනි. එමඟින් ප්‍රාදේශීය භාෂා හා උපභාෂා යන වර්ග ද්විත්වයෙන් කවර වගකට හෝ අයත් නමුදු උපභාෂාවක් සේ හැඳින්වීමට අපහසු භාෂා ව්‍යවහාර හෙවත් කිසියම් සමාජීය ප්‍රස්තාවකට සීමා වූ ව්‍යවහාර ප්‍රභේද පිළිබඳ ව හඳුනාගත හැකි විය.

විමල් දිසානායක විසින් රචිත විවාදාත්මක ලිපි(2015) කෘතියේ සඳහන් නවකතාව හා භාෂා විචාරය යන පරිච්ඡේදය මෙම පර්යේෂණ පත්‍රිකාවේ ඇතුළත් නවකතාවේ භාෂාත්මක අංශය පෝෂණයෙහි ලා ඉවහල් විය. නවකතාකරුවා සිය අභිමතාර්ථ සාධනය කර ගන්නේ භාෂාව මඟිනි. චරිත නිරූපණය, සන්දර්භය, ජීවන දෘෂ්ටිය, කථා කලාව, අත්දැකීම් යනා දී සියල්ල භාෂාව සමඟ අවියෝජනීය ලෙස බැඳී ඇත. නවකතාකරුවා සිය අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම සඳහා උචිත ම වාංමාලා භාවිත කරන ආකාරය හෙවත් වාගුක්ති වරණය යන සංකල්පය පිළිබඳ ව මෙහි දී අවධානයට පාත්‍ර විය. එමෙන්ම සාහිතය නිර්මාණයක භාෂාත්මක ලක්ෂණ විග්‍රහ කරමින් ඉන් ලැබෙන ප්‍රතිඵල එම කෘතියෙහි ගැබ් වූ මුඛ්‍යාර්ථ සාධනය සඳහා යොදා ගන්නා ආකාරය හෙවත් නූතන වාග්විද්‍යාවේ ප්‍රභේදයක් වන රීති විචාරය පිළිබඳ කරුණු මෙම පර්යේෂණ පත්‍රිකාව සඳහා උපස්ථම්භක කර ගැණුනි. ආරිය රාජකරුණා විසින් රචිත සම්මානලාභී නවකතා විමර්ශනය(2015) ග්‍රන්ථයේ සඳහන් කාල සර්ප නවකතාව පිළිබඳ විචාර ලිපිය ද මෙහි සාහිත්‍ය ශානරය සඳහා උපයෝගී විය. සේන තෝරදෙණිය විසින් රචිත විචාර විලෝචන (2018) කෘතියේ එන 'කළුවරයි පුරහඳ' ඇසුරින් සිංහල නවකතාව පිළිබඳ භාෂාත්මක විශ්ලේෂණයක් යන ලිපිය ද මේ සඳහා දායක කර ගැණුනි. එමඟින් නවකතාවක චරිත නිරූපණයෙහි ලා යොදා ගන්නා භාෂණ විලාසය, විශේෂිත වූ සමාජ කණ්ඩායම්වල භාෂා රටාව, විවිධ චරිත අවස්ථානුකූල ව භාෂාව වෙනස් කරන ආකාරය හා විවිධ චරිතවලට ගැළපෙන බස ආදී කාරණා පිළිබඳ ව යම්බඳු දැනුමක් උකහා ගත හැකි විය. තව ද විමල් දිසානායකගේ වීමංසා නවකතා අංකය (2002) හා ඒ.වී.සුරවීරගේ නවකතා නිර්මාණය හා අවබෝධය(1973) යන කෘති ද මෙහි සාහිත්‍ය විමර්ශන ක්ෂේත්‍රය සඳහා උපස්ථම්භක විය.

## පර්යේෂණ ගැටලුව

මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ නූතන සිංහල නවකතාවේ භාෂා ප්‍රබලත්වය උදෙසා ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිතය කෙතරම් දුරට ඉවහල් වී ඇත් ද යන්නයි. එහි දී නවකතාවක චරිත නිරූපණයේ ප්‍රබලත්වය උදෙසා ප්‍රාස්තාවික ව්‍යවහාර සහිත භාෂා ශෛලිය උපස්ථම්භක වේ යන උපන්‍යාසය මත පදනම් ව මෙම අධ්‍යයනය සිදු කෙරේ.

## පර්යේෂණ අරමුණ

නවකතාවකින් අපේක්ෂිත මුඛ්‍ය අරමුණ පාඨක මනසෙහි නිරූපණය කිරීම සඳහා ප්‍රාස්තාවික ව්‍යවහාර සහිත භාෂා ශෛලියේ උචිතානුචිත බව හඳුනා ගැනීම මෙහි මුඛ්‍ය අරමුණ යි. එමඟින් නවකතාවක චරිත නිරූපණය සඳහා ප්‍රාස්තාවික ස්වරූප උපකාරී වන අයුරු මෙන් ම එම ව්‍යවහාර භාවිතයෙන් මනුෂ්‍ය චිත්තය විදාරණය කරන අයුරු පිළිබඳ ව ද අධ්‍යයනය කෙරේ. එමෙන් ම භාවිත භාෂාව නවකතාවේ සමාජ පරිසරයට, සමාජ කාර්යයන්ට, සිද්ධීන්ට, චර්යාවන්ට, සිතුවිලි හා අවස්ථාවන්ට ගැළපෙන අයුරින් යොදාගෙන ඇත්තේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීමට ද මෙමඟින් ඉඩ ප්‍රස්තාව සැලසේ. නවකතාවෙන් නිරූපිත සමාජ පරිසරයට උචිත ලෙස චරිත නිරූපණය සකස් වී තිබේ ද, පාඨකයා තුළ චරිත කෙරෙහි විශ්වසනීයත්වයක් ඇතිවන පරිදි නවකතාවේ භාෂා ශෛලිය සකස් විය යුත්තේ කෙසේ ද, ඒ ඒ ප්‍රස්තාවට උචිත පරිදි නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරීමට ප්‍රාස්තාවික ව්‍යවහාර ඔස්සේ හැකියාවක් තිබේ ද, නවකතාවේ සාර්ථකත්වයට හා ජනප්‍රියත්වයට මෙමඟින් බලපෑමක් සිදුවන්නේ ද, නවකතාවක චරිත නිරූපණය කිරීමේදී ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිත නොකොට පොදු ව්‍යවහාරයක් භාවිත කළහොත් ඉන් අපේක්ෂිත සන්නිවේදන කාර්යයට බාධා පැමිණේ ද යනාදී කාරණා පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරේ.



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණයේ වැදගත්කම

කිසියම් භාෂාවක් පිළිබඳ ව විධිමත් අවබෝධයක් ලැබීමට නම් එම භාෂාවට අයත් ව්‍යාකරණ රීති පමණක් නොව සමාජීය වශයෙන් එම බස භාවිත කෙරෙන ආකාරය ද හඳුනා ගත යුතු ය. භාෂාව හා සමාජය අතර පවත්නා අන්තර් සබැඳියාව හේතු කොටගෙන ඒ හා බැඳී පවත්නා භාෂාත්මක චර්යා අදාළ භාෂක සමාජයේ ද දැකිය හැකි වෙයි. ඒ අනුව භාෂාව හා සමාජය අතර පවතින මෙකී සම්බන්ධය හැදෑරීම සමාජය පිළිබඳ සංස්කෘතික අධ්‍යයනයක් ලෙසින් ද වැදගත් වේ. එසේ ම නවකතාවකින් අපේක්ෂිත මුඛ්‍ය අරමුණ පාඨක මනසට සම්ප්‍රේෂණය කිරීමට ප්‍රාස්තාවික ව්‍යවහාර සහිත බස දක්වන ශක්‍යතාව අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණය වැදගත් වේ. එමෙන්ම නවකතා නිර්මාණයේ නියැලෙන ආධුනිකයන්ට නවකතාවක භාෂා ශෛලිය සකස් විය යුතු ආකාරය පිළිබඳ යම්බඳු අවබෝධයක් ලබා ගැනීමට මෙය දායක වේ. භාෂා චර්යාවෙහි මිනිසාගේ සමාජ ජීවිතය පිළිබිඹු වී ඇති හෙයින් භාෂාව සමාජීය ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීම මඟින් එම භාෂක සමාජය ආශ්‍රිත සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික පසුබිම පිළිබඳ ව අවබෝධ කරගත හැකි ය. කිසියම් භාෂක සමාජයක සමාජ, සංස්කෘතික පසුබිම අනුව භාෂා ව්‍යවහාරයේ සිදුවන වෙනස්කම් හා ලක්ෂණ අධ්‍යයනය කළ හැක්කේ සමාජවාග්විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් භාෂාව අධ්‍යයනය කිරීමෙන් පමණි. එබැවින් භාෂාවේ වාග්විද්‍යාත්මක පැතිකඩ පිළිබඳ ව විමර්ශනය කරන්නෙකුට ද මෙම අධ්‍යයනය උපකාරී වේ. එමෙන් ම මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනයේ නියැළීමට ද මෙම අධ්‍යයනය වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය පුස්තකාල විමර්ශන පාදක කොටගෙන සිදු කෙරේ. මෙහි දී උක්ත ව දක්වා ඇති තෝරා ගත් කෘති සියල්ල ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ගෙන විමර්ශනාත්මක ක්‍රමවේදය මඟින් අධ්‍යයනයට ලක් කරයි. ද්විතියික මූලාශ්‍රය ලෙස ප්‍රාස්තාවික ව්‍යවහාර සම්බන්ධයෙන් රචනා වී ඇති වාග් විද්‍යාත්මක ග්‍රන්ථ, සිංහල නවකථාවේ භාෂා භාවිතය සම්බන්ධ ග්‍රන්ථ, සඟරා, ලිපි, අන්තර්ජාලය යොදාගෙන ඇත. මෙහි ලා උපයෝගී කර ගැනෙන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි.

## සාකච්ඡාව

කතා රචනයෙහිදීත් චරිත නිරූපණයෙහිදීත් නවකතාකරුවා විසින් කරනු ලබන්නේ නිර්මාණයක් වුව ද ඔහු ඒ සඳහා කරුණු රැස් කරගන්නේ අප ජීවත්වන ලෝකයෙන් හා ජන සමාජයෙනි. එබැවින් නවකතාවේ චරිත ද සජීවී විය යුතු ය. නවකතාකරුවා නිර්මාණය කරන චරිත සැබෑ ජීවිතයේ පුද්ගලයන් හට බෙහෙවින් සමාන විය හැකි ය. මෙමඟින් තෝරාගත් නවකතාවන්හි ප්‍රබල චරිත නිරූපණයක් උදෙසා ප්‍රාස්තාවික ව්‍යවහාර දක්වන ශක්‍යතාව අධ්‍යයනය කෙරේ. එක් එක් චරිතයන් සමාජයේ විවිධ ප්‍රස්තර හා සංස්ථානය වන ආකාරය මත භාෂා ස්වරූපයන්හි ඇති වන වෙනස්වීම් පිළිබඳවත් එමඟින් චරිතයන්හි බාහිර හා අභ්‍යන්තර ගුණාංග විවරණය වන ආකාරය පිළිබඳවත් මෙහි දී සාකච්ඡා කෙරේ. ඒ ඒ සමාජ ප්‍රස්තාවන්ට ගැළපෙන පරිදි චරිතයන්හි මුවට නංවා ඇති භාෂා ස්වරූපයන් කෙබඳු ද? චරිතයක් විශ්වසනීය ලෙස පාඨක මනසට සම්ප්‍රේෂණය වීමට යොදා ගෙන ඇති භාෂා ශෛලිය සමත් වන්නේ ද? චරිතයන්හි විවිධාකාර ගති ලක්ෂණ සාධනීය ලෙස ඉස්මතු වීමට යොදාගෙන ඇති භාෂා ස්වරූප බලපාන්නේ ද? යනාදී කාරණා පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කෙරේ. විශේෂයෙන් ම එකම භාෂකයා විවිධ සමාජ පරිසරයන්හි දී භාවිත කරනු ලබන භාෂා ස්වරූපයන්හි විවිධත්වයත් එකී චරිතයන් යථාර්ථවාදී ලෙස රූපණය සඳහා එම භාෂා ස්වරූපයන් දක්වා ඇති දායකත්වයත් මෙහි දී විමර්ශනයට ලක් කෙරේ. එමඟින් අදාළ නිර්මාණයේ අභිප්‍රේත මුඛ්‍යාර්ථ සාධනය වී ඇත් ද යන වග මෙහි දී විමසා බලනු ලැබේ.

අප්පච්චි ඇවිත් නවකතාවෙහි එන නිශ්ශංක යනු අධිකාරීමය පියාට යටත් පියාගේ නාමකරණය ප්‍රතික්ෂේප කළ චරිතයකි. රොබට් බ්ලොච්ගේ සයිකො නවකතාවෙහි එන නෝමන් බෙස්ට් නමැති තරුණයාගේ චරිතයට සමාන චරිතයක් නිශ්ශංක මඟින් ද දෘශ්‍යමාන වේ. ඔහු ද මව මියගිය බව පිළිගන්නේ නැත. මවගෙන් උපදේශන ද ලබා ගනී. ඔහු මිනිස් ඝාතන කිහිපයකට සම්බන්ධ වන්නේ ද මවගේ බලපෑම මත ය. කලකට පෙර මියගිය මවගේ ශරීරය පුළුන් පුරවා වියළා තබා ගන්නා නෝමන් ද නිශ්ශංක මෙන් ම අධිකාරී සංකේතය හා කතා කරමින් අභිමි ආත්මසාරය පත යි. නිශ්ශංක වූ කලී විශ්වවිද්‍යාල සමයේ සිට ම විපරීත ලිංගික ආශාවන්ගෙන් වින්දනයක් ලබන්නෙකි. ඔහු දෙවන වසරේ දී පළමු වසරේ ශිෂ්‍යාවක මඟින් සිය විපරීත ලිංගිකත්වය මුදා හරී. ඔහු යොදා ගන්නා ව්‍යවහාරයන්ගෙන් චිත්ත ස්වභාවයේ පවතින ව්‍යාකූලත්වය මනාව ගම්‍යමාන වේ. මොහු විසින් භාවිත කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය නවකව ද මානසිකත්වය හා බැඳුණු උච්චාරණ ශෛලියකි. මෙවැනි ව්‍යවහාර භාවිතය මඟින් භාෂණයේ යෙදෙන්නාගේ මානසික මට්ටම විවරණය වේ.

> "ගනිං හාෆ් ශීට් එකක්..."
> "බැල්ලි මං කියන ඒවා ලියපං ඔය කොළේ.........ලියපිය පුරුෂ ලිංගය කියන කුණුහරුපෙට කියන ශිෂ්ට සිංහල වචනෙ..."
> (වික්‍රමාරච්චි 2018:83-84).

පියාගේ සංකේතීය බලයට අවනත වන නිශ්ශංක නිවසේ දී, බසයේ දී දී මෙන් ම කාර්යාලයේ දී පවා හැසිරෙන්නේ පියා තමා ආසන්නයේ සිටින්නාක් මෙනි. සමාජයට හාස්‍යයක් වන එකී තත්ත්වය මානසික විකෘතිතාවක් යැයි පිළිගන්නා පුද්ගලයන් සමඟ ඔහු ප්‍රචණ්ඩකාරී ව හැසිරේ. ඔහුගේ සිතෙහි පවතින පියා අමරණීය යැයි පවතින විශ්වාසය එය නොපිළිගන්නා සමාජය වෙත ඔහු එල්ල කරනු ලබන ක්‍රෝධය මුසු වදන්වලින් තහවුරු වේ. ඔහුගේ චිත්ත ස්වභාවයේ පවතින විකෘති බව ඔහුගේ හැසිරීම මත සමාජයට නිරාවරණය වේ. ඒ අනුව භාෂණය යම්බඳු චරිතයක සමාජ තත්ත්වය, පසුබිම හා උගත්කම ප්‍රදර්ශනය


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කරන්නාක් සේ ම මානසික මට්ටම ද විශද කිරීමට සමත් බව මෙහි දී සනාථ වේ.

> "මාතුපාල!
> කෝ යකෝ අනිත් තේ එක!
> මං බොට කිව්වා නේද අප්පච්චිටත් එක්ක තේ දෙකක් ගේන්න කියලා..." (එම 2018: 48).

සමාජයට තමා උමතු රෝගියෙකු නොවන බව පෙන්වීමට නිශ්ශංක නිරන්තරයෙන් උත්සාහ දරයි. නමුත් ඇතුළාන්තයෙන් පෙර පරිදි ම පියාගේ අධිකාරීමය බලයට ඔහු යටත් වේ. කාර්යාලයේ දී නිවසේ දී මෙන් ම ඔහු නියෝජනය කරන සියලුම සමාජ ප්‍රස්තරයන්හි දී ඔහු හැසිරෙන්නේ ප්‍රශස්ත මට්ටමකිනි. පියා තමා අසළ සිටිය ද නොසිටින අයුරින් සමාජය සමඟ ගනුදෙනු කිරීමට ඔහු උත්සාහ දරයි. එසේ හැසිරීමෙන් සිය යථා ස්වභාවය ලෝකයට වසන් කිරීමට යත්න දරන ඔහු තමා වගකීම් සහගත පරිපූර්ණ මිනිසෙකු බව සමාජයට දැනවීමෙන් තෘප්තියක් ලබ යි. අන්‍යයන් රැවටීමෙන් ඔහුගේ සිතට දැනෙන සහනශීලී බව ඔහුගේ වාග් විලාසය මඟින් සනාථ වේ. මෙම උමතුවේ යථා ස්වරූපය නිශ්ශංකගේ චරිතය හරහා විවරණය කිරීමට කතුවරයා මෙවැනි අවස්ථා යොදාගෙන ඇත.

> "ගේනවකො මාතුපාල තේ දෙකක්
> සර්?
> අන්න බලනවා මාතුපාල තමුසෙ හිතන්නෙ මට තාමත් පිස්සුයි කියලනෙ. මම මේ තමුසෙව පොඩ්ඩක් ටෙස්ට් කළා. තේ දෙකක් මොකටද ඕයි මේ තනි මට" (එම 2018: 123).

පියා හා පුතු අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධයත් පියාගේ දෘෂ්ටියෙන් ලෝකය දෙස බලන්නට උත්සාහ කිරීම නිසා ඇති වන සංකීර්ණ මානසික තත්ත්වයත් පියාගේ නාමකරණය පිළිබඳ සාධකයේ යථාර්ථය සොයා යෑමත් මෙම නවකතාව මඟින් අපේක්ෂිත මුඛ්‍යාර්ථයයි. ඒ සඳහා මෙවන් මානසික තත්ත්වයක් සහිත වූවෙකු සමාජයේ විවිධ ප්‍රස්තර හා සට්ටනය වීම මත ඔහුගේ චරිත ලක්ෂණ පාඨකයා වෙත නිරාවරණය කිරීමට අවැසි භාෂා ශෛලියක් භාවිත කර ඇති බව පෙනේ. එමඟින් චරිතය නවකතාව පුරා ගමන් කරවීමටත් එවන් මානසික ව්‍යාධියක තතු යථාර්ථවාදී ලෙස සහෘදයා වෙත සම්ප්‍රේෂණය කිරීමටත් උපයුක්ත භාෂාව සමත් වී ඇත.

නමුත් විනිසුරු හා විත්තියේ නීතීඥයා සඳහා භාවිත කර ඇති වාංමාලා උසාවි පරිසරයක් නියෝජනය සඳහා අනුචිත බව පෙනේ.

> "විනිසුරු: මොකක්ද ඒ පොතේ නම. නැවත කියන්න."
> "විත්තියේ නීතිඥ: What is madness. ඔහු ලියා තිබෙනවා තව හරි අපූරු පොතක් Why Women Write More Letters Than they post කියලා."
> "විනිසුරු: හා....හා...(මහ හඬින් සිනාසේ)" (එම 2018: 199-200).

මෙය සාමාන්‍ය නඩු විභාගයකට වඩා වෙනස් ය. කතුවරයා සමාජ පරිසරය පිළිබඳ ව අවධානය යොමු කිරීමට වඩා නවකතාවේ තේමාත්මක අංශය පිළිබඳ ව පමණක් සැලකිලිමත් වී ඇති අයුරු පෙනේ. එමඟින් සාමාන්‍ය පාඨකයාට දුරවබෝධ තත්ත්වයක් පැන නැඟී ඇත. එමෙන් ම එම සංවාද අන්තර්ගත නඩු විභාගය නවකතාවට පරිබාහිර ව ඇති ස්වභාවයක් ද දක්නට ලැබේ. එයට යොදාගෙන ඇති සාහිත්‍යයික කරුණු අඩංගු ව්‍යවහාර විනිසුරු වෘත්තිය හා අධිකරණ කාර්යය සඳහා නොගැළපෙන බව විශද වේ. එහෙයින් අභිප්‍රේත මුඛ්‍යාර්ථ සාධනය සීමා වී ඇත.

කාලසර්ප නවකතාව ඇරඹෙන්නේ රබර් වතු හිමි පවුලක අවිවාහක තරුණියක වූ විශාඛා කේන්ද්‍ර කොටගෙන ය. මෙම චරිතය නිරූපණයේ දී කතා පුවතට හෝ චරිත නිරූපණයට සම්බන්ධයක් නැති අනවශ්‍ය වාංමාලා භාවිත කර ඇති බව පෙනේ. විශාඛා හා චාරුණී අතර පවතින්නේ අසාමාන්‍ය මිත්‍රත්වයකි. ඔවුන් හමු වූ අවස්ථාවල දී භාවිත කර ඇති වාගුක්ති මඟින් එය සනාථ වේ. ඒවා සාමාන්‍ය සුහද ප්‍රාස්තාවික ස්වරූපයකින් ඔබ්බට ගිය සංවාදයන් ය. එමඟින් කතුවරයා පාඨකයාට සම්ප්‍රේෂණය කිරීමට අපේක්ෂා කළ පණිවිඩය කුමක් ද යන්න පැහැදිලි නොවේ. ඇතැම්විට අවිවාහක බව හේතුවෙන් යටපත් වී ඇති විශාඛාගේ ලිංගික ආශාවන් චාරුණී හමුවේ ඉස්මතු වන අයුරු හා එමඟින් වින්දනයක් ලබන ආකාරය කතුවරයා මෙබඳු ව්‍යවහාර භාවිතයෙන් මතුකොට දැක්වූවා විය හැකි ය. නමුත් එය අභව්‍ය ය.

> "අල්ලගන්න දුන්නෙ කොහොමද...මෙහෙමද?"
> "ඉම්මෙ නැද්ද?" (වැලිසරගේ 2017: 22-23).

ප්‍රධාන චරිතය වන වසන්ත වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වීමේ අරමුණින් විද්‍යා විෂයන් හදාරා අසමත් වූවෙකි. පසුව ඔහු කලා විෂයන් හැදෑරීමට පෙළඹෙන්නේ සිය දුර්වලතා අස්වභාවික ලෙස වසන් කරමිනි. එය ඔහු චාරුණී වෙත යවනු ලබන ලිපිය මඟින් හා සිය මවට පවසන වදන් ඔස්සේ සනාථ වේ. ඔහු විරාගයේ අරවින්ද මෙන් සිය නොහැකියාව සඟවා අන්‍යයන් රැවටීමෙන් වින්දනයක් ලබන්නෙකි. ඔහු අවධාරණාර්ථයෙන් යුක්ත ව සිය අසත්‍ය සාධාරණීකරණය කරයි. චාරුණී ඉදිරියේ ඔහු තමාට වඩා කිසිවෙකු නිර්මාණය කරයි. චාරුණී ඔහු පිළිබඳ ව ඇති කරගන්නා ප්‍රතිරූපය ඔහුට ආස්වාදයකි. මෙම වාංමාලාවන්හි සඳහන් වන්නේ ඔහුගේ චරිතයට ඉඳුරා ම වෙනස් ෆැන්ටසියකි.

> "මට ඒක අදහගන්න බැරි වුණා. කොහොමටත් මම හොඳටම පාස් වෙන බව දැනගෙනයි හිටියෙ. ඒත් මේ තරම් හොඳ ප්‍රතිඵලයක් ලැබෙයි කියල මම හිතුවෙ නෑ. මේක සමහර විට වාර්තාවක් වෙන්නත් පුළුවන්. ඒත් ඒක තාම පත්තරවල එහෙම ප්‍රසිද්ධ නොවුණෙ හේතුවක් ඇතුව..." (එම 2017: 95). "ඇතුල් වෙන්න ඉල්ලුම්පත්තර දාන්න ඕනෙ....තෝරා ගත්තම මළ මිනී අතපත ගාන්නත් වෙනවනෙ...ඒක තමයි ප්‍රශ්නෙ..." (එම 2017: 100).

විභාගය අසමත් වීමෙන් අනතුරු ව ඇති වූ පශ්චත්තාපය


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වසන්තගේ චරිතය සඳහා භාවිත වාංමාලා මඟින් විශද නොවේ. විභාගය අසමත් වී අපේක්ෂා භංගත්වයට පත් වූවෙකුගේ සිතුම් පැතුම් අර්ථවත් ලෙස නිරූපණය කිරීමට කතුවරයා අසමත් වී ඇත.

> "රිසල්ට්ස්?" "සී එකයි එස් එකයි සර්..." "සී එක..." "සූලොජි සර්..." "ෆිසික්ස්" "එෆ් සර්..." (එම 2017: 92).

වසන්ත කුමාර චාරුණීට ලියන ලිපි මඟින් තමා විශ්වවිද්‍යාලයේ දක්ෂ කවිකයෙකු බවත් ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු බවත් දන්වා සිටියි. මෙය සත්‍යයක් ද යන්න පාඨකයාට පැහැදිලි නොවේ. එයට හේතුව ඔහු පෙරත් තමා පිළිබඳ බොරු ප්‍රකාශ සඳහන් කිරීම යි. පාඨකයාට පැහැදිලි අවබෝධයක් ජනිත වන පරිදි වසන්තගේ චරිතය නිරූපණය කිරීමට කතුවරයා අපොහොසත් වී ඇත.

> "අන්තිම කතාව තිබුණෙ මට. මගේ වචන දහයෙන් දහයට කට්ටිය අත්පොඩි ගැහුවුවා. විසිල් ගැහැව්වා. කතාවට කොච්චර හිත් ගියාද කිව්වොත් කොල්ලො මාව කරේ තියාගෙන පෙළපාළියක් යන්නයි ලැස්ති වුණේ..." (එම 2017: 113).

කාල සර්ප කතුවරයාගේ අභිප්‍රාය වී ඇත්තේ මෙරට තරුණ අරගලය පාදක කොටගත් බිහිසුණු වාතාවරණය නිරූපණය බව පෙනේ. නමුත් වසන්තගේ චරිතය මඟින් එම කාර්යය නිසි පරිදි සාධනය නොවූ බව පැහැදිලි ය. විකෘත මනසකින් යුත් ව්‍යාජ චරිතයක් නිරූපණයෙන් කතුවරයා අපේක්ෂා කළ කාරණය වටහා ගත නොහැක.

කාල සර්ප කතුවරයාගේ අභිප්‍රාය වී ඇත්තේ මෙරට තරුණ අරගලය පාදක කොටගත් බිහිසුණු වාතාවරණය නිරූපණය බව පෙනේ. නමුත් වසන්තගේ චරිතය මඟින් එම කාර්යය නිසි පරිදි සාධනය නොවූ බව පැහැදිලි ය. විකෘත මනසකින් යුත් ව්‍යාජ චරිතයක් නිරූපණයෙන් කතුවරයා අපේක්ෂා කළ කාරණය වටහා ගත නොහැක.

> "ඕක ඉවරයක් කොල්ල යමං ගමනක්" "කොහේ..?" "යමං කෝ..." .... "ගොයිතැං සරුයි..?" "ගොයිතැං නෙවෙයි..." "හෙනං..." "වගාව....රබර..." (එම 2017: 184).

යහෝනිස් රන්සෝ සමඟ අයුතු සම්බන්ධයක් පවත්වන අතර ඇය විවාහ කර ගැනීමට ගිරිගෝරිස් කැමති කරවා ගනී. ඒ විවාහයෙන් අනතුරුව ද ඇය තමාගේ අනියම් බිරිඳ ලෙස තබා ගැනීමේ අරමුණෙනි. කතුවරයා අතින් නිරූපණය වන්නේ සභ්‍යත්වයෙන් තොර මෙවන් විකෘත වූ ගැමි දිවියකි.

> "අහපන්...උඹට ගිරිං කැමති වෙයි...අපි දෙන්නගෙ ඇයි හොඳයිය රාසක්...එක ගෑනියෙකුට මිනිස්සු දෙන්නෙක් වැඩි නෑ...එතකොට අඩුපාඩුවක් වෙන්නෙ නෑ..." (එම 2017: 178).

මේ අනුව මෙම කෘතිය මඟින් අපේක්ෂිත සන්නිවේදන කාර්යය සාධනයෙහි ලා ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිතය යෝග්‍ය පරිදි දායක කොටගෙන නොමැති බව තහවුරු වේ.

කුරුලු හදවත නවකතාවෙහි ප්‍රධාන චරිතය වන්නේ දිනසිරි නම් වූ කුඹල් කුලයට අයත් තරුණයෙකි. ඔහු කුල,ධන,බල ආදී පීඩනයන් රැසකට මුහුණ දෙයි. අවසානයේ ඔහුට විමුක්තිය උදාවන්නේ ගුවන්විදුලි නාලිකාවක් මඟිනි. නමුදු ඔහු ධනපති මාධ්‍ය සංස්කෘතියේ සූරාකෑමට ලක්වෙයි. අවසානයේ එහි ම ගොදුරක් වී විනාශ වී යයි. දිනසිරි විද්‍යා අංශයෙන් උසස් පෙළට පෙනී සිට අසමත් වූවෙකි. ඔහු සිය දෙමාපියන්ගේ කුඹල් කර්මාන්තයට සහාය වෙමින් ගුවන්විදුලියේ ගීත ඉල්ලා තැපැල්පත් යොමු කිරීමට පෙළඹේ. දිනසිරි ගමෙහි ජීවත් වුව ද එහි භූ විෂමතාව, ඉතිහාසය, ජනශ්‍රැතිය පිළිබඳ අවබෝධයක් රහිත පුද්ගලයෙකි. පාසලේ දී වුව කවීක තරඟවලට සහභාගී වී කවිකත්වය, මුබරිකම ප්‍රදර්ශනය නොකළ ශිෂ්‍යයෙකි. එවන් පසුගාමී ලක්ෂණවලින් හෙබි තරුණයෙකු වූ දිනසිරි තමා ඇලුම් කරනා තරුණිය වූ රන්දිමා සමාජයේ අපහසුතාවයට ලක්වන විට ආවේගශීලීව ක්‍රියා කරයි.

> "යකෝ තොපිට කලාව කියල එකක් තේරෙන් නැද්ද? පිලිස්තීනුවො" (අමරකීර්ති 2015: 27).

සමාජ කුල දේශපාලන ධූරාවලියේ දී තමාට අකැප නමුත් ලිංගික හැඟීම්වල අවදිවීමේ කාරකයක් වූ රන්දිමා දිනසිරි විෂයෙහි ෆැන්ටසිමය සිහිනයකි. ඇය ඔහුගේ පරිකල්පනයට එල්ල කරන බලපෑම මත ප්‍රබලත්වයට පත් වූ හැඟීම්වල ප්‍රතිඵලය දිනසිරිගේ වාගුක්ති හරහා විද්‍යමාන වේ. ඝට්ටනයන්ට මුහුණ දීමේ සමත්කමක් නොවූ ව ද යොදා ගත් වාග් ප්‍රහාරය හමුවේ දිනසිරි වීරයෙකු බවට පත් වේ. වාගාලාපයන්හි අර්ථයක් නොවූ ව ද එය උච්චාරණය කළ ආකාරයත් යොදාගත් වචනවල ස්වරූපයත් ඔහුගේ ආවේගශීලී චරිත ස්වභාවය ඉස්මතු වීමට හේතු වී ඇත. හංස සංදේශයේ කවියක් හෝ නොදත් දිනසිරි කලාව වෙනුවෙන් පෙනී සිටීම හාස්‍යයකි. නමුත් තමා දන්නා ප්‍රබලතම වචන හසුරුවා රන්දිමාගේ ගෞරවය ආරක්ෂා කිරීම පමණක් ඔහුට අවැසි වූ බව පෙනේ. මෙහි දී චරිතයක භාව ප්‍රකාශන කුළු ගැන්වීමෙහි ලා භාෂා ව්‍යවහාර දක්වන දායකත්වය පැහැදිලි වේ.

දිනසිරි නිරතුරුව ම සිය කුලය පිළිබඳ හටගත් හීනමානයෙන් පෙළෙයි. ඔහුට අවැසි වන්නේ සමාජයෙන් සිය කුලය සඟවාලීමට ය. ඔහු තමා කෙරෙන් තමා ම සඟවා ගනී. එබැවින් කුඹල් කර්මාන්තයට අනන්‍ය වූ ව්‍යවහාරයන් ද ඔහු අවධාරණයෙන් බැහැර කරයි. තමා අයත් සමාජ පරිසරයේ භාෂා ස්වරූපයන් පොදු සමාජයේ දී භාවිත නොකිරීම හේතුවෙන් ඔහුගේ ව්‍යාජ අනන්‍යතාව හෙවත් දිනසිරි කුරුලුගංගොඩ යන නාමය ආරක්ෂා වේ. ඒ අනුව යම්බඳු නවකථාවක චරිතයක් රූපණයේ දී තමා අයත් සමාජ පරිසරයේ භාෂණ විලාසය ම අඩංගු විය යුතු යැයි රීතියක් නොමැති බව පැහැදිලි වේ.

දිනසිරි පාඨකයෙකු නොවේ. ඔහු කියවීමෙන් වින්දනයක් නොලබයි. ඔහුගේ රුචිකත්වය ශ්‍රවණය කිරීම යි. ඔහු සතු


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දැනුම් සම්භාරය ශ්‍රවණය හරහා ලැබුණකි. මොහුට ජීවිතයේ ඉදිරි අපේක්ෂා පිළිබඳ සාධනීය අරමුණක් නොමැත. ප්‍රශ්නෝත්තර පොතකින් උකහාගත් අනුභූතිය, ප්‍රතිභාව, පරිකල්පනය වැනි වදන් මොහු විසින් සිය උගත් බව පෙන්වීම සඳහා භාවිත කරනු ලබයි.

> "...ඒ උනාට සර් සතතාභ්‍යාසය නැත්නං කොච්චර ප්‍රතිභාව තිබ්බත් වැඩක් නෑ..." (එම 2015: 157).

මෙවැනි වචන භාවිත කර තමා අකමැති අවස්ථාවලින් මිදී මගහැර යාමට දිනසිරි සමත් වේ. සමාජ පරිසරය වෙනස් වුව ද සමාජ තත්ත්වය වෙනස් වුව ද දිනසිරිගේ වාග් කෝෂයේ අන්තර්ගත මෙම වචනයන්හි වෙනසක් සිදු නොවේ. එමගින් ඔහු ස්ව අනන්‍යතාවයක් ගොඩනගා ගනී. ගැමි සංස්කෘතිය පිළිබඳ විශේෂඥ මාධ්‍යවේදියෙකු වී ඇත්තේ අර්ථයක් නොදැන මෙබඳු වචන හරඹ සිදුකරන පුද්ගලයෙකු ද යන්න ගැටලු සහගත ය. එමෙන් ම වදන්වලින් සිය පාණ්ඩිත්‍යය පෙන්වන දිනසිරි දිවුරුම් පෙත්සමක් යනු කුමක්ද යන්න පවා අසා නොතිබීම ද පාඨකයාට හාස්‍යයකි. එම ව්‍යවහාර මෙම චරිතය සඳහා අනුචිත බව පෙනේ.

> "...දිවුරුම් පෙස්සමක් ගේන්ඩ පුළුවන්ද?" "දිවුරුම් පෙස්සමක්?" "ඔව්- ජේපී කෙනෙක් දන්නවද?" "ජේවීපී?" "ජේපී ජේපී? සාමදාන විනිශ්චය කාරයෙක්?" (එම 2015: 42-43).

දිනසිරිගේ චරිතය කතුවරයා රූපණය කර ඇත්තේ ඉංග්‍රිසි භාෂාව පිළිබඳ සාමාන්‍ය දැනීමක් පවා නැත්තෙකු ලෙසිනි. විභාගය අසමත් වුව ද ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ හැදෑරූ ශිෂ්‍යයෙකු එබඳු සාමාන්‍ය ඉංග්‍රීසි දැනුමකින් පවා වියුක්ත වීම අභව්‍ය ය. එබැවින් ඔහුගේ චරිතය සඳහා යොදා ඇති එබඳු ව්‍යවහාර විශ්වසනීයත්වයෙන් තොර බව පෙනේ.

> "අවුරුදු හතක්ම ඔයා පොස්ට්කාඩ්ස් ලිව්වද?" "ඔව්" "ෆෝර අ වීක්" "ඈ?" (එම 2015: 162).

මුත්තු අත්තාගේ චරිතය මගින් කතුවරයා පරම්පරා සංවිධානයත් කුලය වැනි ආත්ම බද්ධ කාරණා පුද්ගල ආස්ථානයට ම බද්ධ වී ඇති අයුරුත් විශද කරයි. ඔහු සිය කුලයේ අනන්‍යතාව සඟවා සිදු කරන සමාජීය පරිවර්තනයන්ට අනුබල නොදෙන අතර නොපවතින ගම උත්කර්ෂයට නැංවීම පිළිබඳ ව ද සෘජු ව මත පළකරන චරිතයකි. එම චරිතය සඳහා භාවිත වාංමාලාව මගින් ගැමි ජන සමාජයේ භාෂා රටාව හා භාෂකයා අයත්වන පරම්පරාව හා වයස් කාණ්ඩය ද විද්‍යමාන වේ. බොණ්ඩියෙ, තෝ, උඹ, දාපිය, ගෙනෙං, ගං, කියපිය වැනි වචන එම සමාජයේ වාග් කෝෂයට අනන්‍ය වූ සාමාන්‍ය පද බව පාඨකයා හඳුනා ගන්නේ මෙම චරිතයෙනි.

> "....බොල අපි කුරුල්ලොද? අපි හොඳ බඩහැල මිනිස්සු. ගරීකාර බ්‍රාහ්මණයගෙං තමයි අපි පැවත එන්නෙ. දාපිය සීනි හැන්දක් අල්ලට..." (එම 2015: 57).

භාෂණ රීතියෙහි මූලික ලක්ෂණයක් වන්නේ සුඛෝච්චාරණය සඳහා යම් යම් ශබ්ද වෙනස් වීම ය. ඒ හේතුවෙන් ඇතැම් ශබ්ද ඉවත් වේ. ඇතැම් ශබ්ද අමුතුවෙන් එකතු වේ. තවත් ශබ්දයක් සමීපයේ ඇති ශබ්දවලට සම වන සේ වෙනස් වේ. පද දෙකක් එක සමීපයේ යෙදෙන කල ඇතිවන මෙවැනි වෙනස්කම් ගැමි ව්‍යවහාරයේ බහුල ය. එවැනි ව්‍යවහාර මුත්තු අත්තා හරහා විශද කර ඇත්තේ පාරම්පරික ගැමි සංස්කෘතියේ හැඩ රුව පාඨකයාට සමීප කිරීමට ය.

> "උඹලගෙ කොටහ ඔය ඇන්නාවෙ. මෙහෙං ගෙනිච්ච ක්ෙබල්ලෙකෙන්නෙ මද්ද ගැහුවෙ..." (එම 2015: 275).

ලාංකේය කුල ක්‍රමයේ සමාජ බලපෑම මත විවෘත ආර්ථිකය හා බැඳුණු සියල්ල මුදල් මත තීරණය වන සමාජ පසුබිමක පුද්ගල පැවැත්මෙහි ලා පුද්ගල අනන්‍යතාවය කෙරෙහි ඇතිවන බලපෑම මෙම නවකථාව මගින් විශද වේ. කුල පීඩනයෙන් හා දරිද්‍රතාවයෙන් බැට කන සමාජයක ධනවාදයේ බලපෑම ගැඹුරු චරිත නිරූපණයකට වඩා පාර්ශ්වීය චරිත නිරූපණයක් මගින් විද්‍යමාන කර ඇති බව පෙනේ.

මේ රහස් කවුළුවෙන් එබෙන්න නවකතාවෙහි එන ක්ෂේානි විධායක ශ්‍රේණියේ තනතුරක් දරන්නියකි. කාර්යාල වේලාවේ දී ඇය පූර්ණ රාජකාරීමය බස් වහරක් භාවිත කරයි. එමගින් රැකියාව සම්බන්ධයෙන් ඇගේ චරිතයේ පවතින වගකීම් සහගත බව මනාව විශද වේ. භාවිත ව්‍යවහාර මගින් ඇයගේ සමාජ මට්ටම මෙන් ම උගත්බව ද විද්‍යමාන වේ.

> "ඇම් ග්‍රේට්. ලිට්ල් ලේට් ටුඩේ. ඉෆ් යූ වෝන්ට් යූ කැන් ඇසෙස් මී රයිට් නව්..." (කුමාරසිංහ 2016: 109).

ක්ෂේානි හා අසිත් අතර අනියම් සබඳතාවක් පවතී. මොවුන් ලිංගික සබඳතාවයේ නිරතවෙන අතරතුර පැමිණෙන දුරකතන ඇමතුම් සඳහා පිළිතුරු දෙන්නේ ඔවුන් අයත් සමාජ කාර්යයට අදාළ භාෂා ස්වරූපයෙන් නොවේ. ක්ෂේානි රාජකාරී ස්වරූපයේ භාෂා ශෛලියක් භාවිත කරමින් එම ඇමතුම මඟ හරියි. අසිත් කලබලකාරී ස්වරූපයක් මවා ගනිමින් සංවාදයේ යෙදෙයි. මෙමගින් මධ්‍යම ප්‍රාන්තික ජීවිතවල පවතින ව්‍යාජත්වය කතුවරයා ඉස්මතු කර ඇත. චරිත අදාළ ප්‍රස්තාවෙන් බැහැර ව නිරූපණය වන කල්හි ද චරිතයන්හි අභිමතය පරිදි ඕනෑ ම ප්‍රාස්තාවික ස්වරූපයක් ආරූඪ කර ගත හැකි බව මින් සනාථ වේ. ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිතයේ දී චරිතය අදාළ ප්‍රස්තාවෙහි හෝ සමාජ කාර්යයෙහි ස්ථාවර ව සිටීම අදාළ නොවන බව පෙනේ.

> "හලෝ අක්කා, මං පොඩි මීටිං එකක ඉන්නෙ. අයිල් කෝල් යූ බැක් සූන් ආෆ්ටර් අයි ෆිනිෂ් ඉට්. ඕකේ...බායි..." (එම,2016:22). "බබා මං රිහසල් එකක ඉන්නෙ..." (එම 2016: 25).


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උවනි යනු අසිත්ගේ බිරිඳයි. ඇය පතන ආකාරයේ සෙනෙහසක් අසිත්ගෙන් ඇයට හිමි නොවේ. නමුත් සමාජ මාධ්‍යන්හි දී ඔවුන් ඇති කරගෙන ඇත්තේ දැඩි ප්‍රේමයෙන් වෙසෙන යුවළකගේ ප්‍රතිරූපයකි. එය සත්‍ය නොවේ. යථාර්ථය සඟවා ව්‍යාජය ඉස්මතු කරලීම මධ්‍යම පන්තියේ දර්ශනයයි. උවනිගේ සිතෙහි පවතින ආත්මානුකම්පාව පාඨකයාට විවර වන්නේ ඇය හා මිතුරියක අතර වන සංවාදයක් ආශ්‍රයෙනි. චරිතයේ භාවාතිශය හැඟීම් ඉස්මතු වන පරිදි කතුවරයා බස් වහර සකස් කරගෙන ඇත.

> "අසීගෙයි මගෙයි ෆේස්බුක් වලට ගියාම නං හිතෙන්නෙ අපි දෙන්න තමයි මේ ලෝකෙ ඉන්න ලස්සනම කපල් එක කියලා..." (එම 2016: 131).

තිවංක උවනිට ළං වන්නේ අසිත් සිය බිරිඳ කේෂානි හා පවත්වන අනියම් සම්බන්ධයට පලිගැනීමක් වශයෙනි. නමුත් උවනි තිවංකගේ ආදරය පිළිගෙන ඇත්තේ අසිත්ගෙන් නොලැබෙන සෙනෙහස ලබා ගැනීමේ අරමුණෙනි. විවාහක ස්ත්‍රියක පතන සැනසුම ඇය තිවංකගෙන් අපේක්ෂා කරන අතර එකී වරද නිවැරදි කිරීමේ අවශ්‍යතාවයක් ද ඇයට නැත. ඇය ස්ව කැමැත්තෙන් ම ඔහුට ආශක්ත වන අයුරු හඳුනාගත හැක. මෙය මධ්‍යම පන්තියට පමණක් පොදු ධර්මතාවක් නොවේ. කාර්යබහුල සමාජයක පුද්ගල චර්යාකම්වලින් වියුක්ත ව මානව සබඳතා විඛණ්ඩනය වන ආකාරය මෙම චරිත මඟින් නිරූපිත ය. තිවංක ඇය හා සම්බන්ධ වන්නේ සිය අරමුණ ඉටු කර ගැනීමට පමණි. එබැවින් ඔහු ක්‍රියා කරන්නේ සිය චරිතයට ඉන් කැළලක් ඇති නොවන පරිදි ය. ඔහුගේ වාංමාලා මඟින් එකී චරිත ස්වභාවය ඉස්මතු වී ඇත. ඔහු යොදාගන්නා භාෂා විලාසය ගැහැණියක නිරායාසයෙන් ආශක්ත කර ගැනීමට සමත් ය.

> "හරි බබෝ මම ඔයාව බබෙක් වගේ ගෙදර යවන්නං. හැබැයි මට ඔයත් එක්ක එකට එන්න බෑ. මං ඔයා ඉන්න තැනකට වාහනයක් එවන්නං. ඔයා ඒකෙ කෙලින්ම එන්න..." "මට බයයි අනේ. මං කවදාවත් මෙහෙම දේවල් කරල නෑ..." "ඇයි බබා ඔයා ඔහොම කතා කියන්නෙ. ඔයා මේක කරන්නෙ අමාරුවෙන් නං ඔයා එන්න එපා. මට ඔයාට දුකක් දෙන්න ඕනෙ නෑ..." (එම 2016: 170).

එක ම භාෂකයාට එක ම අවස්ථාවක දී නිරායාසයෙන් එක් ප්‍රාස්තාවික ස්වරූපයක සිට තවත් ස්වරූපයකට මාරු විය හැක. තිවංක උවනි හා කතාබහ කරන්නේ එවැනි ප්‍රයෝග භාවිත කරලමිනි. තම තත්ත්වය හා පෞරුෂය ප්‍රදර්ශනය කොට ඇය තමා වෙත නතු කර ගැනීමට ඔහු යත්න දරයි. එය කතුවරයා උචිත වාංමාලා භාවිතයෙන් සනාථ කර ඇත.

> "හලෝ කැන් අයි ස්පීක් ටු මිසිස් උවනි ඩි සිල්වා ප්ලීස්" "ඔයාගෙ කකුල කොහොමද බබා. ඔයා අද ඉස්කෝලෙ ගියෙ නැද්ද?" (එම 2016: 168-169).

මධ්‍යම ප්‍රාන්තික විවාහ දිවියේ ස්වාමි-භාර්යා ආමන්ත්‍රණ විලාසයන් ද පොදු ව්‍යවහාරයෙන් සපුරා වෙනස් ය. එම ව්‍යවහාර ගෞරවනීය නොවේ. ඒ අයුරින් ම ස්වාමි භාර්යා චර්යාකම් ඔවුන්ගේ ජීවිතවලින් ද බැහැරට ගොස් ඇත. නූතනත්වය මත ගොඩනැගුණු පවුල්වල භූමිකාව මෙම ව්‍යවහාරයන්ගෙන් විශද වේ.

> "තාත්ති ඔයා වැඩක් ද?" "නංගා අර ඇඳුම් ඩ්‍රයි වෙලා ඉවරයි..." (එම 2016: 133).

මධ්‍යම පාන්තිකයන් කෝපය වැනි මනෝභාවයන් පළ කරන්නේ ද ඉංග්‍රීසි මිශ්‍රිත ව්‍යවහාර භාවිතයෙනි. ඔවුන් ගැමි ජනයා මෙන් අසභ්‍ය අව්‍යක්ත ව්‍යවහාර යොදා නොගනී. අසිත්ගේ චරිතය මඟින් එකී වාග් විලාසය හඳුනාගත හැකි ය. උවනි හා තිවංක අතර පැවති ලිංගික සබඳතාව පිළිබඳ දැනුවත් වූ ඔහු ඒ අවස්ථාවේ හැසිරෙන්නේ සිය සමාජ පරිසරයට උචිත වාංමාලා භාවිත කරමිනි. කතුවරයා චරිතයනට පසුබිම් වූ සමාජ ප්‍රස්තුතය කෙරෙහි පැහැදිලි අවබෝධයකින් වාංමාලා සකසා ගෙන ඇත.

> "ඌ ඔයාගෙ හස්බන්ඩ් නෙවෙයි නං...අයි විල් ඩෙෆිනිට්ලි කිල් හිම්..." (එම 2016: 231).

## නිගමනය

ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිතය මඟින් චරිතයක සමාජ ආර්ථික තත්ත්වය, පන්ති ස්තරය හඳුනාගත හැක. එමෙන්ම චරිතය අයත්වන පරම්පරාව හෙවත් වයස් කාණ්ඩය ද එමඟින් නිරූපණය කළ හැකි ය. විවිධ රැකියා තත්ත්වයන්ට සාපේක්ෂ ව මෙන් ම විවිධ පුද්ගල කණ්ඩායම් අතර භාවිත වන භාෂණ විධි, ගම්බද හා නාගරික චරිතවල වෙනස්කම්, උගත් නූගත් ස්වභාවය ආදී චරිත හා බද්ධ වී පවතින ගුණාංග විශ්ලේෂණයෙහි ලා ප්‍රාස්තාවික ස්වරූපවලින් යම්බඳු දායකත්වයක් ලැබේ. පරිසරය හා අවස්ථාවට අනුව භාෂණයේ සිදුවන වෙනස්කම්, විවිධ භාව ප්‍රකාශන (නින්දා කිරීම්, අවලාද කිරීම්, කෝපවීම්) ආදියේ දී ද උගත් නූගත් භේදයකින් තොරව භාෂණය වෙනස්වන අයුරු හඳුනාගත හැකි ය. සමාජ තත්ත්වය, රැකියා තත්ත්වය මත පදනම් ව පුද්ගල භාෂණය වෙනස් වේ. ප්‍රාස්තාවික ස්වරූප මඟින් සමාජ පරතරය විද්‍යමාන වේ. උගතුන්ගේ උච්චාරණයේ වෙනස්කම්, ගමට හා නගරයට සංක්‍රමණය වූවන්ගේ උච්චාරණ විධි, සමාජ පරිසරය මත පදනම් ව උච්චාරණය වෙනස් වන ආකාරය ප්‍රාස්තාවික ව්‍යවහාර මඟින් යම්තාක් දුරට විශද වේ. නවකතාවක චරිත නිරූපණ ක්‍රියාවලියෙහි ලා ප්‍රාස්තාවික ව්‍යවහාර උපස්ථම්භක වන නමුදු එමඟින් අපේක්ෂිත සන්නිවේදන කාර්යය සිදුවන්නේ ඇතැම් නවකතාවලින් පමණක් බව විශද වේ. කතුවරයා චරිතයට අනන්‍ය වූ වාංමාලා භාවිත නොකිරීම මත චරිත අයත්වන සමාජ ප්‍රස්තරයන් සේම ගුණාංග නිරූපණය සීමා වීම එයට හේතුවයි. චරිතය පිළිබඳ පැහැදිලි අවබෝධයකින් තොර ව කතුවරයාගේ අභිලාෂය මත වාංමාලා භාවිත කිරීමෙන් චරිතයේ විශ්වසනීයත්වය බිඳ වැටේ යි. නමුදු නූතන නවකතාවන්හි වස්තු විෂය එක් සමාජ ප්‍රස්තරයක් පමණක් කේන්ද්‍ර කොට ගත්තක් නොවේ. එහි අවකාශීය මාරුවීම් හඳුනාගත හැක. එහි දී ඒ ඒ ප්‍රස්තරයට උචිත


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පරිදි චරිතයන්හි බස හැසිරවීම කෙරෙහි කතුවරයාගේ ප්‍රශස්ත අවධානය යොමු වී ඇති බව පෙනේ. චරිතයක භාෂාව තීරණය වන්නේ සමාජ පරිසරය මෙන් ම උපයුක්ත සමාජ ක්‍රියාකාරකම් මත පදනම් ව ය. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන උපන්‍යාසය සනාථ කරමින් නූතන සිංහල නවකතාවෙන් නිරූපිත සමාජ පරිසරයට හා ඒ ඒ සමාජ කාර්යයයන්ට අනුකූල ව චරිත නිරූපණය විශ්වසනීය ලෙස ඉදිරිපත් කිරීමෙහි ලා ප්‍රාස්තාවික ව්‍යවහාර උපස්ථම්භක වන බව නිගමනය කළ හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


අමරකීර්ති, ලියනගේ (2015) කුරුලු හදවත, කොළඹ 10, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අස්සජිතිස්ස හිමි, කුරුපිට (2017) වාග්විද්‍යා විමර්ශන, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාරසිංහ, කෞශල්‍ය. (2016) මේ රහස් කවුළුවෙන් එබෙන්න, මහරගම, අහස මීඩියා වර්ක්ස්.

කෝපරහේවා, සඳගෝමි (2018) භාෂාව හා සන්නිවේදනය, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

(2018) විසිවන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරය, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

තෝරදෙණිය, සේන (2018) විචාර විලෝචන, මරදාන, දයාවංශ ජයකොඩි සහ සමාගම.

ද සිල්වා, සුගතපාල (1963) භාෂා විමර්ශනය, මහරගම, සමන් ප්‍රකාශකයෝ.

දිසානායක, ජේ.බී. (2016) මානව භාෂා ප්‍රවේශය, කළුබෝවිල, සුමිත ප්‍රකාශකයෝ.

දිසානායක, වසන්ත කේ. මිල්ලගහතැන්න, හර්ෂණී (2010) භාෂාව හා භාවිතය, කර්තෘ ප්‍රකාශන.

දිසානායක, විමල් (2002) වීමංසා නවකතා අංකය, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

(2015) විවාදාත්මක ලිපි, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මදාස, කේ.එන්.ඕ (1996) භාෂාව හා සමාජය, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, විමල් ජී (2012) භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

මිල්ලගහතැන්න, ආරියදාස (2018) අද්‍යතන ව්‍යවහාර භාෂාව, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

රාජකරුණා, ආරිය (2015) සම්මානලාභී නවකථා විමර්ශනය, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

වැලිසරගේ, කීර්ති (2017) කාල සර්ප, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

වික්‍රමාරච්චි, සමන් (2018) අප්පච්චි ඇවිත්, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

සුරවීර, ඒ.වී. (1973) නවකතා නිර්මාණය හා අවබෝධය, කොළඹ 10, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 58-70
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# අද්‍යතන සිංහල නවකතාවේ නිරූපිත පශ්චාත් යථාර්ථවාදී භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: 2010-2018 තෝරා ගත් නවකතා ඇසුරින්

(An Analytical Study on the Usage of Post-Realism Contemporary Sinhalese Novel: with Special Reference to Selected Sinhalese Novel Written During the Period of 2010-2018)

යූ. ආර්. ටී. ගීතාංජලී
ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය
urthakshila121@gmail.com

**සාරසංක්ෂේපය**

අද්‍යතන සිංහල නවකතාව යනු සාම්ප්‍රදායික මිනුම් දඬුවලින් මැනිය නොහැකි සාම්ප්‍රදායික කඩ ඉම් සමතික්‍රමණය කරන සාහිත්‍යාංගයකි. ඒ අනුව අද්‍යතන සිංහල නවකතාව ආකෘතික වශයෙන් හා තේමාත්මක වශයෙන් ද නව්‍ය වූ විශේෂ ලක්ෂණ පෙන්නුම් කරයි. මායා යථාර්ථවාදී, අධියථාර්ථවාදී, පශ්චාත් නූතනවාදී ලක්ෂණ එම අද්‍යතන සිංහල නවකතාවේ දක්නට ලැබෙන ලක්ෂණ වේ. මෙම ලක්ෂණ අඩංගු සංකල්පය පොදුවේ පශ්චාත් යථාර්ථවාදී සංකල්පය ලෙස හඳුන්වා දෙයි. බටහිර සාහිත්‍යයෙහි නිරූපිත මෙම සංකල්පය සිංහල නවකතාවේ මුල් ම වරට දක්නට ලැබුණේ 1981 දී සයිමන් නවගත්තේගම විසින් රචිත සංසාරාරණ්‍යයේ දඩයක්කාරයා නම් නවකතාවෙහි ය. ඉන් පසු මෙම සංකල්පය සිංහල නවකතාවේ වරින් වර දක්නට ලැබුණු අතර අද්‍යතන සිංහල නවකතාව වන විට නූතන නවකතාකරුවෝ බහුල ව මෙම සංකල්පය සිය නිර්මාණය උදෙසා දායක කර ගත් බවක් පෙනී යයි. එහි දි එම නිර්මාණකරුවන් පශ්චාත් යථාර්ථවාදය නැමැති සංකල්පය අද්‍යතන සිංහල නවකතාවේ කෙසේ භාවිත කර ඇද්දැයි විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. එහි දී ප්‍රාථමික දත්ත වශයෙන් පශ්චාත් යථාර්ථවාදී සංකල්පය මුලාශ්‍රය කොට ගෙන 2010-2018 අතර කාලය ඇතුළත නිර්මිත වූ නූතන සිංහල නවකතා කිහිපයක් යොදා ගැණුණි. ද්වීතියික දත්ත වශයෙන් මේ සඳහා ලියැවුණු ග්‍රන්ථ, අන්තර්ජාල ලිපි, සඟරා භාවිත විය. අද්‍යතන සිංහල නවකතාව සඳහා පශ්චාත් යථාර්ථවාදී සංකල්පය යොදා ගැනීමේ දී නවකතාකරුවාගේ මුඛ්‍ය අරමුණ වන සමාජ යථාර්ථය හෙළි කිරීම යන අභිමතාර්ථය සාධනයෙහිලා මෙම සංකල්පය සාර්ථකව යොදා ගත හැකිය යන්න පැහැදිලි වේ. එහි දී නව්‍ය ආකෘති හා තේමා හා ශිල්ප ධර්ම ඇතුළත් වුවත්, පශ්චාත් යථාර්ථවාදී සංකල්පය යනු යථාර්ථවාදයෙහි ම තවත් දිගුවක් බව හඳුනා ගත හැකි ය.

කේන්ද්‍රීය වචන: අද්‍යතන සිංහල නවකතාව, පශ්චාත් යථාර්ථවාදී සංකල්පය, මායා යථාර්ථවාදය, අධියථාර්ථවාදය, පශ්චාත් නූතනවාදය

Contemporary Sinhalese novel is one of the extensive literatures that transgresses the traditional boundaries which cannot be measured with traditional criteria. Therefore, specific features which have structurally and thematically been advanced and modernised should be applied to the contemporary Sinhalese novels. The specific features that are suggested in these particular novels are magic realism, surrealism, and post modernism. The concept, which includes these features can generally be termed as post-realism. This concept which has been already illustrated in the Western literature marked its first advent in Sinhalese novels in 1981 in the novel, 'Sansaranyaye Dadhayakkaraya' written by Simon Nawagattegama. Thereafter, this concept has occurred intermittently in Sinhalese novels and during the period of contemporary Sinhalese novels it can be noticed that modern novelists have used this concept of post-realism for the most part of their works. The main objective of the study is to investigate how selected novelists have adapted the concept of post-realism in contemporary Sinhalese novels. In this regard, several modern Sinhalese novels written in relation to the concept of post-realism during the period of 2010 and 2018 were referred as primary data and books, magazines, and e-journals were patronised as secondary data. Through this research, it was clearly epitomised that this concept could be successfully utilised to achieve the novelists' objective of divulging the social reality in contemporary Sinhalese novel. Moreover, it was identified that though literary strategies such as modern structures and themes have also been included in these works, the concept of post-realism is just another branch of realism.

Key words: Concept of post-realism, Magic realism, Post-modernism, Surrealism, Contempory Sinhalese novel

## හැඳින්වීම

මානව සමාජ විවරණ කර්තව්‍යයෙහි ලා නිමග්න සාහිත්‍යාංගයක් වශයෙන් නවකතාව හඳුන්වා දිය හැකි අතර නවකතාකරුවා විසින් තත්කාලීන ලෝකයේ පවතින ආර්ථික, සමාජීය, සංස්කෘතික සංකථන ඉතා අපූරුවට සිය නිර්මාණය කරා රැගෙන එනු ලැබෙයි. මහාචාර්ය ඒ. වී. සුරවීරට අනුව "නවකතාව වනාහි ජීවිතය හා ආශ්‍රිත මිනිස්

ස්වභාවය නිරූපණය කෙරෙන සේ, යම් කාල පරිච්ඡේදයක මානව වර්ගයාත් ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයත් විවරණය කෙරෙන කල්පිත ගද්‍යමය ආඛ්‍යානය යි" (සුරවීර 1991:114). එමෙන් ම නවකතාව, කලින් කලට නව්‍යාංග ඒකරාශී වන නවත ම ලක්ෂණයන්ගෙන් යුක්ත සාහිත්‍යාංගයක් වශයෙන් ද හඳුන්වා දෙයි (සුරවීර 1991:114). එබැවින් නවකතාව සමාජ විවරණයක යෙදෙන අතර ම කලින් කලට ඒකරාශී වන චින්තනයන් හා සංකල්පයන් මඟින් පෝෂණය වේ.

තුන්වන ලෝකයේ රටවල පැවති ආර්ථික, සමාජීය, සංස්කෘතික සංකථන හේතුවෙන් ඇති වූ චින්තන රටාවක් ලෙස හඳුන්වන පශ්චාත් යථාර්ථවාදය (post-realism) නැමැති සංකල්පය නිරන්තරයෙන් විචාරයට ලක්වන කරුණක් ලෙස පෙන්වා දිය හැකි ය. ඒ පිළිබඳ ව පර්යේෂණයන් හා බොහෝ විචාර ඉදිරිපත් වී ඇති අතර පශ්චාත් කාලීන නවකතාකරුවන් මේ සංකල්පය සිය නිර්මාණය උදෙසා දායක කර ගැනීමට යොමු ව ඇත. එහි ප්‍රමුඛ අරමුණ වී ඇත්තේ ඔවුන් දරන දේශපාලන අදහස් සමාජගත කිරීමට යැයි විචාරකයන්ගේ විශ්වාසය යි. ශ්‍රී ලාංකේය සිංහල නවකතාව ද පශ්චාත් යථාර්ථවාදයෙන් පෝෂිත ය. ඒ පිළිබඳ ව විවිධ මතිමතාන්තර ද පවතී.

පශ්චාත් යථාර්ථවාදය නැමැති සංකල්පය පිළිබඳ ඒකමතික අර්ථකථනයක් දීම අපහසු ය. තුන් වන ලෝකයේ රටවල මේ පිළිබඳ විවිධ අදහස් ඉදිරිපත් ව තිබෙන අතර පොදු නිර්වචනය නම්,

> "Post-realism is a theoretical perspective on international relations. According to post-realism, global actors are joined in a global network of thought, actions, and talk. Post-realism focuses particularly on the talk, on discourse and debate in the conduct and study of international relations. For post-realists, international realism is a form of social scientific and political rhetoric. It opens rather than closes a debate about what is real and what is realistic in international relations":https://en.m.wikipedia.org).

නමුදු පශ්චාත් යථාර්ථවාදය නිර්වචනය කළ පමණින් ම එහි සැබෑ ම අර්ථය වටහා ගත නො හැකි ය. ප්‍රථමයෙන් ම එහි ගැබ්වන්නා වූ ලක්ෂණයන් හඳුනා ගෙන පසු ව එය අර්ථකථනය කළ හැකි ය. අධියථාර්ථවාදය (Surrealism), මායා යථාර්ථවාදය (Magic-Realism), පශ්චාත් නූතනවාදය (Post-Modernism) යන සංකල්ප පශ්චාත් යථාර්ථවාදයට අයත් වේ. මේ සංකල්පවල ගැබ් වන ලක්ෂණයන්ගෙන් පශ්චාත් යථාර්ථවාදී නවකතා පෝෂිත ය. එහි අඩංගු වන ලක්ෂණයක් වන්නේ සැබෑ ලෝකය හා මායා ලෝකය ඒකාබද්ධ කිරීම යි. එනම්, භව්‍යත්වය හා අභව්‍යත්වයත් විශ්වසනීයත්වය හා අවිශ්වසනීයත්වය අතර නව සම්බන්ධතා ඇති කිරීම යි. එමඟින් යථාර්ථවාදයෙහි විෂය ක්ෂේත්‍රය පුළුල් කරයි (අමරකීර්ති 2015:219). එය 'යථාර්ථයෙන් පලායෑමක් නොව යථාර්ථය තුළට තව තවත් ඇතුළු වීමක්'ලෙස ලියනගේ අමරකීර්ති පෙන්වා දෙයි (අමරකීර්ති 2015:246). ඒ බව සනාථ කිරීමට ඔහු ගුන්ටර් ග්‍රාස්ගේ 'ද ෆ්ලවුන්ඩර්'නවකතාවේ එන කතා කරන මත්ස්‍යයකු පිළිබඳ අත්දැකීමක් 'අමුතු කතාව'නම් කෘතියේ දී නිදර්ශනයක් ලෙස පෙන්වා දී තිබේ (එම). ආශ්චර්ය හා අද්භූතාත්මක ලෝකයක් මවා පෙන්වීම මෙම නවකතාවල තවත් ලක්ෂණයකි. එබැවින් ඒවා සුරංගනා කතා හා අද්භූත ආඛ්‍යාන සමඟ සමාන වන බව සිහි කැඳව යි. සමකාලීන ඉතිහාසය ගැඹුරු ලෙස විශ්ලේෂණය කිරීමට එමඟින් යත්න දරයි. චින්තනයට අනුව හේතු-ඵල සම්බන්ධය සංකීර්ණ ව පෙන්වීම හා දේශය, කාලය, අනන්‍යතාව පිළිබඳ සාම්ප්‍රදායික සංකල්ප අතික්‍රමණය කිරීම තවත් ලක්ෂණ කිහිපයකි. ගාර්සියා මාකේස්ගේ 'ඒ හන්ඩ්‍රඩ් ඉයර්ස් ඔෆ් සොලිටියුඩ්'නවකතාවේ එන පුරා අවුරුදු සතරක්, මාස දෙකක්, දින එකොළහක් නොකඩවා ඇති වූ වැස්ස හේතුවෙන් අද්භූත රෝගයක් වසංගතයක් ලෙස පැතිර ගොස් පුරවැසියන්ට අතීතය සහමුලින් ම අමතක වීම යන අවස්ථාව මීට හොඳ ම නිදර්ශනයකි. එමෙන් ම භාෂාවේ දී යෙදෙන රූපකාර්ථ වාච්‍යාර්ථ බවට පත් වී පාඨකයාට වින්දනයක් ලබා දීම තවත් ලක්ෂණයකි. ධනවාදයත් සමඟ සංස්කෘතිය පිළිබිඹු කිරීම, සාම්ප්‍රදායික බටහිර දර්ශන සම්ප්‍රදාය තියුණු විවේචනයට ලක් වීම, ලිංගිකත්වය නිරූපණය කිරීම, යථාර්ථයට වඩා යථාර්ථය නිරූපණය කරන මාධ්‍යමය සංඥා හා මනෝරූප සත්‍ය ස්වරූපයක් ගැනීම ඈ ලක්ෂණයන් මෙයට අයත් වන බව පෙන්වා දිය හැකි ය.

මේ ලක්ෂණයන් ඇතුළත් විශ්වීය නවකතා කිහිපයක් ලෙස ගුන්ටර් ග්‍රාස්ගේ ද ෆ්ලවුන්ඩර්, ටින් ඩ්‍රම් නවකතා ද ටෝනි මොරිසන්ගේ බිලවුඩ් නවකතාව ද ඇන්ජලා කාටර්ගේ නයිට් ඇට් හා ද සර්කස් නවකතා ද සල්මාන් රුෂ්ඩිගේ මිඩ් නයිට් චිල්ඩ්රන් නවකතාව ද ගාර්සියා මාර්කේස්ගේ ඒ හන්ඩ්‍රඩ් ඉයර්ස් ඔෆ් සොලිටියුට් යන නවකතාව ද පෙන්වා දිය හැකි ය.

පශ්චාත් යථාර්ථවාදය සිංහල නවකතා ක්ෂේත්‍රයේ දී හඳුන්වා දෙන්නට නිර්මාණකරුවෝ උත්සුක වූහ. ඇතැම් අද්‍යතන සිංහල නවකතාවන්හි මේ පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ හමු වේ. අද්‍යතන සිංහල නවකතාව යන්නෙන් අදහස් කරන්නේ නූතන නවකතාව යි. පශ්චාත් යථාර්ථවාදය නූතන නවකතාවට භාවිත වෙන්නට පෙර සිංහල නවකතා ඉතිහාසයේ මුල් ම ප්‍රබන්ධ කතාවල ද මෙම ලක්ෂණ අඩු වැඩි වශයෙන් දක්නට ලැබුණු බව එම කතා අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි. නමුදු බටහිර නවකතාව ආභාසයෙන් ඇරඹුණු මෙරට නවකතාවේ පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ හමු වන්නේ 1981න් පසු ව බව විචාරක මතය යි.

1905 දී මීනා නවකතාවෙන් ඇරඹි සිංහල නවකතාව අද වන විට විවිධ විචාර සංකල්ප හා සාහිත්‍ය චින්තන මඟින් පෝෂණය ලබන්නකි. නමුදු මීනා නවකතාවට පෙර ගද්‍යමය ආඛ්‍යාන කිහිපයක් පැවැත ඇත. ඒවා නවකතා නොව ප්‍රබන්ධ කතා ලෙස සිංහලයෙන් ව්‍යවහාර කරන්නට යෙදුණේ පැරණි සාහිත්‍යයෙහි නොවූ රචනා


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විශේෂයක් වීම නිසා බව එදිරිවීර සරච්චන්ද්‍ර මහතා පෙන්වා දෙයි (සරච්චන්ද්‍ර 1951:39). ඒ පිළිබඳ තව දුරටත් විස්තර කරන ඔහු පෙන්වා දෙන්නේ ‘ප්‍රබන්ධ’යන මේ වචනය යොදන්නට ඇත්තේ fiction යන ඉංග්‍රීසි වචනයේ අර්ථය හැඟවීමට විය යුතු බව ය. නමුදු ප්‍රබන්ධ කතාවල නොයෙක් විශේෂතා පවතින හෙයින් බාහිර වෘත්තාන්තය පමණක් පවතින මේ කතාවලට ප්‍රබන්ධ නොව ‘ගද්‍ය ආඛ්‍යාන’(prose romance) යයි කීම වඩාත් සුදුසු බව ඔහු පෙන්වා දෙයි (එම). එවන් ගද්‍ය ආඛ්‍යාන කිහිපයක් ලෙස ‘රුවන් මල්දම’, ‘වාසනාවන්ත පවුල හා කාලකන්නි පවුල’, ‘වෙසක් දූතයා’, ‘ආලයේ ලීලය’, ‘විමලා’, ‘ආදර හසුන’, ‘සිරි බාරී’හඳුන්වා දිය හැකි ය. මීනා නවකතාවෙන් පසු ව ‘තෙරීසා’, ‘සිරියලතා’, ‘ලීලා’, ‘සෝමා’, ‘අයිරාංගනී’, ‘සීතා’, ‘මිරිඟුදිය’ඈ නවකතා රාශියක් බිහි වූ අතර එම ගමන් මඟ වෙනස් වන්නේ 1944 දී ය. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ‘ගම්පෙරළිය’නවකතාවත් සමඟ යථාර්ථවාදී රීතියේ ආරම්භය සනිටුහන් වේ. ගැමි පසුබිමක් සහිත ගැමි ජීවිතය පිළිබඳ යථාර්ථවත් විග්‍රහ කිරීමක් සිදුවන්නේ ගම්පෙරළිය නවකතාවෙනි. බටහිර සාහිත්‍යයෙන් අප සාහිත්‍යයට ඇතුළත් වූ නවකතා කලාව දේශීය සම්ප්‍රදායක් අනුව හැඩගැසෙන්නේ මේ නවකතාවෙන් පසුව ය. 1956 දී ලියැවුණු විරාගය නවකතාව මෙතෙක් පැවැති ගමන් මඟ වෙනස් ම පැතිකඩකට විවරණය කෙරුණකි. මනෝ විද්‍යාත්මක නවකතාවක් වන මෙය පුද්ගලයාගේ යටි සිත පිළිබඳ විවරණයක යෙදෙයි. විරාගයෙන් අනතුරු ව ‘මළගිය ඇත්තෝ ’, ‘මළවුන්ගේ අවුරුදු දා’, ‘හෙවනැල්ල’, ‘යළි උපන්නෙමි’, ‘සිත නැති බඹ ලොව’, ‘පරාජිතයෝ ’, ‘අප්‍රසන්න කතාවක් ’, ‘චරිත තුනක් ’ ඈ නවකතා විරාගයෙහි ආභාසය ලබා ගත් බව පෙනේ. සිංහල නවකතාවේ මෙතෙක් පැවැති සම්ප්‍රදාය අතික්‍රමණය කරමින් ආන්දෝලනාත්මක හැරවුම් ලක්ෂයක් වූයේ 1981 දී ය. ඒ සයිමන් නවගත්තේගමගේ ‘සංසාරාරණ්‍යයේ දඩයක්කාරයා’නවකතාවත් සමඟ ය. සංසාරාරණ්‍යයේ දඩයක්කාරයා නවකතාව මෙතෙක් පැවැති යථාර්ථවාදී රීතියට වෙනස් වූ රීතියක් අනුගමනය කරයි. එය අද්‍යතන සිංහල නවකතාවෙහි පශ්චාත් යථාර්ථවාදය භාවිත කළ ප්‍රථම අවස්ථාව ලෙස හඳුන්වයි.

ඉන්පසු මෙරට පසුකාලීන නිර්මාණකරුවෝ පශ්චාත් යථාර්ථවාදය සිය නවකතාවට එක් කර ගත් හ. එවන් නවකතා කිහිපයක් ලෙස, සයිමන් නවගත්තේගමගේ ‘සංසාරාරණ්‍යයේ අසබඩ’, මොහාන් රාජ් මඩවලගේ ‘බෝදිලිමා’, ‘මාගම් සෝලිය’, ‘ලොවීනා’, ‘ආදරණීය වික්ටෝරියා’, සමන් වික්‍රමාරච්චිගේ ‘අසන්ධිමිත්තා’හා ‘අප්පච්චි ඇවිත් ’, මංජුල වෙඩිවර්ධනගේ ‘මගේ ආදරණීය යක්ෂණී’හා ‘බත්තලංගුණ්ඩුව’, ටෙනිසන් පෙරේරාගේ ‘සසර දිගන්තය’, ‘මහා රාවණ’, ‘භාවාන්තරය’, පියල් කාරියවසම්ගේ ‘වීදුරු කුඩු කැවුණු කලෙක’, කපිල කුමාර කාලිංගගේ ‘සැප්තැම්බරයේ දිගු දවසක් ’එවැනි නවකතා කිහිපයක් ලෙස පෙන්වා දිය හැකි ය. මේ නවකතාවල පශ්චාත් යථාර්ථවාදය මැනවින් ප්‍රකට කර තිබේ. උදාහරණයක් ලෙස පශ්චාත් යථාර්ථවාදී නවකතාවෙහි එන සැබෑ ලෝකය හා මායා ලෝකය ඒකාබද්ධ කිරීම යන ලක්ෂණය අද්‍යතන සිංහල නවකතාවෙහි ගෙන හැර දක්වා ඇත්තේ මෙලෙසිනි.

> “පෙර දා වගේ ම ඒ හඬට නින්දෙන් කලබල ව ඇහැරුණු දැරිය ළිං පතුලට ඇදගෙන වැටුණා ය. මහ ජරමරේ මුළු ගමට ම අ ගසාගෙන වරපට කඹ හොයාගෙන කෙල්ල ළිං පතුලෙන් ගොඩගන්නා විට ඈ තවත් හෝරාවක් විතර රියන් දහයක් ගැඹුරු ඒ ළිඳේ වතුර යට සැපට නිදාගෙන සිටියා ය...” (මඩවල 2013:31).

මෙය මොහාන් රාජ් මඩවලගේ ලොවීනා නවකතාවේ එන අවස්ථාවකි. එහි දී සත්‍යයත් මායාවත් ඉතා අපූරුවට පාඨකයා ඉදිරියට ගෙන එයි. පුන්නි මෙහි එන ප්‍රධාන චරිතය යි. ඇය අසාමාන්‍ය චරිත ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. ඇයගේ අසාමාන්‍ය ක්‍රියාකාරකම් නවකතාවේ මුල සිට අග දක්වා ම දැක් වේ. ඇය ඇතැම් දිනවල රැය පහන් කරන්නේ පොල් ගස් උඩ, ගෙයි වහලය උඩ, නැතහොත් ළිං පතුල යට ය. දිය පිරුණු ළිඳක නිදා ගැනීම අසිරියකි.

මංජුල වෙඩිවර්ධනගේ ‘බත්තලංගුණ්ඩුව’ බැලූ බැල්මට යථාර්ථවාදී නවකතාවක ස්වරූපය පෙන්නුම් කරයි. එහෙත් එය ඉතා සියුම් ලෙස යථාර්ථවාදී රීතිය සමතික්‍රමණය කරයි. ලංකාව නැමැති යථාර්ථවත් දේශපාලනික හා සංස්කෘතික භූමියේ සිට නවකතාවේ කථකයා ක්‍රමයෙන් පිවිසෙන්නේ යුටෝපියානු භූමියකට ය. එහි පුද්ගල හැසිරීම්, චරිත, චින්තන රටා, විවිධ සිදුවීම් ආදිය කතුවරයා විස්තර කරන්නේ තථ්‍ය ලෝකය ඉක්මවා යන පරිදි ය. නවකතාවෙහි අඩංගු බත්තලංගුණ්ඩුව නැමැති දූපත රූපකයක් ලෙස කියවන විට එය එක්තරා දෘෂ්ටාන්තයක හැඩ රුව ගනී. කතුවරයා අපේක්ෂිත තේමාවෙහි මූල බීජ රඳා පවත්නා භූමිය එය යි. එබැවින් බත්තලංගුණ්ඩුව නවකතාවේ “බත්තලංගුණ්ඩුව” නම් වූ කතුවරයා විසින් ෆැන්ටසිගත කරන ලද දූපත පශ්චාත් යථාර්ථවාදය වෙතට යොමු වේ.

ඒ අනුව පශ්චාත් යථාර්ථවාදී නවකතාවකින් අපේක්ෂිත මුඛ්‍ය අරමුණ සාධනයෙහිලා අද්‍යතන සිංහල නවකතාවෙහි එය උපයුක්ත කර ඇති ආකාරයත්, එය අද්‍යතන සිංහල නවකතාවෙහි උපයුක්ත කර ගැනීම මගින් ශ්‍රී ලාංකේය සමාජ යථාර්ථය විවරණය කළ හැකි ද යන්න මෙම පර්යේෂණය මඟින් විමර්ශනය කිරීමට අපේක්ෂිත ය.

## සාහිත්‍ය විමර්ශනය

අනාදිමත් කාලයක සිට පාඨක සිත් සතන් ආනන්දයෙන් මෙන් ම ප්‍රඥාවෙන් පොහොසත් කර වූ කලා මාධ්‍යයක් ලෙස නවකතාව අතීතයේ සිට පැවත ඇත. නවකතාව විකාශනයේ ගමන් මඟ ගෙන හැර බැලූ විට එය ගතික කලා මාධ්‍යයක් ලෙස හැඳින්වීමට හැකි ය. එනම්, කලින් කලට නව්‍ය වූ කලාංගයන් එක් වීමෙන් පරිපූර්ණ කලා මාධ්‍යයක් ලෙස හැඩ ගැස්වීම යි. එය දේශීය මෙන් ම විදේශීය නවකතාවට පොදු වූ ලක්ෂණයකි. ඒ අනුව නූතන දේශීය නවකතාව ගත් විට එය බටහිර නවකතාවේ ආභාසය ද ගෙන නව්‍යකරණයට ලක් වන කලාංගකි. බටහිර රටවල



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නවකතාවේ පැවැතෙන පශ්චාත් යථාර්ථවාදි ලක්ෂණ නූතන නවකතාවේ බහුල වශයෙන් දක්නට ලැබේ. එය නූතන නවකතාවේ ප්‍රවනතාවක් බවට ද පත් ව ඇත. ඒ අනුව මෙම පර්යේෂණය පශ්චාත් යථාර්ථවාදී සංකල්පය හා එය නූතන නවකතාවෙහි භාවිත කර ඇත්තේ කෙසේ දැ යි හඳුනා ගැනීමටත් පිටිවහලක් වේ. විශේෂයෙන් ම පශ්චාත් යථාර්ථවාදී සංකල්පය නූතන නවකතාවෙහි භාවිත කිරීමේ දී යථාර්ථවාදී නවකතාකරුවා ප්‍රතීයමාන කරවීමට අපේක්ෂා කරන යථාර්ථය ම මෙම නවකතාවල දීත් නිරූපණය වේ දැ යි සොයා බැලීම මෙහි අවසාන ඵලය වේ. එය සොයා බලනු වස් ප්‍රාථමික මූලාශය ලෙස 2010 සිට 2018 දක්වා අතර කාලය තුළ දී රචනා වූ මොහාන් රජ් මඩවලගේ රැජින, ආදරණීය වික්ටෝරියා යන නවකතා හා සමන් වික්‍රමාරච්චිගේ අසන්ධිමිත්තා හා අප්පච්චි ඇවිත් නවකතාත්, පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක යන නවකතාවත්, ටෙනිසන් පෙරේරාගේ මහා රාවණ යන නවකතාවත් ප්‍රාථමික මූලාශය ලෙස යොදා ගෙන ඇත. මීට අමතර ව පශ්චාත් යථාර්ථවාදි සංකල්පය හඳුනා ගැනීම සඳහා එම සංකල්පයේ තොරතුරු හා සබැඳි ග්‍රන්ථ, ලිපි, සඟරා, අන්තර්ජාල ලිපි ආදිය ද්විතියික මූලාශ්‍රය ලෙස යොදා ගෙන ඇත.

## පර්යේෂණ ගැටලුව

අද්‍යතන සිංහල නවකතාවෙහි උපයුක්ත පශ්චාත් යථාර්ථවාදය ඔස්සේ ශ්‍රී ලාංකේය සමාජ පරිඥානය විවරණය කළ හැකි ද?

## පර්යේෂණ අරමුණු

යථාර්ථවාදයේ ප්‍රධාන අරමුණ තත්ත්වානුකූල ලෙසත්, තර්කානුකූල ලෙසත් මිනිස් සමාජ විඥානය ප්‍රතිනිර්මාණය කිරීමයි. මේ හා සම්බන්ධ විවිධ ප්‍රභේද පවතින අතර පශ්චාත් යථාර්ථවාදය එයින් එකකි. සත්‍ය ලෝකය හා සැබෑ ලෝකය සම්බන්ධ කරමින් සාහිත්‍ය නිර්මාණ බිහි කිරීමට අනුබල දීම පශ්චාත් යථාර්ථවාදයේ දී බොහෝවිට සිදු වේ. පශ්චාත් යථාර්ථවාදය බටහිර සාහිත්‍යය ආභාසයෙන් මෙරට සාහිත්‍යයට එක් වූ නවාංගයකි. මෙම පශ්චාත් යථාර්ථවාදය පිළිබඳවත් එය අද්‍යතන සිංහල නවකතාවේ උපයුක්ත කර ගැනීම පිළිබඳවත් විචාරවාදීන් විවිධ මත ඉදිරිපත් කර ඇත. නමුදු එය අද්‍යතන සිංහල නවකතාවේ උපයුක්ත කර ගැනීම මඟින් ශ්‍රී ලාංකේය සමාජ විඥානය සාර්ථක ව නිරූපණය කිරීමට හැකිදැයි යන්න ගැටලුව පවතී. ඒ පිළිබඳ පර්යේෂණයන් ද මෙතෙක් සිදු වී නොමැත. එබැවින් ශ්‍රී ලාංකේය සමාජ විඥානය නිරූපණය කිරීම උදෙසා පශ්චාත් යථාර්ථවාදය අද්‍යතන සිංහල නවකතාවේ උපයුක්ත කර ගැනීම උචිත ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. එබැවින් සමාජ විඥානය ප්‍රතිනිර්මාණ විධික්‍රමයක් වශයෙන් පශ්චාත් යථාර්ථවාදයේ භාවිතය හා අද්‍යතන සිංහල නවකතාවේ උපයුක්ත කර ගැනීම පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණය මඟින් සිදු වේ. එහි දී තෝරා ගත් නූතන ම සිංහල නවකතා කිහිපයක් අධ්‍යයනය කර විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කෙරේ. එමඟින් පශ්චාත් යථාර්ථවාදය, යථාර්ථය ප්‍රතිනිර්මාණය උදෙසා නවකතාවට යොදා ගත හැකි බව පෙන්වා දීම මේ පර්යේෂණයේ ප්‍රතිඵලය සේ දැක්විය හැකි ය.

මෙම සංකල්පය විමසීමේ දි පෙනීයන්නේ පශ්චාත් යථාර්ථවාදය බටහිර සාහිත්‍ය ආභාසයෙන් අප සාහිත්‍යයට එක් වූ නවාංගයක් බවයි. වර්තමානය වන විට බොහෝ නවකතාකරුවන් පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණයන්ගෙන් සිය නවකතාව පෝෂණය කිරීමට යොමු වන නැඹුරුතාවක් පවතී. නමුදු ඇතැම් විචාරකයන්ගේ විවිධ මතිමතාන්තරයන්ට ලක් වීමක් ද දක්නට ලැබේ. විමල් දිසානායක පෙන්වා දෙන්නේ පශ්චාත් යථාර්ථවාදය මෙරට සාහිත්‍යයට නොගැළපෙන බවක් නොව ඇතැම් ලේඛකයන් එය භාවිත කරන ආකාරය පිළිබඳ යම් ගැටලුවක් පවතින බවයි. මේ ආදී බොහෝ විචාරයන්ට ලක් වන මෙම නවකතා පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම මෙහි දී සිදු වේ.

## පර්යේෂණ වැදගත්කම

දහනව වන ශත වර්ෂයේ අග භාගයේ සිංහල සාහිත්‍යයට පිවිසුණු නවකතාංගය විසිවන ශත වර්ෂය මුල දී සයිමන් ද සිල්වාගේ “මීනා” නවකතාවත් සමඟ සිංහල සාහිත්‍යයේ ස්ථාවර සාහිත්‍යාංගයක් බවට පත් විය. එතැන් පටන් සිංහල නවකතාව බටහිර ආභාසය ද ගෙන කලින් කලට නවාංග ද එකතු කරමින් වර්තමානය වන විට පරිණත සාහිත්‍යාංගයක් බවට පත් වී හමාර ය. වර්ෂ 1981න් පසු ව සිංහල නවකතාවේ නව නැම්මක් සනිටුහන් වන අතර බටහිර මතිභ්‍රමයකින් ඇති වූ චින්තන රටාවක් ලෙස හඳුන්වන පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ සිංහල නවකතාවෙහි දක්නට ලැබුණි.

නවකතාවේ ඇති වුණු මේ වර්ධනයත් සමඟ වර්තමානය වන විට ලේඛකයෝ බොහෝ විට සිය නිර්මාණය පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ මඟින් පෝෂණය කිරීමට උනන්දුවක් දක්වති.

නවකතාවෙහි සිදු වූ මේ විපර්යාසය විචාරකයන්ගේ විවිධ මතිමතාන්තරවලට ලක් වේ. ඇතැම් විචාරකයන් පෙන්වා දෙන්නේ මේ නවකතා මඟීන් යථාර්ථය පෙන්වා දීමක් නොව ලිංගිකත්වය උත්කර්ෂයට නංවන බවයි. විමල් දිසානායක පෙන්වා දෙන්නේ පශ්චාත් යථාර්ථවාදය යනු යථාර්ථයෙන් පලායෑමක් නොව යථාර්ථය තුළට තව තවත් ඇතුළු වීමක් බවයි. ලිංගිකත්වය නම් විෂයය පරිණත බුද්ධියකින් යුතු ව විශ්ලේෂණය කොට කලාත්මක ලෙස නිරූපණය කළ යුතු දෙයක් බව ද ඔහු පෙන්වා දෙයි. මේ ආදී වශයෙන් බොහෝ මතිමතාන්තරවලට පශ්චාත් යථාර්ථවාදී නවකතාව පත් වී ඇත.

නමුදු පශ්චාත් යථාර්ථවාදී සිංහල නවකතාව අධ්‍යයනය කිරීමේ දී පෙනීයන්නේ එය යථාර්ථය ප්‍රතිනිර්මාණය කරන එක් පැතිකඩක් බව යි. ධනවාදී ආර්ථික ක්‍රමයක් සමඟ ශ්‍රී ලංකාවෙහි සිදු වූ ආර්ථික, සාමාජික, දේශපාලනික, සංස්කෘතික සන්දර්භයන්ගේ විපර්යාසය යි. ශ්‍රී ලාංකේය සමාජ සංස්ථාවෙහි සිදු වූ විපර්යාසය මැනවින් ප්‍රතිනිර්මාණය කළ අවස්ථාවක් ලෙස පශ්චාත්


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

යථාර්ථවාදී අද්‍යතන සිංහල නවකතාව පෙන්වා දීමට පුළුවන. ඒ කෘති පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කර ශ්‍රී ලාංකේය සමාජ විඥානය කෙතෙක් දුරට සාර්ථක ව පශ්චාත් යථාර්ථවාදයේ දී ප්‍රතිනිර්මාණය කළ හැකි දැයි විමසීම මේ පර්යේෂණයේ මූලික වැදගත්කම යි. එමෙන් ම සමාජ යථාර්ථය ප්‍රතිනිර්මාණය කරන පශ්චාත් යථාර්ථවාදය උපයුක්ත අද්‍යතන සිංහල නවකතාව විචාරයට විමසීමට ලක්විය යුතු නවකතාවක් ලෙස ද පෙන්වා දීමත් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනයේ නියැලෙන්ට උපකාරී වීමට ද මෙම අධ්‍යයනය වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

අද්‍යතන සිංහල නවකතාවෙහි උපයුක්ත පශ්චාත් යථාර්ථවාදය භාවිතය පිළිබඳ ව අධ්‍යයනය කිරීම සඳහා මූලික වශයෙන් විමර්ශනාත්මක ක්‍රමවේදය යොදාගෙන ඇත. එහි දී ඊට අදාළ පර්යේෂණ මෙවලම් යොදා ගනිමින් පර්යේෂණය සිදු කර ඇත.

- ප්‍රාථමික මූලාශය තෝරාගත් නවකතා (2010-2018)
  මොහාන් රාජ් මඩවල - රජින, ආදරණීය වික්ටෝරියා,
  සමන් වික්‍රමාරච්චි - අසන්ධිමිත්තා හා අප්පච්චි ඇවිත්
  පියල් කාරියවසම් - වීදුරු කුඩු කැවුණු කලෙක
  ටෙනිසන් පෙරේරා - මහා රාවණ

මෙම අධ්‍යයනය හා සබැඳි න්‍යායාත්මක තොරතුරු රැස් කිරීම උදෙසා පොත්පත්, සඟරා, ශාස්ත්‍රීය ලිපි, අන්තර්ජාල ලිපි වැනි ද්විතීයික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කර ඇත.

- දත්ත විශ්ලේෂණය

නවකතාව යනු කලින් කලට නව්‍යාංග ඒකරාශි වන ගතික කලා මාධ්‍යයකි. නවකතාකරුවා නවකතාව මඟින් ලොව පවතින සැබෑ තත්ත්වය තත්වානුකූල ලෙසත් තර්කානුකූල ලෙසත් නිරූපණය කරයි. මෙය නවකතාව පමණක් නොව අනෙකුත් සෑම සාහිත්‍යාංගයකට ම පොදු වූ කරුණකි. නවකතාකරුවා ලොව පවතින සැබෑ යථාර්ථය ඉදිරිපත් කිරීමේ දී නවකතාවක අඩංගු වන සාම්ප්‍රදායික මිනුම් දඬුවලට සීමා නොවී වෙනත් සංකල්ප ඔස්සේ ද ඉදිරිපත් කිරීමට උත්සහ දරා ඇත. එවන් අවස්ථාවක් අද්‍යතන සිංහල නවකතාවේ 1981න් පසු ව දැක ගත හැකි වීම සුවිශේෂී තත්ත්වයකි. එනම් තේමාත්මක හා වස්තු විෂයෙහි නවකතාවේ දක්නට ලැබෙන නව්‍යත්වය යි. මෙම ප්‍රවණතාව නූතන නවකතාවේ බහුල ව දක්නට ලැබේ. 1944 දී රචනා වූ ගම්පෙරළිය නවකතාවේ දක්නට ලැබුණු යථාර්ථවාදී රචනා ශෛලියට වෙනස් මඟක් ගත් රචනා ශෛලියකි. මෙම රචනා ශෛලිය නූතන නවකතාවේ යොදා ගැනීම පිළිබඳ ව බොහෝ විචාරකයින්ගේ අවධානයට යොමු ව තිබේ. ඇතැම් විචාරකයින් පෙන්වා දෙන්නේ මෙම රචනා ශෛලිය මඟින් නවකතාව මුඛ්‍ය අරමුණ වන සමාජයේ සැබෑ තතු නිරූපණය නොවන බවයි. නමුත් මෙම නවකතා අධ්‍යයනය කිරීමේ දී හෙළි වන කරුණ වන්නේ තේමාත්මක හා වස්තු විෂය අතින් යම් සුවිශේෂිතා දැක් වුව ද මෙම නවකතා එහි මුඛ්‍ය අරමුණ වන සමාජයේ සැබෑ තතු ප්‍රතිනිර්මාණය කර ඇති බවයි. ඒ බව පහත අද්‍යතන නවකතා ඔස්සේ විමසා බැලිය හැකිය.

පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ රැගත් නවකතාවක් ලෙස සමන් වික්‍රමාරච්චි විසින් රචිත අසන්ධිමිත්තා නවකතාව හඳුන්වා දිය හැකි ය. කාන්තාවන් දෙදෙනකු ඝාතනය කළ ගැහැණියක් පිළිබඳ දැක්වෙන මෙම නවකතාව පශ්චාත් නූතනවාදී සමාජය විවරණය කරන අපූරු නවකතාවක් ලෙස හඳුන්වයි. පශ්චාත් නූතනවාදී සමාජයක දක්නට ලැබෙන අධික පරිභෝජනවාදි සමාජයක හැසිරෙන ගැහැණුන්ගේ හා පිරිමින් ගේ ක්‍රියාකාරකම්, මුදල මත පදනම් වූ මානව සබඳතාවල දුවශීලීත්වය මෙන් ම නූතනවාදී සමාජයක කාන්තාවට හිමි වූ තත්ත්වය ආදී කරුණු රැසක් විවරණය කර ඇත.

පශ්චාත් නූතන සමාජයක කාන්තාවකට ඇත්තේ අනාරක්ෂිත බවකි. ඇය නිවසේ දී බසයේ දී මඟතොටේ දී හෝ අනෙකුත් ස්ථානයන්හි හිංසාවට පීඩාවට පත් වේ. මෙම සත්‍ය ගම්‍යමාන කරනු වස් අසන්ධිමිත්තා නවකතාවේ අසන්ධි අවස්ථාවාදී පුද්ගලයන්ගෙන් හිංසාවට පීඩාවට පත් වන ආකාරය නවකතාව පුරාම දක්නට ලැබෙන්නකි. ඇයට බසයේ දී වික්‍රමසේකරගෙන් සිදු වන හිංසනය ඊට උදාහරණ සපය යි. කතුවරයා මේ බව ප්‍රකාශ කරන්නේ ඇයගේ ම ප්‍රකාශනයක් ලෙස ය. කාන්තාවට සිදු වන පීඩාව වෙනත් අයෙකු ලවා හැඟවීමට වඩා ඇය මඟින් ම ඒ බව අනාවරණය කිරීම කෙතරම් සාධාරණ ද? එය හේතුකොට ගෙන අසන්ධිමිත්තා ම හෙළි කරන අන්දමින් මෙම කතාව කියවෙයි. මෙය පශ්චාත් යථාර්ථවාදී නවකතාවක දක්නට ලැබෙන ලක්ෂණයකි. එනම් තමන්ගේ කතාව ප්‍රබන්ධයක් ආකාරයට තමන් විසින් ම ඉදිරිපත් කිරීම යි.

> “මෙන්න මේ වේලාවේ අර මගේ වම් පස ඉඳගෙන ඉන්න මහත්තයාගේ දකුණු වැලමිට මගේ උකුල මැඩගෙන මතු වී ඉහළට එස වී තිබුණ මාංශ රැල්ල මත රැඳුණා. වැලමිට මගේ ඔපනැල්ල තෙරපන විට සිදු වන්නට යන්නේ කුමක්දැයි මට පැහැදිලි වුණා. ස්ථූල වූ ගැහැණු ශරීර කුඩුවකට මාංශ ලෝභයෙන් ඇලුණ තවත් පිරිමියෙක්” (වික්‍රමාරච්චි, 2015:17).

මෙම ලක්ෂණය නවකතාව ආරම්භයේ සිට ම අවසානය තෙක් ම දක්නට ලැබෙයි. එනම් අධික තරබාවය හේතු කොට ගෙන අසන්ධි නාමයෙන් පට බැඳුණු ස්ථූල ගැහැණියක් තමන්ගේ කතාව සිය පාසල් කාලයේ මිත්‍රයකු වන සුජීව ලේඛකයා හට කීමයි. ඒ අනුව මෙම නවකතා ප්‍රබන්ධ කතා ලක්ෂණ පෙන්නුම් කරන බව දැක්වෙයි (ද සිල්වා, 2019:387). එනම්, වෙනත් අයෙකු විසින් කියන ලද ප්‍රබන්ධය තවත් අයෙකු විසින් ලියන මේ මොහොතේ අප විසින් කියවනු ලබමින් සිටින වග පාඨකයාට අවබෝධ වීම යි. එය කතාන්තර කීමේ ස්වරූපයක් ගන්නා අතර එම ප්‍රබන්ධය කියන ස්ත්‍රිය විසින් ම කතාව ලියන වග දැක් වේ (එම).

එමෙන් ම මෙම ලක්ෂණය පශ්චාත් යථාර්ථවාදි නවකතාවක


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දක්නට ලැබෙන ලක්ෂණයක් වන අතර එම ලක්ෂණය අති ප්‍රබන්ධ (Meta Fiction) ලක්ෂණයක් ලෙස ද සාහිත්‍ය ශානර විමංසා යන කෘතිය විස්තර කරමින් කේ. කේ. සමන් කුමාර මේවා පාරප්‍රබන්ධ ලෙස ද හඳුන්වා ඇත (ද සිල්වා, 2019:387).

නවකතාවේ මෙම ලක්ෂණය අනුගමය කරමින් සමාජ විවරණයක යෙදෙන කතුවරයා ධනවාදී ආර්ථිකයත් සමග වර්තමානයේ මුදල තීරණාත්මක සාධකයක් බව පෙන්වා දෙයි. එය මත වර්තමානයේ සියලු දේ තීරණය වෙයි. මිනිසා සතු ව පවත්නා මනුෂ්‍යත්වයත්වය ද මුදල මත තීරණය විම ඛේදනීය තත්ත්වයකි. නමුත් පශ්චාත් නූතනවාදී සමාජයේ මනුෂ්‍යත්වය මුදලට විකිණීමක් දක්නට ලැබේ. එය ගම්‍යමාන කරනු වස් මෙම නවකතාවේ මනුෂ්‍යත්වය මුදලට විකිණීමේ ආරාමයක් පිළිබඳ ව දැක් වේ. එය නමින් 'අසරණියන්ගේ ආරාමය' වේ. අසරණියන්ගේ ආරාමය යනු ජීවිතයේ බලාපොරොත්තු බිඳ ගත් ස්ත්‍රීන්ගේ ආරාමය යි. මෙම ආරාමය ඔස්සේ කාන්තාවන් කුට ලෙස ඔවුනට උපකාරි වන අටියෙන් මුදල් උපයා ගැනීමක් සිදු වේ. මෙය වත්මන් සමාජ පරිස්ථියෙහි ප්‍රවණතාවකි. මෙහි එන අසන්ධිමිත්තා හා වික්‍රමසේකර යනු මුදලට මනුෂ්‍යත්වය විකුණන චරිතයන් ය. ඔවුන් දෙදෙනා මෙම ස්ත්‍රීන්ට උපකාරී වන අටියෙන් දඩයම් කිරීමක් දක්නට ලැබේ. ඒ බව කතුවරයා ගම්‍යමාන කරනු ලබන්නේ මුදල මත පදනම් වන පශ්චාත් නූතනවාදී සමාජයේ මනුෂ්‍යත්වය වියැකී යන ආකාරය යි.

> "අපි මේ පාර මාස 06කට සැරයක් රු.200ක සාමාජික ගාස්තුවක් නියම කරමු. හිතන්න. ගෑනු තුන් හාරසීයක්වත් හදා ගත්තොත් ලැබෙන ආදායම ගැන. තව කොච්චර නම් කඩා ගන්න පුළුවන් ද ඔය මොට්ට ගැහැනුන්ගෙන්...හැබැයි මේ පාර වැඩ කැල්ල තියෙන්නේ ඔයාගේ අතේ " (වික්‍රමාරච්චි, 2015:77-78).

මෙම අවස්ථාව මගින් මනුෂ්‍යත්වයත්වය මුදලට විකිණීමක් පමණක් නොව අසරණ ගැහැණුන් දඩයම් කරන වික්‍රමසේකර වැනි පුද්ගලයන්ගේ මතුපිට පෙනුම හා සත්‍ය අතර පවත්නා විෂමතාවය පෙන්නුම් කරයි. යථාව ගිලිහී ගොස් ව්‍යාජත්වය මතුපිටට පැමිණි අවස්ථාවක් ලෙස අසන්ධිමිත්තා, වික්‍රමසේකර සහ අසරණියන්ගේ ආරාමය පෙන්වා දිය හැකි ය.

පශ්චාත් නූතන සමාජයක මුදල මත සියල්ල ම පවතින බව අසන්දධිමිත්තාට කාලි මෑණියන් ආවේස වීම, කාලි මෑණියන්ගේ මල්වර වීම යනාදි අවස්ථා මගින් දැක්විය හැකි ය. පශ්චාත් නූතනවාදී සමාජය වන විට ආගම දහම පවා මුදලට විකිණීම මෙමගින් විවරණය වේ. වර්තමාන සමාජයේ දෙවියන් ඇදහීම සඳහා මුදලක් නියම වීමත්, මිනිසුන්ගේ මුදල් උපයනා ජීවන ක්‍රමයක් බවට ද මෙවැනි ස්ථාන බිහි ව තිබීම පශ්චාත් නූතනවාදී සමාජයේ දක්නට ලැබෙන සුවිශේෂි කරුණකි. ඒ බව කතුවරයා ගෙන එනු ලබන්නේ පශ්චාත් යථාර්ථවාදී නවකතාවක අඩංගු යථාව හා මායාව අතර ඇති සම්බන්ධය දක්වමිනි.

"දේවාලයක්? එතකොට දෙයියොද අපිට කන්ඩ දෙන්නේ?"

> "නැහැ යෝදියේ....අහගන්නවකො මම කියන දේ. දේවාලයක් දාලා සාත්තර කියමු. මං ඔය වශීකර්ම අරව මේව වැඩ ටිකක් දන්නව. ගමෙත් තියෙනවනෙ මං ගැන පොඩි ප්‍රචාරයක්" (එම, 2015:67).

> "මෙතන හිටපු ගෑනු හැමෝම තමන් ඇඳගෙන හිටපු කම්බාය ගලවල වට තිර ඇද්දා. කාලි අම්මා මල්වර වෙලා. පිරිමි හැමෝම මගෙන් ඈත් කළා. මාව වහං කර ගෙන ඇතුළු කාමරේට ගෙන යන ලෙස විකී ගැහැනුන්ට අණ කරනවා. ඊළඟට විකී බොහොම බැරෑරුම් ලෙස එතන සිටි පිරිමින් ආමන්ත්‍රණය කළා" (එම, 2015:84).

පශ්චාත් යථාර්ථවාදී නවකතාවල භාවිත වූ මායා යථාර්ථවාදී ශෛලිය ද අනුගමනය කර පශ්චාත් යථාර්ථවාදී සමාජයක පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් වික්‍රමසේකර මිනී පෙට්ටියකින් නැගිට ඒම හා මිනී පෙට්ටියෙන් නැගිටීමේ සිහිනය, මහලියන වික්‍රමසේකරගේ එම සිහිනයට ඇතුල් විම, පක්ෂියෙකු සේ රූපාන්තරණය වී අහසට ඉගිල යාම, සමදරා, මදාරා හා මහලියනගේ පුවත විවරණය කරයි.

> "වික්‍රමසේකර මිනී පෙට්ටියෙන් එළියට බැස මහ හයියෙන් හිනා වෙන් ගත්තා. එතන හිටි හැමෝමත් හිනා වෙන්න ගත්තා. අර මිටි ගැහැණිය කැකිරි පළනවා. හැමෝම මාව විහිළුවකට අරගෙන. උන්ගේ හිනාව බොල් අවකාශය පුරා පැතිර යනවා" (එම, 2015:52).

> "මහලියන හරි අපූර් වූ සොයා ගැනීමක් සිදු කළා. ඔහු වික්‍රමසේකරගේ හීනයට හොරෙන් ඇතුළු වෙලා. ඒ හීනයට අනුව විකී රූපාන්තරණ හීතිකාවකින් පෙළෙන්නෙක්" (එම, 2015:57).

> "මෙන්න මේ මොහොතේ ඔහු තුළ කුමක්දෝ විපරියාසයක් වන්නට පටන් අරගෙන. තමා අහසට එසවෙන බවත් ඊළඟට වේගයෙන් පියඹා යා හැකි පක්ෂියෙකු බවට රූපාන්තරණය වී ඇති බවත් ඔහුට දැනුණා" (එම, 2015:57).

මෙවන් අවස්ථා ලෝක නවකතා වන 'One Hundred year of solitude' (1971), 'The Tin Drum' (1964), 'Midnight's Children' (1981), 'The House of Spirits' (1982) වැනි නවකතාවල ද දක්නට ලැබේ (අමරකීර්ති, 2015:216-217). එයට උදාහරණයක් ලෙස, සල්මාන් රුෂ්ඩිගේ 'රෑ මැදියම් දරුවෝ' නවකතාවේ ද මැජික්මය අවස්ථා නිතර හමු වේ. නවකතාවේ වීරයා වන සලීම් සිනායිගේ කිරි අම්මාට ඇගේ දියණියන්ගේ සිහිනවලට හොරෙන් එබී බලන්නට පුළුවන (එම, 2015:217). මෙම අවස්ථාව මහලියන වික්‍රමසේකරගේ සිහිනයට ඇතුල් විම හා සමපාත වේ.

මේ ආකාරයට පශ්චාත් නූතනවාදී සමාජයක දක්නට ලැබෙන ගැහැණුන්ගේ හා පිරිමින්ගේ ක්‍රියාකාරකම් මෙම


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නවකතාව මඟින් ඉදිරිපත් කර ඇති බව පෙන්වා දිය හැකි අතර පශ්චාත් යථාර්ථවාදී නවකතාවක දී දැක්වෙන ලක්ෂණ ඔස්සේ එම සමාජ විවරණය සිදු කර ඇති බව පෙනි යයි. කතුවරයා භාවිත කරනු ලැබූ මෙම ශිල්පීය උපක්‍රම මඟින් සමාජය හොඳින් විවරණය වී ඇති බව සාධනීය ලක්ෂණයකි.

මායා යථාර්ථවාදය මෑත ඉතිහාසයේ නවකතාවේ දක්නට ලැබුණු නව ප්‍රවණතා අතර සුලභ මාතෘකාවකි. විශ්ව නවකතා ක්ෂේත්‍රයන්හි මෙම රීතීය අනුදත් නවකතාකරුවන් මෙය භාවිත කරනු ලබන්නේ පවතින ප්‍රතිනිර්මාණ විධි අතික්‍රමණය කිරීමෙහි විකල්ප ක්‍රමයක් වශයෙනි. එසේත් නැතිනම් පවතින නීතිමය හා සම්මුතිමය බාධා ජය ගැනීමට කරන ලද උත්සහයක් වශයෙනි. ඔවුන් සිය නවකතා මඟින් විශ්වාස කළ නොහැකි එනම් අද්භූත, මායාමය සිදුවීම් ඉදිරිපත් කළේ යථාර්ථය මූලික කර ගනිමින් මිස එයින් බැහැර වෙමින් නොවේ. තම නිර්මාණයෙහි යථාර්ථයෙන් බැහැර වූ එක ම වැකියක්වත් නැති බව මාර්කේස් ප්‍රකාශ කළේ ය. ඔහුගේ නවකතාවන්හි අද්භූත හා ගුප්ත සිදුවීම් කාව්‍යාත්මක හා නිර්මාණාත්මක ව ඉදිරිපත් වෙයි. ඔවුන් මෙම සංකල්පය අර්ථවත් කළේ ඒ ආකාරයෙනි. යථාර්ථයත් මායාවත් අතර මනා අනුසන්ධානයක් ඇති කිරීමට ඔවුහු සමත් වූහ. මේ ප්‍රවණතාව සිංහල නවකතාව කෙරෙහිත් යම් තාක් දුරකට බලපෑමක් ඇති කළ බව මෑත ඉතිහාසය මඟින් තහවුරු වේ. මෙහි දී අධ්‍යයනයට පාදක කර ගනු ලබන මොහාන් රාජ් මඩවල විසින් රචිත ආදරණීය වික්ටෝරියා යන නවකතාවෙහි ද ඉහත සංකල්පයේ බලපෑමක් දක්නට ලැබේ (ලසිකා, 2019:195).

දහ නම වෙනි සහ විසි වන සියවසේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ හඳුන්වා දුන් වැවිලි ආර්ථිකය පදනම් කර ගෙන ශ්‍රී ලාංකේය සමාජ පරිස්ථිතියේ සිදු වූ වෙනස්කම් පිළිබඳ විවරණය කරන මෙම නවකතාව මඟින් දේශපාලන බලාධිකාරිය හිමි නව ධනපති සමාජයක නැගීම සනිටුහන් කරයි. යැපුම් කෘෂිකර්මාන්තය මත පදනම් වූ මෙරට ආර්ථික රටාව මෙම වැවිලි ආර්ථිකයත් සමඟ සුළු පරිමාණයේ රේන්ද කටයුතු, වෙළඳාම් සහ ප්‍රාරම්භන යටත් විජිත ආර්ථිකයේ ලක්ෂණයක් වූ සුළු ලාභ ලැබීමේ සිට ගුණාත්මක ලාභ ලැබීම දක්වා ආර්ථික රටාව වෙනස් වූ අතර එය හේතු කොට ගෙන මෙම නව සමාජ පන්තියක ඇරඹුම සනිටුහන් විය. මෙය අනාගත ශ්‍රී ලංකාවේ ධනයත් බලයත් හිමි ධනේශ්වර පංතියේ ආරම්භය බව සිංහල පරිවර්තනයක් වූ ‘සොක්කන් ලොක්කන් වූ වගයි’ නම් කෘතියේ කුමාරි ජයවර්ධන විසින් සනාථ කර ඇත.

> “සුළු පරිමාණ රේන්ද කටයුතු, වෙළඳාම් සහ ප්‍රාරම්භක යටත් විජිත ආර්ථිකයේ ලක්ෂණයක් වූ සුළු ලාභ ලැබීමේ සිට ගුණාත්මක වෙනසක් සිදු වූයේ නව සමාජ පන්තියක් වර්ධනය වීමට සැබෑ තල්ලුවක් දුන්නා වූ වැවිලි කර්මාන්ත ක්‍රමය වේගයෙන් වර්ධනය වීමත් සමග ය. වැවිලි කර්මාන්ත ස්වරූපය ආර්ථිකයට සංක්‍රමණය වීමත් සමග ම සොක්කන් ලොක්කන් බවට පත්වීම ආරාම්භ විය” (ජයවර්ධන, 2008:79).

මායා යථාර්ථවාදය යටතේ ගොඩ නැගුණු මෙම නවකතාවේ දේශපාලන පුද්ගලයාගේ විකෘතිකර ස්වාභාවය පෙන්වන චරිතය වන්නේ අන්දරිස් ය. අන්දිරිස් සිය ව්‍යාපාර බුද්ධිය යොදවා සාමෙල්ගේ අරක්කු පීප්ප ව්‍යාපාරය අරක්කු රේන්ද ව්‍යාපාරය දක්වා දියුණු කරයි. අරක්කු රේන්ද ව්‍යාපාරයකු බවට පත් වීමෙන් පසු සාමෙල් මියයන අතර ඉන් පසු එම ව්‍යාපාරයේ හිමිකරුවා වූයේ අන්දිරිස් ය. අන්දිරිස්ගේ මෙතෙක් දියුණු වීමේ මගේ ඔහුගේ චරිතයේ සංකීර්ණ අවස්ථා පෙන්නුම් කරන චරිතය වන්නේ ලීනා ය.

ලීනාගේ චරිතය විස්මය ජනක හා යථාර්ථයෙන් ඔබ්බට ගිය චරිතයන් සේ මැවීමට කතුවරයා වෑයම් කරන අතර ඇය හරහා සැබෑ සත්‍ය ගම්‍යමාන කිරීමටත් හා මායාවන්ගෙන්, අද්භූතයන්ගෙන් පිරුණු අවස්ථා උලුප්පා දැක්වීමටත් කතුවරයා ඉඩ හසර වෙන් කර ගනී. එංගල්තීනා හා අන්දිරිස් පවත්වන රහස්‍ය ලිංගික සබඳතා එංගල්තීනාගේ දියණිය වන ලීනා දැන සිටිය ද ඇය ඒ බව නොදන්නා මෙන් සිටින බව අන්දිරිස් ද දැන සිටී. නමුත් ඔවුන් දෙදෙනා ම ඇඟවීමක් නොකළ අතර ඔවුන් දෙදෙනා ඇති කර ගන්නා මෙම රහස්‍ය අන්‍යෝන්‍ය සබඳතාව මඟින් ලීනාගේ චරිතය යථාර්ථයෙන් ඔබ්බට ගිය චරිතයක් ලෙස පෙන්වා දෙයි. ඒ බව ඇය නිරන්තරයෙන් පුනරුච්චාරණය කරන කළු කුරුමිණි අවස්ථාව හා සම්බන්ධ වේ.

> “කළු කුරුමිණියෝ පොල් ගස් ගොබේ කන්නේ කාටවත් නොපෙනෙන්ඩ” (එම, 2014:109).

පොල් ගස්වල පොල් ගසේ ගොබය කන කළු කුරුමිණියෝ එම පොල් ගසට ගෙන එන්නේ මහත් ව්‍යවසනයකි. එමගින්, පුද්ගලාභ්‍යන්තරයෙහි සිටින යථාර්ථය ඉස්මතු වී පුද්ගලයා ව විනාශයට පත් කරන බව කතුවරයා ගම්‍යමාන කර ඇත.

එමෙන් ම අන්දිරිස් රා අරක්කු මඟින් උපයනා මුදල්, කල්දේරම්වල බහාලීම සිදු කරයි. නමුත් එම කල්දේරම්වල කළු කුරුමිණියෝ දක්නට ලැබීමත්, ඔවුන් ඒවායෙහි මැරී සිටීමෙන් දුර්ගන්ධයක් හමන බව දැක ගැනීමෙන් පසු ලීනා එය අන්දිරිස්ට විස්තර කර දෙන්නේ එම මුදල්වල ඇති සත්‍යතාව පෙන්වා දෙමිනි.

> “එවිට ඇය ඔහුට පෙරලා පිළිතුරු දී තිබුණේ කිසිම හේතුවක් නැතිව පොල් ගස්වල පොල් කුරුමිණියන් බෝ වෙනවා වගේ පොල් ගස්වලින් පෙරා ගන්නා පොල් අරක්කුවලින් උපයන කාසිවලත් කිසිම හේතුවක් නැතිව කළු කුරුමිණින් බෝ විය හැකි බවය. ඒ බව කළු කුරුමිණියන්ට තඹ කල්දේරම් ඇතුළේ හුස්ම ගන්න අපහසු බැවින් උන් මිය ගිය විට මේ දුර්ගන්ධය උපදින බවත් එපමණක් නොව කාසිවලින් උපදින කළු කුරුමිණියන් මරණයට පත් වීම ඒ කාසි නැති හංගස්ථාන වීමට බලපාන හේතුවක් බවත් ඇය ඔහුට පැහැදිලි කර දුන්නා ය ” (එම, 2014:109).

කළු කුරුමිණියන් ලීනාගේ චරිතය හා සම්බන්ධ කර විස්තර කිරීමෙන් ධනපති සමාජයකට පියමන් කරන අන්දිරිස්ගේ


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විකෘතිකර ස්වභාවය පාඨකයාට වටහා ගැනීමට හැකි අතර මෙම ආර්ථිකය ඔස්සේ ගොඩ නැගෙන යටත් විජිත ලංකාවේ නවමු ධනපති පංතියේ ජීවිතය හා ඓතිහාසික දේශපාලන භූමිකාවේ විකෘතිය නවකතාව අවසානයේ එන අන්දිරිස්ගේ මරණය සිදු වන දිනයේ සෙලිනා නම් බැල්ල අමුතු සත්ත්වයකු බිහි කිරීමෙන් පෙන්වා දෙයි. ඌ බල්ලෙකුගේ හා අශ්වයෙකුගේ දෙමුහුන් සත්ත්වයෙක් විය.

> "ඌ අමුතු සත්ත්වයෙක් විය. උගේ පහළට කඩා වැටුණු කන් දෙක බලු කන් දෙකක් වුවත් පිට දිගේ දෙපැත්තට විහිදුණු කේශර විය. බල්ලෙකුගේ වගේ ඇස් දෙකක් ඌට තිබුණත් දිගු හොම්බක් සහිත කට සම්පූර්ණයෙන් ම අශ්වයෙකු මෙන් විය. උගේ ළැම පෙදෙස සහතික ලෙස ම බල්ලෙකු පරිදිය. එහෙත් කකුල්වල තිබුණේ අශ්ව කුර ය. ලීනා ළඟට එන විට ඌ ඇය ව පිළිගත්තේ අශ්වයෙකුගේ මෙන් දිග කේශර විහිදී තිබූ නැට්ට බල්ලෙකු පරිදි වනමිනි"(එම, 2014:204).

මෙය ලාංකේය දේශපාලනයේ තත්කාලීන යථාර්ථය ගම්‍යමාන කිරීමට කතුවරයා වෑයම් කරන අවස්ථාව යි. එහි දී සොලමන් රිජ්වේ ඩයස් බණ්ඩාරනායකගේ උපත හා සමගාමී ව අන්දිරිස්ගේ නිවසෙහි සෙලිනා නම් බැල්ල අමුතු සත්ත්වයකු ප්‍රසූත කිරීම මඟින් කතුවරයා ගම්‍ය කරන්නේ බණ්ඩාරනායක පරම්පරාවේ නව සාමාජිකයාගේ උපතින් පසු ව ලාංකේය දේශපාලනයේ ඇති වූ විකෘති කර ස්වභාවය හා අනාගත ශ්‍රී ලාංකේය දේශපාලනය හසුරුවන්නෝ මොවුන් ය යන සත්‍ය හෙළි කිරීමෙනි. ඒ බව ඇල්ෆ්‍රඩ් අන්දිරිස්ට එවූ ලිපිය මඟින් ද අනාවරණය කර ඇත.

> "බණ්ඩාරනායකලා, ඔබේසේකර, සොයිසලා වගේ හැකි තරම් ළඟින් ආශ්‍රය කරන්න. ඉංග්‍රිසි ආණ්ඩුව සමඟ ගනු දෙනු කරන්න. ඔවුන්ගේ විශ්වාසය දිනා ගන්න. ඉදිරි කාලයේ ලංකාවේ අනාගතය තීන්දු කරන්නේ ඔවුන්ගේ එම විශ්වාසය දිනා ගත් දේශපාලකයන් විසිනි" (එම, 2014:276).

ඇල්ෆ්‍රඩ් අන්දිරිස්ට එවූ ලිපිය අනුව අනාගත ශ්‍රී ලංකාවේ දේශපාලනය හසුරුවන්නේ මෙම කණ්ඩායම බව කතුවරයා මෙම ඓතිහාසික සිද්ධිය පදනම් කරගෙන දක්වා ඇත. මෙම කණ්ඩායම චතුවගාව හරහා ගොඩනැගී අරක්කු රේන්ද ව්‍යාපාරය වැනි ව්‍යවසාය මාර්ගවලට සමාජයෙහි උසස් තත්ත්වයක් ලබා ගත් හ. ඔවුන් එමඟින් පසු කලෙක දැවැන්ත ව්‍යාපාරවලට යොමු වුණ අතර ධනයත් බලයත් මේ පිරිස අනාගත ශ්‍රී ලංකාවේ දේශපාලනය හසුරුවන බව දක්වයි. නවකතාව හරහා මෙවැනි තොරතුරු දැක්වීමෙන් කතුවරයා සිදු කර ඇත්තේ ඉතිහාසසය හැදෑරීමක් බව ද දැක්විය හැකි ය.

වර්තමාන සමාජය මුදලට ඇත්තේ අපමණ වටිනාකමක් ය. මුදල මත සමාජයේ සියල්ල රදා පවතී. එබැවින් මුදල් මත යැපෙමින් ඝාතනයන් කිරීමත් හෝ ඇතැම් ඝාතනයන් යටපත් කිරීමත් සිදු වේ. එංගල්තීනාගේ මරණයට අන්දිරිස්ගේ හා ලීනාගේ සම්බන්ධතාව හේතු නොවූ බව ගම්මුන් අතර ප්‍රචලිත කරන්නේ සිය ගෝලයන්ට මුදල් දීමෙන් අනතුරුව ය.

> "එහෙත් අඬ හෝරා අඩක් යන්නටත් මත්තෙන් මතෙස්, කිරිබණ්ඩියා, වෙදරාළ කැඳවාගෙන ආවේ ය. ගෙදර ආලින්දයේ දී ම අන්දිරිස් වෙදරාළ අතට සුදු රෙද්දකින් ආවරණය කළ කාසි පොට්ටනියක් දුන්නේ ය" (එම, 2015:160).

> "මේක කැළැ උණ හැදිල හරි දෙයියන්ගේ ලෙඩ හැදිල හරි සිද්ධ වෙච්ච මරණයක් මිසක් දිවි නසාගන්ඩ එල්ලිලා මැරිච්ච මරණයක් නෙමෙයි....ඒ විදිහට තමයි මේ මුළු ගමම මේ මරණය ගැන ගන්ඩ ඕන" (එම, 2015:161).

අන්දිරිස්ගේ ක්‍රියාකාරකම් මඟින් හෙළි වන්නේ වර්තමාන දේශපාලකයාගේ දේශපාලන බලපරාක්‍රමය යි. අතීතයේ මෙන් ම වර්තමාන දේශපාලකයාගේ ද මෙවන් රඟපෑම් නිරන්තරයෙන් දක්නට ලැබෙන්නකි. වර්තමානයේ ඕනෑ ම දූෂණ, වංචා, මිනීමැරුම්, මතු නොව සිය බලය පවත්වාගෙන යාම සඳහා කෝටි ප්‍රකෝටි ගණන් ගෙවන්නට දේශපාලකයෝ පසුබට නොවෙති.

මුළා කිරීම පශ්චාත් නූතනවාදී සාමාජයේ ප්‍රවණතාව යි. මුළා කිරීමකින් තොර ව කිසිවක් සමාජයේ නොපවතී. මෙය බහුල ව දක්නට ලැබෙන්නේ දේශපාලනයේ ය. දේශපාලකයා සිය පැවැත්ම උදෙසා සත්‍ය වසන් කර බොරු මවාපෑම් ඉදිරිපත් කරයි. මෙවන් අවස්ථා බොහොමයක් මෙම නවකතාව ඔස්සේ නවකතාකරුවා විවරණය කරන අතර පානදුරාවාදය ද ඉන් එක් අවස්ථාවකි. බෞද්ධාගමේ පුනර්ජීවනය උදෙසා ක්‍රියාත්මක වූ පානදුරාවාදය පැවැත්වීම උදෙසා අනුග්‍රහය ලබා දෙන්නේ අරක්කු රේන්ද ව්‍යාපාරිකයන් ය.

> "එක් පසෙක ගුණානන්ද හිමියන්ටත් අනෙක් පස සිටි ඩේවිඩ් ද සිල්වා පාදිලි තුමන්ටත් අමතරව තවත් සම්භාවනීය අමුත්තන් කීප දෙනෙක් වෙනුවෙන් වේදිකාවේ කොනක අසුන් පනවා තිබිණ. ගුණානන්ද හිමියන් තම අදහස් ප්‍රකාශ අතර අන්දිරිස්ගේ ඇහැ ගියේ ඒ ආරාධිතයන් වෙතය. ඒ සමඟ ම තමා දන්නා කිසිවකු හඳුනාගත්තක් මෙන් ඔහු තිගස්සුණේ ය. ඒ සමඟ මීට අවුරුදු හතරකට විතර ඉහත දවසක අස්ස කරත්තයක දූවිලි අතරින් මතු වුණු ආඩම්බර මිනිහෙකුගේ මතකයක් ඔහුගේ ඇටමිදුළු සසල කළේය. එසේම දාඩිය මිශ්‍ර මුඩු ගඳ වළකමින් නාස් පුඩු හකුළාගත් මිනිහෙකුගේ රුවක් ඔහුගේ හදවතේ ඇඳුණේය"

ඉතිහාසයේ සිදු වූ මෙම අවස්ථාව කතුවරයා ව්‍යාජ අතීත සමාජය හෙළි කරන අතරතුර ම පෙන්වා දෙන්නේ පශ්චාත් නූතනවාදී සමාජයේ ඊනියා ජාතිකවාදීන් ජාතික චින්තකයන් සහ ඊනියා බෞද්ධයෝ එන්. පී. ඕ. කුමන්ත්‍රණකරුවෝගේ ක්‍රියා නොවේ ද? පශ්චාත් යථාර්ථවාදී නවකතාවේ කාලය හා අවකාශය මෙමගින් විවරණය කරයි.

ධනපති සමාජයක අනුකාරකවාදී යටත්විජිත මානසිකත්වය අන්දිරිස් හා ඇල්ෆ්‍රඩ් මගින් දක්වා ඇත. මොවුන්


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දෙදෙනාගේ බටහිර අනුකාරකවාදී බව නවකතාවේ අවසන් පිටු කිහිපය මගින් හෙළි වේ. ඉංග්‍රිසි යටත්විජිත සමය ඇතුළත ධනේශ්වර සමාජයේ මිනිසුන් කෙතරම් බටහිර අනුකරකවාදී ව කටයුතු කළේ ද යන්න ඔවුන්ගේ සිතුවිලිවලින් මනා ව ගම්‍යමාන වේ. අන්දිරිස් හා ඇල්ෆ්‍රඩ් අතර සිදු වන ලියුම් හුවමාරුවේ දී ඔවුන් දෙදෙනාගේ බටහිර අනුකාරකවාදී බව නිරූපණය වන උච්චත ම අවස්ථාව යි.

තම පියාගේ මේ අරක්කු යෝජනා පිළිබඳ ගැන ඇල්ෆ්‍රඩ් කිසිම වේලාවක කිසිම ප්‍රතිචාරයක් නොදැක් වූ තම පියාගේ ඉහළ සමාජය සහ ඉංග්‍රිසි ආණ්ඩුව පිළිබඳ සඳහන් කළ ප්‍රතිචාර දැක්වූයේ හදපිරි උද්යෝගයකින් යුතුව ය. වරක් සොලමන් බණ්ඩාරනායක මහ මුදලි ගැන අන්දිරිස් ලීනා ලවා ඔහුට මෙසේ ලියා යැව්වේ ය.

> "කෙතරම් ගාම්භිර මිනිහෙක් වුණත් මහමුදලි බණ්ඩාරනායක ඉංග්‍රිසි ආණ්ඩුව ළඟ දණින් වැටෙන්නේ පොඩි ළමයෙකු වගේ ය. උන්වහන්සේගේ මේ තේජවන්ත වලව්ව පිරී තිබෙන්නේ ඊට ප්‍රතිචාර වශයෙන් ඉංග්‍රිසි ආණ්ඩුවෙන් ලැබූ අනේක නම්බුනාම සහ ගෞරව බහුනාමවලිනි" (එම, 2014:276).

මෙවන් අවස්ථා නිරූපණය කිරීම මගින් පුද්ගලයන්ගේ බටහිර අනුකාරකභාවය පෙන්නුම් කරන අතර මෙම නවකතාවේ ප්‍රධාන චරිතය වූ අන්දිරිස් නැගී එන ධනපති පන්තියේ ධනේශ්වර සමාජයේ පුරුක වන අතර ඔවුන් අනාගතයේ දී ශ්‍රී ලාංකේය දේශපාලනය හසුරුවන්නෝ බව මෙම නවකතාවෙන් පෙන්වා දෙන්නකි. ඒ බව ඇල්ෆ්‍රඩ් සිය පියාට එවන ලිපිය මඟින් තහවුරු කෙරේ.

ඓතිහාසික සිද්ධියක් පදනම් කොටගත් මෙම නවකතාව මගින් වර්තමානයට වඩා අතීතය පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඇති බව පෙනී යයි.

පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ ඇතුළත් තවත් කෘතියක් ලෙස මහා රාවණ හඳුන්වා දිය හැකි අතර මෙය දිනපොතෙ ඇසුරු කර ලියන ලද නවකතා ප්‍රවර්ගයට ඇතුලත් වේ. මෙම ශෛලිය ලෝක ප්‍රබන්ධ සාහිත්‍යයේ ඉපැරණි ආඛ්‍යාන ශෛලියක් බවත් ලෝක ප්‍රකට නවකතාකරුවන් මෙම ක්‍රමය භාවිත කර ඇති අතර බවත් සඳහන් ය (ද සිල්වා, 2019:401). බහු ශාබ්දික තේමාවන්ගෙන් යුත් මෙම නවකාතාව දිනපොතක දැක්වෙන ආකාරයට ප්‍රථම සටහන, දෙවැනි සටහන, තුන්වන සටහන ආදි වශයෙන් විසිතුන් වන සටහන දක්වා ඇත. නවකතාව අවසන් වන්නේ,

> "මෙතෙක් මා දිනපොතේ ලියු සටහන් පිටු ගණන එපමණයි. මම චරිත හා සිද්ධි නැවතත් පරිකල්පනය කර ප්‍රබන්ධයන් ලියන්නට සටහනක් පිළියෙල කරන්නට ලක ලෑස්ති වුණා" (පෙරේරා, 2015:220).

මෙහි එන මහා රාවණ, රාවණ අවධියේ එක ම බලවතා වේ. ඔහුට විරුද්ධ වන්නවුන්ට හිමිවනුයේ මරණය පමණි. එසේ වුව ද අසීමිත බලාධිකාරය තාවකාලික වූවක් බව සිතිය හැකි ය.

නවකතාව ආරාම්භ වන්නේ ලක්ෂ්මන් නැමැති නවකතාවේ ප්‍රධාන චරිතය නිදහස් සුවය පතා ළඟා වන යුනිවර්සල් එස්ටේට් ප්‍රදේශය පිළිබඳ විස්තරයක් කරන අන්දමිනි. එය අද්භූතජනක පෙදෙසක් සේ වර්ණිත ය. එහි දී ගුප්ත බොහෝ දෑ දැකිය හැකි ය. පාඨකයාට සියුම් සන්ත්‍රාසයක් කුතුහලයක් ඇති කරව යි. දිනක් ලක්ෂ්මන් බර්ටිගේ මෝටර් රථයෙන් කඳු පල්ලම් පසු කරමින් කාරය පදවද්දී හිටිහැටියේ ම කාරය නතර වේ. එවිට ම වේගයෙන් එන රථයෙන් පැමිණෙනුයේ මහා රාවණ ය. ඔහු තමාගේ නිවසට පැමිණෙන ලෙස ලක්ෂ්මන්ට ආරාධනා කරන අතර එහි දී ඔවුන් සංවාදයක නිරත වේ. ඔවුන්ගේ සංවාද ක්‍රමයෙන් ඇරඹෙද්දී අභිරහස් ජනක අද්භූත පෙදෙසකට මන්දිරයකට ඇතුළු වුවාක් හැගිමක් පාඨකයාට දැනේ.

> "අද්භූත කඳුවැටියක් ඔහු එසේ කියා මා දෙස බැලුවා"
> "සමහර වෙලාවට කිසියම් මන්දිරයක වහලක් පෙනෙනවා"
> "ඒක රාවණා සනුහරේ මායාවක්. තමන් කවදා හරි මේ පැත්තේ ජීවත් වෙලා තිබෙනවා ඔහු ගත් කටටම කීය."
> ඔහේ ආත්ම ගණනකට ඉහත දුනු දිය විද්ද මිනිහෙක් වෙලා හිටිය නේද? අර හනුමන්තාගේ සේනාවට විද්ද විස කවපු හිතල මතකද?
> "ඇයි මට එහෙම හිතුණේ තමුසේ ධනුද්ධරයෙක්, විදිමේ ශූරයෙක් මට හිතෙන දේ වැරදෙන්න බෑ. ගොයියෝ බලනවා තමුසෙගේ දකුණු උරහිස මත තවමත් කැළැක් තිබෙනවා නේ ද කොහොම වුනත් උඹ අපේ වංසේ එකෙක්."
> "ඔහු මා දෙස දයාර්ද බැල්මක් හෙලමින් කීවා. කෙසේ වුවත් මගේ දකුණු උරහිස මත කැළලක් තිබුණා" (පෙරේරා, 2015:32-33)

මෙලෙස ලක්ෂ්මන් මහා රාවණ හමු වීම ම පාඨක සිත් කුහුලින් පුරවා දමන අවස්ථාවකි. එහි දී හමු වන වේටර්වරයා ද අනුන්ගේ සිත් කියවීමට දන්නා අද්භූත ජනක මායාකාරයෙකු වැනි ය. ඔහු ක්‍රියා කරනුයේ මැජික්කරුවෙකු මෙන් ය.

> "හෙනහුරෙකු සේ පැමිණි වේටර්වරයා මේසය මත දුම් දමන බඳුන් තබන්නට පටන් ගත්තා. මම වහා ඕපා දූප පින්තූර බැලිල්ල පසෙක දමා මේසය අසළට විත් අසුන් ගත්තා. සර්ගේ නෝනා කැමති දැල්ලෝ ස්ටුව ඔන්න තියෙනවා. මම දන්නවා සර් මොනවා තිබුණත් මුරුංගා කොළවලින් තෙල් දාපු පරිප්පු හොද්දට කැමති නේ. අපේ කෝකියෝ කෑම හදන්නේ දිව්‍ය ඥානයෙන්.
>
> මම මේ කතා හා කෙරුවාව අසා මවිතයට පත් වුණා. මගේ බිරිඳ හෝටලයකට ගිය හොත් මිනුවේ දැල්ලෝ ස්ටුව බව මම සක්සුදක් සේ දන්නවා. මට මෙය ජේනකාරයින් සිටින බංගලාවක් සේ දැනුනා.


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මට ලන්ඩන්වල මිනි ඔළු එල්ලා තිබූ යන්ත්‍ර මන්ත්‍ර කාරයින්ගේ වීදියේ ගිය දිනය සිහියට ආවා"ග

"සර් ලුණුවිල මාලුව කාලා තියෙනවද? රාවණ රජ්ජුරුවෝත් සුබ සිහින දකින්ඩ කෑවේ ලුණුවිල මාලුව. ලුණුවිල ලැබුණ පලියට උයල වැඩක් නෑ. පුරාතන කෑම වට්ටෝරුවක් අනුව උයන්න ඕන. මේ පළාත්වල ඉන්න රාවණ පරම්පරාවෙන් පැවත එන උන් ඕක දන්නව. සර් කාල ම බලන්නකෝ අද රාත්‍රිය සිහින දකින සුන්දර රාත්‍රියක් වේවි. රාවණ උන්නාන්සේ සීතා ගැන ඒ විදිහට හීන බල සතුටු වුණාලු" (පෙරේරා, 2015:37-38).

සෑම නවකතාවකින් ම කිසියම් හෝ තේමාවක් ඍජු හෝ වක්‍ර ව ප්‍රකාශ වේ යැයි ඉදුරා ම ප්‍රකාශ කළ නොහැකි ය. එහෙත් කුමනාකාරයෙන් හෝ ලේඛකයා විසින් යම් සමාජ, දේශපාලන, සංස්කෘතික යථාර්ථයන් වෙත කරනු ලබන දෘෂ්ටිවාදීමය සංජානනිය මැදිහත්කාරක ගුණයක් එම නිර්මාණ මතින් හඳුනා ගැනීමට සත්‍යතාව පවතී. මහා රාවණ නවකතාව තුළ තේමාව හෝ සමකාලීන සමාජ යථාර්ථය මතු වේ. තමාගේ අණසක නොතකා ක්‍රියා කළ කිසිවෙකුටත් මහා රාවණගෙන් කිසිදු ගැලවීමක් නොවී ය. මෙහි මහා රාවණ යනු හමුදා සේවයෙහි වියතු උසස් නිලධාරියෙක් සේ සැලකිය හැකි ය. ඔහු ට විරුද්ධ වන සියලු දෙනාට මරණය හිමි විය. ඔහුගේ එක ම පුතු වූ සුජීස්වරගේ මරණය ම එයට හොඳ ම උදාහරණයකි. පසු ගිය කාල වකවානුවල දී අප රට පැවති භීෂණය හා අවනීතිය රජ වූ අතර සාක්ෂි නොමැති ඝාතනයන් සැඟ වී ගිය අයුරු සිහිපත් වේ. බලවතුන් හමුවේ සාමාන්‍ය ජනතා හඬක් නොනැගූ අයුරු සුජීස්වරගේ මරණය සිදු වූ අයුරින් හඳුනා ගත හැකි ය. මංකඩ පන්සලේ පුලස්ති නායක හාමුරුවෝ පවා මහා රාවණගේ නායකත්වයෙන් සුජීස්වරගෙ ආදාහන කටයුතු හමාර කළේ අන්ධයෙක් ගොළුවෙක් බිහිරෙක් ලෙස ය.

සුජීස්වරගෙ ආදාහන කටයුතුවල දී කිසිවෙක් හඬ නොනගන්නේ සත්‍ය පවසන්වුන්ට අත්වන ඉරණම යුගය විසින් තීරණය කොට තිබූ බැවිනි. එසේ ම මහා රාවණගේ ප්‍රථම බිරිඳ වූ උඩුගල කුමාරි හාමිගේ ඝාතනය සුජීස්වරගේ රූමත් බිරිඳ වූ සෝබා සහීර්ගේ ඝාතනය මෙම පුද්ගල ඝාතනය සඳහා ඇසින් දුටු කිසිදු සාක්ෂියක් නොමැති බැවින් ඒ සඳහා කිසිදු වරදකරුවකු සොයා ගත නො හැකි වේ. සමකාලීන සමාජ දේශපාලන සංකථනයක් යටි පෙළින් මතු වෙමින් සමාජ පරිස්ථිතියෙහි සැබෑ යථාර්ථයන් සත්‍ය හා මායාව මුසු රීතියකින් සකසමින් පශ්චාත් යථාර්ථවාදී නවකතාවේ මං සලකුණු තැබීමට ප්‍රයත්න දරා ඇති බව හඳුනා ගත හැකි ය.

පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ රැගත් නවකතාවක් ලෙස පියල් කාරියවසම් විසින් රචිත වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව නව ප්‍රබන්ධ සාහිත්‍යයේ සුවිශේෂ ආකෘති හැඩතල අත්පත් කරගත් කෘතියක් ලෙස හඳුන්වා දිය හැකි ය. මහේස්ත්‍රාත්වරයෙකුගේ ජීවිතය අළලා රචනා වූ මෙම නවකතාව පශ්චාත් නූතනවාදී දේශපාලනික සමාජය විවරණය කරන අපූරු නවකතාවක් ලෙස හඳුන්ව යි. පශ්චාත් නූතනවාදී දේශපාලන සමාජයක දක්නට ලැබෙන බලාධිකාරියේ ස්වරූපය හා එවැනි සමාජයක හැසිරෙන ගැහැණුන්ගේ හා පිරිමින් ගේ ක්‍රියාකාරකම්, මුදල මත පදනම් වූ මානව සබඳතාවල ද්‍රවශීලී තත්ත්වය ආදී කරුණු රැසක් විවරණය කර ඇත. නවකතාව ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් විකාශය වෙයි.

නවකතාව ආරාම්භයේ දී ම පාඨකයා කුතුහලයෙන් පිරිවීමට සමත් වෙයි. කතකයා වර්තමාන ජීවිතයත් අතීත ජීවිතයත් අතර දෝලනයක් ලෙස මෙම නවකතාව ගලා යන බවක් පෙනී ය යි. වරෙක ඔහු අතීත ජීවිතය සමඟත්, වරෙක් සීතාගේ අතීත ස්මරණ සමඟත්, වරෙක ඔහු වර්තමාන ජීවිතය සමඟ ජීවත් වීම දක්නට ලැබේ. නවකතාවක අඩංගු කාලය හා අවකාශය යන ලක්ෂණය දක්නට ලැබේ. එනම් එක් පරිසරයක සිට තවත් පරිසරයකට ගමන් කිරීම යි. එම කාලය හා අවකාශය මඟින් මෙහි එන සම්මත රීති විමසුමට ලක් කරයි.

අප ජීවත් සමකාලීන දේශපාලන පසුබිම ඉතා ප්‍රචණ්ඩකාරී දේශපාලන පසුබිමකි. එම දේශපාලන පසුබිම ඇතුළත අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ජනතාවගෙන් අසුරා ඇත. මෙම යථාර්ථය මෙම නවකතාව මඟින් හෙළි වේ. මෙහි එන මහේස්ත්‍රාත්වරයා සිය රාජකාරියට අමතර ව කෙටිකතා ලේඛකයකු ද වේ. ඔහු ඒ සඳහා ප්‍රස්තුත කරගනු ලබන අද්දැකීම් වන්නේ සිය මහේස්ත්‍රාත් ජීවිතයේ දී ලැබූ අද්දැකීම් ය. නමුත් ඔහුට අවසානයේ දී සිදු වන්නේ මරණය යි.

"...උඹේ නිබන්ධයට එකතු කරපු හැම විස්තරයක් ම, හැම ලේඛනයක්ම, පිටපත් බලකොටුව ඇතුලෙ තියෙනවා. ඒ වගේම බලකොටුවේ පිට කිසිම තැනක ඒ වගේ ලේඛන තියෙන්න බැරි බවත් උඹ දන්නවනෙ?
"ඇයි බැරි මං මැජිස්ට්‍රේට්... "
"බෑ"
රජීව සිහින් සිනාවක් නගයි. තුනී වන සිගරට් දුම අතරින් මා දෙස බලා සිටියි.
"වෘත්තිය කියන්නේ එකක්. වෘත්තියට අදාලව පරිහරණය කරන ලේඛන ගැන, වෙන වෙන ම දෘෂ්ටි කෝණවලින් බලන එක තව එකක්. අනික බලකොටුව අනුව ඒ විස්තර ඔක්කොම හොඳින් දන්න මනුස්ස ජීවිතයකට, පවතින්න බැහැ."
"දැන් උඹට තියෙන්නේ දුක් විඳ විඳ, ඇද ඇද ඉන්නේ නැතුව එක පාරටම චුත වෙන එක... "
"තහර ඔස්සේ ගමන් ගනිමින් සිටි පත්තෑයා හිස අභ්‍යන්තරයට රිංගා ඇති බව හැඟෙද්දී රජීව නැගිට සාක්කුවෙන් ගත් 9 එම්. එම්. පිස්තෝලය මට පරිත්‍යාග කරයි" (කාරියවසම්, 2009:89).

මෙහි එන රජීව යනු ධනයත්, බලයත් හිමි පුද්ගලයෙකි. ඔහු වෛද්‍යවරයෙකු වුවත් සිය පැවැත්ම උදෙසා දේශපාලනයට ද යොමු ව ඇති ව බව පාඨකයාට දැන ගැනීමට ලැබේ. මහේස්ත්‍රාත්වරයා විසින් හෙළි කිරීමට යන සියලු සිද්ධීන් හා රජීවගේ සම්බන්ධයක් ඇති බැවින් අවසානයේ සිය මිතුරා පවා ඝාතනය කිරීමට සිතන්නේ එබැවිනි. දේශපාලනයේ


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සත්‍ය තතු අනාවරණය කරන ලේඛකයාට සිදු වන්නේ මෙවැනි ඛේදනීය ඉරණමකට මුහුණ දීමට ය. සමකාලීන දේශපාලනයේ තතු අනාවරණය කළ ලසන්ත වික්‍රමතුංග වැනි ලේඛකයන් කිසිවකුත් නොදැනි ම අතුරුදහන් වූ අවස්ථාව හා මේ සිද්ධිය සමපාත නොවේ ද? මෙම තත්ත්වය පශ්චාත් නූතනවාදි දේශපාලනයේ සත්‍යයි.

කතුවරයා පශ්චාත් යථාර්ථවාදි ව මෙම දේශපාලනික තත්ත්ව අනාවරණය කරන්නේ අපූරු සංකේතයක් හරහා ය. යථාර්ථවාදී ලේඛකයා භාවිත නොකළ සංකේත පශ්චාත් යථාර්ථවාදී ලේඛකයා භාවිත කළ බව ද නවකතාවේ ආකෘතික වශයෙන් නව්‍යකරණයක් සඳහා මෙම පශ්චාත් යථාර්ථවාදී සංකල්පය යොදා ගන්නට ඇතැයි සිතිය හැක. ඒ අනුව සමකාලීන දේශපාලනයේ වූ ප්‍රචණ්ඩකාරී ස්වභාවය කතුවරයා හෙළි කරන්නේ “ගැබ්බර කළු එකැස් බැළලියකගෙනි”.

අනිකුත් සමාජීය සංස්ථාවන් අතර විවාහ සංස්ථාවට හිමි වන්නේ ඉතා වැදගත් ස්ථානයකි. පවුල් සංස්ථාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ස්වාමි පුරුෂයා මෙන් ම භාර්යාව යන දෙදෙනාට ම පැවරී ඇත්තේ භාරදූර වූ කර්තව්‍යයන් රාශියකි. එසේ ම එකිනෙකා අවබෝධ කර ගැනීම ද මානුෂික ව ගැටලු දෙස අවධානය යොමු කිරීම ද ආදරයෙන් සෙනෙහසින් සිටීම ද දෙදෙනාගේ ම යහපත සඳහා අවශ්‍ය ය. එහෙත් පුරුෂ මූලික සමාජයක දී බොහෝ විට ස්ත්‍රිය දෙස බැලීමේ දී කාන්තාවක වශයෙන් ඇය ඉමහත් පීඩාවට පත් වේ. බොහෝ විට ඇය ලිංගික ප්‍රචණ්ඩත්වයට පවා පත් විය හැකි ය. මෙලෙස ලිංගික ප්‍රචණ්ඩත්වයට පත් වන ස්ත්‍රියගේ ශෝචනීය ඉරණම රැජින නවකතාව මඟින් හෙළි කරයි.

අවසානයේ වාසුකි නම් වූ තිස්සගේ පෙම්වතියට තිස්සගේ මිය ගිය සිරුර බෙහෙත් කවා ආරක්ෂා කොට ගත් මමියක් ලෙස හමුවේ.

පශ්චාත් යථාර්ථවාදි ලක්ෂණ රැගත් කලා කෘතියක් ලෙස සලකන ‘’රැජින’’ නවකාතාවේ පුරුෂාධිපත්‍ය රජයන සමාජයක ස්ත්‍රී පරපීඩනයෙහි යථාර්ථය ධ්වනිත කෙරෙයි. විවාහක දිවියෙත්, සමාජ දිවියෙත් ලිංගික ප්‍රචණ්ඩත්වය හේතු කොටගෙන ස්ත්‍රිය විඳින කායික මානසික පීඩාව කතුවරයා විසින් මායා යථාර්ථවාදී රීතිය අනුගමනය කරමින් හෙළි කරයි. මායා යථාර්ථවාදය යනු, භව්‍යත්වය හා අභව්‍යත්වය විස්වසනීයත්වය හා අවිස්වසනීයත්වය අතර නව සම්බන්ධයක් ඇති කරමින් යථාර්ථවාදයේ විෂය ක්ෂේත්‍රය තව දුරටත් පුළුල් කිරීම යි (අමරකීර්ති, 2015:219). ඒ අනුව මෙහි එන අනුලා බිසවගේ චිත්තාභ්‍යන්තරයේ හැඟීම් විවරණය කරන්නේ භව්‍යත්වය හා අභව්‍යත්වයත් විස්වසනීයත්වය හා අවිස්වසනීයත්වය පෙන්නුම් කරමිනි. ඇයට අහිමි වුණ ආදරය නැවත තිස්ස නම් පුරුෂයෙකුගෙන් ලැබීමෙන් පසු ඇයගේ සිත තුළ පැවති උද්දාමය පෙන්නුම් කරන්නේ, මාලුවන් හා සමඟ කතා කරන අවස්ථාව හා සබැඳෙමිනි. යථාර්ථවාදී නවකතාකරුවා සිත තුළ පවතින හැඟීම් යථාර්ථවාදී ව ප්‍රකාශ කිරීමේ දී පශ්චාත් යථාර්ථවාදී නවකතාකරුවා එය මායාව හා යථාර්ථවාදී අතර සිට ප්‍රකාශ කරයි.

> “උඟ ඇසුවේ වෙන කිසිවක් නොව අර ඔටු කිරි සහ මී පැණි මිශ්‍ර කළ නාන ඔරුවේ තකහනියේ ම සිද්ධ වූ මධු සමය කොහොමදැයි කියාය. එයට පිළිතුරු වශයෙන් “මහ වලත්ත ලූලෙක්” යැයි කියා ඇය ආදරයෙන් උගේ කට නොරිදෙන්නට මිරිකුවත් ඇය වැඩිපුර ම කැමැත්තෙන් උත්තර දුන්නේ ඒ ප්‍රශ්නයට බව හැම මාළුවෙක් ම තේරුම් ගත්හ” (මඩවල, 216:177).

ස්ත්‍රිත්වය පදනම් කොට ගෙන කාන්තාව පුරුෂ පාර්ශ්වයේ කෙළි බඩුවක් බවට පත් වෙයි. ඇයගෙන් තම කායික අවශ්‍යතා ඉටු කර ගැනීමට පෙලඹීම සාම්ප්‍රදායික සමාජයක බහුල ව දක්නට ලැබෙන සංසිද්ධියකි. බොහෝ විට කාන්තාව ගැරහුම් ලබන්නේත් සුපුරුදු ස්ත්‍රිත්වය පදනම් කොට ගෙන ය. එබැවින් ඇයට උරුම වන්නේ පීඩනය පමණි. මෙය ස්ත්‍රිත්වය හා බැඳුණු ඛේදණීය තත්ත්වය යි. නවකතාකරුවා එවන් සිද්ධි සමුදායක් අනුලා යන චරිතය හා මිත්තා යන චරිතය ඔස්සේ ගෙන එනු ලබයි. අනුලා මහලු වියේ පසු වන මහානාග රජුගේ හා දහහත් වියේ පසුවන කුඩා තිස්ස රජුගේ ලිංගික හිංසනයට පත් වන චරිතය යි. ඇය දහ තුන් වියේ දී රජ මාළිගයට පැමිණෙන්නේ මහානාග රජුගේ බිසව ලෙස ය. නමුත් රජුගේ දැඩි කාමුකත්වය හේතුවෙන් ඇය ඔහුගේ ලිංගික හිංසනයට භාජනය වේ.

මේ ආකාරයට පුරුෂාධිපත්‍යය රජයන සමාජයක ස්ත්‍රියට හිමි වන අවාසනාවන්ත ඉරණම කතුවරයා යථාර්ථවාදී ව හා මායා යථාර්ථවාදී ව ගෙන හැර දක්වා ඇත. ලිංගික අතවරයට ලක්වන ස්ත්‍රියකගේ කායික, මානසික පීඩනය හා එහි චරිතය යථාර්ථය වෙසෙසින් පසක් කරවන රැජින නවකතාව මඟින්, ස්ත්‍රිය සමාජයෙහි කුමන තත්ත්වයක් නිරූපණය කළ ද ස්ත්‍රීත්වය හේතු කොටගෙන ඇයට නියත වශයෙන් ම පීඩනය උරුම වන බවත්, ස්ත්‍රිය යනු ආදරය උරුම කොට ගත් අයෙකු බැවින් කුමන තත්ත්වයේ සිටිය දී වුව ඇය ආදරය, සෙනෙහස නිරන්තරයෙන් සොයන්නට උත්සුක වන බවත් හෙළි කරයි. මෙම කරුණු පදනම් කරගෙන කතුවරයා මෙවන් අවස්ථා නිරූපණය කිරීම මඟින් ස්ත්‍රිත්වය පදනම් කොට ගෙන කාන්තාව කෙතරම් පීඩනයට ලක් වන්නේ දැයි උක්ත ව දැක් වූ නවකතා ද්විත්වයෙන් ම හෙළි කරන්නකි. මෙම නවකතාවල විශේෂත්වය වන්නේ එම කරුණු පශ්චාත් යථාර්ථවාදී රීතීන් උපයෝගී කොට ගෙන ඉදිරිපත් කර ඇති ආකාරය යි. කතුවරයා කුමන රීතියක් භාවිත කොට මෙම කරුණු අනාවරණය කළ ද ඒ සෑම කරුණකින් ම හෙළි කතුවරයාට යථාර්ථවාදය අත් නොහැරිය නො හැකි බව යි.

පවුල් සංස්ථාව ඇතුළත ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වන කාන්තා ගැටලු පිළිබඳ වෙනස් ම දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කළ නවකතාවක් ලෙස මොහාන් රාජ් මඩවල විසින් රචිත ආදරණීය වික්ටෝරියා නවකතාව හඳුන්වා දිය හැකි ය. විවාහ දිවියේත් සමාජයේත් කාන්තාව මුහුණ දෙන අර්බුධකාරී තත්ත්වය පිළිබඳ ව බොහෝ ලේඛක ලේඛිකාවන් අවධානය යොමු කර ඇති අතර මෙහි දී විග්‍රහයට ලක් වන්නේ වික්ටෝරියා නම් කාන්තාව ධනේශ්වර සංස්කෘතියට


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ලක් ව ගෘහස්ථයේ දී ප්‍රචණ්ඩත්යවට ලක් වන ආකාරය යි.

පුරුෂාධිපත්‍යය රජයන සමාජයක ස්ත්‍රී පීඩනය ගෘහස්ථයේ දී බිරිඳට පමණක් නොවන බව වික්ටෝරියා නම් කාන්තාව ඔස්සේ ගෙන එන්නකි. වික්ටෝරියා යනු මෙම නවකතාවේ ප්‍රධාන චරිතය වන අන්දිරිස්ගේ දියණිය යි. අද ගොවියකුගේ පුත්‍රයෙක් වූ අන්දිරිස් සාමෙල් අරක්කු පීප්ප වෙළෙන්දෙකු ඔස්සේ අරක්කු රේන්ද ව්‍යාපාරයකු බවට පත් වන සමාජයේ ඉහළ තත්ත්වයක් හිමි කරගෙන සිටින ධනේශ්වර සංස්කෘතියේ සංකේතය යි. එහෙයින් ඔහු ධනේශ්වර සංස්කෘතියට උචිත පරිදි ජීවත් වීමට නිරන්තරයෙන් උත්සහ කළ ආකාරයක් දක්නට ලැබේ. ඒ අනුව අන්දිරිස් ධනේශ්වර සංස්කෘතිය ඇතුළත තමාට නොමැති තත්ත්වයන් ලබා ගැනීම උදෙසා සිය දියණිය පවා ද පීඩනයට ලක් වන මෙම ලක් වන ආකාරය මෙම නවකතාවෙන් අනාවරණය වේ.

ධනේශ්වර සංස්කෘතිය කෲර බව විදහා දක්වන බොහෝ යථාර්ථවාදී නිර්මාණ මඟින් ධනේශ්වර සංස්කෘතිය නම් මරු කතරෙහි සිය අභිමතාර්ථ සාධනාපේක්ෂාවෙන් ප්‍රේරනය වන ස්ත්‍රියගේ හෝ පුරුෂයාගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරූපණය වන්නකි. අන්දිරිස් ද එවන් චරිතයක් ලෙස තමාට නොමැති සමාජ තත්ත්වයක් උදෙසා සිය දියණිය වෛද්‍යවරයෙකුට පාවා දෙයි. එයින් ධනේශ්වර සංස්කෘතියෙන් පීඩා විඳින ඇය සිය පියා ගෙන එන යෝජනාවට කැමැත්තක් දක්වන්නේ එබැවිනි. ධනේශ්වර සංස්කෘතියෙන් ස්ත්‍රිය වෙත හෙළන පීඩනය වික්ටෝරියා මඟින් හෙළි වේ.

> “කොහොමෙ වුනත් පළමු වර දෙවන වර එනවාට වඩා තෙවන වර එන විට වැහැරී සිටියා ය. එහෙත් අර ශූන්‍ය හැඟීම කිසි වෙනසක් නොවී ය. ඇය සිව්වෙනි වර නොපැමිණි විට තවත් වැහැරී සිටි ඇයගෙන් තවත් සඟවාගෙන නොසිට ඇයි දැයි විමසන්නට ලීනාට සිද්ධ වුණේය.

වික්ටෝරියා එයට උත්තර දුන්නේ එසේ ය. එහෙත් එසේ කියන විට ඇය හුස්ම ගන්නා ශබ්දය බඹ ගානක් ඈතට ඇසුණේ ය.

> දැන් දරුවෙක් ගැන හිතන්න ඕන කාලේ
> ලීනා එසේ කීවේ වික්ටෝරියාගේ අවධානය වෙනතක යොමු කරනු පිණිස ය. එහෙත් වික්ටෝරියා අර පරණ වචන දෙක නැවත පුනරුච්චාරණය කළා ය.
> මට මහන්සියි” (මඩවල, 2014:14).

ඇය ධනේශ්වර සංස්කෘතියට දක්වන අකමැත්ත “මට මහන්සියි” යන පදයෙන් හෙළි කරන බව නවකතාවෙන් අනාවරණය වේ. එමගින් කතුවරයා පාඨකයා හමුවට ගෙන ඒමට උත්සහ කරන්නේ ධනේශ්වර සංස්කෘතියකට මැදි ව පීඩනයට පත් වන ස්ත්‍රිය යි. ඇයගේ සිතුම් පැතුම් මෙවැනි තත්ත්වයන් ඔස්සේ වියැකී යන බව මෙමගින් හෙළි කොට ඇත.

ස්ත්‍රිය යනු හැඟීම් උරුම කොට ගත් අයෙකි. ඇය තමා හා වෙසෙන පුරුෂයාට අවංකව ම ආදරය කරන්නී ය. තමා ආදරය කරන පුරුෂයා වෙනත් අයෙකු සමඟ සම්බන්ධතා පැවැත්වීම දැකීම හේතුවෙන් ඇයගේ සිතේ බොහෝ ව්‍යාකූලතා ඇති වේ . ඇයට එය දරා ගත නොහැකි ය. මේ බව මෙහි එන එංගලතීනාගේ චරිතයේ හෙළි වේ. ඇය සම්බන්ධතා පැවැත් වූ අන්දිරිස් තම දියණිය සමඟ සම්බන්ධතා පවත්වන බව දැන ගැනීමෙන් පසු ඇය සිය ජීවිතය විනාශ කර ගැනීමට සිතන්නේ එබැවිනි.

> “ඔවුන් ඇත් මැත් කරමින් අන්දිරිස් කාමරයේ ඇතුළට හිස පොවා බැලුවේ ය. එවිට ඔහුට දැක ගත හැකි වූයේ කාමරයේ ඉහළ මුඳුන් ලීයේ සිට පහළට ඇදී ආ ලණු පොටක කෙළවර හැඟීම් රහිත ව එල්ලී තිබූ එංගල්තීනාගේ ප්‍රාණ රහිත සිරුර ය” (මඩවල, 2014:155).

මේ ආකාරයට ස්ත්‍රීත්වය හා බැඳුණු ඛේදනීය තත්ත්වයන් විවාහ සංස්ථාව, ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වෙනත් සමාජීය කාරණාවන් අරබයා සිංහල නවකතාකරුවාගේ අවධානයට විවිධ අයුරින් යොමු ව තිබූ අයුරු ඉහත කරුණු මඟින් අනාවරණය වේ. විවිධාකාර වූ සමාජ බලවේග හමුවේ මෙන් ම හුදු ස්ත්‍රීත්වය හේතු කොට ගෙන ද බොහෝ කාන්තාවන් ජීවිතයෙහි ආගාධ පක්ෂය වෙත ඇද වැටෙන අයුරු ද මෙම නවකතා මඟින් යථාර්ථවාදී ව ඉදිරිපත් කොට ඇත. එමෙන් ම ආර්ථික තත්ත්වයන්, පුරුෂයාධිපත්‍ය හා ලිංගික ප්‍රචණ්ඩත්වය, පුරුෂයන්ගේ ක්‍රියාකාරකම් යන බොහෝ හේතු පදනම් කොට ගෙන කාන්තාව ගෘහස්ථයේ මෙන් ම ඉන් පිටත දීත් අසරණභාවයට පත් වන බව මේ සියලු නවකතා මඟින් අනාවරණය කර ගත හැකි ය.

## නිගමනය

අද්‍යතන සිංහල නවකතාව යනු සාම්ප්‍රදායික මිනුම් දඬුවලින් මැනිය නොහැකි සාම්ප්‍රදායික කඩයිම් සමතික්‍රමණය කරන සාහිත්‍යාංගයකි. ඒ අනුව අද්‍යතන සිංහල නවකතාව ආකෘතික වශයෙන් හා තේමාත්මක වශයෙන් නව්‍ය වූ විශේෂ ලක්ෂණ රැසක් පෙන්නුම් කරයි. මායා යථාර්ථවාදී, අධියථාර්ථවාදී මෙන් ම පශ්චාත් නූතනවාදී ලක්ෂණ එම අද්‍යතන සිංහල නවකතාවේ දක්නට ලැබෙන ලක්ෂණ වේ. මෙම ලක්ෂණ අඩංගු සංකල්පය පොදුවේ පශ්චාත් යථාර්ථවාදී සංකල්පය ලෙස හඳුන්වයි. බටහිර සාහිත්‍යයේ නිරූපිත මෙම සංකල්පය සිංහල නවකතාවේ මුල් ම වරට දක්නට ලැබුණේ 1981 දී සයිමන් නවගත්තේගම විසින් රචිත ‘සංසාරාරණ්‍යයේ දඩයක්කාරයා’ නම් නවකතාවෙහි ය. ඉන් පසු මෙම සංකල්පය සිංහල නවකතාවේ වරින් වර දක්නට ලැබුණු අතර අද්‍යතන සිංහල නවකතාව වන විට නූතන නවකතාකරුවෝ බහුල ව ම මෙම සංකල්පය සිය නිර්මාණ උදෙසා දායක කරගත් බවක් පෙනී යයි. අද්‍යතන සිංහල නවකතාකරුවා මෙම සංකල්පය යොදා ගෙන මිනිස් ජීවිතය හා ඔහු වටා බැඳී පවතින සමාජයේ තතු ප්‍රතිනිර්මාණය කර ඇත. ඒ අනුව අද්‍යතන සිංහල නවකතාව සඳහා පශ්චාත් යථාර්ථවාදී සංකල්පය යොදා ගැනීමේ දී නවකතාකරුවාගේ මුඛ්‍ය අරමුණ වන සමාජ යථාර්ථය නිරූපණය කිරීම යන අභිමතාර්ථය සාධනයෙහිලා මෙම සංකල්පය සාර්ථක ව


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

යොදාගත හැකි බවත් එම රීතිය යථාර්ථවාදී රීතියේ ම තවත් දිගුවක් බවත් හඳුනා ගත හැකි විය.

## පරිශීලිත මූලාශ්‍රය

### ග්‍රන්ථ


අමරකීර්ති, ලියනගේ (2015) අමුතු කතාව: පශ්චාත්-යථාර්ථවාදී ප්‍රබන්ධ කතාවක් වෙත: ආඛ්‍යාන න්‍යායික රචනා, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

අලවත්ත, ජේ., කුමාරසිංහ, කේ. සහ ගුණරත්න, ඩී.කේ. (2015) ත්‍රිමාණ කියවීමක්, නුගේගොඩ: බිසෝ ප්‍රකාශන.

ඉලයප්ආරච්චි, එරික් (2005) විචාර පත්‍රිකා, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කාරියවසම් පියල් (2010) වීදුරු කුඩු කැවුණු කලෙක, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ගම්ලත්, සුචරිත (2005) ප්‍රතිගාමී පශ්චාත් නූතනවාදය, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ජයතිලක, කේ. (1969) නූතන සිංහල නවකතාවට සංස්කෘතික පසුබිම, කොළඹ 12: ප්‍රදීප ප්‍රකාශකයෝ.

ජයවර්ධන කුමාරි (2006) සොක්කන් ලොක්කන් වූ වගයි, කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය සහ සංජීව පොත් ප්‍රකාශකයෝ.

තිලකරත්න, මිණිවන් පී. (1969) රුසියානු සාහිත්‍ය හා වර්තමාන සිංහල නවකතාව හා කෙටිකතාව, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නන්දුල, අනූප (2011) පශ්චාත් -නූතනත්වය, රත්මලාන: ශ්‍රී ලංකා පෙරටුගාමී පක්ෂය.

නවගත්තේගම, සයිමන් (2004) සාහිත්‍ය සමාජවාදය හා කලා විචාරය, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එම (2015) මහා රාවණ නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

එම (2014) ආදරණීය වික්ටෝරියා, නුගේගොඩ: බිසෝ ප්‍රකාශන.

එම (2016) රජින, නුගේගොඩ: බිසෝ ප්‍රකාශන.

මැද්දේගම, උයද ප්‍රශාන්ත (1999) සියවසක සිංහල නවකථා, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එම (1949) සිංහල සාහිත්‍යයේ නැඟීම, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමාරච්චි, සමන් (2017) අප්පච්චි ඇවිත්, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

එම (2015) අසන්ධිමිත්තා, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

සුරවීර, ඒ.වී.(1991) සාහිත්‍ය විචාර ප්‍රදීපිකා, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එම (1990) සම්ප්‍රදාය නිර්මාණය හා විචාරය, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.


### සංස්කරණ


රත්නායක, මහින්ද (2018) 'නූතන සිංහල නවකතාව: ආකෘතික හා තේමා විෂයක නවීනත්වය.' සමන්ත හේරත්, තිලකරත්න කුරුවිට බණ්ඩාර, රෝහිණී පරණවිතාන සහ බුද්ධදාස ගලප්පත්ති (සංස්.) සාහිත්‍යය, රාජ්‍ය සාහිත්‍ය උපදේශක මණ්ඩලය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.



© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දසවැනි කලාපය 2019 දෙසැම්බර් පිටු 71-78
ISSN 1800-1459 eISSN 2386-2041
© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් හෙළි වන සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය පිළිබඳ සංස්කෘතික ස්ත්‍රීවාදී විශ්ලේෂණයක්: අනුරාධා නිල්මිණී, සුහර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳයන්ගේ තෝරාගත් කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙනි

(Female Cultural Oppression Portrayed in Modern Female Poets: A Feminist Analysis on Anuradha Nilmini, Suharshani Dharmarathna and Vipuli Hettiarachchi)

බුද්ධික හේරත්
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ලංකාව
hmbikherath@gmail.com

**සාරසංක්ෂේපය**

ස්ත්‍රීවාදය වූ කලී ගැහැණුන්ගේ දුක්පීඩාවල ප්‍රකාශනයකි. ඒවා ප්‍රදර්ශනය වීමකි. (තිරු චන්ද්‍රන්, 1995:12) නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් ද ස්ත්‍රීන්ගේ දුක් පීඩාවල ප්‍රකාශනයක් නිරූපණය වෙයි. එහි දී විශේෂයෙන් ම නූතන සිංහල කිවිඳියන් ස්ත්‍රීන් ලෙස තමන් අත්විඳින ලද දුක්පීඩාවන් ද ඇතුළු ව සමස්ත ස්ත්‍රීන්ගේ දුක් පීඩාවන් ස්ත්‍රී දෘෂ්ටියෙන් ඉදිරිපත් කිරීමට උත්සහ දරයි. නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍යමය නිර්මාණවලින් පැහැදිලි වන ප්‍රධානතම ධාරණාව වන්නේ ස්ත්‍රීය ස්ත්‍රීත්වය හේතුවෙන් සංස්කෘතිකමය පරිපීඩනයට ලක් ව ඇති බවයි. ස්ත්‍රීයට සොබාදහමින් ස්වභාවික ව උරුම වී ඇති ස්ත්‍රී ලිංගික වෙනස සංස්කෘතිය විසින් ස්ත්‍රී/පුරුෂ සමාජභාවය උපයෝගී කරගෙන පුරුෂ මූලික සංස්කෘතියක් නිර්මාණය කර තිබෙන අතර, එම පුරුෂ මූලික සංස්කෘතිය සහ සංස්කෘතියෙහි අංග වන ආගම, සදාචාරය, සිරිත් විරිත්, විවාහය, අයිතිය පිළිබඳ ක්‍රමය, ආචාර සමාචාර, කර්මාන්ත ආදී සංස්කෘතියෙහි අංග ද ස්ත්‍රීය සංස්කෘතිමය වශයෙන් පීඩාවට ලක්කිරීමට හේතු වී ඇති බව නූතන සිංහල කිවිඳියන් කාව්‍යමය බුහුටිතාවයෙන් සහ රැඩිකල්වාදි ව නිරූපණය කරයි. තවද නූතන සිංහල කිවිඳියන් තම කාව්‍යමය නිර්මාණවලින් ප්‍රකාශ කරන ආකාරයට සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය විසින් ස්ත්‍රීය කායික ව හෝ මානසික ව පරිපීඩනයට ලක්කිරීමට වඩා දෘෂ්ටිවාදිමය පරිපීඩනයට ලක්කිරීමට සමත් වී ඇත. නූතන සිංහල කිවිඳියන් වන අනුරාධා නිල්මිණී, සුහර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳියන්ගේ තෝරාගත් කාව්‍ය නිර්මාණ කිහිපයක් අනුසාරයෙන් සංස්කෘතිය විසින් ස්ත්‍රිය පරිපීඩනයට ලක්වන ආකාරය මෙහි දී අධ්‍යයනයට ලක්වෙයි. ගුණාත්මක පර්යේෂණයක් වන මෙම පර්යේෂණ සඳහා අනුරාධා නිල්මිණී, සුහර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳයන්ගේ තෝරාගත් කාව්‍ය නිර්මාණ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කෙරුණු අතර, ද්විතීය මූලාශ්‍රය ලෙස ස්ත්‍රිවාදය, සංස්කෘතිය සහ සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය, නූතන සිංහල කවිය පිළිබඳ රචනා වී තිබෙන ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි ලේඛන භාවිතයට ගැනිණි.

කේන්ද්‍රීය වචන:සංස්කෘතික ස්ත්‍රීය පරිපීඩනය, ස්ත්‍රී දෘෂ්ටිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පුරුෂ මූලික සංස්කෘතිය

Feminism is an expression of female agony and is exhibiting their oppression.:Thiru Chandran 1995:12) Modern poetic creations of selected female poets also express female agony. Especially, as females, those poets have experienced the oppression and they have developed some form of female ideology in expressing them. The main point of this study is to exemplify that the modern female poets are being culturally oppressed. The difference of femininity, as illustrated in the poetry that is discussed in this study, is that it is inherited naturally and the gender has been created by the patriarchal culture in which religion, customs, marriage, morals are defined on a patriarchal basis. The system of ownership, industries are the incidental elements that subjectivized the woman to suffer culturally as illustrated by the female poets represented here. According to the modern female poets who radically express their views, females suffer physically and mentally than they suffer ideologically. This research studies how the females suffer culturally by investigating the poetry written by Anuradha Nilmini, Suharshani Dharmarathna and Vipuli Hettiarachchi. This study is qualitative in it nature and the selected primary sources by Anuradha Nilmini, Suharshani Dharmarathna and Vipuli Hettiarachchi will be interpreted using modern feminist theories to reach at the above conclusion. The secondary resources of this research will be the literal articles and books that are written under the feminism together with culture critiques and literary criticism etc. It concludes that the above poets express deep notions of female cultural oppression during contemporary times.

Key words: Female cultural oppression, Feminist ideology, Gender roles, Masculine culture

## හැඳින්වීම

නූතන සිංහල කවියෙහි හඳුනා ගැනීමට හැකි කැපී පෙනෙන යුග ප්‍රවණතාවයක් වන්නේ නව සිංහල කිවිඳියන් රාශියක් සිංහල කාව්‍ය ක්ෂේත්‍රය වෙත ආගමනය වී තිබීම යි. තවද යුග කාරක කිවිඳියක වීමට සමත්කම් දක්වන නව කිවිඳියන් රාශියක් ද ඒ අතර සිටියි. අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි, මාලතී කල්පනා ඇම්බ්‍රෝස් ආදී කිවිඳියෝ නූතන සිංහල කිවියෙහි සිටින යුගකාරක කිවිඳියක වීමට සමත්කම් පෙන්වන කිවිඳියෝ වෙති (අමරකීර්ති, 2017). 70 දශකයේ සිංහල කවිය වර්ණවත් කළ මොනිකා රුවන්පතිරණ සිංහල කාව්‍ය ක්ෂේත්‍රයෙහි අපට සිටින එක ම යුගකාරක කිවිඳිය යි. "කලාව ජනතාව උදෙසා ය" යන ජනතාවාදී මතය වැළඳගනිමින්, ස්ත්‍රියක ලෙස තමන් විඳින ලද අත්දැකීම් ද උපයෝගි කර ගෙන තමන් ද ඇතුළු දුක්විඳින පීඩිත පංතියේ ශ්‍රීලාංකේය ස්ත්‍රීය වෙනුවෙන් අඛණ්ඩ ව කවි ලියූ ආරම්භක කිවිඳිය මොනිකා රුවන්පතිරණ යි. "අපි දෙන්නා සහ තවත් කිහිපදෙනෙක්, තහනම් දේසයකින්, අංගුලිමාලගේ සිහින, ඔබ යෙහෙළිය ඇය ගැහැණිය, විසිවසක ශේෂ පත්‍රය, අසත් පත්තිනි දේවතාවි, සිරිපා කවි, අලුත්ම සිහිනය, හිපොක්‍රටීස් සහ රෝගිනිය" යන කාව්‍ය ග්‍රන්ථ 08 ක් රචනා කළ රුවන්පතිරණ කිවිඳිය 1970 දශකයෙන් පසු ව ශ්‍රීලාංකේය සමාජයෙහි විෂම වූ සමාජ සාධක හේතුවෙන් පීඩනයට ලක්වන ස්ත්‍රීන්ගේ පීඩිත අත්දැකීම් ස්ත්‍රී දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කරමින් සිංහල කවිය සුසාධිත සාහිත්‍ය ශානරයක් බවට පත් කිරීමට පුරෝගාමී වූ පළමු සිංහල කිවිඳිය යි. රුවන්පතිරණ කිවිඳියගෙන් අනතුරු ව කවි ලියූ බොහෝ කිවිඳියන් පිරිසක් සිංහල කාව්‍ය ක්ෂේත්‍රයේ සිටිය ද යුග කාරක කිවිඳියක වන්නට කාව්‍යමය බුහුටිකම් පෑ කිවිඳියක අසූව සහ අනූව දශකවල දී හමු නොවේ (අමරකීර්ති, 2017). එහෙත් නූතන සිංහල කිවිඳියන් මොනිකා රුවන්පතිරණ කිවිඳියගේ ගමන් මාර්ගය අනුව ගමන් කරමින් නූතන සිංහල කවිය වස්තුවිෂයික සහ අකෘතික විවිධත්වයෙන් සුසාධිත සාහිත්‍ය ශානරයක් බවට පත් කිරීමට උත්සහ දරමින් සිටියි. ප්‍රේමය, විරහව, පරිසරය, මාතෘත්වය, සමකාලීන සමාජ ගැටළු ආදි විවිධත්වයෙන් යුතු කාව්‍යමය තේමාවන් කාව්‍යකරණයට යොදා ගන්නා නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවල කැපීපෙනෙන ධාරණාව වන්නේ ස්ත්‍රී පරිපීඩනය පිළිබඳ ව ස්ත්‍රී දෘෂ්ටිකෝණයෙන් කාව්‍ය නිර්මාණය කිරීම යි. කවියන්ගේ කාව්‍ය නිර්මාණවලින් කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණ විශේෂිත වන්නේ ද කිවිඳියන් ස්ත්‍රී දෘෂ්ටි කෝණයෙන් ස්ත්‍රී පරිපීඩනය හෘද සංවේදීව ඉදිරිපත් කිරීම හේතුවෙනි. තවද ස්ත්‍රී පරිපීඩනය පිළිබඳ ව කවි ලියූ පළමු සිංහල කිවිඳියන් නූතන යුගයේ සිංහල කිවිඳියන් පමණක් ම නොවේ. මොනිකා රුවන් පතිරණ කිවිඳියගෙන් ආරම්භ වී අසූව සහ අනූව දශකයේ කවි ලියූ සීතා රංජනී, අයිරින් විජේවර්ධන, යමුනා මාලනී පෙරේරා ආදී කිවිඳියන් ද විවිධ වූ සමාජ සාධක හේතුවෙන් පරිපීඩනයට ලක්වන ස්ත්‍රීන්ගේ හෘද වේදනාව පිළිබඳ ව කවි ලියා තිබේ. එහෙත් නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවල පවතින විශේෂත්වය වන්නේ මතුපිටට දර්ශනය නොවන, සියුම් සමාජ, දේශපාලන, සංස්කෘතික, ආර්ථික සාධක හේතුවෙන් ආන්තීකරණයට ලක්වන ස්ත්‍රීන් පිළිබඳ ව ස්ත්‍රියක ලෙස තමන් ලද කම්පනය ද උපයෝගී කරගෙන ස්ත්‍රී දෘෂ්ටියෙන් කාව්‍යකරණයෙහි නිරතවීම යි. අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි නූතන සිංහල කවිය නියෝජනය කරන කිවිඳියන් තිදෙනෙකි. මතුපිටට නොපෙනෙන සංස්කෘතික සාධකවලින් ස්ත්‍රීය පරිපීඩනයට ලක්වන ආකාරය පිළිබඳ ව සවිඥ්ඥාණිකව ඒ පිළිබඳ ව ස්ත්‍රීවාදි දෘෂ්ටිකෝණයෙන් කවි ලිවීම මෙම කිවිඳියන් තිදෙනාගේ විශේෂත්වය යි. මෙම පර්යේෂණයේ දී නූතන සිංහල කිවිඳියන් වන අනුරාධා නිල්මිණි, සුහර්ෂණි ධර්මරත්න සහ විපුලි හෙට්ටිආරච්චි තම කාව්‍ය නිර්මාණවලින් ඉදිරිපත් කරන සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය පිළිබඳ ව සංස්කෘතික ස්ත්‍රී දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කෙරෙයි.

## සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් නූතන සිංහල කිවිඳියන් විසින් රචනා කරන ලද කාව්‍ය නිර්මාණ භාවිත කෙරිණි. එහි දී විශේෂයෙන් ම අනුරාධා නිල්මිණිගේ "වත්සියපත්" (2014), සුහර්ෂණි ධර්මරත්නගේ "සුදුවත ඇඳි කෙකනිය" (2015), විපුලි හෙට්ටිආරච්චිගේ "රූ" (2015) යන කාව්‍ය කෘතිවල තෝරාගත් කාව්‍ය නිර්මාණ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය ලෙස භාවිත කරනු ලැබිණි. මෙම කාව්‍ය ග්‍රන්ථ ත්‍රිත්වය පමණක් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත වන්නේ ස්ත්‍රීය සංස්කෘතික පරිපීඩනයට ලක්වන ආකාරය ගැඹුරින් නිරූපණය වන කාව්‍ය නිර්මාණ මෙම කාව්‍ය ග්‍රන්ථ ත්‍රිත්වයෙහි අන්තර්ගත වීම හේතුවෙනි. ද්විතීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස ස්ත්‍රීවාදය, සංස්කෘතිකය සහ සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය, නූතන සිංහල කවිය පිළිබඳ රචනා වී තිබෙන ග්‍රන්ථ, ලිපිලේඛන, භාවිතයට ගැනිණි.

## පර්යේෂණ ගැටලු

1. නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් හෙළිවන සංස්කෘතිය නැමැති සාධකය ශ්‍රී ලාංකීය ස්ත්‍රීය විෂයෙහි සිදු කරනු ලබන පරිපීඩනයෙහි බලපෑම කෙබඳු ද ?
2. සංස්කෘතිය විසින් නූතන ශ්‍රී ලාංකේය ස්ත්‍රීයට ලබා දී ඇති සමාජ කාරකත්වයෙහි ස්වභාවය කෙබඳු ද ?

## පර්යේෂණ අරමුණු

දියුණු යැයි සම්මත නූතන තාක්ෂණ යුගයේ දී ද සංස්කෘතිය නැමැති සාධකය ස්ත්‍රීය විෂයෙහි බලපැවැත්වෙන ආකාරය පිළිබඳ ව නූතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණ ඇසුරෙන් විමර්ශනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ.

## පර්යේෂණ වැදගත්කම

ස්ත්‍රීවාදය සාහිත්‍ය න්‍යායක් ලෙස සිංහල විචාර ක්ෂේත්‍රයෙහි දීර්ඝ කාලයක් පවතින නමුත්, සාහිත්‍ය නිර්මාණ සමග ස්ත්‍රීවාදය බද්ධකළ ස්ත්‍රීවාදී කියවීම් නූතන සිංහල විචාර ක්ෂේත්‍රයේ දී හමුවන්නේ අල්ප වශයෙනි. තවද නූතන


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සිංහල කිවිඳියන්ගේ කාව්‍යමය භාවිතය පිළිබඳව ද විධිමත් පර්යේෂණයක් මෙතෙක් සිදු වී නොමැත. සිංහල සාහිත්‍ය විචාර ක්ෂේත්‍රයේ පවතින මෙම පර්යේෂණ රික්තය පූරණය කිරීමට මෙම පර්යේෂණය වැදගත් වනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් වූ මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අනුරාධා නිල්මිණිගේ "වත්සියපත්" (2014), සුහර්ෂණී ධර්මරත්නගේ "සුදුවත ඇඳි කෙකනිය" (2015), විපුලි හෙට්ටිආරච්චිගේ "රූ" (2015) යන කාව්‍ය කෘතිවලින් තෝරාගත් කාව්‍ය නිර්මාණ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය ලෙස භාවිත කරනු ලැබී ය. තව ද, ද්විතීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස ස්ත්‍රීවාදය, සංස්කෘතිකය සහ සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය, නූතන සිංහල කවිය පිළිබඳ ව රචනා වී තිබෙන ග්‍රන්ථ, සාහිත්‍ය ලිපිලේඛන (ප්‍රකාශිත) භාවිත කෙරිණි.

## සාකච්ඡාව

ස්ත්‍රීවාදය (Feminism) යනු සමාජයේ සෑම ක්ෂේත්‍රයකදී ම ස්ත්‍රීය වෙත හිමිකොට ඇති අප්‍රධාන බව, සාපේක්ෂ අසමානත්වය හෙවත් වෙනස් කොට සැලකීම හා ඇය ව පරිපීඩනයට හා සූරාකෑමට ලක්කිරීම පිළිබඳ ව සංවේදී හා සවිඥානික වන සහ එම අසමානත්වයන් අප්‍රධාන බව, පීඩනය හා සූරාකෑම දුරුකොට සමාජයේ සෑම අංශයකදී ම පුරුෂයන්ට සමාන සම සාධාරණත්වයක් නිර්මාණය කිරීමේ මූලික අරමුණු සහිත දෘෂ්ටිවාදයකි. (ලියනගේ සහ වලාකුළගේ, 2006:39) එහි දී විශේෂයෙන් ම ලිබරල් ස්ත්‍රීවාදය, සමාජවාදී ස්ත්‍රීවාදය, රැඩිකල් ස්ත්‍රීවාදය, මනෝවිශ්ලේෂණ ස්ත්‍රීවාදය, සාන්දෘෂ්ටිකවාදී ස්ත්‍රීවාදය, පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදය, කලු ජාතික ස්ත්‍රීවාදය ආදී වශයෙන් ස්ත්‍රීවාදය උපන්‍යායන්වලට බෙදී පවති යි. සංස්කෘතික ස්ත්‍රීවාදය ද ස්ත්‍රීවාදයේ තවත් එක් උපන්‍යායකි. සංස්කෘතික ස්ත්‍රීවාදීන්ගේ තර්කය වන්නේ සංස්කෘතිය විසින් කාන්තාව පරිපීඩනයට ලක්කරන බවයි. සංස්කෘතිය වනාහී දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු පුහුණු හා හැකියාවන් අඩංගු වන මිනිසාගේ සමස්ත ජීවන මාර්ගය යි. (Tylor, 1920) දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත්, භාෂාව, විවාහය, අයිතිය පිළිබඳ ව ක්‍රමය, ආචාර සමාචාර, කර්මාන්ත, ඇතුළු සමස්ත භෞතික හා අභෞතික සාධක සියල්ල ම සංස්කෘතියෙහි උපසාධක වේ. සංස්කෘතික ස්ත්‍රීවාදින්ගේ තර්කය වන්නේ සංස්කෘතියෙහි අන්තර්ගත ඉහත සඳහන් කළ සාධක විසින් ස්ත්‍රීය පරිපීඩනයට ලක්කරන බවයි. එහි දී ස්ත්‍රීය හා පුරුෂයා අතර ඇති ජීව විද්‍යාත්මක වෙනස ඉවත දමා සංස්කෘතික සාධක කේන්ද්‍ර කරගෙන නිර්මාණය කර තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රකරගෙන නිර්මාණය කර තිබෙන පුරුෂ මූලික සංස්කෘතිය ස්ත්‍රීය සංස්කෘතිකමය වශයෙන් පරිපීඩනයට ලක්කිරීමට හේතුවන බව සංස්කෘතික ස්ත්‍රීන්වාදීන්ගේ ප්‍රධානතම තර්කය යි.

නූතන සිංහල කිවිඳියන් වන අනුරාධා නිල්මිණි, සුහර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳයන් සංස්කෘතිය මූලික කරගෙන නිර්මාණය වී පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රකරගෙන නිර්මාණය වී තිබෙන්නා වූ පුරුෂ මූලික සමාජය විසින් නූතන ශ්‍රී ලාංකීය ස්ත්‍රීය සංස්කෘතිකමය පරිපීඩනයට ලක්වන ආකාරය කාව්‍යමය බුහුටිතාවයෙන් සහ රැඩිකල්වාදී ව නිරූපණය කරයි. සුහර්ෂණී ධර්මරත්න කිවිඳියගේ "වැලන්ටයින් දවසෙත් අපි රණ්ඩු වුණා" පද්‍ය නිර්මාණය සංස්කෘතිය විසින් නිර්මාණය කර තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුවෙන් ගෘහස්ථ පරිපීඩනයට ලක්වන ස්ත්‍රීයකගේ හෘද විලාපය ඉදිරිපත් කරයි.

'පොඩි චූටිට වෙරස් උණ
රෑ තිස්සෙම ඇඟ තෙමතෙම
හිටයේ ෆිට්එකට බයෙන්
ලොකු චූටිට විභාගේ අද
මං හිටියේ බත් බැඳ බැඳ
ඒ වෙලාවේ චූටි ඇඬුවේ ඇඳුම තෙමන්

චූටිගේ තෙත මාරු කරලා
ලොකුගේ සුදු ගවුම මැදලා
ඉවර කරලා උණ බැලුවම
දන්නෙම නෑ එකසිය ගාණකට නැගලා
චූටි ඇඬුවේ වෙවුල වෙවුලා

එයා හිටියේ රැවුල බබා
උරුවම් බානවත් ඇහුණා
බබා බලන්නට කීවම
එයාට අද යකා වැහුණා
ඒත් අම්මේ මං ඉවසුවා

එයාගේ අම්මා හිටියේ බණ අහ අහා
ටීවී එකටත් වැඳගෙන
"ළමයි බමයි නිදිකරලා
අපි නම් කුඹුරටත් ගියා"
එයා කිව්වේ මට ඇදේට
ඒත් අම්මේ මං ඉවසුවා

මේ සේරම කරන්න මට
තියෙන්නේ අත් දෙකයි කියලා
කිව්වෙත් මං බොහොම හෙමින්
මගේ කරුමෙට ඒක ඇහිලා
"ගෑණු දෙතුන් දෙනෙක් ගන්න
කියලද දැන් මට කියන්නේ"
එයා ඇහුවේ සද්දේ දමලා
"මගේ මොකද"
මාත් කිව්වා
"තමුසේ කියනකම් හිටියේ
මටත් ඕක හිතුනා"
එයා කිව්වේ ඔළුවේ ජෙල් ගාන ගමන්


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඒ වෙලාවේ මතක් වුණෙම
කොටට කොටේ ගවුම ඇඳන්
අවුරුදු පාටියට ඇවිත්
එයා එක්ක මුකුළු කරපු
ජැකී ෂෙරන්

අම්මේ මට යකා වැහුණා
වතුර ජොග්ගුවත් පෙරළුණා
එයා ගියේ කේන්තියෙන්
ලොකු ගියේ බඩගින්නේ
නැන්දම්මත් බුම්මාගෙන
කැවෙත් අද එහා ගෙයින්

ඔෆිස් එකට කෝල් කරලා
බබාට උණ බව කීවම
වැලන්ටයින් සමරනවද
සර්රුත් ඔච්චමට ඇහුවා

ඊයේ ෂෝට් ලිව් දමලා
ගත්ත කමිසේ බෑග් එකේ
දෙන්න හිතෙන්නෙත් නෑ දැන්
අම්මේ මට බනින්නෙපා
වැලන්ටයින් දවසෙත් අපි රණ්ඩු
වුණා'
(ධර්මරත්න, 2015:47).

ධර්මරත්න කිවිඳිය කවිය වෙත එළඹෙන්නේ ස්ත්‍රීන් විසින් දෛනික ව සිදු කළ යුතු යැයි සම්මත වී තිබෙන "ස්ත්‍රී ක්‍රියාකාරකම්" යැයි සංස්කෘතිය විසින් නම් කරන ලද වැඩ රාශියක් ද සමගිනි. දරුවන් රැකබලා ගැනීම, දරුවන් පෝෂණය කිරීම, ගෙදර දෙර කටයුතු කිරීම, ආගමික කටයුතු නෑදෑ හිතවත්කම් පැවැත්වීම ආදී ගෘහාශ්‍රිත කටයුතු කාන්තාවන්ට අයත් වූ ස්ත්‍රී ක්‍රියාකාරකම් වශයෙන් සංස්කෘතිය විසින් ම ස්ත්‍රියට ස්වභාවිකව ම භාරකර තිබේ. තව ද නිවසින් පිටත රැකියා සහ ආදායම් මාර්ගවල නිරතවීම, බාහිර සමාජ සම්බන්ධතා පැවැත්වීම සහ බිරිඳට සහ දරුවන්ට ආරක්ෂාව සැපයීම සංස්කෘතිය විසින් පුරුෂ ක්‍රියාකාරකම් වශයෙන් නම් කරනු ලැබ තිබේ. (CIDA, 1993) මෙලෙස ස්ත්‍රී ක්‍රියාකාරකම් සහ පුරුෂ ක්‍රියාකාරකම් ලෙස සංස්කෘතිය විසින් වැඩ (ගෘහාශ්‍රිත කාර්යයන් සහ සමාජ කාර්යයන්) වර්ග කිරීමට හේතු වී තිබෙන්නේ සංස්කෘතිය විසින් ම නිර්මාණය කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය යි. ස්ත්‍රී පුරුෂ ලිංගික භේදය ඉවත දමා සංස්කෘතිය විසින් නිර්මාණය කරන ලද සමාජ සබඳතාව ස්ත්‍රී පුරුෂ සමාජභාවය යි.

"ජීව විද්‍යාත්මකව ස්ත්‍රියට හා පුරුෂයාට ලැබී ඇති ලිංගික වෙනස මත සමාජය විසින් දීර්ඝ කාලයක් තිස්සේ වෙනස් වූ සමාජ තත්ත්වයන් මෙම දෙපක්ෂය සඳහා නිර්මාණය කර දෙනු ලැබ තිබේ සමාජය හා සංස්කෘතිය විසින් ස්ත්‍රිය හා පුරුෂ වශයෙන් කරනු ලැබ ඇති මෙම බෙදීම සමාජයේ සෑම ස්ථානයකදී ම දක්නට ලැබේ. ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට එකිනෙකට වෙනස් වූ ගති ලක්ෂණ, අනන්‍යතා, හැසිරීම් රටා, භූමිකා සහ වෘත්තීන් පවා සමාජය විසින් නිර්මාණය කරනු ලැබ ඇත. ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට පවරා ඇති එම සමාජ, සංස්කෘතික තත්ත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ලෙස සරලව හැඳින්විය හැකිය". (ලියනගේ සහ වලාකුළගේ, 2006)

ඒ අනුව "ස්ත්‍රී ක්‍රියාකාරකම්" යැයි හඳුන්වන දරුවන් බලා ගැනීම, ගෙදර දෙර වැඩ කටයුතු කිරීම, නෑදෑ හිතවත්කම් පැවැත්වීම, ආගමික කටයුතු සිදුකිරීම ආදී ගෘහාශ්‍රිත කටයුතු කාන්තාවට පවරමින් කාන්තාව පවුල් සත්ත්වයෙක් (Family Animal) ලෙස ස්ථාන ගත කර තිබෙන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යි. සංස්කෘතියෙහි අන්තර්ගත ආගම, විශ්වාස, ඇදහිලි හා සිරිත් විරිත් උපයෝගී කර ගෙන දෘෂ්ටිවාද මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රිය පවුල් සත්ත්වයෙක් ය බවට වන ප්‍රවාදය සමාජයට කාවද්ද තිබේ. ධර්මරත්නගේ "වැලන්ටයින් දවසෙත් අපි රණ්ඩු වුණා" යන පද්‍ය නිර්මාණයේ අභ්‍යන්තර කණිකා මඟින් මතුවන්නේ ගෘහාශ්‍රිත කටයුතු හේතුවෙන් හෙම්බත් වී පරිපීඩනයට ලක් වූ ස්ත්‍රියකගේ හෘද විලාපය යි. තවද මෙම පද්‍ය නිර්මාණය අභ්‍යන්තරයෙන් මතුකරන ආකාරයට ගෘහාශ්‍රිත කටයුතු සිදු කිරීමෙන් ඇති වන කායික, මානසික ආතතිය ස්ත්‍රිය තනිව ම විඳ දරාගත යුතුය. ස්ත්‍රිය හා පුරුෂයා අතර පවත්නා වූ ජීව විද්‍යාත්මක වෙනස සංස්කෘතිය විසින් විශාල කොට විශ්වමය පුරුෂාධිපත්‍යයක් නිර්මාණය කරනු ලැබ තිබෙන බව එඩ්වඩ් විල්සන්ගේ තර්කය යි (කුමාර, 2009:104). මෙහි දී විශ්වමය පුරුෂාධිපත්‍යය නිර්මාණය වීමට හේතු වී තිබෙන්නේ සංස්කෘතිකමය වශයෙන් ස්ත්‍රිය හා පුරුෂයා අර්ථ දක්වා ඇති ආකාරය යි. සංස්කෘතිය, ස්ත්‍රිය හා පුරුෂයා අර්ථ දක්වා ඇති ආකාරය වගුව 1හි දැක්වෙන පරිදි වේ.

ඉහත දළ සටහන නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ පුරුෂයා හැඩිදැඩි, ශක්තිමත්, ඉක්මන් තීරණ ගත හැකි, තාර්කික සහ බුද්ධිමත් පුද්ගලයෙකු ලෙසත්, ස්ත්‍රිය මෘදු මොළොක්, ඉක්මන් තීරණ ගත නොහැකි, ඉක්මනින් සසලවන තැනැත්තියක් ලෙසත් නිරූපණය කර තිබෙන ආකාරය යි. තවද පුරුෂයා සමාජ ප්‍රගමනයට දායක වන නායකයෙකු ලෙසත්, ස්ත්‍රිය පුරුෂයා මත යැපෙන පුරුෂයාට පිටුපසින් ගමන් කරන පුරුෂයාගේ උපභටයෙකු ලෙසත් සංස්කෘතිය විසින් අර්ථකථනය කර තිබේ. පුරුෂයා සමාජයෙහි "නායකයා" ලෙසට නිර්මාණය කර තිබෙන සංස්කෘතික දෘෂ්ටිවාදය හේතුවෙන් පුරුෂයා වටා අසීමාන්තික බලයක් ගොඩ නැගී තිබේ. පුරුෂයා වටා ගොඩනැගී තිබෙන මෙම අසීමාන්තික බලය මූලික කරගෙන ස්ත්‍රිය පුරුෂයාට වඩා බලයෙන් අඩු සහ අප්‍රධාන තැනැත්තියක් බවට සංස්කෘතිය විසින් ස්වභාවීකරණය කර තිබේ. සංස්කෘතිය විසින් ස්වභාවීකරණය කර තිබෙන ස්ත්‍රිය අප්‍රධාන සහ ද්විතීය තැනැත්තියක් බවට වන ප්‍රවාදය ස්ත්‍රීකාරකත්වය ක්ෂය කරමින් ස්ත්‍රී පරිපීඩනයට සෘජුව හේතු වී තිබේ. අනුරාධා නිල්මිණිගේ "සුමනසමන්ගෙන් කොටකෙතන බවලතුන්ට" යන පද්‍ය නිර්මාණය පුරුෂ මූලික සංස්කෘතිය විසින් කාන්තාව පරිපීඩනයට ලක්වන


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 1

| | පුරුෂයා | ස්ත්‍රිය |
|---|---|---|
| i. | ශරීර ශක්තිය හැඩි දැඩි ශක්තිමත් | මුදු මොළොක්, කෝමල, ළාමක |
| ii. | ලිංගික ප්‍රහාරකයා | ලිංගික පීඩිතයා |
| iii. | තාර්කික (Rational) ලෙස සිතන | හැඟීම්බර (Emotional) ලෙස කටයුතු කරන |
| iv. | විශ්ලේෂණකාරි | සංස්ලේශිත |
| v. | ඌනන්නතවාදී ඒකියවාදී | සමස්තය ගැන සිතන, බහුවිධ |
| vi. | පරිසර ආක්‍රමණකාරි | ගහකොළ, සතා සිව්පාවාට කැමති |
| vii. | ද්විකෝටික තාර්කික | ද්විකෝටිකට අකමැති |
| viii. | අධික කෝපය | ඉවසිලිවන්ත භාවය |
| ix. | පහසුවෙන් සසල නොවන | පහසුවෙන් සසල වන |
| x. | නායක, ප්‍රධානියා | කීකරු යටත් වැසියා |

(කුමාර, 2009:6-7)

ආකාරය රැඩිකල්වාදීව නිරූපණය කිරීමට සමත් වෙයි.

‘සුමන සමන්ගෙන්,
කොටකෙතන බවලතුන්ට..

තව එකුන් හද කල්පයක්
දෙව්ලොව සරා
මයිත්රී නාමයෙන්
තුන් ලොවම එකලුකර
නිවාලන්නෙමි
සර්වදාරයේ නැගෙන ගිනි
එතෙක් ඉවසනු මැනේ..
කොටකෙතන නැගණියේ..

සමන් මම, ගම ළගම
අතමානයේ වෙසෙමි
ගමන් යන, එන ගමන්
මෙහි පැමිණි බව දනිමි

බමන්නන් වෙසෙන බිම
ධවල සලුවෙන් වසමි
රවන්නට කාරි නැත
උන් කෝටු මස් කරමි

මුළු දේව සභාවම
ගැස්සිලා මේ ටිකට
කළුතාර දමන්නට
සැරසුණා, මගෙ ඉහළ
දලුදාපු හිනා වහකදුරු
දැන් පත්තිනිට
බලු පුරුස ලිඟු කපා
ගෙනෙමි, මම එක මිටට
අහලගං හත අයිති
සමන්ටයි කිය, කියා
ගහලයින් වැල නොකැඩි
මෙහෙත් ඇවිදින් ගියා
පහළ බැවුම ළගදි
වැදැමහ මග තියා
වහල පිපිරෙන තුරුම
ගින්න අවුළා ගියා

උස-මහත දිග පළල
දුටිමි, දැන සිටින්නෙමි
වස කවන, විස පොවන
තැන් දකිමි, හැදිනෙමි

අසරණව නගන දුක්
අදෝනා අසන්නෙමි
ඇස අරිනු කෙලෙස මතු
බුදු බවම පතන්නෙමි

අතේ සුදු නෙළුම මත
යෝනි මස් විසිරිලා
නැතේ එකලාසයක්
යන්ට උඩුගං බලා
හිතේ සංතාපයන්
පිහි තුඩක අමුණලා
කෙතේ වළලමි, මුලින්
මගෙ ලිගුව ගලවලා..’
(නිල්මිණි, 2014:75)

ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොටකෙතන ප්‍රදේශය සුමනසමන් දෙවියන්ගේ අඩවියට අයත්වන්නා වූ කොටසකි. ශ්‍රී ලාංකේය ජනයා විශ්වාස කරන පරිදි සබරගමු පළාත සුමන සමන් දෙවියන්ගේ අඩවිය යි. ජනසම්මත විශ්වාසය අනුව, සබරගමුව පළාතේ ගහකොළ, සතා සිව්පාවුන් ඇතුළු සමස්ත සබරගමු මිනිසුන්ගේ ආරක්ෂකයා වශයෙන් පෙනී සිටින්නේ සුමන සමන් දෙවියන් ය.

‘සුද්ද ලෙසින් නිති ගත බබලන්නේ
සුද්ද ඇතා පිටවඳ වැඩ ඉන්නේ
බුද්ධ මේ ශාසන දියුණු කරන්නේ
සුද්ද සමන් දෙවියෝය වඩින්නේ
ගොසින් වඳිමු සිරිපා මුනිඳුන්නේ


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සමන් දෙවිඳුවද භාරව ඉන්නේ
සමන් දෙවිඳු මත්තට බුදුවන්නෙ
පද්මේ වඩින්නට පිහිට ලැබෙන්නේ
(පඤ්ඤාලෝක, 1952:191)

ශ්වේත වර්ණයෙන් බබළමින්, ශ්වේත වර්ණයෙන් ම බබළන ඇත්රාජයෙකු පිට වැඩ සිටිමින් ශ්‍රීපාදස්ථානය ඇතුළු සමස්ත සබරගමුවේ ම ප්‍රාණීන් ආරක්ෂා කරන මහා බලවේගය සමන් දෙවියන් බව සබරගමු ජන විශ්වාසය යි. එහෙත් සුමන සමන් දෙවියන් ආරක්ෂකයා වන සබරගමුවේ කොටකෙතනෙහි කාන්තා මිනීමැරුම් ගණනාවක් සිදුවීම ලාංකේය සමාජ මනස්වල තවමත් අමතක නොවන මතකයක් ව තැන්පත් ව පවති යි. කොටකෙතන ප්‍රදේශයේ අඛණ්ඩව ම කාන්තාවන් මරුමුවට පත්කළ ද එකඳු පුරුෂයෙක් හෝ මරණයට පත් කළේ නැත. කොටකෙතන ස්ත්‍රීන් මරණයට පත් කිරීමට මූලික වූයේ පුරුෂයන් මිස ස්ත්‍රීන් නොවේ. සබරගමුව රකිනා සුමන සමන් දෙවියන් ද පුරුෂයෙකි. හෙතෙම කොටකෙතන ස්ත්‍රීන්ගේ මරණයන්ගෙන් කම්පාවට පත් වෙයි. එහෙත් සුමන සමන් දෙව් පුරුෂයාගේ කම්පාව ව්‍යාජ කම්පාවක් බව හැඟෙන්නේ, මතු බුදුබව පතනා සුමන සමන් දේව පුරුෂයාටත් කොටකෙතන ස්ත්‍රීන් පිළිබඳ ව කම්පා වනවා හැර කරන්නට අන් යමක් නොවන බැවිනි.

'තව එකුන් හද්‍ර කල්පයක්
දෙව්ලොව සරා
මයිත්‍රී නාමයෙන්
තුන් ලොවම එකලු කර
නිවාලන්නෙමි
සර්වදාරයේ නැගෙන ගිනි
එතෙක් ඉවසනු මැනේ..
කොටකෙතන නැගණියේ'
(නිල්මිණි, 2014:75)

සුමන සමන් දේව පුරුෂයා කොටකෙතන ස්ත්‍රීන්ගෙන් ඉල්ලීමක් සිදු කරයි. ඒ තමන් බුදුබව ලබා ගන්නා තුරු තවත් එක් හද්‍රකල්පයක් පුරුෂයන් වෙතින් එල්ලවන පීඩනය ඉවසා සිටින ලෙසට යි. සුමන සමන් දේව පුරුෂයාගේ කල්පයක් ඉවසා සිටින්න යැයි කරන ප්‍රකාශය ම පුරුෂ මූලික වෙයි. සුමන සමන් පුරුෂයා කියන්නේ තවත් හද්‍රකල්පයක් යනතුරු පුරුෂ මූලික සංස්කෘතිය විසින් ස්ත්‍රීය මත එල්ලකරනු ලබන පරිපීඩනය අඛණ්ඩව පවතිනු ඇති බවට යි. අනුරාධා නිල්මිණී සුමන සමන්ගෙන්, කොටකෙතන බවලතුන්ට පද්‍ය නිර්මාණයෙන් රැඩිකල්වාදී ව ඉදිරිපත් කරනු ලබන්නේ පුරුෂ මූලික සංස්කෘතිය ස්ත්‍රීන් ව මරා දැමීමට තරම් ප්‍රබල වී ඇති බවට යි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික කරගත් පුරුෂ කේන්ද්‍රීය වූ සංස්කෘතිය මගින් පමණක් නොව සංස්කෘතියෙහි ආනුශාංගික අංග වන ආගම, සිරිත් විරිත්, ඇදහිලි විශ්වාස හේතුවෙන් ද ස්ත්‍රීය සංස්කෘතික පරිපීඩනයට ලක් වෙයි. විපුලි හෙට්ටිආරච්චිගේ 'උ'-වැසියෝ නමින් වන පද්‍ය නිර්මාණය ආගම විසින් ස්ත්‍රිය සංස්කෘතිකමය පරිපීඩනයට ලක්කර ඇති ආකාරය කාව්‍යමය බුහුටි බවින් යුක්ත ව, සියුම් ව ඉදිරිපත් කරයි.

'උ'-වැසියකගෙන් .....

සිව්වණක් පිරිස මැද අපිත් හිටියා පෙරට
පන්සලේ ගම්දෙරේ දනුත් පිඳුවා යසට
ආරාම උයන්වතු සොය සොයා ගොස් නිබඳ
පුරවරේ රූ තිරේ බණත් ඇහුවා අපිම

සංසාරේ හැටි අනේ හැඳින අටලෝ දහම
කැටේ කැඩුවා කඩෙන් ගත්ත අට පිරිකරට
සතර පේරුවේ නෑයෝ නිවන් යන පින්කමට
පිනේ පිං බර කොලුත් ඇරලුවා පන්සලට

පස්පවින් පස්මරුන් මද සිතින් සුදු වතට
මුනිඳු දළඳ පුදති අත්ගසා කරඬුවට
හේමමාලා බැන්ද මුහුලසින් වැඩියාට
කරඬුවට කිලි ගෑණු අපේ පව් වැඳුණාම

රහත් සසමිත් තෙරණි අතින් ගෙන වැඩියාට
මහබෝධි සාමිනේ කැපත් නැතුවා අපට
වැලි ගසා බෝපතක් තබා ලය මත බැතින
දෑත නළලේ තබා ඇත උන්නා පවට

යාර ගණනින් සුදුම සුදු පිළි ඔතාගෙන
පේවිලා ආවේ අපි අපේ බුදුන් දකින්නට
අපේ පොඩි කෙලි පොඩ්ඩි පවා දිග කලිසමට
උඩින් ඇන්ද ඔය පිරුවටේ සුදු රෙද්ද

අපි අපේ පාඩුවේ අපේ පින් පිරුවාට
අපේ හාමුදුරුවෝවත් කියාදුන්නෑ අපට
ලේ නහර සම් මසද ජරාවක් නම් කයම
ගෑණුන්ගේ කිලි කිළුටු පවක් වන්නේ කෝම

කෝටියක් සංවරේ සිල් රකිනු බැරුවාට
බවුන් වැඩුවා සිල් පදත් රැක්කා පහම
සමා අවසර අපෙ හාමුදුරුවනේ අපට
සිව්වණක් පිරිසෙනුත් එකක් අඩුවා නොවෙද

විශාකාවට වගේ මිණිමෙවුල් නැතුවාට
උගස් තිබ්බා කනේ අරුංගල් දෙක නිතර
පේරු දනේ දුන්නේ තුන් සිතම පහදන
වන්දනාවේ ගියේ හිතේ බර ඔසවාන

උරුක්කර දඹරෙටම දඹරැගිලි අපෙ අතට
බුදු පුතේ තරවටුද ගර්ජනා මේ කුමට
දරු දෙන්නා රකින්නට මගක් නැති අපෙ උන්ට
වඳන්නට අණ පනත් හදන්නේ ඇයි මෙහෙම


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ධාතු වැන්ද රයක් පෝලිමේ සිටියා අපි
පිච්චමල් නෙළුම් මල් එක පොදියේ පිදුවේ අපි
උපාසක බලලුන්ට පවා දන් දුන්නේ අපි
'උ'-වැසියෝ අද මතුත් 'උ'-වැසියෝ වෙමුද අප
(හෙට්ටිආරච්චි, 2015:47-48)

බෞද්ධ භික්ෂුවකගෙන් ධර්මය ශ්‍රවණය කරන නූතන යුගයේ උපාසිකාව විසින් භික්ෂුවගේ බණ අහවර වූ පසුව පෙරළා නැවත උපාසිකාව විසින් භික්ෂුවට බණක් කියනු ලබයි. බෞද්ධ ශාසන ඉතිහාසයේ බණ ඇසූ උපාසිකාවන් මිස බණ කියූ බෞද්ධ උපාසිකාවන් පිළිබඳ ව වර්තමානය දක්වා ම අප අසා නැත. එහෙත් නූතන යුගයේ මෙම උපාසිකාව පෙරලා බණ බෞද්ධ භික්ෂූන් වහන්සේට පවස යි. එය හුදෙක් බණවරක් පමණක් නොව බෞද්ධාගම මූලික කරගත් බෞද්ධ සංස්කෘතිය විසින් පීඩාවට පත් කරන ලද යුග යුග බද්ධ වූ බෞද්ධ උපාසිකාවන්ගේ හෘද විලාපය යි.

බෞද්ධ ශාසනයේ සහ බෞද්ධ සංස්කෘතියේ අත්තිවාරම වන්නේ භික්ෂු, භික්ෂුණී, උපාසක උපාසිකා යන සිව්වනක් පිරිස යි. පද්‍ය නිර්මාණයේ අපට හමුවන උපාසිකාව පවසන ආකාරයට සිව්වනක් පිරිස මධ්‍යයේ උපාසිකාවන් ද පෙරමුණෙන් ම සිටියි. බුද්ධ දේශනාවේ සඳහන් වන ආකාරයට භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසම එක හා සමාන වෙති. විශාඛා, සාමා, නකුලමාතා, ආදී බුද්ධ කාලීන උපාසිකාවන් මෙන් ම නූතන යුගයේ උපාසිකාවන් ද තම ජීවිතයේ වටිනා සම්පත් බුද්ධ ශාසනයට කැප කරමින් බුදුදහමේ චිරපැවැත්ම වෙනුවෙන් උරදී ක්‍රියා කරයි. බුද්ධ කාලයේ විසූ විශාඛා මහෝපාසිකාව තම රනින් කළ මේළ පළඳනාව විකුණා පූර්වාරාමය සදා බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කළේ බුදුදහමේ චිර පැවැත්ම වෙනුවෙනි. විශාඛාවට මෙන් රනින් කළ මේළ පළඳනා නූතන යුගයේ උපාසිකාවන්ට නොමැති වුවත් දසමසක් කුසෙහි හොවා විළිරුද විඳ මෙලොවට බිහිකළ තම දරුවා බුද්ධ ශාසනයට පූජා කිරීමට තරම් නූතන බෞද්ධ උපාසිකාවන් නිර්ලෝභී ය. ඔවුන්ට උවමනා වන්නේ බුද්ධ ශාසනය රැකගැනීමට ය. බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට දන මාන පිළිගන්වමින්, නෙළුම් මල්, පිච්ච මල්, පෙරහැර මංගල්‍යය පවත්වමින් වෙහෙර විහාර ගොඩනගන්නට ක්‍රියා කරමින් නූතන උපාසිකාව බුදුදහමේ මතු දියුණුව වෙනුවෙන් මහා සෙබල මුලක් සේ පෙළ ගැසී සිටියි. කවියේ අභ්‍යන්තර කණිකාවලින් ප්‍රසාරණය වන අර්ථය වන්නේ බෞද්ධ ශාසනය අඛණ්ඩව පැවතගෙන ආවේ බෞද්ධ උපාසිකාවන්ගේ නොමද අනුග්‍රහයෙන් බවයි. එහෙත් නූතන උපාසිකාව ප්‍රකාශ කරන පරිදි බෞද්ධ සංස්කෘතිය විසින් බෞද්ධ උපාසිකාව පරිපීඩනයට ලක්කර තිබේ. මෙම පරිපීඩනය ශාරීරික, මානසික පරිපීඩනයක් නොව දෘෂ්ටිවාදමය පරිපීඩනයකි. සංඝමිත්තා තෙරණිය විසින් රැගෙන ආ ශ්‍රී මහා බෝධිය ආසන්නයට යන්නටද, හේමමාලා නැමැති ස්ත්‍රිය රැගෙන ආ බුදුන් වහන්සේගේ දන්ත ධාතුව වන්දනා කිරීමට යන්නට ද නූතන බෞද්ධ උපාසිකාවට තහංචි එල්ල වී තිබේ. ස්ත්‍රියට ජීව විද්‍යාත්මකව, ස්වභාවික ව උරුම වූ ස්ත්‍රී මාසික ඔසප්වීමට සංස්කෘතිය විසින් කිල්ල යන සංස්කෘතික තහංචිය නිර්මාණය කර තිබේ. ඔසප් කාල සීමාවේ දී ස්ත්‍රිය කිල්ල විසින් අපවිත්‍ර කර ඇති බවට වන විශ්වාසයක් සංස්කෘතිය විසින් දෘෂ්ටිවාද මගින් සමාජ මනස්වලට ඇතුළත් කර තිබේ. මෙම අපවිත්‍ර කාල සීමාවේදී කාන්තාව අපවිත්‍ර සත්ත්ව කොට්ඨාශයක් වන බැවින් ඔවුන්ට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම ව සිටින උඩමළුව, දළද වහන්සේ වැඩම කරන දළද මාළිගාවට යන්නට තහංචි දමා තිබේ. ඔසප් කාල සීමාවේ දී ස්ත්‍රියට ආගමික ස්ථානයක ඇතුළත්වීම එම ආගමික ස්ථානය අපවිත්‍ර කිරීමට හේතුවන බවට මතයක් සංස්කෘතිය විසින් නිර්මාණය කරනු ලැබ තිබේ. එහෙත් ශ්‍රී මහා බෝධිය හා දළදව ලංකාවට රැගෙන ආවේ ද ස්ත්‍රීන් දෙදෙනෙකි. බුද්ධ දේශනාවේ සඳහන් වන්නේ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව සමස්ත ශරීරයම ජරාවක් බවයි.

ස්ත්‍රියට ස්වභාවිකම උරුම වී ඇති මාසික ශුද්ධවීම නහර මස් ලේවලින් සෑදුණු ශරීරයේ ම කොටසකි. එසේ නම් ශුද්ධවීමෙන් පිටවන ලේ පවක් වන්නට හේතුවක් නැත. එහෙත් මාසික ඔසප්වීමෙන් පිටවන ලේ හේතුවෙන් බෞද්ධ උපාසිකාවන් විසින් ආන්තීකරණයට ලක් වී තිබේ. ස්වභාවික ස්ත්‍රී ශරීරය හේතුවෙන් කාන්තාව අපවිත්‍ර කොට්ඨාශයක් ලෙස සලකන්නේ බෞද්ධ සංස්කෘතිය පමණක් ම නොවේ. හින්දු ආගම, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම් ආගම, ස්ත්‍රීන්වීම හේතුවෙන් ම ස්ත්‍රීන්ව පරිපීඩනයට ලක්කර තිබේ.

> "හින්දු සමය වැන්දඹුවන් පුළුස්සනු ලැබීය. චීන ආගම් ඇයගේ පාද බන්ධනය සඳහා බලකරන ලදි. අප්‍රිකානු ගෝත්‍ර ආගම් හා ඉස්ලාම් ආගම මගින් ජනනේද්‍රිය ඡේදනයට උනන්දු කරන ලදි. ක්‍රිස්තියානි යුරෝපය දහස් ගණනින් මන්ත්‍රකාරියන් පුළුස්සා දමන ලදි"
> (ද සිල්වා, 2004:80)

තවද කුරාණයේ සඳහන්,

> "ගැහැණු ළමයෙකු පැවැත්මට නොඒම වඩාත්ම හොඳ වේය. ඉපදුනේ නම් එක්කෝ විවාහ විය යුතුය. නැත්නම් වැළලිය යුතුය"
> (ද සිල්වා, 2004:80)

යනුවෙනි. මෙලෙස ලොව පවතින ආගම් විසින් ස්ත්‍රිය පරපීඩනයට ලක් කිරීමට හේතු වී තිබෙන්නේ ස්ත්‍රී පුරුෂ ජීව විද්‍යාත්මක වෙනස හේතුවෙන් ස්ත්‍රිය අපවිත්‍ර යන පුරුෂ මූලික වූ සංස්කෘතික දෘෂ්ටිවාදය යි. ඉහත කවියේ බෞද්ධ උපාසිකාව ප්‍රකාශ කරන පරිදි බෞද්ධ සංස්කෘතිය විසින් බෞද්ධ උපාසිකාවන් සිව්වනක් පිරිසෙන් ඉවත් කොට වෙනම කොට්ඨාශයක් ලෙස ක්‍රියා කර තිබේ.

> 'උ'-වැසියෝ අද මතුත් 'උ'-වැසියෝ වෙමුද අපි"
> (හෙට්ටිආරච්චි, 2015:47-48)

යන 'උ'-වැසියෝ යන යෙදුම බෞද්ධ සංස්කෘතිය විසින් බෞද්ධ උපාසිකාව සිව්වනක් පිරිසෙන් ඉවත්කොට සිදුකර


© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඇති සංස්කෘතික ආන්තීකරණය විශද කරයි. 'උ'-වැසියෝ වෙමුද අපි යන ප්‍රශ්නකරණය තමන් 'උ'-වැසියන් කරවීම වෙනුවෙන් සවිඥ්ඥණික වී ඒ වෙනුවෙන් නැගී සිටිය යුතුය බවට වන ප්‍රකාශනයක් බඳු ය. එහෙත් බෞද්ධ උපාසිකාවන්ට එලෙස නැගී සිටිය හැකි ද යන්න ගැටළුවකි. මන්දයත් "පරිපීඩිත කණ්ඩායම් සැමවිට ම පාහේ පාලක කණ්ඩායම්වල ක්‍රියාවන්ට යටත් ව පිහිටි අතර, ඔවුන් කැරලි ගසමින් නැගී සිටියදී පවා තත්ත්වය එයම විය" (Guha, 1982:4).

කාන්තාවන් ද පරිපීඩිත කණ්ඩායමකි. පුරුෂ මූලික සංස්කෘතිය විසින් ස්ත්‍රීය පරිපීඩනයට ලක්කර ඇති අතර, එම පරපීඩනයට විරුද්ධව නැගි සිටිය ද ස්ත්‍රී සංස්කෘතික පරිපීඩනයෙහි වෙනසක් සිදු නොවිය හැකි ය.

## නිගමනය

අනුරාධා නිල්මිණි, සුහර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිඳියන් නූතන සිංහල කවිය නියෝජනය කරන, යුගකාරක කිවිඳියක වීමට තරම් කාව්‍යමය බුහුටිතාවයන් ප්‍රදර්ශනය කරන නූතන සිංහල කිවිඳියන් වේ. මෙම කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණවලින් විශද වන්නේ ස්ත්‍රීන්ගේ පරිපීඩනය පිළිබඳ ව ප්‍රකාශනයකි. එහි දී විශේෂයෙන් ම ස්ත්‍රීය සංස්කෘතිය සමඟ අවියෝජනීය ව බද්ධ කොට සංස්කෘතියෙහි ගොදුරක් බවට පත් ව පරිපීඩනයට ලක්වන ආකාරය නූතන සිංහල කිවිඳියන් කාව්‍යමය බුහුටිතාවයෙන් සහ රැඩිකල්වාදී ව ඉදිරිපත් කරයි. ස්ත්‍රීය සහ පුරුෂයා අතර පවතින ලිංගභේදය සංස්කෘතිකමය අර්ථයකින් විග්‍රහ කර තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය ස්ත්‍රීය පවුල් සත්ත්වයෙකු ලෙස නිර්මාණය කිරීම ස්ත්‍රීය පරිපීඩනයට ලක්වීමට බලපාන බලපෑම් සහගත සාධකයක් වී ඇති බව, උපයෝගි කර ගත් කාව්‍ය නිර්මාණ අනුව පැහැදිලි වේ. තවද ස්ත්‍රී පුරුෂ සමාජභාවය විසින් පුරුෂයා සමාජ සත්ත්වයෙකු ලෙස නිර්මාණය කර තිබෙන අතර, එමගින් පුරුෂයා වටා අසීමිත බලයක් ගොඩනැගී පුරුෂයා සමාජ ක්‍රමයෙහි නායකයා ලෙස බලවත් වී තිබෙන අතර, එම බලවත්වීම ස්ත්‍රීය අප්‍රධානත්වයට, ද්විතීයත්වයට පත්කිරීමට ද හේතු වී තිබේ. මෙලෙස ස්ත්‍රීය අප්‍රධානත්වයට හා ද්විතීයත්වයට පත්වීම ස්ත්‍රීකාරකත්වය ක්ෂය කිරීමට හේතුවී ඇති බවටද කරුණු අනාවරණය කරන නූතන සිංහල කිවිඳියන් ස්ත්‍රීය, පුරුෂ මූලික සංස්කෘතියෙන් ද්විතියත්වයට සහ අප්‍රධානත්වයට පත්වීම ස්ත්‍රීයගේ කාරකත්වය ක්ෂය කර ස්ත්‍රීය මරා දැමීමට තරම් ප්‍රබල වී ඇති බවට ද අවධාරණය කරයි. සංස්කෘතිය මූලික කරගෙන නිර්මාණය කර තිබෙන පුරුෂයා කේන්ද්‍රකරගත් සංස්කෘතිය පමණක් නොව සංස්කෘතියෙහි අංග (විශේෂයෙන්ම ආගම) මගින් ද ස්ත්‍රී පරිපීඩනය සිදු වන බව ප්‍රකාශ කරන අනුරාධා නිල්මිණි, සුහර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන නූතන සිංහල කිවිඳියන් ස්ත්‍රීය මත ඇතිකරන සංස්කෘතික පරිපීඩනය කායික සහ මානසික පරිපීඩනයට එහා ගිය දෘෂ්ටිවාදිමය පරිපීඩනයක් බවට ද තොරතුරු අනාවරණය කරයි. එහිදී විශේෂයෙන් ම පුරුෂයා සමාජ සංවිධානයෙහි ප්‍රධානියා ය, ස්ත්‍රීය ද්විතීය සහ අප්‍රධාන තැනැත්තියක් ය, ස්වභාවයෙන් ම ස්ත්‍රීය පවුල් සත්ත්වයෙක් ය, ස්ත්‍රීයගේ මාසික ඔසප්චක්‍රය අපවිත්‍ර කිලිටිවලින් යුක්ත ය බවට වන සංස්කෘතික ප්‍රවාදය සංස්කෘතිය විසින් සමාජ මනස්වලට ඇතුළත් කර ස්ත්‍රීය පරිපීඩනය ස්වභාවිකරණය කර තිබේ.

## පරිශීලිත මූලාශ්‍රය


### ග්‍රන්ථ (සිංහල)

අමරකීර්ති, ලියනගේ (2018). නව කවි සළකුණ. සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

කුමාර, හේමන්ත. (2009). ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම්, පුංචි බොරැල්ල:විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

තිරුචන්ද්‍රන්, සෙල්වි (1995). ස්ත්‍රීවාදි දර්ශන කෝණයෙන් සමාජ න්‍යායන් විග්‍රහ කිරීමක්. කාන්තා අධ්‍යයන හා පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ.

පඤ්ඤලෝක, එච්.යූ. (1952). පුරාණ හිමගත වර්ණනය. ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ධර්මරත්න, සුහර්ෂණී (2015). සුදුවත ඇඳි කෙකිනිය. ෆාස්ට් පබ්ලිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ.

ලියනගේ, කමලා සහ සුමුදු වළාකුළගේ (2006). ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී වාදය. ෆෙඩ්රික් ඊබට් පදනම, කොළඹ.

හෙට්ටිආරච්චි, විපුලි (2015). රූ. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

නිල්මිණි, අනුරාධා (2014). වත්සියපත්. ෆාස්ට් පබ්ලිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ.

ද සිල්වා, ඥනසිරි. (2004). දර්ශනය හා කාන්තාව. සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

### ග්‍රන්ථ (ඉංග්‍රීසි)

Bagawat, Vidyut. (2004). Feminist Social Thought: An Introduction to six key thinkers, Rawath Publications, New Delhi.

CIDA (1993). Gender Training Manual, Gender and Development Unit, CIDA, Colombo.

Guha, Ranajith. (1982). Subaltern Studies, Writing on South Asian Society, London: Oxford Univercity Press.

Sudha, Dk (2000). Gender Roles. A.P.H. Publishing Company, New Delhi.

Tylor, E (1920). Primitive Culture. John Murry, London.




© 2019 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
## දසවැනි කලාපය - 2019 දෙසැම්බර්


තාරකා විද්‍යාව, ජ්‍යොතිෂය සහ මිනිසා කෙරෙහි එහි බලපෑම් පිළිබඳ ගවේෂණයක් 1-9
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ඩී. වික්‍රමසිංහ**

පශ්චාත් යථාර්ථවාදී නවකතාවෙහි නිරූපිත ස්ත්‍රීත්වය හා සබැඳුණු ගැටලු: ගබ්සාව හා ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂ අවධානය සහිත ව කෙරෙන විමර්ශනයකි 10-22
**ආචාර්ය චම්පා එස්. ද සිල්වා සහ ආචාර්ය මනෝජ් ආරියරත්න**

ගුණසේන ගලප්පත්ති අනුවර්තිත නාට්‍ය නිර්මාණවලින් ධ්වනිත වන ශ්‍රී ලාංකේය ජන විඥානය: තෝරාගත් නාට්‍ය නිර්මාණ ඇසුරිනි 23-29
**ආචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර**

ඌව පළාතේ ගුහා විහාර සිතුවම් පිළිබඳ සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් 30-39
**ආචාර්ය ජයන්ති බණ්ඩාර**

ආපතික අනුරාගයේ ඉස්මතු වීම: මනමේ පිළිබඳ මනෝවිශ්ලේෂණාත්මක විචාරයක් 40-47
**ආචාර්ය මනෝජ් ආරියරත්න සහ ආචාර්ය මහේෂ් හපුගොඩ**

නූතන සිංහල නවකතාවේ ප්‍රාස්තාවික ව්‍යවහාර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (2010-2018 තෝරාගත් නවකතා ඇසුරෙනි) 48-57
**තේජා නානායක්කාර**

අද්‍යතන සිංහල නවකතාවේ නිරූපිත පශ්චාත් යථාර්ථවාදී භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: 2010-2018 තෝරා ගත් නවකතා ඇසුරින් 58-70
**යූ. ආර්. ටී. ගීතාංජලී**

නූතන සිංහල කිවිදියන්ගේ කාව්‍ය නිර්මාණවලින් හෙළි වන සංස්කෘතික ස්ත්‍රී පරිපීඩනය පිළිබඳ සංස්කෘතික ස්ත්‍රීවාදී විශ්ලේෂණයක්: අනුරාධා නිල්මිණි, සුභර්ෂණී ධර්මරත්න, විපුලි හෙට්ටිආරච්චි යන කිවිදියන්ගේ තෝරාගත් කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙනි 71-78
**එච්. එම්. බුද්ධික හේරත්**



ISSN 1800-1459
eISSN 2673-1177